
ආතර් කොනන් ඩොයිල්ගේ

# ලේ සලකුණ සහ වෙනත්

# ෂර්ලොක් හෝම්ස් කතා



## චන්දන මෙන්ඩිස්

Reading Purpose Only... Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# ලේ සලකුණු
# සහ වෙනත්
# ෂර්ලොක් හෝම්ස් කථා

ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල්ගේ
**MEMOIRS OF SHERLOCK HOLMES** හි
අපරාධ පරීක්ෂණ හතක්

පරිවර්තනය
**චන්ද්‍රන මෙන්ඩිස්**

ප්‍රකාශක
චන්දන මෙන්ඩිස්
141/2, දූව පාර,
බැද්දගාන - කෝට්ටේ.



Reading Purpose Only... Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com



ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල්

http://sherlockholmesinvestigations.blogspot.com

# පටුන


1. බොස්කෝම්බ් වලව්වේ පලුහිලව්ව 7

2. පුහු මැණුරේ මිනීමැරුම 40

3. කල්‍යාණ මිත්‍රයා 73

4. රන් පදක්කම 103

5. මැර පීටර් 130

6. ලේ සලකුණ 167

7. මිනීමරුවා නිදැල්ලේ 210


Reading Purpose Only, Not For Print.



http://sherlockholmesinvestigations.blogspot.com

# ශොස්කෝම්බ් වලව්වේ පළහිලව්ව

Reading Purpose Only. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com



viii. "අන්වීක්ෂය අපරාධ පරීක්ෂණයකට උදව් කරගත යුතුයි යන්න ඔප්පු කිරීමට මේක හොඳ උදාහරණයක්."

http://sherlockholmesinvestigations.blogspot.com

# ෂොස්කෝම්බ් වලව්වේ පළහිලව්ව

"මං හිතුවා හරි වොට්සන්. කිසිම සැකයක් නෑ, මේ මැලියම් වර්ගයක්. ඔබත් බලන්න මේ අන්වීක්ෂයෙන්." සෑහෙන වේලාවක් තිස්සේ යමක් සූක්ෂ්ම ලෙස පරීක්ෂා කරමින් සිටි හෝම්ස් කීය.

මම ඔහුගේ අන්වීක්ෂය වෙත පහත් වී, එහි දර්ශන පථය පැහැදිලි වන සේ කාච ඉහළ පහළ කරකවා බැලුවෙමි.

"ඔබට පෙනෙනවා නේද කෙඳි වගයක්? ඒ විවිධ රෙද්දෙන් මැසූ කබායකින් ආව කෙඳි. නිශ්චිත හැඩයක් නොමැතිව අළු පැහැයට තිබෙන්නේ දූවිලි. ඔය වම් පැත්තේ තියෙන්නේ කොරපොතු. නමුත් මැදින් තිබෙනවා නේද දුඹුරු පැහැති ගෝලාකාර වස්තූන් සමූහයක්? ඒ තමයි මැලියම."

"ඔබ එහෙම කියනවා නම් මං ඒක විශ්වාස කරනවා හෝම්ස්" මම සිනාසෙමින් පැවසුවෙමි.

"මෙතනදී මේ මැලියම් වල වැදගත්කම මොකක්ද?"

"අන්වීක්ෂය අපරාධ පරීක්ෂණයට ආධාර කරගත යුතුයි යන්න ඔප්පු කිරීමට, මේක හොඳ උදාහරණයක්. සාන්ත පැන්ක්‍රාස් ප්‍රදේශයේ සිදුවුණු මිනීමැරුම ඔබට මතකද් වොට්සන් ?"

"ඔව්. පොලිස් භටයකු මියගිය එක?"

"අන්න හරි. මළසිරුර අසලම වැටී තිබුණා කැප් තොප්පියක්. එම කැප් තොප්පිය මතුපිට තිබුණු පැල්ලම් කිහිපයක් සූරා, මම මේ අන්වීක්ෂයට දමල පරීක්ෂා කළා. අපරාධය ගැන සැකකරන තැනැත්තා කියනවා කැප් තොප්පිය ඔහුගේ නෙමෙයිලු. ඔහු වෘත්තියෙන් පින්තූර රාමු කරන්නෙක්. පින්තූර රාමුකරන අය නිතරම මැලියම් පාවිච්චි කරන අය නේ."

"මේ පරීක්ෂණයත් ඔබටද භාරවෙලා තියෙන්නේ ?"

http://sherlockholmesinvestigations.blogspot.com

"නෑ. මෙක ස්කොට්ලන්ඩ්යාඩ්හි මගේ මිත්‍ර මෙරිවෙල්ටයි භාර වෙලා තියෙන්නේ. ඔහු මගෙන් ඉල්ලා සිටියා, අන්වීක්ෂයෙන් කළ හැකි පරීක්ෂාවක් කරලා, ඔහුට උදව්ව කරන්න කියලා.

මං හොරකාසි අච්චු ගහපු මිනිහෙක් අල්ලා ගත්තා, ඔහුගේ කමිස අතේ වාට්යේ, රැඳී තිබුණු සියුම් ලෝහ කුඩු අන්වීක්ෂයෙන් පරීක්ෂා කරලා. ඒ කුඩු, කාසි නිෂ්පාදනයේදී භාවිත කරන තඹ හා සින්ක් මිශ්‍ර ලෝහයක් පීරි ගෑමෙන් ඇතිවුණු ඒවා බව මට සොයාගැනීමට හැකිවුණා. එදින් පස්සේ ස්කොට්ලන්ඩ්යාඩ් එකටත් වැටහිලා, අපරාධ පරීක්ෂණය සඳහා අන්වීක්ෂය යොදාගැනීමේ වැදගත්කම ගැන."

කථාව අවසන් කළ හෝම්ස්, යළිත් වරක් නොඉවසිල්ලෙන් තම අත් ඔරලෝසුව දෙස බැලීය.

"අලුත් අනුග්‍රාහකයෙක් මේ වෙලාවේදී මා හමුවෙන්න එනවා කියලා, මට දනුම්දීල තියෙනවා. ඔහු ටිකක් ප්‍රමාද වගෙයි. ඒක නෙමෙයි වොට්සන්. මොනවද ඔබ අශ්ව රේස් ගැන දන්නෙ?"

"අශ්වරේස් ගැන මං ටිකක් දන්නවා. ඇයි?"

"එහෙනම් වැඩෙ හරි. මට ඔබව යොදා ගන්න පුළුවන්." 'තුරඟ තරඟ පිටිය සඳහා අත් පොත' වගයෙන්. සර් රොබට් නෝබටන් ගැන ඔබ මොනවා හරි දන්නවද?"

"ඇත්තෙන්ම ඔව්. ඔහුගේ පදිංචිය ෂොස්කෝම්බ් පරණ වලව්වේ. මං ඒ ප්‍රදේශය හොඳට දන්නවා. එක් ගිම්හාන සෘතුවක මං ඒ පළාතේ නේවාසිකව හිටියා. නෝබටන් එක්වරක් ඔබේ ක්ෂෙත්‍රයට බොහොම ළඟින්, ගෑවී නොගෑවී ගියා කිව්ව හැකි. . . ."

". . . . මොනවා? ඒ කොහොමද ඒ?"

"නිව්මාකට් හීත්හි කර්සොන් විටියේ, සල්ලි පොලියට දෙන සෑම් බ්‍රෑවර් ගැන ඔබ අහලා ඇති හෝම්ස්. සර් රොබට් ඒ මිනිහට අශ්වයින්ට තළන කසයෙන් තදින්ම පහර දුන්නා. ඒ මිනිහා මරණයෙන් ගැලවුණේ අනූනවයෙන්."

"හැබෑට? ඔහුගේ හැසිරීම බොහොම සුවිශේෂ එකක් බවයි පෙනෙන්නෙ. නිතර නිතර ඔහු ඒ වගේ කටයුතු වල යෙදෙන බව අහන්න ලැබෙනවද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"නිතර නිතර මම දන්නේ නෑ. නමුත් ඔහු බොහොම දරුණු පුද්ගලයෙක් ලෙස ප්‍රසිද්ධයි. එංගලන්තයේ ඉන්න අශ්වාරෝහකයින් අතරින් ඔහු තරම් නිර්භය කෙනෙක් ගැන අහන්න ලැබෙන්නෙ නෑ. ඔහු අශ්වයා පිට නැගගෙන උඹ දක්කාගෙන යන්නෙ තමන්ගේ ජීවිතය ගැන කිසිම තැකීමක් නොකර. සර් රොබට් අවුරුදු ගණනකට කලින්, එංගලන්තයේ ජාතික තුරඟ තරඟ ශූර්තාවලියේ දෙවැනි තැන දිනාගත්තා. ඔහුගේ සමකාලීනයන් බොහොමයක් දැන් ජීවතුන් අතර නැහැ. සර් රොබට් නෝබටන් තරුණ කාලයේ බොහොම දක්ෂ බොක්සිං ක්‍රීඩක යෙක්, මලල ක්‍රීඩකයෙක්, අශ්වාරෝහකයෙක්, විනෝදකාමී සල්ලාලයෙක්. ඔහු වැරදි මාර්ගයට යොමු වෙලා, ඒකෙ බොහෝ දුර ගිහින්; හරි මාර්ගය මොකක්ද කියලා හොයා ගෙන ආපහු එන්න බැරි තරම් දුර වැරදි මාර්ගයේ ගිහින්"

"අනර්ඝයි වොට්සන්! ඔබ වචන කිහිපයකින් නෝබටන් පිළිබඳව සම්පූර්ණ නිවැරදි චිත්‍රයක් මැව්වා. දැන් මට තේරුම් ගන්න පුළුවන් මිනිහා මොන වාගේ කෙනෙක්ද කියලා. ෂොස්කෝම්බ් පරණ වලව්ව කොහොම තැනක්ද?"

"ඒක පිහිටා තියෙන්නේ පෞරාණික ෂොස්කෝම්බ් උද්‍යානය මැද්දේ. අර සුප්‍රසිද්ධ ෂොස්කෝම්බ් අශ්ව අභිජනන හා පුහුණු කිරීමේ මධ්‍යස්ථානය තිබෙන්නේ ඊට සමීපව"

මම කීවෙමි. ඉන්පසු හෝම්ස් කථාව පටන් ගත්තේ මා විස්මයට පත් කරමිනි.

". . . .එතැන ඉන්න ප්‍රධාන අශ්වයින් පුහුණුකරුවා ජෝන් මේසන්. මා දිහා පුදුමයෙන් බලන්න එපා වොට්සන්. මේ ලියුම මට එවලා තියෙන්නේ ඔහු. අපි මේ සෑරේ අතගහලා තියෙන්නේ යහමින් මුදල් ගැවසෙන තැනක පරීක්ෂණයකට බඳගෙයි. ෂොස්කෝම්බ් මැඬුර ගැන වෙන මොනවාද ඔබ දන්නේ?"

"ෂොස්කෝම්බ් ස්පැනියෙල් වර්ගයේ සුනඛයින් හරි ප්‍රසිද්ධයි. ඕය සුනඛ ප්‍රදර්ශන හැම එකකදීම වගේ උන් ගැන අහන්න ලැබෙනවා. උන් එංගලන්තයට පමණක් සීමා වූ සුනඛ විශේෂයක්නු. ෂොස්කෝම්බ් හි ආර්යාව ඒ ගැන හරි ආඩම්බරයි."

"ඒ කියන්නේ· සර් රොබට්ගේ බිරිඳ වෙන්න ඇති?"

http://sherlockholmesinvestigations.blogspot.com

"නෑ නෑ. සර් රොබට් කවදාවත් විවාහ වුණේ නෑ. ඔහු මේ පදිංචි වෙලා ඉන්නේ ඔහුගේ අක්කාගේ නිවසේ. ඔහුගේ අක්කා තමයි බියට්‍රිස් ෆෝල්ඩර් ආර්යාව. සර් ජේම්ස් ෆෝල්ඩර් බොහෝ කාලයකට පෙර මියගියා."

"හැබැට?"

"ඔව්. රොබටන්ට ශොස්කෝම්බ් වල කිසිම උරුමයක්, අයිතියක් නැහැ. බියට්‍රිස් ෆෝල්ඩර් ආර්යාවට මෙහෑන තියෙන්නේ ප්‍රාණ භුක්තියක් පමණයි. ඒට පස්සේ මෙතැන අයිතිවෙන්නේ සර් ජේම්ස්ගේ සහෝදරයාට. නමුත් දැනට එම දේපොළෙන් - වතුපිටි වලින් ලැබෙන ආදායම ඔක්කොම ඇයට ලැබෙනවා."

"අක්කා ඔක්කොම ආදායම ගන්නවා. මල්ලි ඔක්කොම වියදම් කරනවා. එහෙමද?"

"වැඩ කටයුතු සිද්ධවෙන්නේ බොහොම දුරට ඒ විදියට තමයි. මිනිස්සු කියන්නේ රොබටන් මහ යකාගේ මිනිහෙක් කියලයි. ඔහු නිසා ආර්යාවට මුහුණ දෙන්න සිද්ධවෙලා තියෙන්නේ මහා කරදරකාරී ජීවිතයකට. ඔහුගෙන් කොයිතරම් හිරිහැර වුණත්, මල්ලිට තියෙන ආදරය නිසා බියට්‍රිස් ආර්යාව හැම දෙයක්ම ඉවසන බවයි, මං අහල තියෙන්නේ. ඉතින් ශොස්කෝම්බ් මන්දිරයේ ඇතිවෙලා තිබෙන ප්‍රශ්නය මොකක්ද?"

"අන්න ඒක තමයි වොට්සන් මටත් දැනගන්න ඕන වෙලා තියෙන්නේ. මං හිතන්නේ මේ එන පුද්ගලයාට හැකි වේවි ඒ ගැන වැඩි විස්තර අපට කියන්න"

කිසිවෙකු උඩු මහලට නඟින ශබ්දය තරප්පුව දෙසින් ඇසිණි. දොර විවෘත විය. සේවක ළමයා විසින් උඩ තට්ටුවට කැඳවා ගෙන එනු ලැබූ අමුත්තා අපේ විසිත්ත කාමරයට ඇතුළුවිය. ඔහු උසින් වැඩි, මුහුණේ උඩු රැවුළ, යටි රැවුළ කිසිවක් නොමැති වන සේ, රැවුළ මුඩු කළ අයෙකි. සාමාන්‍යයෙන් අශ්වයන් හෝ ශිෂ්‍යයන් පාලනය කරන්නන්ගේ දැකිය හැකි, සිනහවකින් තොර දැඩි බවක් ඔහුගේ මුහුණෙන් ප්‍රකාශ විය. ජෝන් මේසන් යටතේ මේ දෙපක්ෂයම පුහුණුව ලැබූ අතර, ඔහු අපහසුභාවයකින් තොරව, අශ්වයින්ට මෙන්ම තරුණයින්ට ද මුහුණ දෙන්නට ඇතුවා නිසැකය.

"මගේ ලියුම ඔබට ලැබුණාද හෝම්ස් මහත්මයා?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබේ ලියුම ලැබුණා. එහෙත් ඔබේ ගැටළුව කුමක්ද කියා එහි සඳහන් වුණේ නැහැ?"

"එය, ලිපියකින් ඔබට තේරුම් කරල දෙන්න අපහසු සියුම් කරුණක්; ඒ වගේම සංකීර්ණ, තේරුම් ගැනීමට අපහසු එකක්. ඉතින් මං තීරණය කළා ඔබව හමුවෙන්න. හමුවෙලා කරන සාකච්ඡාවකින් පමණයි මේක ඔබට තේරුම් කර දෙන්න පුළුවන්"

"හොඳයි, අපි සූදානම් ඔබට සවන් දෙන්න."

"හෝම්ස් මහත්තයා, මට මුලින්ම කියන්න තියෙන්නේ මගේ ස්වාමියා වන සර් රොබට් නෝබටන්ට හොඳටම පිස්සු!"

හෝම්ස් ඇස්බැම් ඉහලට එසවූයේ විස්මය පළකරමිනි.

"මේසන් මහත්මයා, මේක බේකර් වීථිය. වෛද්‍ය විශේෂඥයන් සඳහා නම් ඔබ යායුතු හාර්ලි වීථියට. ඒ වුණත් මොකද ඔබ ඔහුට පිස්සුයි කියන්නේ?"

"මෙන්න මේ කරුණ නිසයි. මිනිහෙක් අපට තේරුම් ගන්න බැරි විකාර වැඩ එකක් කළොත්, නැත්නම් දෙකක් කළොත්, අපි හිතනවා ඔහු ඒක කරන්න ඇත්තේ යම් කිසි අදහසක් ඇතුව, තේරුමක් ඇතුව කියලයි. නමුත් ඔහු කරන හැම වැඩක්ම පිස්සු විකාර වැඩ වෙනකොට, අපට තේරුම් ගන්න බැරි වෙනවා මොකක්ද මේ වෙන්න යන්නේ කියලා. මට හිතෙන්නේ අශ්ව රේස් පිටිය හා 'ෂොස්කෝම්බ් ප්‍රින්ස්' නිසා සර් රොබට් උමතුවෙලා."

"ඒ කිව්වේ ඔබ තුරග තරඟ සඳහා ඉදිරිපත් කරන අශ්වයාගේ නමද?"

"ඔව්. ඌ තමයි මේ එංගලන්තයේ ම ඉන්න නොම්මර එකේ අශ්වයා, හෝම්ස් මහත්මයා. ඒ බව මං කාටත් වඩා හොඳින් දන්නවා. මං දැන් ඔබට සම්පූර්ණ ඇත්ත හෙළිකරන්නම්. මං දන්නවා ඔබ දෙදෙනා නියම මහත්වරු කියා; මේ කාරණයේ රහසිගත භාවය ඔබ ආරක්ෂා කරන බව මට විශ්වාසයි.

මේ සැරේ ඩර්බි තුරග තරඟ වලදී සර් රොබට් ජයග්‍රහණය කළ යුතුමයි. ඔහු දැන් දහ අතේ ණය වෙලා; බෙල්ල ළඟටම එරිලා; සම්පූර්ණයෙන්ම බංකොලොත්. මේක තමා ඔහුට ලැබෙන අවසාන අවස්ථාව. අශ්වයා දිනාවි කියන බලාපොරොත්තුවෙන් ඔහුට තව

http://sherlockholmesinvestigations.blogspot.com

තවත් මුදල් ණයට ගන්න පුළුවනි. අපේ අශ්වයාට මෙවර ජයග්‍රහණය ලබන්නත් හොඳ හැකියාවක් තිබෙනවා. නමුත් සර් රොබට්ගේ මුළු ජීවිතයම රඳාපවතින්නේ මෙවර ජයග්‍රහණය මත. ණයකාර යුදෙව්වන්ගේ ග්‍රහණයට හසුනොවී ඔහු යන්තම් බේරිලා ඉන්නේ තුරඟ තරඟ පවත්වන තුරු. අපේ අශ්වයා පරාජය වුණොත් සර් රොබට් හෝබටන් කපෝතියි.!"

"ඒක හරි අන්තරායදායක විදියේ ජීවිතය සමඟ ඔට්ටු ඇල්ලීමක් නේ. නමුත් සර් රොබට්ට පිස්සු හැදිලා කියන කතාව සම්බන්ධ වෙන්නේ කොතැනටද?"

"වෙන මොකුත් එහෙම නැහැ මහත්මයා. ඒක ඔහු දිහා බැලූ බැල්මටම පෙනෙනවා. මා හිතන්නේ නෑ රෑට ඔහු එක මොහොතක් යහතින් නිදාගන්නවා කියල. කොයි වෙලේ බැලුවත් ඉස්තාලය පැත්තෙමයි. ඇස් දෙකේ තිබෙන්නේ මහා රතුපු පෙනුමක්. මං දන්නවා දැන් නම් මේ ප්‍රශ්නයේ උග්‍ර තත්ත්වය, ඔහුගේ මොළයට විඳ දරාගන්න පුළුවන් සීමාව ඉක්මවා ගිහින්. අනෙක් එක දැන් ඔහු බියට්‍රිස් ආර්යාවට දක්වන සැලකීම."

"ඇයි එතැන මොකක්ද ප්‍රශ්නේ?"

"අක්කයි මල්ලියි දෙන්නා බොහොම ආදරයෙන් හිතවත්වයි හිටියේ. දෙන්නාගෙම කැමැත්ත, අකමැත්ත තිබුණේ එකම දේවල් වලට. සර් රොබට් වගේම බියට්‍රිස් ආර්යාවත් අශ්වයින්ට ආදරෙයි. කරත්තයේ නැගිලා අශ්වයින් පුහුණු කරන තැනට, ඉස්තාලයට ඈ හැමදාමත් එකම වෙලාවට එනවා. ඒක කිසිම දවසක වරද්දන්නේ නෑ. අනෙක ඇය 'ෂොස්කෝම්බ් ප්‍රින්ස්' අශ්වයාට හරිම ආදරෙයි. ආර්යාවගේ කරත්තය එන ශබ්දය ඇහෙන විට ඌ කන්පෙති ඔසවාගෙන හොඳින් කුන්දිගෙන ඉන්නවා. ඊළඟට අශ්වකරත්තය ඇවිත් නැවැත්තුවාම 'ප්‍රින්ස්' එතැනට ඇවිදගෙන යන්නේ කවුරුවත් අණදීල නෙමෙයි. ආර්යාවගෙන් තෑගි ලැබෙන සීනි අහුරු කන්න, ඌ මඟ බලාගෙන ඉන්නවා. නමුත් දැන් ඒ ඔක්කොම ඉවරයි."

"ඒ මොකද?"

"අශ්වයින් ගැන ඇගේ තිබුණ ආදරය සම්පූර්ණයෙන්ම නැතිවෙලා ගිහිං වගෙයි පෙනෙන්නේ. දැන් සතියක් තිස්සේ ඉස්තාලය පහුකරගෙන අශ්වකරත්තය ගමන් කරනවා. නමුත් එක

http://sherlockholmesinvestigations.blogspot.com

මොහොතකට අපි ඉන්න පැත්තෙ නවතින්නෙත් නෑ, "සුභ උදෑසනක්" කියන්නවත්. "

"ඔබ හිතන්නේ මොකක් හරි ලොකු සණ්ඩුවක් වෙලා කියලද?"

"එහෙම සණ්ඩුවක් වෙලා නම් ඒක බොහොම ප්‍රකෝපකාරී දරුණු එකක් වෙන්න ඇති. බියට්‍රිස් ආර්යාව දරුවෙක් වගේ ආදරයෙන් ඒක බලාගත්ත බල්ලෙක් හිටියා. දැන් දින කිහිපයකට කලින් සර් රොබට් ඒ බල්ලාව මිනිහෙකුට දුන්නා අරගෙන යන්න කියලා. හැතැක්ම තුනක් දුර ක්‍රෙන්ඩෝල් වල ග්‍රීන් ඩ්‍රැගන් තානායම අයිති බාන්ස්ටයි බල්ලව දුන්නෙත්. දරුණු අමනාපයක් නොතිබුණා නම් එහෙම කරාවිද?"

"ඒක නම් ඇත්තෙන්ම හරි පුදුමයි"

"බියට්‍රිස් ආර්යාව හදවතේ දුර්වලතාවයක් නිසා බොහොම කාලයක් තිස්සේ අසනීප ගතියෙන් ඉන්නෙ. හැමදාම හැන්දෑවට අක්කාගේ කාමරේට ගිහින් ඇය සමග සෑහෙන වෙලාවක් සතුටු සාමීචියේ යෙදෙන්න සර් රොබට් කවදාවත් අමතක කළේ නෑ. ඇයත් ඔහුට බොහොම හිතවත්ව ආදරයෙන් හිටියා. ඒ ඔක්කොම දැන් ඉවරයි. දැන් සර් රොබට්, බියට්‍රිස් ආර්යාව ඉන්න පැත්ත පළාතේ යන්නේ නෑ. ඒක ඇයට තදබල සිත් වේදනාවක් ගෙනා බවට කිසිම සැකයක් නෑ. ඇය දැන් නොනවත්වාම මත්පැන් බොන්න පටන් අරගෙන. විශ්වාස කරන්න හෝම්ස් මහත්තයා, ඇයට දැන් මත්පැන් නැතුව බැහැ, නියම බේබද්දෙකුට වගේ."

"මෙම සිත් අමනාපය ඇතිවෙන්න කලිනුත් ඇය මත්පැන් බිව්වද?"

"එහෙම බිව්වෙ නැහැ මහත්මයා. දවසකටම වයින් වීදුරුවක් විතර බිව්වා. නමුත් දැන් හවස් වරුවකට එක බෝතලයක්ම ඉවර කරනවා. මට මේ ටික කිව්වේ ගෘහ පාලකයා ස්ටීවන්ස්. හෝම්ස් මහත්තයා, හැම දෙයක්ම අපට තේරුම් ගන්න බැරි විධියට වෙනස් වෙලා. මෙතන යටින් මොකක් හරි නින්දා සහගත වැඩක් සිද්ධ වෙනවා. දෙව්මැදුරේ සොහොන් ගැබ ඇතුළේ, කළුවර වැටුණට පස්සේ සර් රොබට්ට මොකක්ද තියෙන රාජකාරිය? ඔහු එහේදී රහසේ හමුවෙන පුද්ගලයා කවුද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබට කියන්න තිබෙන දේවල් දිගටම කියාගෙන යන්න මෙසන් මහත්තයා. ඔබේ කතාව ඉතාම සිත්ගන්නා සුලුයි."

"එක දවසක් රෑ දොළහට, ධාරානිපාත වැස්සක් පවා තියෙන වෙලාවේ සර් රොබට් නිවසින් පිටවෙලා යනවා, ගෘහ පාලකයා ස්ටීවන් දැකලා තියෙනවා. ඉතින් ඊළඟ දවසේ රෑ මම ගිහින් බලාගෙන හිටියා. මෙන්න එදා රෑත් අපේ ස්වාමියා නිවසෙන් පිටවෙලා ගියා. මමත් ස්ටීවනුත් ඔහු පසුපස ගියා. අපට යන්න සිදුවුණේ ඔහුට සැහෙන තරම් පිටුපසින්. ඔහුට අහුවුණා නම් අපි දෙන්නා විනාසයි. කේන්ති ගියාම සර් රොබට් බොහොම දරුණු පුද්ගලයෙක්. කෙනෙකුට පහර දෙන්න ගියාම කොහනින් නවත්වන්න ඕනද කියලා ඔහුම දන්නෙ නෑ. ඔහු ගියේ අවතාර තිබෙන සොහොන් ගැබටයි. එතැනට සර් රොබට් ගියේ කෙනෙකුව හමුවෙන්න."

"අවතාර තිබෙන සොහොන් ගැබ යනුවෙන් ඔබ සඳහන් කළේ කුමක්ද?"

"ෂොස්කෝම්බ් උද්‍යානය මැද්දේ හොඳටම ගරාවැටුණු පුරාණ දේව් මැඳුරක් තිබෙනවා. මෙක කොයිතරම් පැරණි එකක්ද කියනවා නම්, කිසිම කෙනෙක් දන්නෙ නෑ ඇත්තෙම මෙලා ශතවර්ෂයක ගොඩ නගපු එකක්ද කියලා. ඔය දේව්මැඳුරේ නටබුන් වලට යටවෙලා තියෙන්නේ, ආදි කාලේ මෘතශරීර තැන්පත් කරන්න භාවිත කළ සොහොන් ගැබ. එතැන අවතාර හොල්මන් තිබෙන තැනක් හැටියට කා අතරත් ප්‍රසිද්ධයි. දවල් කාලෙට වුණත් මෙතැන මහ අඳුරු, මුස්පේන්තු තැනක්. අඳුරු වැටුණු වෙලාවට මෙතැනට යන්න භය නැති කෙනෙක්, මේ බර්ක්ෂයර් ප්‍රාන්තයෙන් හොයාගන්න ලැබෙන එකක් නැහැ. නමුත් සර් රොබට් කිසිම භයක් නෑ. ඔහු මුළු ජීවිතයටම කිසිදේකට, කිසිම කෙණෙකුට භයක් තිබුණු මිනිහෙක් නෙමෙයි. ඒ වුණත් ඔහුට මහ රෑ එතැන තිබෙන රාජකාරිය මොකක්ද?"

"ඔහොම ඉන්න ටිකක්. ඔබ කිව්වා එතැන මිනිහෙක් හිටියා කියල. කිසිම සැකයක් නෑ ඔහු ඔබේ අශ්ව ඉස්තාලේ සේවය කරන කෙනෙක් වෙන්න ඇති? එහෙමත් නැත්නම් ෂොස්කෝම්බ් මන්දිරයේ ගෘහ සේවකයෙක් වෙන්න ඇති. ඔබට තියෙන්නේ ඒ මිනිහාව අල්ලගෙන ඔහුගෙන් ප්‍රශ්න කරන්නයි."

"නැහැ හෝම්ස් මහත්මයා. ඒ තැනැත්තා මං කිසිදාක දැක නැති කෙනෙක්"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබ කොහොමද ඒක කියන්නේ?"

"මට කියන්න පුළුවනි, මං ඔහුව හරි හැටි දුටු නිසා. ඒක සිද්ධවුණේ එදා දෙවැනි දවසෙ. සර් රොබට් පිටුපසින්, ස්ටීවන් සමග මං ඉදිරියට ගිය බව ඔබට කිව්ව නේ. එදා රෑ සැහෙන්න සඳ එළියත් තිබුණා. ඒ නිසා අපි දෙන්නා ඉස්සරහට ගියේ හාවෝ දෙන්නෙක් වගේ, පඳුරෙන් පඳුරට හැංගි හැංගි. සර් රොබට් සැහෙන දුරක් ගියාට පස්සේ අපට ඇහුණා, අපේ පිටුපසින් තවත් කවුද ඉදිරියට එන ශබ්දය. ඔහුට ටිකක් ඉදිරියට යන්න ඇරලා, අපි හැංගිලා බලාගෙන හිටියා. ඊළඟට අපි දෙන්නා ඔහුට ළංවුණා. ඊට පස්සේ මොකුත් අමුත්තක් නොපෙන්වා මං කිව්වා,

"ආයුබෝවන් මිනුගා. ඔහේ කවුද?"

එක්වරම ඔහු පුදුමයෙන් පිටුපස හැරිලා බැලුවා. අපව දකපු ගමන් ඔහුගේ මුහුණ වෙනස් වුණේ හරියට මළයක්ෂයෙකුව දකපුවා වගේ. මරළතෝනියක් නැගූ ඔහු ඉදිරියට දිව්වේ මීටෙන් ඇරපු කුරුල්ලෙක් වගේ. ඔහුට බොහෝම වේගයෙන් දුවන්න පුළුවන් බව පෙනුණා. ඒ මොකද මිනිත්තුවක් යන්න කලින් ඔහු අතුරුදන් වුණා. ඔහු කාගේ කවුද, එතැන කළේ මොකක්ද ආදී කිසිදෙයක් අපට තවම දැනගන්න ලැබුණේ නෑ."

"ඒ වුණත් සඳ එළියෙන් ඔහුගේ මුහුණ ඔබට පැහැදිලිවම දැකගන්න ලැබුණා?"

"ඇත්තෙන්ම ඔව්. ඔහුගේ කහපාට මුහුණ මං හොඳ හැටි දැක්කා. මහ පහත් තත්ත්වයක මිනිහෙක්. මේ වගේ මිනිහෙක් එක්ක සර් රොබට්ට තියෙන ගනුදෙනුව මොකක්ද කියලා මට හිතාගන්නවත් බෑ."

හෝම්ස් මඳ වේලාවක් නිහඬව කල්පනා කරමින් සිටියේය. ඔහු මනසින් ෂොස්කෝම්බ් උද්‍යානයට පිවිසෙන්නට ඇතැයි මම සිතුවෙමි

"බියට්‍රිස් ෆෝල්ඩර් ආර්යාවගේ සේවයට ඉන්න සේවිකාවෝ කවුද?"

"ආර්යාවට එක සේවිකාවක් ඉන්නවා. නම කැරී එවන්ස්. පහුගිය අවුරුදු පහක් තිස්සෙම සේවිකාව බලාගත්තේ ඇය තමයි."

http://sherlockholmesinvestigations.blogspot.com

"එහෙනම් බොහොම කැපවීමෙන්, ආදරයෙන් තමන්ගේ ස්වාමිදූව බලාගන්නවා ඇති?"

ජෝන් මේසන් මහතා යමක් කීමට උත්සාහ කොට එය අපහසුවෙන් යටපත් කරගත්තේය. අනතුරුව යළි අප ඇමතුවේ මඳ වේලාවකට පසුවයි.

"ආදරයෙන් කැපවීමෙන් බලාගන්නවා තමා. නමුත් කාවද තියල මං කියන්නෙ නෑ."

"ආ . . . . මට තේරුම් ගන්න පුළුවනි, මේසන් මහත්මයා. සර් රොබට්ගේ චරිතය ගැන තොරතුරු ටිකක් මට වොට්සන් කිව්වා. ඒකෙන් මට හැම දෙයක්ම හිතාගන්න පුළුවනි. අක්කයි මල්ලියි අතර ආරවුලට හේතුව එය බව ඔබට හිතෙන්නේ නැද්ද?"

"මං හිතන්නේ නෑ. ඒ මොකද එය බොහොම කාලයක සිට ප්‍රසිද්ධ කාරණයක්."

"අපි මෙහෙම හිතමු මේසන් මහත්මයා. අනෙක් අය අතර ප්‍රසිද්ධ කාරණයක් වුණත්, බියට්‍රිස් ආර්යාව මේ ගැන දැනගෙන හිටියේ නැතුවා වෙන්න පුළුවනි. ඇබට මේක හදිසියෙන් දැනගන්න ලැබෙනවා. ඇය වහාම තීරණය කරනවා සේවිකාව රැකියාවෙන් පහකර දමන්න. නමුත් ඇගේ සොහොයුරා මේකට ඉඩදෙන්නේ නෑ. තමන්ට තිබෙන අසනීපයේ ස්වභාවය නිසා බියට්‍රිස් ආර්යාවට තනියම කිසිදෙයක් කර කියා ගන්න බෑ. ඇය අසරණයි. ඇයට ඕනෙ හැටියට කටයුතු කරන්න ක්‍රමයක් නෑ. ඇය බලවත් කලකිරීමට පත්වෙනවා. ඒ නිසා මත්පැන් බීමට පටන්ගන්නවා. ඔහුට ඇතිවූ කෝපය නිසා, සර් රොබට් ඇගේ සුරතල් බල්ලාව වෙන කාටහරි දුන්නා. එහෙම පැහැදිලි කිරීමක් කළොත්, හැම නිරීක්ෂණයකටම ගැළපෙනවා නේද?"

"බාග වෙලාවට ගැළපෙන්න පුළුවනි. නමුත් සෑහෙන තරම් දුරට." මේසන් කීය.

"හරියටම හරි. සෑහෙන තරම් දුරට ගැළපෙනවා. නමුත් සර් රොබට් රාත්‍රි කාලයේ සොහොන් ගැබට යන සවාරි මේ උපකල්පනයට ඈඳුළ කරන්නෙ කොහොමද? ඒක නම් කතාවට හරි හැටි අමුනන්න බෑ. එහෙම නේද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"හෝම්ස් මහත්මයා. ඔතැනට අමුණාන්න බැරි තවත් සිද්ධියක් තිබෙනවා. වළ දමා ඇති මළ සිරුරක් ගොඩගන්න, සර් රොබට්ට ඇති උවමනාව මොකක්ද?"

"මොනවා?"

"ඔව් මහත්මයා. ඒක අප්ප හොයා දැනීමට හැකි වුණේ ඊයේ, ඔබට ලියුම එව්වාට පස්සේ. ඊයේ සර් රොබට්ට ලන්ඩනයට ඒමට සිදුවුණා. මම ස්ටීවන් සමග අර සොහොන් ගැබ තුළට ගිහිං පරීක්ෂා කරල බැලුවා. අනෙක් සෑම තැනක්ම සාමාන්‍ය විදියට තිබුණා. නමුත් ඒක මුල්ලක මළසිරුරක කොටස් වගයක් තිබුණා."

"ඔබ පොලිසියට දැන්නුවාද?"

අපේ අමුත්තාගේ මුහුණට සිනාවල්ලක් නැගිණි.

"එහෙම දැන්නුවත් පොලීසියට නම් ඒ ගැන කුතුහලයක් ඇති වෙව් කියල මං හිතන්නෙ නෑ. ඒ ගැන තිබුණේ මළසිරුරක හිස් කබල සහ අස්ථි කිහිපයක් පමණයි. ඒක මං හිතන්නේ අවුරුදු දාහකටත් වඩා පැරණි මානශරීරයක කොටස් වෙන්න ඇති. වියළී ගිය සම, හිස් කබලට ඇලිලා. අර ඊජිප්තු සොහොන් වල තිබී හමු වුණු මමියක් වගේ.

නමුත් පුදුමය කියන්නෙත් හෝම්ස් මහත්මයා, සොහොන් ගැබේ ඔය මුල්ලේ මීට ඉස්සර කිසිම දෙයක් තිබුණෙ නැහැ. ඒ ගැන මං විතරක් නෙමෙයි ස්ටීවනුත් දිවුරන්න සූදානම්. මේ මමියේ සුන්බුන් මුල්ලක දමලා, ලෑල්ලකින් වහල තිබුණා. නමුත් අපට හොඳටම විශ්වාසයි, එතැන හිස්ව තිබුණු තැනක්."

"ඔබ මොකද ඒකට කළේ?"

"අපි ඒක එහෙමම තියෙන්න හැරියා"

"ඒක බොහොම නැණවත් ක්‍රියාවක්. ඔබ කිව්වා සර් රොබට් ඊයේ නිවසෙන් පිටව් ගිහින් සිටියා කියල. ඔහු ආපහු ඇවිත්ද?"

"අද ඔහු ආපහු එව් කියල අපි බලාපොරොත්තු වෙනවා."

"අක්කාගෙ සුරතල් බල්ලාව, සර් රොබට් කාටද දුන්නා කිව්වා නේ. හරියටම ඒ කවදාද?"

"හරියටම මීට සතියකට කලින්. මේ බල්ලා, නිවසෙන් පිටත පාළු ළිඳ වටා ඇති ආවරණ නිවස අසල දිගින් දිගටම බුරමින්

http://sherlockholmesinvestigations.blogspot.com

සිටියා. එදා උදේ ඉඳලාම සර් රොබට් බොහොම කේන්තියෙන් හිටියේ. ඔහු ගිහින් බල්ලාව අල්ලලා හොනාපු හැටියට, මං හිතුව ඌව මරා දමාවි කියලා. නමුත් ඔහු බල්ලාව අපේ අශ්වාරෝහකයෙක් වන සැන්ඩි බේන්ට දුන්නා.

"මේකව අරගෙන ගිහිං ග්‍රීන් ඩ්‍රැගන් තානායමේ නාකි බාන්ස්ට දීපං. කියාපං මූව එහේ තියාගන්න කියලා. මගේ ජීවිතේටම මූව ආයෙත් මගේ ඇස්දෙකට දකින්න මං කැමති නෑ." ඔහු කිව්වා.

හෝම්ස් මඳ වේලාවක් කල්පනා කරමින් සිටියේ ඔහුගේ පයිප්පය උරමිනි. එදා හෝම්ස් ඔහුගේ පයිප්පයට යොදා තිබුණේ සැර දුමක් නැගෙනා දුම්කොළ වර්ගයකි.

"මෙසන් මහත්මයා. මට තවමත් හරියටම පැහැදිලි නැහැ ඔබ මෙතැනදී මගෙන් බලාපොරොත්තු වෙන්නෙ මොනවද කියලා. ඔබට නිවැරදිවම කියන්න පුළුවන්ද මා කළ යුත්තේ කුමක්ද කියලා?" හෝම්ස් ඇසීය.

"මෙන්න මහත්මයා මේක දිහා බලන්න. එතකොට ඔබට හරියටම හිතාගන්න පුළුවනි"

කඩදාසියක ඔතා තිබූ යමක් සාක්කුවෙන් එළියට ගත් ඔහු, එය ප්‍රවේශමෙන් දිග හැරියේය. එහි වූයේ අර්ධ වශයෙන් පිළිස්සී ගිය අස්ථියක කොටසකි.

හෝම්ස් එය පරීක්ෂා කිරීමට ගත්තේ දැඩි උනන්දුවකිනි.

"ඔබට මේක හමුවුණේ කොහේ තිබිලද?"

"බියට්‍රිස් ආර්යාවගේ කාමරය උණුසුමට තබා ගැනීම සඳහා, උණුසුම් වාතය යැවූ උදුනක් තිබෙනවා බිම් මහලේ. සැහෙන කාලයක් තිස්සේ ඒක පාවිච්චි නොකර අත්හැර දමලයි තිබුණේ. මේ ළඟකදී සර් රොබට් නියම කළා, ඒ උදුන යළිත් දල්වන්න. ඔහු කිව්වා ආර්යාවගේ කාමරයට දැන් අයෙමත් සීතල ගතියක් දැනෙනවා කියල. උදුනට අඟුරු ගෙනත් දමන එකත්, අළු ඉවත් කොට පිරිසිදු කිරීමත් කරන්නේ හාවි නම් ඉලන්දාරියෙක්. ඔහු මා යටතේ ඉස්තාලයේ සේවය කරන ළමයෙක්. මේක ඔහුගේ හිතට ඇල්ලුවේ නෑ. ඉතින් මිනිහා මේක මට ගෙනත් දුන්නා"

"මේක මගේ හිතටත් අල්ලන්නෙ නෑ" හෝම්ස් කීය.

http://sherlockholmesinvestigations.blogspot.com

"මේ ගැන ඔබට මොනවද කියන්න පුළුවන් වොට්සන්?"

එය සම්පූර්ණයෙන්ම පාගේ අඟුරු වනසේ දැවී ගොස් තිබිණි. එහෙත් එය මනුෂ්‍යයෙකුගේ කකුලේ ඌර්ධවස්ථිය බව මට හඳුනාගත හැකි විය.

"හරියට හරි!" හෝම්ස් පැවසුවේ දැඩි උද්‍යෝගයකිනි. "මේ ළමයා උදුන පිරිසිදු කරන්නේ මොන වේලාවටද?"

"ඔහු හැමදාම හැන්දෑවට අළු ඉවත්කරලා, උදුන පිරිසිදු කරලා අලුත් අඟුරු යොදනවා."

"ඒ කියන්නේ රෑට ඕනෑ කාට හරි එතැනට යන්න පුළුවනි?"

"ඔව් මහත්මයා".

"මේ උදුන පිහිටි බිම මහලේ කාමරයට පිටතින් කෙනෙකුට ඇතුළු වියහැකි ක්‍රමයක් තිබෙනවාද?"

"පිටතින් ම ඇතුළු වියහැකි එක දොරක් තිබෙනවා. ඊට අමතරව තවත් දොරක් තිබෙනවා. බියට්‍රිස් ආර්යාවගේ කාමරයට ඇතුළුවන තැන බරාඳයට ඒක තරප්පුවකින් සම්බන්ධ වෙනවා."

"මේක බොහොම බැරෑරුම් ප්‍රශ්නයක් මේසන් මහත්මයා. බැරෑරුම් වගේම පිළිකුල් සහගත එකක්. ඔබ කිව්වා සර් රොබට් ඊයේ රාත්‍රි ගෙදර හිටියේ නැහැ කියල?"

"ඔහු ගෙදර හිටියේ නෑ"

"හොඳයි ඔහු නෙමෙයි නම් කවුද මේ ඇටකටු පුළුස්සන්නේ?"

"ඒකත් ඇත්ත"

"මොකක්ද ඔබ කිව් අර තානායමේ නම?"

"ග්‍රීන් ඩ්‍රැගන් "

"බර්ක්ෂයර් ප්‍රාන්තයේ ඔය පැත්තේ, විනෝදයට මසුන් අල්ලන්න පුළුවන් ඇළ දොළ එහෙම මොනවද තියෙන්නේ?"

ජෝන් මේසන්ගේ මුහුණ එක්වරම වෙනස් විය. ඔහුගේ මුහුණේ ඇති වූයේ තමාට තවත් පිස්සෙකුට මුහුණ දීමට සිදුවී ඇතැයි යන බැල්මකි. මොහොතක් කල්පනා කළ ඔහු පැනයට පිළිතුරු දුන්නේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"මං අහල තියෙනවා මහත්මයාගේ ප්‍රදේශය හරහා ගලන දොළේ 'ට්‍රවුට්' මසුන් ඉන්නා බව. ෂොස්කෝම්බ උද්‍යානයට අයත් විලේ 'පයික්' වර්ගයේ මත්ස්‍යයින් ඉන්නවා."

"බොහොම හොඳයි. වොට්සනුයි මායි විනෝදයට බිලීබෑම කරන අය බව ප්‍රසිද්ධ කරුණක්. එහෙම නේද වොට්සන්? ඔබ අප වෙත ලිපි මොනවා හරි එවනවා නම් ග්‍රීන් ඩ්‍රැගන් තානායමට එවන්න. ඒත් අප හමුවෙන්න එහේට එන්න එපා කියල මං ඔබට අමුතුවෙන් කිවයුතු නැහැනේ?

කොහොම වුණත් කුඩා ලියුම් කැබැල්ලක් එව්වොත් නම් එය අපට ලැබේවි. ඒ වාගේම මට ඇවිත් ඔබව හමුවෙන්න බැරිකමකුත් නෑ මං හිතන්නෙ. මේ ගැටලුව පිළිබඳව අප තවත් ඉදිරියට ගියාම, මේ ගැන මගේ අදහස ඔබට දැනුම් දෙන්නම්."

* * *

ඉතින් මැයි මාසයේ එක් දීප්තිමත් සන්ධ්‍යාවක අපි බර්ක්ෂයරය බලා දුම්රියෙන් පිටත්ව ගියෙමු. කුඩා දුම්රියපොළක් වූ ෂොස්කෝම්බ්හි දුම්රිය නැවැත්වූයේ නැගීමට හෝ බැසීමට මගීන් සිටියේ නම් පමණකි. අශ්වකරත්තයක නැගී, දුම්රියපොළේ සිට අපි ග්‍රීන් ඩ්‍රැගන් තානායම බලා පිටත්ව ගියෙමු. බිලී බෑමේදී අවශ්‍ය වන බිලී පිති, තංගුස් රෝල් හා කුඩ කිහිපයක් අපි අශ්ව කරත්තයේ වහලේ පටවා ගත්තෙමු. පැරණි තාලේ තානායමක් වූ ග්‍රීන් ඩ්‍රැගන් හි හිමිකරුවා ජෝසයියා බාන්ස් නම් විය. ප්‍රදේශයේ අවට ජලාශවල මසුන් බෑමේ අපේ සැලැස්මට සහාය දීමට ඔහු සතුටින් එකඟ විය.

"බාන්ස් මහත්මයා, මම අහලා තියනවා, ෂොස්කෝම්බ මන්දිරයට අයත් ජලාශයේ පයික් මත්ස්‍යයින් ඉන්නවා කියල. කොහොමද අපි එතැනින් පටන් ගත්තොත්?" හෝම්ස් ඇසීය.

තානායම්කරුගේ මුහුණ අඳුරු විය.

"ඒ වැඩේ ගැන නම් හිතන්නවත් එපා මහත්මයා. මාළුවෙක් අල්ලගන්න කලින් ඔබව කකුල් දෙකෙන් ඔසවලා ජලාශයට වීසි නොකෙරුවොත් තමයි පුදුමේ."

"මොනවා? ඒ කොහොමද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඇයි මහත්මයා සර් රොබට් නෝබර්ටන් ඉන්නේ ෂොස්කෝම්බ් මන්දිරයේ නෙ. ඔහුගේ ජලාශයේ මත්ස්‍යයින් වෙනත් කෙනෙක් බිලිබා ගන්නවාට ඔහු කොහොමවත් කැමති වෙන්නේ නෑ. කිසිම සැකයක් නෑ ඔහුට ඉරිසියා හිතේවි. මේ පළාතේ කිසි කෙනෙක් නාඳුනන ඔබ දෙදෙනා, ඔහුගේ අශ්වයින් පුහුණු කිරීමේ මධ්‍යස්ථානය අසල ගැවසෙන එකට සර් රොබට් කොහොමවත් කැමති වෙන්නේ නෑ"

"මට අහන්න ලැබුණා මේ සැරේ ඩර්බි මහා තුරග තරගාවලියට ඔහුත් අශ්වයෙක් ඉදිරිපත් කරනවා කියල?"

"ඔව්. බොහොම හොඳ අශ්වයෙක්. මේ පළාතේ හැමෝම ඔට්ටු අල්ලලා තියෙන්නේ සර් රොබට්ගේ අශ්වයා දිනනවා කියලයි. . . . ඒක නෙමෙයි; ඔබ දෙදෙනා අශ්ව රේස් ගැන උනන්දුව දක්වන අයද?"

"කොහොමටවත් නැහැ. අපි ලන්ඩනයේ ගෙවන ජීවිතයෙන් හොඳටම හෙම්බත් වෙලයි ඉන්නේ. බර්ක්ෂයර්හි පිරිසිදු වාතය ටිකක් හුස්ම ගන්න අදහසින් තමයි අපි මේ ආවේ."

"එහෙම නම් ඔබ ඇවිත් තියෙන්නේ නියම තැනටයි මහත්මයා. පිරිසිදු වාතය මේ අවට හැමතැනකම තිබෙනවා. ඒ වුණත් මං සර් රොබට් ගැන කියපු දේවල් හොඳහැටි මතක තියාගන්න. ෂොස්කෝම්බ් වනෝද්‍යානය හතර මායිමට යන්න එපා. ඔහු, මුලින් පහර දීලා පස්සේ ප්‍රශ්න අහන ජාතියේ එක්කෙනෙක්."

"ඒ ගැන නම් බය වෙන්න එපා, බෑන්ස් මහත්මයා. අපි ඔබේ අවවාදය අමතක කරන්නෙ නෑ. ඒක නෙමෙයි, ඔබේ තානායම් ශාලාව අසල මං දැක්ක බලු පැටියා හරිම අලංකාර එකෙක් නේ."

"ඔබේ කතාව ඇත්ත මහත්මයා. ඌ විශේෂ ෂොස්කෝම්බ් පැටිකිරියේ, ස්පැනියෙල් බල්ලෙක්. ඒ තරම් හොඳ බල්ලො වර්ගයක් ඔබට මේ එංගලන්තයේ කොහෙන්වත් හොයාගන්න බෑ."

"මමත් බල්ලන්ට හරිම ආසයි. මං මේක ඇහුවට කමක් නැද්ද මං දන්නෙ නෑ. මේ වගේ අනර්ඝ බල්ලෙක් බොහොම මිළ වෙන්න ඇති?"

"බොහොම මිළයි මහත්මයා. මේ වගේ බල්ලෙක් සල්ලි දීලා ගන්න මට වත්කමක් නෑ. සර් රොබට් තමයි මේ බල්ලාව මට තෑගි

http://sherlockholmesinvestigations.blogspot.com

දුන්නෙ. ඒ නිසා තමයි මං ඌව ඔය දම්වැලකින් බැඳලා දාල තියෙන්නේ. ඕක ලිහුවොතින් වෙඩිල්ලක් වගේ දුවලා ගිහිං නවතින්නේ මොස්කෝම්බ් මන්දිරයේ තමයි"

කතාබහ අවසන් කළ තානායම හිමිකරුවා කිසියම් රාජකාරියක් සඳහා පිටවී ගියේය.

"අපේ අතටත් තුරුම්පු කීපයක් ලැබෙන බවයි පෙනෙන්නෙ වොට්සන්. ඒ වුණත් මේක සෙල්ලම් කරන්න පහසු කාඩ් අතක් නෙමෙයි. කොහොම වුණත් දවසක් දෙකක් ගතවෙද්දි අපට ටිකක් ඉදිරියට යෑමට බැරිවෙන්නෙ නෑ. සර් රොබට් තවමත් ලන්ඩනයේ බව මට අහන්න ලැබුණා. ඒ නිසා ඔහුගේ අභිරහස් රාජධානිය තුළට අපි අද රෑට රිංගලා බලමු. ඔහුගෙන් පහර කෑමේ අවදානමට ලක්වෙන්නෙ නැතුව අපට ඒ පැත්ත පරීක්ෂා කරල බලන්න හැකිවේවි. මට තියෙනවා තැනක් දෙකක් හොඳට සෝදිසි කරලා බලන්න. එවිට මගේ හිතේ ඇතිවී තිබෙන සැකයන් දුරුකරගන්න පිළිවන්."

"ඔබ මොනවා හරි උපකල්පනයක් ගොඩ නැගුවද හෝම්ස්?"

"මෙන්න මෙච්චරයි වොට්සන්. දැනට සතියකට හෝ ඊට ආසන්න කාලයකට පෙර මොස්කෝම්බ් මන්දිරයේ මොනවා හරි බරපතල දෙයක් සිද්ධවුණා. ඒක ඒ ස්ථානයේ නිවැසියන්ට සෑහෙන තරම් බලපෑමක් ඇතිකළ දෙයක්. නමුත් මොකක්ද මේ බරපතල සිද්ධිම? එයින් ලැබී තිබෙන ප්‍රතිඵල වලින් අපට මොනවා හරි අනුමාන කරන්න පුළුවනි. නමුත් අනුමාන කරන ඒවා එකකට එකක් නොගැළපෙන ඒවා වගෙයි පෙනෙන්නෙ. අපට ලැබී තිබෙන දත්ත ගැන තව ටිකක් හිතලා බලමු.

මල්ලි, තමන් ඉතාම ආදරය කරන, ඒ වගේම ආබාධිත තත්ත්වයට පත්වෙලා ඉන්න ඔහුගේ අක්කාව බලන්න යන්නෙ නෑ. ඇගේ සුරතල් බල්ලාව ඔහු වෙනත් කෙනෙකුට දෙනවා. ඇය ආදරයෙන් රැකබලා ගන්නා ඇගේ සුරතල් බල්ලා, වොට්සන්! ඒකෙන් ඔබට මොකුත් හිතාගන්න බැරිද?"

"මොකුත් බෑ, සහෝදරයාගෙ දුෂ්ට චේතනාව ඇරෙන්න."

"ඔව් ඒක එහෙම වෙන්න හැකියි. එහෙමත් නැත්නම් මේකට වෙනත් විකල්ප විසඳුමක් තියෙනවද? අර සණ්ඩුව ඇති වුණු වෙලාවෙ ඉඳල

http://sherlockholmesinvestigations.blogspot.com

වුණු සිදුවීම් ගැන අපි ආයෙත් හිතලා බලමු. එහෙම සණ්ඩුවක් ඇති වුණා නම් ඇයි බියට්‍රිස් ආර්යාව කාමරයටම වෙලා ඉන්නෙ? ඇගේ සිරිත් විරිත් ඔක්කොම වෙනස් කරලා. ඇයව පිට අයට දකින්න ලැබෙන්නේ, ඇගේ සේවිකාව එක්ක අශ්වකරත්තයේ නැගිලා යනකොට පමණයි. ඒ වාගේම ඈ ඉතාම ප්‍රියකරන අශ්වයාට අමතන්න මොහොතක් ඉස්තාලය ළඟ නවත්වන්නේ නෑ. ඒ වගේම මත්පැනට ඇබ්බැහි වෙලා තෝනවත්වාම මත්පැන් බොනවා. එපමණයි නේද?"

"ඇයි එතකොට අර සොහොන් ගැබ ඇතුළේ සිදුවීම?"

"ඒක අපි වෙනම හිතා බැලිය යුතු සම්පූර්ණයෙන්ම වෙනස් සිතුවිලි දාමයක් වෙනවා වොට්සන්. මෙතැන ක්‍රියාවලි දෙකක් තියෙනවා. මං ඔබෙන් ඉල්ලා හිටිනවා ඒ දෙක පටලවා ගන්න එපා කියලා. බියට්‍රිස් ආර්යාව සම්බන්ධ සිදුවීම් සමුදාය අපි හඳුන්වමු අංක 1 කියල. ඒකෙ මොනාවා හරි දුෂ්ට, අපරාධයක ලකුණු යන්තමට පෙනෙනවා. එහෙම නේද වොට්සන්?"

"මට නම් මොකුත්ම පෙනෙන්නේ නෑ."

"දැන් අපි ගමු සර් රොබට් නෝබටන් සම්බන්ධ අංක 2 දරන සිදුවීම් සමුදාය. ඩර්බි තුරඟ තරඟවලින් ඔහු ජයග්‍රහණය කළ යුතුමයි. ඔහු ඉන්නේ ණයකාර යුදෙව්වන්ගේ ග්‍රහණයට හසුවෙලා. ඔහු පරාජය වුණොත්, තමන් සතු අශ්වයින්, ඔවුන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානය හා අනෙක් දේපලත් ඔවුන් අත්පත් කරගෙන වෙන්දේසි කරනවා සිකුරුයි. ඒ නිසා ඔහු මුහුණ දීලා ඉන්නේ බොහොම උග්‍ර ප්‍රශ්නයකට. ඔහුගේ වියදමට මුදල් ලැබෙන්නේ අක්කාගෙන්. ඇගේ සේවිකාව තමා ඔහුගේ මේ හැම කටයුත්තකටම උදව් කරන්නේ. ඇගේ මාර්ගයෙන් තමා ඔහු අක්කාව පාලනය කරන්නේ. අපේ මේ නිගමන සෑහෙන තරම් නිවැරදියි කියල අපට හිතන්න පුළුවන්. එහෙම නේද?"

"නමුත් අර සොහොන් ගැබ?"

"ආ ඔව්. අපි මෙහෙම දෙයක් උපකල්පනය කරමු වොට්සන්. මහා ආන්දෝලනයක්, කලබලයක් ඇති කරන්න පුළුවන් උපකල්පනයක්. අපි මේක ඉදිරිපත් කරන්නේ තර්කානුකූලව කරුණු විග්‍රහ කිරීමේ අරමුණෙන් පමණයි; අපි හිතමු සර් රොබට් ඔහුගේ සොහොයුරිය මරා දමලා කියල!! "

http://sherlockholmesinvestigations.blogspot.com

"හෝම්ස් ඒක නම් කවදාවත්ම වෙන්න බැරි දෙයක්"

"ඔව් වොට්සන්, බොහෝ විට ඔබ නිවැරදි ඇති. සර් රොබට් බොහොම නම්බුකාර වැදගත් පවුලක කෙනෙක්. නමුත් ඔබ දන්නවාද රාජාලියො රංචුවක් අතරෙ සැඟවිලා කලාතුරකින් කළු කපුටෙක් සිටීමට ඉඩ තියෙනවා."

අපේ උපකල්පනය ගැන අපි මෙහෙම තර්ක කරමු. ඔහුට මේ පළාත අත්හැරලා පැනගන්න හැකියාවක් නෑ. ඒ මොකද ඔහුට විශාල ධන සම්භාරයක් උපයා ගැනීමට තිබෙන එකම සහ අවසන් අවස්ථාවට ඔහු මුහුණ දිය යුතුයි. ඒක කරගන්න පුළුවන් 'ෂොස්කෝම්බ් ප්‍රින්ස්' නම් අශ්වයාගේ මාර්ගයෙන් පමණයි. ඒ නිසා ඔහු මේ දැනට සිටින ස්ථාවරත්වයේ සිටිය යුතුයි. එය කිරීමට ඔහු බියට්‍රිස් ආර්යාවගේ මළසිරුර විනාශ කර දැමිය යුතුයි, නැත්නම් සැඟවිය යුතුයි. ඊළඟට ආර්යාව ලෙස පෙනී සිටීමට කෙනෙක් සොයාගත යුතුයි. ඇගේ සේවිකාව ඔහුගේ පැත්තේ නිසා ඒක අමාරු නෑ. ආර්යාවගේ සිරුර රහසේම සොහොන් ගැබට ගෙනිහිං, කොටස් වලට වෙන් කරලා, රාත්‍රී කාලයේ දී අර උදුනේ වරින් වර පුළුස්සා දමනවා වෙන්න පුළුවන්. මොකක්ද වොට්සන් ඒ ගැන ඔබේ අදහස?"

"ඔබ අර මුලින් කරපු බිහිසුණු උපකල්පනය නිවැරදි නම් පසුව කිව් හැම එකක්ම ඇත්ත වෙන්න පුළුවන්."

"වොට්සන් මට හිතෙනවා හෙට පොඩි අත්හදා බැලීමක් කරන්න. ඒකෙන් මේ අභිරහස ගැන කරුණු මොනවා හරි එළියට එන්න බැරි නෑ. ඒ අතරේම, අපි දෙන්නා විනෝදයට බිලීබාන්න මෙහේ ආව ලන්ඩන් නගර වැසියො බව, බ්‍රාන්ස්ට මතක් කර දෙන්න යමක් කළ යුතුයි.

ඉස්සර වෙලාම අපි එයාගෙ වයින් බෝතලයක රස විඳිමු. ඒ ගමන් මේ පැත්තෙ ජලාශවල මාළු ගැන කතාබහක් පටන්ගමු. මිනිහගේ හිත දිනාගන්න තිබෙන එකම ක්‍රමය ඒකයි. කතාව දුරදිග ගෙනිච්චොත් මේ පළාතෙ තියෙන ඕපදූප ටිකක් අපට අහගන්න බැරිවෙන්නෙ නෑ."

පසුදා උදෑසන අප බිලීබෑම සඳහා යාමට නියමිතව තිබිණි. එහෙත් ජැක් මසුන් සඳහා අවශ්‍ය ඇම කිසිවක් ගෙන ඒමට අපට

http://sherlockholmesinvestigations.blogspot.com

අතපසු වී ඇති බැව් හෝම්ස් දුටුවේ එවිටයි. එහෙයින් එදිනට බිලිබෑමේ කටයුතු අත්හැර දැමීමට අපට සිදුවිය.

"දැන් ඉතින් කරන්න දෙයක් නෑ වොට්සන්. අපි මේ පැත්තේ ටිකක් ඇවිදල එන්න යමු. මං හිතන්නේ මේ ගම්බද පළාත්වල බොහොම සිත්ගන්නා සුන්දර දර්ශන බැලීමට අපට හැකිවේවි.

බාන්ස් මහත්මයා, ඔබේ ශම සුරතල් බල්ලා දෙනවද අපට ඇවිදින්න යනකොට අරගෙන යන්න?"

බාන්ස්ගෙන් ඊට අවසර ලැබිණි. අපි-උදේ එකොළහට පමණ පිටත් වී ගියෙමු.

සැතපුම් තුනක පා ගමනකින් පසු, ශොස්කෝම්බ් මන්දිරයට අයත් උද්‍යානයේ දොරටුව යයි සිතිය හැකි ස්ථානයකට අපි පැමිණියෙමු. මිථ්‍යා කථා වල සඳහන් අද්භූත සත්ත්වයෙකුගේ පිළිම දෙකක් යෙදූ උස් කුළුණු දෙකක් සහිත, විශාල ගේට්ටුවක් එහි විය.

"හරි මේක තමයි තැන. මට බාන්ස්ගෙන් දැනගන්න ලැබුණා, හැමදාම මධ්‍යාහ්න වෙලාවට බියට්‍රිස් ආර්යාව මන්දිරයෙන් පිටවෙලා, අශ්වකරත්තයෙන් එනවලු. ගේට්ටුව හරිනි තුරු කරත්තය මඳ වෙලාවකට, මෙතැන නවත්වන්න සිදුවෙනවා. අශ්ව කරත්තය ගේට්ටුවෙන් පිටවෙලා යන්න සූදානම් වෙන කොටම, ඔබ කළ යුතු රාජකාරියක් තිබෙනවා වොට්සන්. කරත්තය වේගය වැඩිකරන්න කලින්, සංඥා කරලා ඔබ එය නවත්වා ගන්න. ඊළඟට රියැදුරා ගෙන් මොනවා හරි ප්‍රශ්නයක් අහන්න. මං ගැන බලන්න එපා. මං අර මල් පඳුරු පිටුපසට වෙලා හැංගිලා ඉන්නම්. මොනවා හරි අමතර දෙයක් නිරීක්ෂණය කරන්න මං උත්සාහයක් දොළා බලන්නම්.

අපට එතරම් වේලාවක් බලා සිටීමට සිදුනොවිය. පැය කාලක් පමණ ගතවෙද්දී, ගස්වලින් සෙවණ වූ මාවත දිගේ අශ්ව කරත්තයක් පැමිණෙන අයුරු අපි දුටුවෙමු. කහ පැහැති, විවෘත, සුඛෝපභෝගී අශ්ව කරත්තයක් වූ එය ඇදගෙන එනු ලැබුවේ, අලංකාර අශ්වයින් දෙදෙනෙකු විසිනි.

හෝම්ස් බල්ලා ද රැගෙන මල් පඳුර පිටුපස සැඟවුණේය. අශ්ව කරත්තය පිළිබඳව සැලකීමක් නොකරන අයුරෙන්, අත තිබූ වේවැල ද සොලවමින් මම මාර්ගයේ රැඳී සිටියෙමි. උද්‍යාන

http://sherlockholmesinvestigations.blogspot.com

සේවකයෙක් වහා දුවැ විත් විශාල ගේට්ටු පියන් දෙක විවෘත කළේය.

රියේ වේගය බොහෝ සෙයින් අඩු වී තිබුණු නිසා, ඒ තුළ ගමන්ගත් අය හොඳින් බලාගැනීමට මට අවස්ථාවක් සැලසිණ. රන්වන් පැහැති කොණ්ඩයක් හා සුමුදු පැහැයට හුරු සමක් තිබූ තරුණ කාන්තාවක් රියේ වම්පස වාඩිවී සිටියාය. ඇගේ දකුණු පසින් වූයේ වයස්ගත කරබාරු කාන්තාවකි. ඇය ආබාධිත හෝ අසනීපයෙන් පසුවූ තැනැත්තියක් ලෙස සිතාගත හැකි වූයේ, ඇගේ උරහිස් හා මුහුණ වටා රඳවා තිබූ කොට්ට හා සළුපිළි නිසායි. අශ්වයින් ප්‍රධාන පාරට පිවිසෙද්දී මම ඉදිරියට ගියෙමි.

කරත්තය නවත්වන ලෙස සංඥා කරමින් මා අත එසවූයේ, කිසියම් රාජකාරියක් සඳහා පැමිණි නිලධරයකු අයුරෙනි. රියැදුරා අශ්ව කරත්තය නැවැත්වූ විට සර් රොබට් ෂොස්කෝම්බ් මන්දිරයේ සිටීදැයි විමසුවෙමි.

පඳුරෙන් එළියට පැමිණි හෝම්ස් ඒ මොහොතේම බල්ලා නම ග්‍රහණයෙන් අත්හැරියේය. ඉමහත් ප්‍රීතියෙන් බුරන්නට පටන්ගත් බල්ලා වේගයෙන් කරත්තය ඉදිරියට දුවගොස් එහි පාපුවරුව මතට පැනගත්තේය. එහෙත් උගේ ප්‍රීතිමත් බිරුම, එක් ක්ෂණයකින් වෙනස් විය, ඊළඟ මොහොතේ ඌ වඩාත් උස් හඬින් බිරීමට පටන් ගත්තේ කෝපයට පත් වූ අයුරිනි.

"අශ්වයන් දක්කාපන් ඉක්මනට! ඉක්මන් කරපන්!"

කිසිවකු යටි උගුරෙන් මෙන් අණකරනු අපට අසන්නට ලැබිණි. රියැදුරා නොනවත්වාම අසුන් මත කස පහර එල්ල කරද්දී, රථය වේගයෙන් ගමන් ගත්තේ අප එහි තනිකර දමමිනි.

"ඔන්න වොට්සන් ප්‍රශ්නය විසඳුණා."

හෝම්ස් පැවසුවේ බල්ලාගේ කරපටිය යළිත් දම්වැලට සවි කරමිනි.

"මූ හිතුවේ ඒ උගෙ ස්වාමිදූව කියලා. නමුත් එතැනට ගියාමයි ඌට තේරුණේ ඒ වෙනු කෙනෙක් බව. බල්ලන්ට වරදින්නෙ නෑ."

"ඒක පිරිමියෙකුගේ කටහඬ වගෙයි මට නම් ඇහුණේ."

http://sherlockholmesinvestigations.blogspot.com





"අශ්වයන් දක්කාපන් ඉක්මනට! ඉක්මන් කරපන්!"

http://sherlockholmesinvestigations.blogspot.com

"හරියට හරි. අපේ අතට තවත් තුරුම්පු කොළයක් ලැබුණා. ඒ වුණත් මේ කාඩ් අත ක්‍රීඩා කරන්න වෙන්නේ බොහොම ප්‍රවේශමෙන්."

එදිනට කළ යුතු තවත් රාජකාරි කිසිවක් හෝම්ස්ට නොමැති විය. එහෙයින් දවසේ ඉතිරි කාලය, අපි මෝල අසලින් ගලා ගිය දොළේ ට්‍රවුට් මසුන් ඇල්ලීම සඳහා ගතකළෙමු. රාත්‍රී ආහාරය සඳහා මත්ස්‍යයින් කිහිපදෙනෙකු පිළිබා ගැනීමට අපට හැකිවිය. හෝම්ස් යළිත් ක්‍රියාශීලී වූයේ එම ආහාරයෙන් පසුවයි.

යළිත් වරක් අපි උදේ වරුවෙ ගමන් ගත් ෂොස්කෝම්බ් උද්‍යානයේ ප්‍රධාන දොරටුව දෙසට ගමන් කළෙමු. ගේට්ටුව අසල රැඳී සිටි උස පුද්ගලයෙකුගේ අඳුරු පැහැති ඡායාවක් අපට දක්නට ලැබිණි. ඒ ලන්ඩනයේදී අප හමුවට ආ අශ්වයින් පුහුණුකරු, ජෝන් මේසන් මහතාය.

"සුභ සන්ධ්‍යාවක් මහත්වරුනි." ඔහු අප ඇමතුවේය.

"හෝම්ස් මහත්මයා. මට ඔබේ ලියුම් කැල්ල ලැබුණා. සර් රොබට් තවමත් ආපහු ඇවිත් නැහැ. ඔහු අද රෑට ආපහු එන බවයි දැනුම්දීල තියෙන්නේ."

"නිවසේ ඉඳල කොච්චරම දුරින්ද අර සොහොන් ගැබ තියෙන්නෙ?" හෝම්ස් ඇසීය.

"හැතැක්ම කාලක් විතර ඇති"

"එහෙනම් අපට ඔහු ගැන අමතක කරන්න පුළුවනි"

"ඒත් මට ඔහුව අමතක කරන්න හැකියාවක් නෑ හෝම්ස් මහත්මයා. ඔහු ආපහු ආව සැණින් මට පණිවුඩයක් එවනවා. ඔහුට උවමනා වේවි 'ෂොස්කෝම්බ් ප්‍රින්ස්' ගේ අලුත්ම තත්ත්වය දැනගන්න"

"ඒකත් එහෙමද? එහෙම වුණොත් මේසන් මහත්මයා අපට මේ කටයුතු වල යෙදීමට සිදුවෙන්නේ ඔබ නොමැතිවයි. සොහොන් ගැබ අපට පෙන්වලා, ඔබට යන්න පුළුවනි."

සඳ පායා නොතිබු බැවින් අවට පැවැතියේ ඝන අඳුරකි. මේසන් මහතා තණබිම හරහා අප කැඳවාගෙන ගියේය. සැතපුම් කාලක ගමනින් පසු අප ඉදිරියේ දක්නට ලැබුණේ, ගරා වැටුණු පෞරාණික දේවස්ථානයකි. නශ්‍යාවශේෂ අතරින්, එහි එක් කෙළවරක, පොළෝ

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව්. මිනිය උඩහට්ටුවේ. හදිසි මරණ පරීක්ෂණය පැවැත් වෙන්නේ හෙට."

"ඔබේ සේවකයෙක් ලෙස ඔහු දැන් සෑහෙන කාලයක සිට කටයුතු කළා නේද කර්නල් රොස්?"

"ඔව්. ඔහු ඉතාම හොඳ සේවකයෙක් බව මට සෑම විටකම පෙනීගියා."

"ඔහුගේ මරණය සිදුවෙන මොලාවේ ස්ට්‍රේකර්ගේ සාක්කුවේ තිබුණු ද්‍රව්‍ය වල නාමලේඛනයක් ඔබ පිළියෙළ කරන්න ඇති ග්‍රෙගරි?"

"එම දේවල් හැම එකක්ම එකතුකරලා විසිත්ත කාමරයේ තැනක මම තැන්පත් කර තැබුවා. ඔබට අවශ්‍ය නම් බලන්න පුළුවනි."

"එය දකින්න ලැබෙනවා නම් මට ලොකු සතුටක්." හෝම්ස් පිළිතුරු දුන්නේය.

අප මේසය වටා වාඩි වී බලාසිටියදී පොලිස් පරීක්ෂක ග්‍රෙගරි, හතරැස් ලෝහ පෙට්ටියක තිබූ දේවල් මේසය මතට හැළුවේය. ගිනිපෙට්ටියක්, අඟල් දෙකක් පමණ දිග ඉටිපන්දම් කැබැල්ලක්, බ්‍රයර් ලීයෙන් තැනූ දුම් පයිප්පයක්, පසුම්බියක ඇසිරූ පයිප්පයට දමන දුම්කොළ අවුන්ස භාගයක්, රන්දම්වැලක් සහිත රිදී ඔරලෝසුවක්, රන්පවුම් කාසි පහක්, ඇලුමිනියම් පැන්සල් පෙට්ටියක්, ලිපි කිහිපයක්, සහ ලන්ඩනයේ වයිස් සමාගමේ තැනූ ඇත්දත් මිටක් සමඟ ඉතා මුවහත්, එහෙත් නොනැමෙන සුලු තලයක් සහිත පිහියක් දක්නට විය.

"මේක හරිම සුවිශේෂී පිහියක්." හෝම්ස් පැවසුවේ එය සියුම් ලෙස පරීක්ෂණයට ලක් කරමිනි.

"මෙහි දක්නට ලැබෙන ලේ පැල්ලම් නිසා මට හිතෙනවා මියගිය තැනැත්තා අතේ තිබූ පිහිය මේක වෙන්න ඇති කියලා. වොට්සන් මේක නම් ඔබේ ක්ෂේත්‍රයේ භාවිත කරන ආයුධයක් බවට සැක නැ?"

"මේකට තමයි අපි කියන්නේ Cataract knife - අක්ෂි සැත්කම් පිහිය කියලා."

"මං දැනගත්තා. බොහොම සියුම් සැත්කම් සඳහා යොදාගන්නා සියුම් තලයක් සහිත පිහියක්. රාත්‍රියේ ගෙදරින් එළියට බැහැලා

http://sherlockholmesinvestigations.blogspot.com

ජෝන් මෙසන් අපෙන් සමුගෙන පිටත්ව ගියේය. හෝම්ස් ක්‍රමානුකූලව සොහොන් ගැබ හා ඒ තුළ තිබූ මිනීපෙට්ටි පරීක්ෂා කිරීමට පටන්ගත්තේ ඉන් පසුවයි.

6 වැනි ශතවර්ෂයේ එංගලන්තය ආක්‍රමණය කළ, ඉතා පැරණි සැක්සන් වරුන්ගේ සොහොනක සිට 11 වැනි සියවසේ නෝමන්, හියුගෝ සහ ඔඩෝ වරුන්ගේ මිනීපෙට්ටි ද හෝම්ස් ගේ අවධානයට ලක් විය. මීළඟට ඔහුගේ පරීක්ෂාවට ලක් වූයේ 18 වැනි සියවසේ වාසය කළ සර් විලියම් ෆෝල්ඩර් හා සර් ඩෙනිස් ෆෝල්ඩර්ගේ මිනීපෙට්ටියි. මෙසේ දිගටම පරීක්ෂා කරගෙන ගිය හෝම්ස්, පැයකට හෝ ඊට වැඩිකාලයකට පසු ඊයම් වලින් තනා තිබූ මිනීපෙට්ටියක් වෙත පැමිණියේය. සොහොන් ගැබට ඇතුළු වෙන දොරටුවට තුදුරින් ම එය කෙළින් අතට හිටවා, ඉහළ කෙළවර බිත්තියට හේත්තු කොට තිබිණි. තමාගේ වැඩකටයුතු සාර්ථක වී, සොයමින් සිටි දෙය හමුවූ බව හැඟෙන හඬක් හෝම්ස් ගේ මුවෙන් නිකුත් විය.

තම උත්තල කාචය අතට ගත් හෝම්ස්, ඉක්මනින් මිනීපෙට්ටියේ පියන පරීක්ෂා කිරීම ඇරඹුවේය. අනතුරුව ඔහු තම සාක්කුවෙන් ඉස්කුරුප්පු නියනක් හා අපෙට්ටි විවෘත කිරීමට යොදා ගන්නා උපකරණයක් ඉවතට ගත්තේය. ඒවා ආධාරයෙන් හෝම්ස් මිනීපෙට්ටියේ පියන විවෘත කිරීමට උත්සාහ දැරීය. පියන, පෙට්ටියට සවිකොට තිබුණේ අගුළු කිහිපයකින් පමණි. පුපුරා යන ශබ්දයක් නගමින් අගුළක් කැඩී ගියේය. තම අත තිබූ නියනෙන් ලීවර කොට පියන ඇරීමට, හෝම්ස් තවදුරටත් උත්සාහ කළේය. මෙවර ඔහුගේ උත්සාහය සාර්ථක වන ලකුණු පෙනිණි. පියන අඩක් විවෘත විය. එහෙත් ඇතුළත තිබූ දෑ දැකගැනීමට ප්‍රථම බලාපොරොත්තු නොවූ බාධාවක් අප වෙත එල්ල විය.

ඒ යමකිසිවකු සොහොන් ගැබට ඉහළින් පිහිටි ගල්පුවරු මත, දේවස්ථාන බිමේ ඇවිදින හඬයි. මෙම ස්ථානයේ පිහිටීම හොඳින් දන්නා කවුරුන් හෝ යමකිසි කටයුත්තක නිරත වීමේ අරමුණෙන් මෙහි පැමිණ ඇති බව අපි වටහා ගත්තෙමු. මුදුනේ විවරය තුළින් තරප්පු පෙළ පහළට දීප්තිමත් ආලෝක ධාරාවක් එල්ල විය. මොහොතකට පසු එය එල්ල කළ පුද්ගලයාගේ ඡායාව, දොරටුව මැදින් දුටුවෙමු. ඔහුගේ පෙනුම කෙනෙකු භීතියට පත් කරවන සුලු විය. ශරීර ප්‍රමාණයෙන් ඉතා විශාල පුද්ගලයෙකු වූ ඔහුගේ, මුහුණේ

http://sherlockholmesinvestigations.blogspot.com

තිබුණේ කෲර, බිහිසුණු පෙනුමකි. අශ්ව ගාල්වල පාවිච්චියට ගන්නා, විශාල ලන්තෑරුමක් ඔහුගේ අතේ තිබිණි. එයින් විහිදුණු දීප්තිමත් ආලෝකයෙන්, ඔහු කෝපයෙන් විරූප වී සිටින හැටි අපි පැහැදිලිව දුටුවෙමු. සොහොන් ගැබේ සෑම අස්සකටම මුල්ලකටම යොමු කළ ඔහුගේ දෙනෙත්, අවසානයේ මා සහ මගේ මිත්‍රයා ළඟ නැවැතිණි. ඔහු මොහොතක් අප දෙස බලාසිටියේ කෝපයෙන් වෙව්ලමිනි.

"කොහේ ඉඳලා ආව යක්ෂයොද තොපි? මට අයිති මේ සොහොන් බිමේ මොනවද තොපි කරන්නේ?" ඔහු ගිගුරුවේය.

හෝම්ස් ඊට පිළිතුරු දීමට උත්සාහ නොකෙළේය. තමාගේ ප්‍රශ්නය ගණන් නොගත් බව දුටු අමුත්තා, කෝපයෙන් දැවෙමින් ඉදිරියට ආවේ අතේ තිබූ බර මුගුරක් ඔසවාගෙනයි.

"තොපිට ඇහුණේද මං අහපු ප්‍රශ්නේ? තොපි කවුද? මොනවාද මෙහේ කරන්නෙ ?"

ඔහු අත තිබූ මුගුර අප දෙදෙනාට එල්ල කළේ කොයි මොහොතේ හෝ එයින් අපට පහර දීමට සූදානම් බව හඟවමිනි.

එහෙත් භයෙන් පසුපසට යනු වෙනුවට ෂර්ලොක් හෝම්ස් ඔහු ඉදිරියට පියවරක් තැබීය.

"මටත් තියෙනවා සර් රොබට් ඔබෙන් අහන්න ප්‍රශ්නයක්. . . . මේ කවුද? මෙයා මොනවද මෙතන කරන්නෙ?" හෝම්ස් ඇසුවේ ඔහු විවෘත කිරීමට තැත්කළ මිනීපෙට්ටිය දෙසට අත දිගු කරමිනි.

ඊළඟට හෝම්ස් මිනීපෙට්ටි පියන සම්පූර්ණයෙන්ම විවෘත කළේය. ලන්තෑරුමේ එළියෙන් එහි ඇතුළත වූ දෙය පැහැදිලිවම දුටුවෙමු. එහි වූයේ බෙල්ලේ සිට දෙපතුල් දක්වාම සුදු රෙද්දකින් වසා තිබූ මෘතශරීරයකි. මන්තරකාරියකගේ වැනි උල් දිගු නාසය හා උල් නිකට ඉහළට මතුවී පෙනිණි. මස් දියවී ගිය දුර්වර්ණ වූ මුහුණේ, මලානික ඇස් විවෘතව තිබූ නිසා, එහි තිබුණේ බියකරු පෙනුමකි.

භීතියෙන් කෑගසමින් පිටුපසට පැන්න සර් රොබට්, ක්ලාන්ත ගතියෙන් මෙන් ගලෙන් නෙළූ මිනීපෙට්ටියකට හේත්තු විය.

"තමුසෙලා කොහොමද මේක දැනගත්තේ?" යයි විමසූ ඔහු, අනතුරුව තම සැරපරුෂ ස්වභාවයෙන් යළිත් වරක් කඩා පැන්නේය.

"මෙවට හොස්ස දාන්න තොපිට ඇති අයිතිය මොකක්ද?"

http://sherlockholmesinvestigations.blogspot.com



34 භීතියෙන් කෑගසමින් පිටුපසට පැන්න සර් රොබට් . . . .

http://sherlockholmesinvestigations.blogspot.com

"මම තමයි ෂර්ලොක් හෝම්ස්. සමහර විට ඔබ මගේ නම අහලත් ඇති. අනෙක් හැම යුක්ති ගරුක පුරවැසියෙකුට වගේම මටත් අයිතියක් තිබෙනවා නීතිගරුක වෙන්න. මං හිතන්නේ ඔබට ඒකට පිළිතුරු දෙන්න වෙයි?"

සර් රොබට්ගේ කෝපය ඉහවහා ගොස්, මුහුණේ යළිත් බිහිසුණු පෙනුමක් මතුවිය. එහෙත් එය පැවැතියේ එක් මොහොතකි. හෝම්ස්ගේ ශාන්තදාන්ත ස්වරය නිසා, සර් රොබට්ගේ කෝපය සංසිඳුණා විය යුතුයි.

"දෙයියෝත් සාක්කි හෝම්ස් මහත්මයා! බැලූ බැල්මට පෙනෙන්නේ මං මහා වැරදි වැඩක් කළා වගේ; ඔගේ වැඩේ නීති විරෝධියි. ඒක මං පිළිගන්නවා. නමුත් මට වෙන කරන්න දෙයක් තිබුණේ නෑ."

"ඒ විදියට හිතන්න මමත් කැමතියි. නමුත් ඔබේ නිදහසට කරුණු ඉදිරිපත් කරන්න වෙන්නේ පොලීසියට."

"හොඳයි. දේවල් සිද්ධවෙන්නේ ඒ පිළිවෙලට නං, වෙන දෙයක් වුණාවෙ. යමු අපේ ගෙදරට; එතකොට ඔබටම තීරණය කරන්න පුළුවනි මං මුහුණ දීල තියෙන්නෙ මොන වගේ තත්ත්වයකටද කියලා."

පැය කාලකට පසු අපි ෂොස්කෝම්බ් මන්දිරයේ ඉදිරි කාමරයක අසුන්ගෙන සිටියෙමු. වීදුරු අල්මාරි තුළ තිබූ තුවක්කු රාශියක ඔප දැමූ ලෝහ බට දුටු මම, මෙය ආයුධ කාමරය බව වටහා ගත්තෙමි.

මොහොතකට අපෙන් සමුගත් සර් රොබට් ආපසු පැමිණියේ තවත් දෙදෙනෙකු සමගයි. එක් අයෙකු එදා අශ්ව කරත්තයේ ගමන් කරනු අප දුටු තරුණ කාන්තාවයි. අනෙක් තැනැත්තා මීයෙකු වැනි, අප්‍රසන්න, තක්කඩි පෙනුමක් තිබූ කුඩා මිනිසෙකි. දෙදෙනාම ඉමහත් විමතියට පත්වී සිටියහ. උද්ගත වී ඇති තත්ත්වය ඔවුනට තේරුම් කර දීමට සර් රොබට්ට අවකාශයක් නොලැබුණු බව ඉන් පැහැදිලි විය.

"මේ ඉන්නේ නෝලට් මහතා සහ මහත්මිය. විවාහයට පෙර ඇගේ නම වූ එවන්ස් යන නමින් අවුරුදු කිහිපයක් තිස්සේ මගේ අක්කාගේ විශ්වාසවන්ත සේවිකාව වුණේ ඇයයි. මං ඔවුන් දෙදෙනා මෙතැනට කැඳවා ගෙන ආවේ එක් විශේෂ කරුණක් නිසා. ඒ

http://sherlockholmesinvestigations.blogspot.com

මොකක්ද කියනවා නම්, මං දැන් ඔබට කියන්න හදන කතාව, සම්පූර්ණ සත්‍යය බව තහවුරු කරන්න පුළුවන් මේ දෙදෙනාට පමණයි."

"මේවා මේ විධියට විස්තර කිරීමට අවශ්‍ය ද සර් රොබට්? ඔබ මේ කරන්න හදන දේ ගැන දුර දිග කල්පනා කරලා බැලුවද?"

කාන්තාව ඔහුට බාධා කළේ අමනාප ස්වරයෙනි.

"ඔන්න මම නම් මේ එකක්ටවත් සම්බන්ධ නෑ. මට මේ කිසි දෙයක වගකීමක් භාරගන්නත් බෑ. මාව නිදහස් කරල ඕන දෙයක් කියන්න." සේවිකාවගේ සැමියා කීය.

සර් රොබට් ඔහු දෙස හෙළුවේ අප්හාසාත්මක බැල්මකි.

"මං භාර ගන්නවා, සම්පූර්ණ වගකීම. මං ඔබට කියන්නම් හෝම්ස් මහත්මයා සම්පූර්ණ කතන්දරය.

මං දන්නවා ඔබ මගේ කටයුතු සම්බන්ධයෙන් බොහොම දුරදිග ගිහින් තියෙනවා. එහෙම නොවුණා නම්, මට අද ඔබ හමුවුණු තැනදී, ඔබව දකින්න ලැබෙන්නේ නැහැ. මං ඩර්බි තුරඟ තරඟවලට අශ්වයෙක් ඉදිරිපත් කරන බව ඔබට අහන්න ලැබෙන්න ඇති. දැන් මගේ ජීවිතයේ හැම දෙයක්ම රඳා පවතින්නේ උගේ ජයග්‍රහණය මතයි. මගේ අශ්වයා දිනුවොත් හැම ප්‍රශ්නයක්ම නිකම්ම විසඳේවි. මගේ අශ්වයා පරාද වුණොත්? දෙවියනේ! මං ඒ ගැන හිතන්නවත් කැමති නෑ!"

"මට තේරෙනවා ඔබ පත්වී ඇති තත්ත්වය" හෝම්ස් කීය.

"හැම දෙයක් සඳහාම මං යැපෙන්නේ මගේ සොහොයුරිය වන බියට්‍රිස් ආර්යාවගෙන්. නමුත් ඇය සතු මේ වතුපිටි හැම එකක් සඳහාම ඇගේ අයිතිවාසිකම, ජීවිත භුක්තිය පමණයි. මගේ තියන වත්කම ගැන කියනව නම් මං ඉන්නේ යුදෙව් ගිනිපොලී කාරයන්ට දත අතේ ණය වෙලා. මගේ සොහොයුරිය මියගියොත් ඒක මගේ අවසානය බව මම හොඳාකාරවම දැනගිටියා. ඒ මොකද එහෙම වුණු වහාම ණයකාරයෝ ඒවි, මාව ඩැහැගන්න, ගිජුලිහිණියො රෑනක් වගේ. ඇවිත් මා සන්තක හැම දෙයක්ම, මගේ අශ්වයින්, උන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානය හැම දෙයක්ම අයිති කරගන්නවා. ඒක මං හොඳින් දැනගිටියා. නමුත් මොනවා කරන්නද හෝම්ස් මහත්මයා; මගේ සොහොයුරිය මීට සතියකට පමණ කලින් මියගියා!! "

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබ ඒ ගැන කාටවත් කිව්වේ නෑ?"

"මං මොනවා කරන්නද? මා ඉදිරියේ තිබුණේ සම්පූර්ණ විනාශය පමණයි. මට මේ මරණය සති තුනකට කල් දාගන්න තිබුණා නම් හැම ප්‍රශ්නයක්ම විසඳෙනවා. අක්කාගෙ සේවිකාවගේ සැමියා මේ මිනිහා නළුවෙක්. මේ ගැටලුව විසඳාගන්න ක්‍රමයක් කල්පනා කරන කොට අපේ මොළයට ආවා - මගේ මොළයට ආවා හොඳ අදහසක්. කෙටි කාලයකට මේ මිනිහට මගේ අක්කා වගේ පෙනී ඉන්න පුළුවන් නම්, ඇය හැටියට පෙනී සිටින්න පුළුවන් නම් ප්‍රශ්නය විසඳෙනවා. ඔහුට තියෙන්නේ ඇය වගේ සැරසිලා, හැමදාම එක් වරක්, අශ්ව කරත්තයෙන් ගිහින් එන්න පමණයි. ඇගේ කාමරයට ඇතුළු වන්නේ සේවිකාව පමණක් නිසා එතැන ප්‍රශ්නයක් පැන නගින්නේ නෑ. ඒ ප්‍රයෝගය සැලසුම් කරලා ක්‍රියාවට නංවන්න ඒ තරම් අපහසු වුණේ නෑ. මගේ සොයුරිය මිය ගියේ කාලයක් තිස්සේ ඇය පීඩා වින්ද හෘදය දුර්වල වීම නිසා ඇතිවුණු, ශරීරය ඉදිමීමෙන්."

"ඒක තීරණය කිරීම අයිති හදිසි මරණ පරීක්ෂකවරයාටයි."

"මාස ගණනක් තිස්සේ ඇය බොහොම අසාධ්‍යව, මරණය පෙනි පෙනී සිටි බව ඇගේ වෛද්‍යවරයා සහතික කරාවි"

"හොඳයි. ඔබ ඊළඟට මොකද කළේ?"

"මළසිරුර මෙහේ තබාගන්න අපට විධියක් නෑ. ඉතින් එදා රෑ නෝලට්ගේ උදව්වෙන් මම මළසිරුර වත්ත පහළට අරගෙන ගියා. උද්‍යානය පහළ බොහෝ කලකට පෙර භාවිච්චි කරලා වහපු ළිඳක් තිබෙනවා. අක්කාගේ සුරතල් බල්ලා නොනවත්වාම උඩුබුරුලමින් අපේ පස්සෙන් ආවා. උගේ අඬෝනාව කොහොමවත් නවත්වන්න බැරුව ගියා. ඉතින් මං තේරුම් ගත්තා ඌ කොහොම හරි මේ ගෙදරින් ඉවත් කළ යුතු බව. මීළඟට අපි මිනිය, පාළු දෙව්මැඳුරේ සොහොන් ගැබට ගෙන ගියා. ඇගේ මෘතශරීරයට මොකුත් අපහාසයක් සිදුවුණේ නෑ හෝම්ස් මහත්මයා; මං හිතන්නේ මගෙන් මළවුන්ට අගෞරවයක් වුණේ නෑ.

"ඒත් ඔබ ගත් ක්‍රියා මාර්ගය වැරැදියි"

ප්‍රභුවරයා හිස දෙඅත්සට හෙලවූයේ තමා ඊට එකඟ නොවන බව හඟවමිනි.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබට ඔය වගේ දේශනා කිරීම පහසුයි. නමුත් මගේ තත්ත්වයේ සිටියා නම්, වටහාගන්න තිබුණා තමන් මුහුණ දෙන්නේ මොන තරම් බැරෑරුම් අර්බුදයකටද කියලා. තමන්ගේ සියලුම බලාපොරොත්තු, සැලසුම් විනාශ වෙන්න ඉඩදීලා, කෙනෙක් කොහොමද ඔහේ නිකම් බලාගෙන ඉන්නෙ? එයින් ගැළැවීමට මොනත් හරි උත්සාහයක් දරන එක තමයි ස්වාභාවය.

ඇගේ ස්වාමි පුරුෂයාගේ මුතුන් මිත්තන් සාමදානයේ සැතපෙන, සොහොන් ගැබේ මිනීපෙට්ටියක, ඇයටත් අවසන් නින්ද නිදාගන්න සලස්වන එක වැරැද්දක් නෙමෙයි කියල මට හිතුණා. ඉතින් එවැනි මිනීපෙට්ටියක් හිස්කරලා අපි ඇයව තැන්පත් කළා. එහි තිබුණු මිනි ඇටකටු එතැන දමන්න විධියක් නෑ. ඒ නිසා අපි ඒවා ආපහු ගෙනැත් ඉන්ලටගේ ආධාරයෙන් ගිනි උදුනෙන් පිළිස්සුවා. මට කියන්න තියෙන්නේ එපමණයි හෝම්ස් මහත්මයා. මේවා ඔක්කොම හෙළිකරන තත්ත්වයට ඔබ මාව පත් කළේ කොහොමද කියලා මට නම් තේරුම් ගන්න බෑ."

හෝම්ස් මඳ වෙලාවක් කල්පනා කළේය.

"සර් රොබට් ඔබේ කතන්දරයේ එක් අඩුපාඩුවක් තියෙනවා. ණයකාරයො ඔබේ දේපොළ අයිති කරගත්තත් තුරඟ තරගය සඳහා ඔබ අල්ලා තිබෙන ඔට්ටු මුදල්, ඒ වගේම අනාගතය ගැන තිබෙන බලාපොරොත්තු කිසිවකට පාඩුවක් වෙන්නෙ නෑ"

"අශ්වයා මගේ දේපොළට අයත් කොටසක්. මගේ රේස් ඔට්ටු ගැන උන් සලකා බලාවි කියල ඔබ හිතනවද? සමහර විට මගේ අශ්වයා මට ආපහු දෙන එකක්ම නෑ. අවාසනාවකට වගේ මගේ ලොකුම ණයකාරයා තමයි මගේ පරම සතුරා සෑම් බ්‍රෑවර්.

මගෙන් කසපහර කාපු ඒ යක්ෂයා මගේ ගැළවුම්කාරයා වේවි කියලා ඔබ හිතනවද?"

"හොඳයි සර් රොබට්" හෝම්ස් නැවතුනේ අසුනෙන් නැගී සිටිමිනි.

"මේ සිද්ධිය මා පොලීසියට වාර්තා කළ යුතුයි. සැඟවුණු කාරණා එළිදක්වීම, මගේ රාජකාරිය. නමුත් එතැනින් එහාට මං මොකුත් කරන්න යන්නේ නෑ. ඔබේ ක්‍රියාමාර්ගයේ සදාචාරාත්මක භාවය ගැන අදහස් පැවසීම මට අයිති කටයුත්තක් නෙමෙයි.

http://sherlockholmesinvestigations.blogspot.com

වොට්සන් මධ්‍යම රාත්‍රියත් පහුවුණා. මං හිතන්නේ අපේ නවාතැනට යන්න වෙලාව හරි"

සර් රොබට් නෝබටන්ගේ ක්‍රියාකලාපය කෙසේ වුවත්, සියල්ල සතුටුදායක අන්දමින් නිමවිය.

ඩර්බි මහා තුරඟා තරඟාවලියෙන් "ෂොස්කෝම්බ ප්‍රින්ස්" අශ්වයා විශිෂ්ට ලෙස ජයග්‍රහණය කළේය. සර් රොබට් දිනාගත් ඔට්ටු මුදල් වල වටිනාකම රන් පවුම් අසූ දහස ඉක්මවා ගියේය. තරඟය නිම වනතුරු ඉවසා සිටීමට ණයකරුවෝ එකඟ වී සිටියහ.

ඔවුන්ගේ ණය සියල්ල ගෙවූ පසුද, සර් රොබට් නෝබටන්ට සාධාරණ දිවිපෙවෙතක් ගෙවීම සඳහා සෑහෙන මුදලක් ඉතිරි විය.

මරණය ගැන දැනුම් දීමට ප්‍රමාද වීම ගැන ලිහිල්ව ක්‍රියාකිරීමට පොලීසිය හා මරණ පරීක්ෂකවරයා එකඟ වූ බැවින් නීතියෙන් හිරිහැරයකට ලක් නොවී බේරීමට සර් රොබට් වාසනාවන්ත විය.

Reading Purpose Only

http://sherlockholmesinvestigations.blogspot.com

# ප්‍රභූ මැඳුරේ මිනීමැරුම

Reading Purpose Only. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# ප්‍රභූ මැඳුරේ මිනීමැරුම

1887 අප්‍රේල් මස 14 වැනි දින මා වෙත ලැබුණු විදුලි පණිවුඩයකි.

*"ෂර්ලොක් හෝම්ස් මහතා බරපතල ලෙස රෝගාතුරව මෙම හෝටලයේ රැඳී සිටියි. ඔහු, දොස්තර වොට්සන්ට හැකි ඉක්මනින් මෙහි පැමිණෙන ලෙස ආයාචනය කරයි.*

*කළමනාකරු, ඩුලොං හෝටලය*
*ලියොන්ස්, ප්‍රංශය."*

මම වහාම ප්‍රංශය බලා පිටත්වීමි. පැය විසිහතරක් ගතවීමට පෙර හෝම්ස් ලැගුම් ගෙන සිටි ඩුලොං හෝටලය වෙත ළඟාවීමට මට හැකි විය. දින කිහිපයකට පෙර ඔහුගේ රෝග තත්ත්වය බරපතලව තිබූ නමුත්, මේ වන විට ඔහු සෑහෙන තරම් සුවය ලබා සිටි බව දැකීම මට සැනසීමට කරුණක් විය.

"ඔබේ මේ අසනීපයට හේතුව විවේකයක් නොගෙන, හරිහැටි කෑමක් බීමක් නොගෙන, දිගින් දිගටම රාජකාරි කිරීම. එහෙම නේද? හෝම්ස්?"

"වොට්සන් ඔබ වෛද්‍ය මතයක් ඉදිරිපත් කළාම, ඒකට එක්වරම එකඟවීම මගේ සාමාන්‍ය සිරිත නෙමෙයි නේද. නමුත් මේ සැරේ නම් මම ඔබේ මතයට හිස නමනවා." හෝම්ස් පැවසුවේ සිනාමුසු මුහුණෙනි.

"මොකක්ද ඇත්තටම වුණේ?"

"මට කිසිම විවේකයක් ගැනීමට ඉඩක් තිබුණෙ නැහැ වොට්සන්. මේ අපරාධකාරයා යුරෝපයේ සිටි නොම්මර එකේ වංචාකාර තක්කඩියා. ඔහු අල්ලා ගැනීමට රටවල් තුනක පොලිසි දැඩි උත්සාහයක යෙදුණා. ඒත් සෑම රටකම පොලිසිවල ඇහැට වැලි ගහලා, තවත්

Only. Not for Print.
http://sherlockholmesinvestigations.blogspot.com

රටකට පැන ගැනීමට ඔහු සමත් වුණා. මාස දෙකක් තිස්සේ නොකඩවා දැඩි උත්සාහයක් දරලා, ඔහු භාරයට ගන්න මට හැකිවුණා."

"ඒ වුණත් ඔබේ සෞඛ්‍ය තත්ත්වය?"

"ප්‍රංශ වෛද්‍යවරුන්ට පින් සිද්ධවෙන්න මට දැන් සෑහෙන්න සනීපයි."

"ඔබ කිසිම විවේකයක් ගත්තෙ නෑ?"

"අවුම ගණනේ දවසකට පැය පහළොවක්වත් මහන්සි වෙන්න සිද්ධවුණා. කිහිප වතාවක්ම නොකඩවා සතියකට දින පහ බැගින් මගේ රාජකාරි කටයුතුවල යෙදුණා."

"එහෙනම් ඔබ අසනීප වුණු එකේ පුදුමයක් නැහැ. දැන් ඔබට අවශ්‍ය හොඳ විවේකයක්. ඒක නෙමෙයි හෝම්ස්. මොනවද අර මේසයක් උඩ ගොඩගහලා තිබෙන ලිපි, විදුලි පණිවුඩ?"

"ඔබම කියවලා බලන්න, මගේ හිතවත් මිත්‍රයා."

"අපරාධකරුවා සාර්ථක ලෙස භාරයට ගැනීම සම්බන්ධයෙන්, ෂර්ලොක් හෝම්ස් ලැබූ ජයග්‍රහණයට, ඔහු වෙත ශුභ පතා එවූ ලිපි හා විදුලි පණිවුඩ සංඛ්‍යාව දැක මම විස්මයට පත්වීමි. යුරෝපය පුරා රටවල් ගණනාවක රාජ්‍ය නායකයන්, ජාත්‍යන්තර සංවිධාන, පොලිසි හා විවිධ තරාතිරම්වල පුද්ගලයන් විසින් එම ලිපි එවා තිබිණ.

දින තුනකට පසු, අපි බේකර් වීථියේ අපේ නිවහන වෙත ළඟාවීමු. සතියක් පමණ ගෙවී ගියේය. එහෙත් හෝම්ස්ගෙන් ආධාර පතා එහි ළඟාවෙන අනුග්‍රාහකයින්ගෙන්, හා ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ ලෙස්ට්‍රේඩ්, ස්ටැන්ලි හොප්කින්ස් හා ටෝබියස් ග්‍රෙග්සන් ආදී පොලිස් නිලධරයන්ගෙන් ගැළවීම පහසු කාරියක් නොවීය. ඒ සඳහා විසඳුම ලන්ඩන් නුවරින් පිටවී යාම බව මට අවබෝධ විය.

"හෝම්ස් ඔබ අහලා තියෙනවද කර්නල් හේටර් ගැන?" මම ඇසීමි.

"මගේ මතකය නිවැරදි නම් ඔහු ඔබේ මිත්‍රයෙක්. ඇයි මොකක්ද ඔහුට ඇතිවෙලා තියෙන ප්‍රශ්නේ?"

http://sherlockholmesinvestigations.blogspot.com

"හේටර්ට කිසිම ප්‍රශ්නයක් ඇතිවෙලා නැහැ. ඔහුගෙන් ආරාධනයක් තියෙනවා ඔබත් එක්ක නිවාඩුවක් ගතකරන්න එහේ එන්න කියලා."

"ඔබ දන්නවනේ වොට්සන් මං එතරම් සමාජශීලී කෙනෙක් නොවන බව? ඔහුගේ පවුලේ කටයුතුවලට බාධාවක් වෙන විදියට නිවසේ ලැගුම් ගැනීම . . . ."

"ඔහුට ඒ කරදර කිසිවක් නෑ. කර්නල් හේටර් අවිවාහකයෙක්. ඔහුගේ නිවස තිබෙන්නේ සරේ ප්‍රාන්තය කෙළවරේ, රයිගේට් නම් ගම්මානයට නුදුරුව. ඔහු සමග නිවාඩුවක් ගත කරන්න එන්න කියලා හේටර් මට ආරාධනා කරනවා දැන් බොහොම කාලයක ඉඳල. මට පමණක් නෙමෙයි ඔබටත් එක්කයි ආරාධනාව. ඔහු ආගන්තුක සත්කාරයේ ලැදි, ලෝකය පුරා සංචාරය කර ඇති, ප්‍රියමනාප කෙනෙක්. මං හිතන්නේ ඔබට හොඳ සුවයක් ලැබෙන තුරු විවේකීව කාලය ගත කරන්න ඒට වඩා හොඳ තැනක් නෑ."

මගේ බලවත් පෙරැත්තය නිසා, මා සමග රයිගේට්හි නිවාඩුවක් ගතකිරීමට යාමට හෝම්ස් එකඟ විය. බ්‍රිතාන්‍ය හමුදා ඇෆ්ගනිස්ථානයේ යුද වැදුණු සමයේ කර්නල් හේටර් හමුදා සේනාංකයක් භාරව සිටියේය. සතුරන් සමග කළ සටනකදී බරපතල තුවාල ලැබූ ඔහු, ශල්‍ය වෛද්‍ය ඒකකයේ ප්‍රතිකාර ලැබුවේ මගේ අධීක්ෂණය යටතේයි. එමගින් අප දෙදෙනා අතර දැඩි මිත්‍රත්වයක් ඇරැඹිණි.

අප රයිගේට් බලා පැමිණි දින රාත්‍රී ආහාරයෙන් පසු, අපි හේටර්ගේ නිවසේ ආයුධ කාමරයේ කාලය ගත කළෙමු. හෝම්ස් සෝපාවේ වැතිර සිටියදී මම හේටර් සමග ඔහුගේ ආයුධ එකතුව පරීක්ෂා කළෙමි. ඇෆ්ගනිස්ථානයේදී හා ඉන්දියාවේදී ඔහු එකතු කරගත් පෙරදිග අවිආයුධ රැසක් එහි තිබිණි.

"ඒක නෙමෙයි වොට්සන්. මං හිතන්නේ මෙයින් පිස්තෝලයක් ගෙනිහිං, මං නිදාගන්න කාමරේ තබාගත්තොත් හොඳයි," හේටර් පැවසීය.

"ඒ මොකද හදිසියේම එහෙම හිතුණේ?" මම ඇසීමි.

"ඒයෙ පෙරේදා ඉඳල මේ පැත්තෙ ගෙවල් බිඳින හොරු වගයක් ගැවසෙන්න පටන් අරගෙන. මේ පැත්තේ බොහොම ධනවත්ම,

http://sherlockholmesinvestigations.blogspot.com

වැදගත් මහත්මයෙක් තමයි වයස්ගත ඇක්ටන්. ගිය සඳුදා හොරු ඇක්ටන්ගෙ ගේ බිඳලා. ලොකු හිරිහැරයක්, පාඩුවක් නම් වෙලා නෑ. නමුත් තවම හොරු අල්ලාගන්න බැරිවුණා."

"ඔවුන් හොරකම කළ තැන තිබී හෝඩුවාවල් මොකුත් හමුවුණේ නැද්ද?" හෝම්ස් ඇසුවේ හිස ඔසවා බලමිනි.

"කිසිම දෙයක් තවමත් දැනගන්න ලැබුණේ නැහැ. දන්නෙ නැද්ද මේ පළාත්බදව සිදුවෙන සුළු හොරමැරකම්. ජාත්‍යන්තර හොරුන් අල්ලන ඔබේ අවධානය යොමු කරන්න තරම්. මේවා වැදගත් ඒවා නෙමෙයි . . . ."

තම දක්ෂකම් අගය කිරීම ගැන සතුටට පත් හෝම්ස්ගේ මුහුණේ සිනාරැල්ලක් මම දුටුවෙමි.

". . . . කොච්චර මහන්සි වුණත් හොරු අරන් ගිහිල්ල තියෙන්නෙ, බොහොම සුළු දේවල් කිහිපයක් පමණයි. ඔවුන් පුස්තකාල කාමරයේ හැම දෙයක්ම ඇදලි බලලා. ලාච්චු, අල්මාරි ඔක්කොම අවුස්සලා, අනික් පැත්ත පෙරළලා. නමුත් හොරු ගෙනිහිං තියෙන්නේ මොනවාද කියල දන්නවද?"

"මොනවාද?"

"පෝප් විසින් රචනා කරපු 'හෝමර්' ග්‍රන්ථයේ පිටපතක්, ඊවයින් නූල් බෝලයක්, කුඩා වායු පීඩන මානයක්, කඩදාසි බරට තබන ඇත්දල තැබැල්ලක් සහ රිදී ආලේප කළ ඉටිපන්දම් රඳවන දෙකක්."

"හරිම පුදුමාකාර විදියේ බඩු මන් හොරා තෝරාගෙන තියෙන්නෙ." මම කීවෙමි.

"මම හිතන්නේ ඒ වෙලාවෙ ඔවුනට අහුවුණේ ඒ බඩු ටික වෙන්න ඇති. පොලීසියට තිබුණෙ මේකෙන් යම්කිසි නිගමනයකට එන්න. පැහැදිලිවම පෙනෙනවා නෙ . . . ."

හෝම්ස් සෝපාවේ හාන්සි වී සිටම අපේ කථාවට හවුල් වීමට සූදානම් විය. මම දකුණතේ දබරැඟිල්ල ඔසවා ඔහුට අනතුරු ඇඟවූයෙමි.

"මගේ හිතවත් මිත්‍රයා. ඔබ මෙහේ ඇවිත් ඉන්නෙ විවේක ගන්නයි. ඒ නිසා අලුතෙන් ගැටලු විසඳීමේ වැඩක් පටන් ගන්න හිතන්නවත් එපා. ඒක ඔබේ ස්නායු වලට කොහොමට වත් ඔරොත්තු දෙන්නෙ නෑ." මම කීවෙමි.

http://sherlockholmesinvestigations.blogspot.com

සිනාමුසු මුහුණින් හෝම්ස් කර්නල් හේටර් වෙත ඉඟි කළේය. ඔහු අභිනයෙන් පෙන්වූයේ මෙම කටයුතුවල යෙදීමට තමාට මගෙන් අවසරයක් නොලැබෙන බවයි. ඉන්පසු කතාබහ වෙනත් මාතෘකා ඔස්සේ ඇදී ගියේය.

මගේ මිතුරා වෙත හොඳ විවේකයක් හා වෛද්‍ය රැකවරණය ලබාදීමට මම අදිටන් කරගෙන සිටියෙමි. එහෙත් එම ප්‍රයත්නය සම්පූර්ණයෙන්ම අසාර්ථක විය. පසුවදා උදයේ සියල්ල අවුල් වී ගියේය. අප උදේ ආහාරය ගනිමින් සිටියදී, හේටර්ගේ ගෘහ පාලකයා අප වෙත දුව ආවේ හතිදමමිනි.

"මහත්මයා! ඔබට ආරංචිද? කනිංහැම් මහත්මයලගෙ ගෙදර ඇතිවූ . . . .!" ඔහු පැවසුවේ දැඩි කැළැඹීමෙනි.

"මොකද හොරු ගේ බිඳලද?"

"මිනීමරලා!"

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ!" හේටර්ගේ මුවෙන් පිටවිය.

"කාවද මරාදාලා තියෙන්නෙ? සාමදාන විනිශ්චයකාරතුමාද? ඔහුගේ පුතාද?"

"ඒ දෙන්නම නෙමෙයි, අශ්ව කරත්ත රියැදුරු විලියම්. වෙඩිපහර වැදිලා තියෙන්නෙ පපුවටමයි. ඔහුට එක වචනයක් වත් කථා කරන්න ලැබිල නෑ."

"කවුද වෙඩි තියල තියෙන්නෙ?"

"වෙන කවුද ගේ බිඳපු හොරා මිසක්? විලියම්ට වෙඩි තියලා ඌ ඉක්මනින් පැන ගිහින්. කෑමකුස කාමරයේ ජනේලය කඩාගෙන, හොරා ගෙට ඇතුළුවෙලා. ශබ්දය ඇහිලා වෙන්න ඇති, විලියම් එතැනට ඇවිත් තියෙනවා. ස්වාමියාගේ දේපළ ආරක්ෂා කරන්න ගිහිං, ඔහුගේ ජීවිතය නැතිවුණා."

"රෑ කීයටද මේක වෙලා තියෙන්නෙ?"

"ඊයෙ රෑ දොළහට විතරලු."

"ආ . . . . හැබෑද? අපි හෙමින් සැරේ කනිංහැම්ලගේ ගෙදර පැත්තෙ ගිහින් බලමු."

හේටර් යළිත් උදේ ආහාරය ගැනීම ඇරඹුවේ වැඩි කැළැඹීමකින් තොරවයි. ගෘහ පාලකයා එතැනින් පිටවී ගිය පසු හේටර් යළිත් කතාබහ පටන් ගත්තේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"මහ දරුණු විධියේ වැඩ තේ දූන් සිද්ධවෙන්නෙ. වයසක කනිංහැම් තමා මේ ගමේ වැඩකටයුතුවල්දී ප්‍රධාන තැනක් අරගන්න මනුස්සයා. හරි විනීත පුද්ගලයෙක්. ඔහු හරිම කලකිරීමට පත්වෙවි. මේ විලියම් බොහොම හොඳ සේවකයෙක්. දූන් සෑහෙන කාලෙක ඉඳලයි කනිංහැම්ල ළඟ වැඩ කරන්නෙ. කිසිම සැකයක් නෑ; ඇක්ටන්ලගෙ ගේ බිඳපු හොරාම තමා මේක කරන්න ඇත්තෙ."

"අර බඩු වගයක් සුවිශේෂ ආකාරයට තෝරාගෙන, අරං ගිය හොරාද?"

"අන්න හරි."

"හ්ම්. කාට හරි එහෙම කියන්න පුළුවන් බව ඇත්තයි. නමුත් බැලූ බැල්මට ඒක හරිම පුදුමයි කර්නල්.

මෙහෙම හිතමු. ගෙවල් බිඳින හොර කණ්ඩායමක් ක්‍රියාත්මක වෙනවා. එක ගෙයක් බිඳලා, ඒළඟට ඔවුන් තරමක් ඈත තැනක ක්‍රියාත්මක වෙන්නෙ නෑ. දින කිහිපයක් ඇතුළත කලින් තැනට ඉතාම නුදුරින් ගෙයක් බිඳිනවා. අපි ටිකක් ප්‍රවේශම් වෙන්න ඕනෙ කියලා ඔබ ඊයෙ රෑ කිව්වා නේද? නමුත් ඒ වෙලාවෙ මට හිතුණෙ වෙනත් දෙයක්. හොරු එංගලන්තෙ කොහේ ගෙවල් බින්දත් මේ පළාතෙ ගෙවල් බිඳින්න අද හෙට ඒවි කියල හිතන්නත් අමාරුයි යන්න. ඒකෙන් තේරෙන්නෙ මටත් තව ඉගෙන ගන්න හුඟාක් දේවල් තියෙන බව." හෝම්ස් කිය.

"මට හිතෙනවා ඕක මේ පැත්තෙම තක්කඩියෙකුගේ වැඩක් වෙන්න ඇති. ඒ මොකද මේ පළාතේ ලොකුම ඉඩම් හිමි දෙගොල්ල තමයි ඇක්ටන්ලයි කනිංහැම්ලයි."

"ඒ වගේම ලොකු සල්ලිකාරයොත්?"

"ඔව්, එහෙම විය යුතුයි. ඒ වුණත් දූන් අවුරුදු ගණනාවක් තිස්සේ මේ දෙපක්ෂය අතරේ ඉඩම් නඩුවක් තියෙනවා. ඒකට වියදම් කරලා දෙපැත්තම සෑහෙන්න බංකොලොත් වෙලයි ඉන්නේ. කනිංහැම් භුක්ති විඳින වතුයායෙන් භාගයකටම ඇක්ටන්ට අයිතිවාසිකම් තියෙනවලු. දන්නෙ නැද්ද ඉතින් නීතිඥයො ඉඩම් නඩු බදාගත්තම?"

"අපරාධකාරයා ගමේ මිනිහෙක් නම්, ඔහුව අල්ලාගන්න එක ඒ හැටි අමාරු වෙන එකක් නැහැ. හොඳයි හොඳයි වොට්සන් ඔන්න

http://sherlockholmesinvestigations.blogspot.com

එහෙනම් මං මේ වැඩේට අතගහන්න යන්නෙ නෑ." හෝම්ස් පැවසුවේ ඇනුමක් හරිමිනි.

හේටර්ගේ ගෘහ පාලකයා එක්වරම දොර විවෘත කරගෙන යළිත් අප කතාබහ කරමින් සිටි තැනට පැමිණියේය. ඔහු පිටුපසින් පැමිණියේ පොලිස් නිලධරයෙකි.

"පොලිස් පරීක්ෂක ෆොරස්ටර් මහත්මයා."

කඩවසම් පෙනුමක් තිබූ තරුණ පොලිස් නිලධරයා කෑම කාමරය තුළට පැමිණියේ හිස නමා ආචාර කරමිනි.

"සුභ උදෑසනක් කර්නල්. මට සමාවෙන්න මං මේ විධියට ඔබට බාධා කරනවට. අපට අහන්න ලැබුණා, බේකර් වීථියේ සුප්‍රසිද්ධ ෂර්ලොක් හෝම්ස් මහත්මයා මෙහේ ඇවිත් ඉන්න බව."

කිසිවක් නොකී හේටර් තම අත හෝම්ස් දෙසට දිගු කළේය. පොලිස් පරීක්ෂකවරයා සතුටු මුහුණින් කතාබහ ආරම්භ කළේ යළිත් ආචාර කරමිනි.

"හෝම්ස් මහත්මයා, ඔබට ටිකක් ඇවිත් බලන්න පුළුවන් නම් අපට ලොකු උදව්වක්."

"මං මොනවා කරන්නද වොට්සන්? ඔබ එතායිතරම් අනමැති වුණත් මගේ අවසන් ඉරණම මේකයි." හෝම්ස් පැවසුවේ සිනහ මුහුණෙනි.

"අපි ඔය ගැන කථා කර කරයි හිටියේ මහත්මයා. මේ සිද්ධිය සම්බන්ධව සම්පූර්ණ විස්තරයක් ඔබට කියන්න පුළුවන් නම් බොහොම ප්‍රයෝජනවත් වේවි."

පැවසූ හෝම්ස්, සුවපහසු පුටුවක හිඳ ගත්තේය. මගේ විරුද්ධත්වයෙන් තවදුරටත් පලක් නොවන බව මම වටහා ගතිමි.

"ඇක්ටන් මහත්මයාගේ ගේ බිඳීමේ සිද්ධියෙදි, පරීක්ෂණය ඉදිරියට ගෙනියන්න අපට කිසිම හේතුවාවක් තිබුණෙ නැහැ. නමුත් මේ සැරේ නම් අපට තොරතුරු හුඟක් තියෙනවා. කිසිම සැකයක් නෑ ඔවුන්ම තමා මේකත් කරල තියෙන්නේ. අපරාධකාරයාව දකින්න ලැබිල තියෙනවා."

"හැබෑද?"

"ඔව් මහත්මයා. නමුත් අහිංසක විලියම් කර්වන්ට වෙඩි තබපු හැටියෙම අපරාධකරුවා විදුලි වේගයෙන් පැන ගිහින්. ඔහු පැනයන

http://sherlockholmesinvestigations.blogspot.com

හැටි, කනිංහැම් මහත්මයා නිදන කාමරයේ ජනේලයෙන් දැකලා තියෙනවා. ඒ මහත්මයාගෙ පුතා - ඇලෙක් කනිංහැම්, ගේ පිටුපස බරාඳයේ සිට අපරාධකාරයාව දැකල තියෙනවා. වෙඩි ශබ්දය ඇහිල තියෙන්නෙ රෑ දොළහට කාලක් තියෙද්දි. කනිංහැම් මහත්මයා නිදාගන්න ගියා විතරයි. ඇලෙක් මහත්මයා නින්දට යාමට ඇඳුම් මාරු නොකොට, පයිප්පයක් බිබී ඉඳල තියෙන්නේ. වියැදුරු විලියම් උදව් ඉල්ලා කෑගැසූ හඬ දෙදෙන්නාටම ඇහිල තියෙනවා. ඇලෙක් මහත්මයා උඩ තට්ටුවේ ඉඳල එවේලේම පහළට දුව ආවලු. ගෙයි පිටුපසට යන දොර ඇරදමා තිබුණු බව ඔහු දුටුවා. තරප්පු පෙළ පාමුළ දී ඔහු දුටුවා ගෙයින් පිටත දෙදෙනෙක් පොර බදන බව. එක්කෙනෙක් වෙඩිතැබූ අතර අනෙකා බිම ඇද වැටුණු බව ඇලෙක් මහත්මයා දුටුවා.

අපරාධකාරයා ගෙවත්ත හරහා දුව ගිහින්, මල්වැට උඩින් පැන ගිහින් තිබෙනවා. වයසක කනිංහැම් මහත්මයා උඩ තට්ටුවේ නිදන කාමරයේ ජනේලයෙන් දැක තිබෙනවා, මල්වැටෙන් පැනගනිපු අපරාධකරු පාරදිගේ දුවන හැටි. ඒත් ඔහු ඉක්මනින්ම නොපෙනී ගියාලු. ඇලෙක් මහත්මයා විලියම්ගේ පිහිටට ගියා. ඒ අතරෙයි මිනීමරුවා පැනගිහින් තියෙන්නෙ. ඔහු දුඹුරු පැහැති ඇඳුම් වලින් සැරසුණු මධ්‍යම ප්‍රමාණයේ මිනිහෙක් කියනවා ඇරෙන්න වෙනත් තොරතුරු මොකුත් නෑ. ඒ වුණත් අපි පරීක්ෂණය දිගටම ඉදිරියට ගෙනයනවා. ඔහු මේ පැත්තට අමුත්තෙක් නම් අපට ඉක්මනටම හොයාගන්න බැරිවෙන්නෙ නෑ."

"ඔය වෙලාවෙ විලියම් මොනවද ඔතන කරල තියෙන්නෙ? ඔහු මියයන්න කලින් යමක් කිව්වද?"

"විලියම්ට එක වචනයක්වත් කථා කරන්න ලැබිල නෑ. ඔහු ජීවත් වුණේ මේ වත්තේම පහළ තිබෙන කුඩා නිවසක. ඔහුට සිටින එකම ඥාතියා වයස්ගත මව විතරයි. විලියම් බොහොම විශ්වාසවන්ත සේවකයෙක්. මං හිතන්නේ කනිංහැම් නිවසේ පරෙස්සම ගැන හිතලා, ඒ ගැන හොයා බලන්න ඔහු ආවා වෙන්න පුළුවනි. ඇක්ටන් නිවසේ සිද්ධියෙන් පස්සේ, මේ පළාතේ කවුරුත් තම තමන්ගේ ආරක්ෂාව ගැන සැලකිලිමත් වුණාලු. හොරා, දොර අගුළ කඩාගෙන ගෙට ඇතුළු වෙන්න ඇති; අගුළ කඩා දමා ඇති බව මට දකින්න ලැබුණා. විලියම් ඒ වෙලාවෙම ඔහුව අල්ලා ගන්න ඇති."


http://sherlockholmesinvestigations.blogspot.com

"මේ වෙලාවෙ ගෙදරින් පිටවෙලා එද්දි, විලියම් ඔහුගේ මවට මොකුත් කියල තිබුණද?"

"ඇය බොහොම වයස්ගතයි. කන්දෙකම ඇහෙන්නෙ නෑ. ඇගෙන් කිසිම තොරතුරක් ලබාගන්න බැහැ. මේ මරණය නිසා ඇතිවුණු කම්පනයෙන් දැන් ඇගේ සිහිය පවා බාගෙට විකල්වෙලා වගෙයි. නමුත් ඉතාමත් වැදගත් වෙනත් දෙයක් අපට ලැබුණා. මේ බලන්න."

සටහන් පොතකින් ඉරාගත් කුඩා කඩදාසි කැබැල්ලක් පොලිස් නිලධරයා අපට පෙන්වීය.

"මෙය හමුවුණේ මියගිය විලියම්ගේ අතේ දබරැඟිල්ල හා මහපටැඟිල්ල අතර රැඳී තිබිලා. මේක ලොකු කඩදාසියකින් ඉරී ගිය කැබැල්ලක් බවයි පෙනෙන්නේ. ඔබට පෙනෙනවා ඇති ඔහු මරණයට පත්වුණේ මෙහි සඳහන් වෙලාවටමයි කියලා. ඔහුගේ අතේ තිබුණු කඩදාසිය මිනීමරුවා උදුරාගෙන යන්න ඇති. එහෙමත් නැත්නම්, මිනීමරුවා අතේ තිබුණු කඩදාසිය උදුරන්න ගිහින් විලියම් අතට ලැබුණේ මේ කැබැල්ල පමණක් වෙන්නත් පුළුවන්.




කොහොම වුණත් මෙම වෙලාවට හමුවීමට, කලින් යොදාගෙන තිබූ සූදානමක් බව තමයි කියන්න පුළුවන්."

හෝම්ස් එම කඩදාසි කැබැල්ල අතට ගෙන පරීක්ෂා කර බැලුවේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"හොඳයි මෙය කලින් යොදාගත් හමුවීමක් කියමු." පොලිස් පරීක්ෂකවරයා කථාව යළි ඇරඹීය.

"එහෙම නම් මෙහෙම දෙයක් අපට උපකල්පනය කරන්න පුළුවන්. විලියම් කර්වන් අවංක ගුණයහපත් මිනිහෙක් හැටියට ප්‍රසිද්ධ වෙලා තිබුණත්, ඔහු හොරා සමඟ හවුලේ ක්‍රියාත්මක වූ බවට සාක්ෂියක් තියෙන බව. ඔහු හොරාව එතැනදී හමුවෙන්න ඇති. සමහරවිට දොර අගුළු කඩාගෙන ඇතුළු වෙන්න, විලියම් හොරාට උදව් වෙන්නත් ඇති. ඊළඟට මොනවා හරි හේතුවක් උඩ, දෙදෙනා අතර ආරවුලක් ඇතිවූ බවයි පෙනෙන්නෙ."

"මේකෙ ලියවිලා තිබෙන දේ, හරිම අසාමාන්‍ය බවක් පෙන්වනවා." හෝම්ස් පෑඩුසුවේ දැඩි අවධානයකින් ලියුම් කැබැල්ල පරීක්ෂා කිරීමෙන් අනතුරුවයි.

"මේක මා හිතුවාට වඩා බොහොම සංකීර්ණ ගැටලුවක්." පැවසූ හෝම්ස් යළිත් වරක් එම ලියුම් කැබැල්ල පරීක්ෂා කිරීම ඇරඹුවේය.

ලන්ඩනයෙන් පැමිණි විශේෂඥ රහස් පරීක්ෂකවරයා ද, ලිපියෙන් විමතියට පත්වූ හැටි දුටු පොලිස් නිලධරයාගේ මුහුණේ සිනාවක් මතුවිය.

"ෆොරෙස්ටර් මහත්මයා. ඔබ අන්තිමට කිව්ව කරුණ, ඒ කියන්නේ හොරා සහ සේවකයා අතර සම්බන්ධයක් තිබූ බවත්, මේක කලින් සූදානම් කරගත් හමුවීමක් යන්නත් ඉතාම දක්ෂ උපකල්පනයන්. එහෙම දෙයක් නොවෙන්න බැරි කමකුත් නෑ. නමුත් මේ ලියමනෙන් තමා බිඳී යන්නේ . . . ."

වාක්‍යය සම්පූර්ණ නොකළ හෝම්ස් යළිත් ගැඹුරු කල්පනාවකට වැටුණේය.

ඔහු පියවි ලොවට පිවිසුණේ මිනිත්තු කිහිපයකට පසුයි. එවිට ඔහුගේ මුහුණ සතුටෙන් රත් පැහැවූ ආකාරයත්, බැබලෙන දෑසත් මම දුටුවෙමි. හෝම්ස් එක්වරම පුටුවෙන් නැගී සිටියේ, නැතිවී තිබූ ශක්තිය යළි ලැබූ අයෙකු මෙනි.

"මං කියන්නද? මේ සිද්ධියට අදාළ දේවල් ගැන ටිකක් කල්පනා කරල බලන්න මං කැමතියි. මේකෙ තියෙනවා මගේ හිත පුදුම විධියට ඇදගන්නා මොනවා හරි සැඟවුණු ලක්ෂණයක්. කර්නල් ඔබගෙන් අවසර ලැබෙනවා නම්, මං කැමතියි වොට්සන් හා ඔබ

http://sherlockholmesinvestigations.blogspot.com

මෙහි සිටියදී, පොලිස් පරීක්ෂකවරයා එක්ක ඒ ගැන ටිකක් බලා එන්න. මට ඕනෙ කරන්නෙ, මගේ හිතේ ඇතිවුණු යම් යම් දේවල් මේ සිද්ධියට ගැළපෙනවද බලන්න. මං පැය භාගෙන් ආපසු එන්නම්."

හෝම්ස් පිටත් වී ගියේය.

සෑහෙන වේලාවක් අපට බලා සිටීමට සිදුවිය. පැය එකහමාරක් ගතවූ පසු පොලිස් පරීක්ෂකවරයා පමණක් අප හමුවට පැමිණියේය.

"හෝම්ස් මහත්මයා, එළියේ වත්තේ ඉහළ පහළ ඇවිදිනවා. ඔහු කියනවා අපි හතර දෙනාම කාමරය වෙනුවෙන් නිවසට යමු කියලා."

"ඒ මොකටද?"

"මං දන්නෙ නෑ මහත්මයා. මං හිතුවේ ෂර්ලොක් හෝම්ස් මහත්මයාට තිබුණ කිවි අසනීපෙන් හරිහැටි සුවයක් ලැබිලා නැතුවා වගෙයි. ඔහු හැසිරෙන්නේ හරිම පුදුමාකාර විධියට."

"ඒ ගැන කලබල වෙන්න දෙයක් නැහැ මහත්මයා. ඔහුගේ හැසිරීමේ ඔය විකාර ගතිය මං බොහෝ විට දකින දෙයක්." මම කීවෙමි.

අප එළියට යද්දී හිස පහතට නමාගෙන, කල්පනා කරමින්, හෝම්ස් වත්තේ ඉහළ පහළ ඇවිදිමින් සිටියේය.

"සිද්ධිය බොහෝම සිත් ඇදගන්නා සුලු බවයි පෙනෙන්නෙ වොට්සන්. ඔබ සූදානම් කළ චාරිකාව නම් ඉතාම සාර්ථකයි. අද උදේ වරුවෙ ඉඳන් මගේ ඇඟට හොඳ සනීප ගතියක් දැනෙනවා."

"ඔබ අපරාධය සිදුවූ තැනට ගිහින් වගෙයි?" කර්නල් හේටර් ඇසීය.

"ඔව්. පොලිස් පරීක්ෂක මහත්මයත් එක්ක මං අපරාධය සිදුවූ අඩවිය හියුණු පරීක්ෂණයකට ලක් කළා."

"ප්‍රතිඵල සතුටුදායකද?"

"ඔව්. පුදුමාකාර කරුණු කිහිපයක් අපට සොයාගැනීමට හැකිවුණා. දැන් අපි යමු. යන අතරේ ඒ ගැන කථා කරමු.

අප මුලින්ම දුටුවේ අර අවාසනාවන්ත මනුස්සයාගෙ මළසිරුර. ඔහුගේ මරණයට හේතුව, කලින් කිව්ව වගේ රිවෝල්වරයකින් එල්ල වූ වෙඩි පහරක්."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඇයි ඔබට ඒ ගැන සැකයක් තිබුණද?"

"කොයි දේ වුණත් හොඳින් පරීක්ෂා කරල, විශ්වාසයට ගැනීම වඩාත් හොඳයි. අපේ පරීක්ෂාව අපතෙ ගියේ නෑ. ඊට පස්සෙ අපට අවස්ථාවක් ලැබුණා, කනිංහැම් මහත්මයා සහ ඔහුගේ පුතා සමග කතාබහ කරන්න. ඒ දෙන්නා අපට පෙන්වා දුන්නා, හොරා, වත්තෙ මල්වැට කඩාගෙන පැන දුවපු තැන. එතැන පරීක්ෂා කරල බැලීම හරිම සිත්ඇදගන්නා එකක් වුණා!"

"හැබෑට?"

"ඊට පස්සෙ අපි ගියා විලියම්ගේ අම්ට හමුවෙන්න. ඇය හරිම වයස්ගතයි, දුර්වලයි. ඒ නිසා අපට ඇගෙන් මොකක්වත් දැනගන්න ලැබුණෙ නෑ."

"ඔබේ පරීක්ෂාවෙන් ලැබුණු ප්‍රතිඵලය මොකක්ද?"

"මෙක මහ භුදුමාකාර මිනීමැරුමක්, අන්න ඒ නිගමනයටයි අපට එන්න පුළුවන් වුණේ. දැන් අප එහේ ගියාම එහි අවුල් සහගත ගතිය ටිකක් අඩුකරගන්න පුළුවන් වෙයි. මියගිය තැනැත්තා අතේ තිබුණු, වෙලාව සඳහන් ඒ ලියුම් කෑබැල්ල, මෙතැනදී ඉතාම වැදගත් හෝඩුවාවක් වෙනවා. ඒ කාරණාව ගැන පොලිස් නිලධාරී මහත්මයත් මමත් දෙදෙනාම එකඟයි."

"ඔව්. නිසැකවම ඒකෙන් ඔබට මොනවා හරි හොයාගන්න බැරිවෙන්නෙ නෑ හෝම්ස් මහත්මයා." හේටර් කීවේය.

"ඔව්. ඒක ලියූ පුද්ගලයා තමයි මධ්‍යම රාත්‍රියේ විලියම් කර්වන්ව එතැනට ගෙන්වා ගත්තේ. ඒ වුණත් කෝ ලියුමේ අනිත් කෑබැල්ල?"

"මං ඒ අවට හැමතැනක්ම පරීක්ෂා කරල බැලුවා. ඒත් ලියුමේ ඉතිරි කෑබැල්ල නම් හමුවුණේ නැහැ." පොලිස් නිලධරයා කීය.

"ඒක ලියූ තැනැත්තා ඒක උදුරා ගත්තේ මියගිය විලියම්ගේ අතෙන්. මොකටද එය ආපහු ලබාගන්න කවුරුහරි ඒ තරම් උත්සාහයක් දරන්නේ? ඒ මොකද ලියුම පොලීසියට අහුවුණොත් අපරාධය කළ තැනැත්තා හඳුනාගන්න පුළුවන් නිසා. එහෙම දෙයක් උදුරාගත්ත ගමන් ඔහු මොකක්ද කරන්නෙ. එය තමන්ගේ සාක්කුවේ ඔබාගන්නවා. එහෙම කරද්දි සමහරවිට තමන් දන්නෙ නෑ, අර ලියුමෙන් කුඩා කෑබැල්ලක් ඉරීලා, මළසිරුරේ රැඳී තිබෙනවා කියල. ලියුමේ ඉතිරි

http://sherlockholmesinvestigations.blogspot.com

කොටස හොයාගත්තොත් මේ අභිරහස බොහොම දුරට විසඳලා ඉවරයි."

"ඒක හැබෑව. නමුත් අපි අපරාධකාරයාගෙ සාක්කු පරීක්ෂා කරන්නෙ කොහොමද හෝම්ස් මහත්මයා, අපරාධකාරයා අල්ලා ගන්නෙ නැතුව?"

"හරි හරි. අපි ඒ ගැන තව ටිකක් කල්පනා කරල බලමු. ඊළඟට මේ ගැන තවත් කාරණයක් තියෙනවා. මේ ලියුම කවුරු හරි විලියම් අතට ලැබෙන්න සැලැස්සුවා. ලියුම ලියූ තැනැත්තාට ඒක ගෙනිහිං දෙන්න හෝ පණිවුඩය කටින් කියන්න හැකියාවක් තිබුණෙ නෑ. නැත්නම් පණිවුඩය කටින් කියන්න තිබුණ නෙ. එහෙනම් ලියුම් කැබැල්ල අරගෙන ආවේ කවුද? එහෙමත් නැත්නම් ඔහුට එය ලැබුණේ තැපෑලෙන්ද?"

"මං ඒ ගැන හොයා බැලුවා මහත්මයා. ඊයේ හවස තැපෑලෙන් විලියම්ට ලියුමක් ලැබිලා තියෙනවා. ඔහු ඒකෙ කවරය විනාශකර දම්මාලු."

"විශිෂ්ටයි!" හෝම්ස් පැවසුවේ පොලිස් පරීක්ෂක ෆොරස්ටර්ගේ පිටට තට්ටු කරමිනි.

"ඔබ ලියුම් බෙදන්නා පවා හමුවුණා මේ ගැන හොයන්න? ඔබ සමග පරීක්ෂණයකට සහභාගිවීමට ලැබීමත් සතුටක්. ඔන්න අපි කනිංහැම් මන්දිරය ළඟටම ආවා. මේ පැත්තෙන් එනවා නම් අපට පෙන්වන්න පුළුවනි අපරාධය සිදුවූ තැන."

මියගිය විලියම් ජීවත් වූ කුඩා නිවස අසුකොට, අපි ඕක් ගස්වලින් සෙවණ වූ මාවතකට ඇතුළුවුණෙමු. එය කෙලවර වූයේ ඉතා අලංකාර, එමෙන්ම පුරාණ මන්දිරයකි. හෝම්ස් අප කැඳවාගෙන ගියේ එහි නැගෙනහිර පැත්තටයි. එතැනින් නිවසට ඇතුළුවීමට කුඩා දොරටුවකි. වත්තේ මායිම ලෙස තිබූ මල්වැට හා දොරටුව අතර කුඩා මල් උයනකි.

කුස්සියේ දොර අසල පොලිස් භටයෙක් මුරට සිටියේය.

"කරුණාකරල මේ දොර හොඳට විවෘත කරන්න." හෝම්ස් පොලිස් භටයාගෙන් ඉල්ලා සිටියේය.

"දැන් මෙතැනට ඇවිත් බලන්න කර්නල් හේටර්; මිනිසුන් දෙදෙනා මෙතැන පොරබඳන වෙලාවෙ, ඇලෙක් මහත්මයා

http://sherlockholmesinvestigations.blogspot.com

නැගිටල බලාගෙන ඉඳල තියෙන්නේ. අන්න අර තරප්පු පෙළ පාමුල ඉඳලයි.

වයසක කනිංහැම් මහත්මයා අන්න අර ජනේලයෙන් - අර වම්පැත්තේ ඉඳල දෙවැනි එකෙන් තමයි බලාගෙන හිටියෙ. ඔහු දක්කා අපරාධකාරයා අර මල් පඳුරට බම් පැත්තෙන් පැනල දුවනවා. ඒක ඔහුගේ පුතත් දක්කා. මල්පඳුරේ මොන පැත්තෙන්ද පැන දිව්වේ කියන එක ගැන දෙන්නාටම හොඳටම විශ්වාසයි.

ඊට පස්සේ ඇලෙක් මහත්මයා දුව ඇවිත් තුවාලකාරයා ළඟ දණගසා ගත්තා. පොළොව හොඳටම වියළියි. කිසිම පා සටහනක් වදින්නෙ නැහැ."

හෝම්ස් එසේ කියද්දී කනිංහැම් පිය පුතු දෙදෙනා, උයන මැදින් වැටී තිබුණු මංවත දිගේ අප සිටි දෙසට පැමිණියහ. වයස්ගත කනිංහැම් මහතාගේ මුහුණ බොහෝ දුරට රැළිවැටී තිබුණු අතර, දෙනෙත් පුවළ ඉදිරියට නෙරා විහිදා තිබිණි. අනෙකා උද්‍යෝගිමත් තරුණයෙකි. ඔහු අලංකාර ඇඳුමක් හැඳ, දීප්තිමත් සිනහවකින් මුව සරසාගෙන සිටියේය.

"ඕක තවමත් විසඳලා ඉවර නැද්ද?" තරුණයා පැවසුවේ හෝම්ස්ටයි.

"මම නම් හිතුවේ ලන්ඩන්වල රහස් පරීක්ෂකයන්ට කොහොමට වත් වරදින්නෙ නෑ කියලයි. මට නං පෙනෙන්නේ ඔබේ වැඩ බොහොම හෙමින් වගෙයි."

"ඒක හැබෑව. අපට තව ටිකක් වෙලා දෙන්නකො මහත්මයා." හෝම්ස් පිළිතුරු දුන්නේ සිනාමුසු මුහුණෙනි.

"ඔව්. ඔව්. වෙලාව නම් ඇත්තෙන්ම උවමනා වේවි. ඒ මොකද මට නම් පෙනෙන්නෙ නෑ මිනීමරුවා ගැන කිසිම හෝඩුවාවක් ඉතුරු වෙලා තිබෙන බවක්." තරුණ ඇලෙක් කනිංහැම් පැවසීය.

"ඇයි නැත්තේ? එකම හෝඩුවාවක් තියෙනවා." පොලිස් පරීක්ෂකවරයා කථාව ඇරඹුවේය.

"අපි හිතන්නේ, අපට හොයාගන්න පුළුවන් නම් . . . . දෙයියෝ සාක්කි!! හෝම්ස් මහත්මයා! මොකක්ද මේ ඔබට වුණේ?"

මගේ මිත්‍රයාගේ මුහුණ භයානක අයුරින් විරූපී ස්වභාවයකට හැරිණි. දෑස්වල කළු ඉංගිරියාව උඩට ගොස්, මුළු ශරීරයම අපස්මාර

http://sherlockholmesinvestigations.blogspot.com

රෝගියෙකුගේ මෙන් වෙවුලන්නට පටන් ගත්තේය. ඔහු කෙඳිරිගාමින් බිම ඇදවැටිණි.

හෝම්ස් එක්වරම මෙවැනි බරපතල රෝගී තත්ත්වයකට පත්වීම ගැන අපි භීතියට පත් වුණෙමු. ඔහු ඔසවා කුස්සිය වෙත ගෙන ගොස්, එහි වූ බංකුවක් මත හෝම්ස් හාන්සි කළෙමු. මිනිත්තු කිහිපයක් යනතුරු ඔහු ආශ්වාස-ප්‍රශ්වාස කළේ ඉතා අපහසුවෙනි. මඳ වේලාවකින් හෝම්ස් යළි නැගිටීමට තමාගෙන් සිදුවූ හිරිහැරය ගැන සමාව අයැදිමිනි.

"වොට්සන් ඔබට කියාවි; බරපතල විධියට මං සැහෙන කාලයක් අසනීප වෙලා ඉඳල යම් සුවයක් ලැබුවා විතරයි. සමහර වෙලාවට ස්නායු දුර්වලත්වය නිසා මේ වගේ සිහිවිසංඥවීම් එක්වරටම ඇතිවෙනවා."

"මගේ අශ්ව කරත්තයෙන් ඔබව ගෙදර යවන්නද?"

වයසක කනිංහැම් විමසීය.

"නෑ මෙහෙ ගණන් ගන්න දෙයක් නෑ මහත්මයා. දැන් ඉතින් මෙහෙ ඇවිත් ඉන්න එකේ මට නිසැක වශයෙන්ම දැනගන්න උවමනා එක් කරුණක් ගැන. ඒක අපට පහසුවෙන්ම ඔප්පු කරන්න පුළුවන් දෙයක්."

"ඒ මොකක්ද?"

"මට පෙනෙන හැටියට විලියම් මෙතැනට ඇවිත් තියෙන්නේ, හොරා මෙතැනට එන්න කලින් නෙමෙයි; හොරා ගෙට ඇතුළුවුණාට පස්සෙයි. ඔබ නම් තීරණය කරල තියෙන්නේ දොරේ අගුළු කඩල තිබුණත්, හොරා ගෙට ඇතුළු වුණේ නැහැ කියලයි. එහෙම නේද?" හෝම්ස් ඇසීය.

"මං හිතන්නේ ඒක තොහොඳම පැහැදිලි කරුණක්." වයසක කනිංහැම් මහතා කීවේ තැවරුම් විලාසයෙනි.

"ඇයි ඔය වෙලාව වෙනකොට මගේ පුතා නින්දට ගිහිං හිටියෙත් නැහැ. කවුරුත් එහෙ මෙහෙ ඇවිද්දා නම්, ශබ්ද කළා නම් ඔහුට ඇහෙනවා නෙ."

"ඔහු කොහේද වාඩිවෙලා හිටියෙ?"

http://sherlockholmesinvestigations.blogspot.com

"මං මගේ නිදන කාමරයට අල්ලපු කාමරේට වෙලා පයිප්පය බිබී හිටියෙ."

"ඔය කියන්නෙ මොන ජනේලයද?"

"අර වම් පැත්තෙ කෙළවරේ එක; තාත්තගෙ කාමරේ එකට, ඊළඟ එක."

"ඔබ දෙදෙනාගෙම කාමරවල පහන් දල්වලයි තිබුණෙ?"

"ඇත්තෙන්ම ඔව්."

"මෙතැන තියෙනවා බොහොම අසාමාන්‍ය කරුණු කිහිපයක්. අගුළු කඩාගෙන, ගෙට ඇතුළු වෙන්න සූදානම්වෙන පළපුරුදු හොරෙක්, ඒකට හොරා ගිනිවිද ගෙහිමියන් දෙදෙනෙක් තවමත් අවදියෙන් ඉන්න වේලාවක්?" හෝම්ස් ඇසුවේය.

"මිනිහ ඒව ගණනකට ගන්නෙ නැති හොඳ පුරුදු කාරයෙක් වෙන්න ඇති." ඇලෙක් කනිංහැම් පිළිතුරු දුන්නේය.

"හෝම්ස් මහත්මයා. අපි මේ ගැන ඔබගෙන් විමසුවෙත් මේක අසාමාන්‍ය සිද්ධියක් නිසා. නමුත් ඔබ කියන්නේ, විලියම් ඔහු සමග පොර බදන්න කලින්, හොරා ගෙට ඇතුළු වෙලා බඩු හොරකම් කළා කියල නේද? ඒක නම් මහ පිස්සු කතාවක්. එහෙම වුණා නම්, ගෙදර බඩු අවුල් වී ඇති හැටින්, සමහර දේවල් අඩු බවත් අප පැහැදිලිව දකිය යුතුයි නේ?" ඇලෙක් තරුණයා පැවසුවේය.

"ඒක තීරණය වෙන්නේ ගෙනිහිං තියෙන බඩු මොනවද කියන එක උඩයි." හෝම්ස් පිළිතුරු දුන්නේය.

"අපට හොයන්න සිද්ධවෙලා තියෙන්නේ, ඔහුටම සුවිශේෂ බඩු හොරකම් කරන, අමුතුම මාදිලියේ හොරෙක්. ඒ බව අමතක කරන්න එපා."

"හොඳයි. අපි ඔබ යෝජනා කරන ඕනෑම දේකට එකඟයි. ඔබ හෝ පොලිස් පරීක්ෂක මහත්මයා නියම කරන ඕනෑම දෙයක් ඉටු කරන්න අපට පිළිවන්." වයසක කනිංහැම් කියා සිටියේය.

"හොඳයි. එහෙම නම්, මුලින්ම ඔබ ප්‍රසිද්ධියට පත් කරන්න ඕනෙ මේ මිනිමැරුම ගැන හරි ආරංචියක් දෙන කෙනෙකුට, ත්‍යාගයක් දෙන බව." හෝම්ස් තම අදහස පළ කළේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"තෑග්ගට දෙන මුදල කියක් විය යුතුද යන්න ගැන එකඟතාවයකට එන්න පොලිස් නිලධරයන්ට පැය ගණනක් ගතවේවි. ඒ නිසා ඔන්න මම ලියනවා දැන්වීමක්. කනිංහැම් මහත්මයා ඔබ මේක අත්සන් කරල දුන්නොත් හරි. නිවැරදි ආරංචියක් දෙන කෙනෙකුට පවුම් පනහක තෑග්ගක් දුන්නොත් ඔහෙ තරම් ඇති." හෝම්ස් කීවේය.

"මං බොහොම කැමැත්තෙන්ම දෙන්නම් පවුම් පන්සීයක්." සාමදාන විනිශ්චයකාරතුමා පැවසුවේ හෝම්ස් දුන් කඩදාසිය හා පැන්සල අතට ගනිමිනි.

"ආ . . . . ඔබ ලියල තියෙන එක වැරදියි නේ හෝම්ස් මහත්මයා. ඔබ ලියල තියෙන්නෙ 'අඟහරුවාදා පාන්දර එකට කාලක් තිබියදී . . . .' ආදී වශයෙන්. ඇත්තටම මේක සිදුවුණේ දොළහට කාලක් තිබියදී."

හෝම්ස් අතින් වූ මෙම වැරදීම ගැන මම බලවත් කණගාටුවට පත්විමි. ඊට හේතුව හෝම්ස් අතින් මෙවැනි වැරදීම් කලාතුරකින්වත් සිදුනොවන බව, මා දැන සිටීමයි. නමුත් ප්‍රංශයේදී බරපතල ලෙස රෝගාතුර වීම නිසා, හෝම්ස් කායික වශයෙන් පමණක් නොව, මානසිකව ද බෙහෙවින් අබල දුබල තත්ත්වයකට පැමිණ ඇත. ඔහු කලින් සිටි තීක්ෂණ බුද්ධියෙන් යුතු හෝම්ස් නොවන බව, මේ අතපසු වීමෙන්ම සනාථ වේ.

කනිංහැම් මහතා එම වරද පෙන්වා දෙද්දී, හෝම්ස් ලැජ්ජාවට පත්වූ අයුරු මම දුටුවෙමි. පොලිස් පරීක්ෂකවරයා දෙබැම ඉහළට එසැවූයේ පුදුමයෙනි. ඇලෙක් තරුණයාට නම් එය කොක් හඬලා සිනාසීමට තරම් විහිළුවක් විය. වයස්ගත කනිංහැම් මහතා, හෝම්ස් අතින් සිදුවූ වරද, නිවැරදි කොට, කඩදාසිය හෝම්ස් අතටම භාර දුන්නේය.

"පුළුවන් ඉක්මනට මේක පත්තරේට දාන්න. මටත් හිතෙනවා ඔබෙ මේ අදහස කදිම එකක් කියල."

හෝම්ස් කඩදාසිය නමා තමාගේ සටහන් පොත ඇතුළේ තැන්පත් කොට එය සාක්කුවේ දමාගත්තේය.

"හොඳයි දැන් අපි හැමෝම එකතුවෙලා, මුළු ගේම පරීක්ෂා කරල බලමු. මේ අමුතුම මාදිලියේ හොරා ඇත්තෙන්ම කිසි දෙයක් ගෙනිහිං ද නැද්ද කියන එක හොඳින් තහවුරු කර ගනිමු."

http://sherlockholmesinvestigations.blogspot.com

නිවසට ඇතුළුවීමට පෙර, සොරුන් විසින් කඩාදමන ලද අගුළු හා දොර පරීක්ෂා කර බැලීමට හෝම්ස් අමතක නොකෙළේය. නියනක් හෝ ශක්තිමත් පිහිතලයක් ආධාරයෙන් අගුළ පත්‍රා ඇති බව අපි පැහැදිලිවම දුටුවෙමු. එම ආයුධය ඇතුළු කළ ස්ථානයේ ලීය පළුදු වී ඇති සැටි ද දක ගත හැකි විය.

"දොර අරින්න බැරිවෙන්න දොර අගුළු දැමීමක් ඔබ කරන්නෙ නැද්ද?"

"එහෙම දෙයක අවශ්‍යතාවය අපට කවදාවත් දැනුණෙ නැහැ."

"ඔබ බල්ලෙක් ඇති කරන්නෙත් නැහැ?"

"බල්ලෙක් ඉන්නවා, හැබැයි දම්වැලකින් බැඳල දාලා ඉන්නේ ගෙදර අනෙක් පැත්තේ."

"සේවකයන් නින්දට යන්නේ රාත්‍රී කීයටද?"

"දහයට පමණ."

"ඒ කියන්නේ රැ දහය වෙනකොට විලියම් නිදාගන්න ගිහිං?"

"ඔව්."

"රාත්‍රියේ මේ වෙලාවෙ ඔහු අවදියෙන් සිටීම අසාමාන්‍ය දෙයක්?"

"ඔව්."

"කනිංහැම් මහත්මයා. දැන් ඉතින් නිවසේ සෑම තැනක්ම පෙන්වා දෙන්න ඔබට හැකිනම් ලොකු උදව්වක්."

මෙම විශාල නිවසේ ඉස්තෝප්පුව දෙසින් එක් තරප්පු පෙළක් ද, ශාලය දෙසින් තවත් තරප්පු පෙළක් ද විය. මීට අමතරව නොයෙක් අතට විහිදුණු නිදන කාමර රාශියක්ද තිබිණි. ගෘහ නිර්මාණ ශිල්පය හා කාමර විහිදී තිබුණු ආකාරය ගැන දැඩි අවධානයක් යොමු කරමින්, හෝම්ස් ඉතා සෙමින් විවිධ දිශාවලට ඇවිද බැලීය. ඔහු හෝඩුවාවක් ගැන ඉව වැටී, ඒ පිටුපස තියුණු ලෙස ඉව අල්ලමින් ගමන් කරන බව මම වටහා ගතිමි. එහෙත් ඔහුගේ නිරීක්ෂණ අනුව එළැඹි නිගමනයන්, යොමු වී ඇත්තේ කුමන දිශාවකටදැයි මට සිතාගැනීමට වත් නොහැකි විය.

http://sherlockholmesinvestigations.blogspot.com

"මහත්මයා . . . ." කනිංහැම් පැවසුවේ දඩි නොඉවසිල්ලෙනි. "මේ විදියට අපේ කාමර පරීක්ෂා කිරීම අනවශ්‍ය දෙයක් නේද? මේ තරප්පු පෙළ කෙළවරේ තියෙන්නෙ මගේ කාමරය. ඊට එහායින් එක මගේ පුතාගේ කාමරය. ඔබම කල්පනා කරල බලන්න අපේ අවධානයට යොමු නොවී, හොරාට මෙහේ එන්න පුළුවන් කමක් තිබුණද කියල."

"මං හිතන්නේ ඔබ උත්සාහ කරල බලන්න ඕනෙ හොයාගන්න, හොරා ඉතුරු කරල ගිය යම්කිසි දෙයක, හෝඩුවාවක්. එහෙම දෙයක් තියෙනව නම් ඒක පරීක්ෂණය සඳහා ආධාර කරගන්න පුළුවන්ද කියල බලන්න ඕනෙ." ඇලෙක් පැවසුවේ දුෂ්ට උපහාසාත්මක සිනාවක් මුහුණට නගා ගනිමිනි.

"ඒ වුණත් ඔබ මට තව ටිකක් ඉඩ දෙන්න. උදාහරණයක් වශයෙන් මං කැමතියි දැනගන්න, නිදන කාමරවල ඉදිරිපස ජනේලවලට, නිවස ඉදිරිපස උද්‍යානය පෙනෙන්නෙ කොහොමද කියල. මේක වෙන්න ඇති ඇලෙක් මහත්මයගෙ කාමරය . . . ."

හෝම්ස් කාමරයක දොර තල්ලු කොට විවෘත කළේය.

"මං හිතනවා විලියම උදව් ඉල්ලා කෑගහන ශබ්දෙ ඇහෙද්දි, ඇලෙක් මහත්මයා පයිප්පෙ උරමින් ඉන්න ඇත්තෙ අන්න අර කාමරේ වෙන්න ඇති?"

ඔහු නිදන කාමරයට යාබදව තිබූ අනෙක් කාමරයට ඇතුළු විය.

"මේකෙ ජනේලයෙන් බැලුවාම පේනෙන්නෙ කොහේද කියල බලමු." හෝම්ස් කීය.

"ඔබේ හිතට හරියට සෑහීමකට පත්වුණාද?" කනිංහැම් මහතා ඇසුවේ හෝම්ස්ගේ මේ පරීක්ෂාව නිසා සිත් වේදනාවට පත් ස්වරයෙනි.

"බොහොම ස්තූතියි. බලන්න ඕනෙ කරන ඔක්කොම මං බලාගත්තා."

"හොඳයි ඔබට ඕනෙ නම් මගේ කාමරේත් පෙන්වන්නම්." කනිංහැම් මහතා කීය.

"ඔබට ඒ හැටි කරදරයක් නෙමෙයි නම් . . . ."

http://sherlockholmesinvestigations.blogspot.com



 "අයියෝ වොට්සන්! දෙවියනේ මොකක්ද මේ ඔබ අතින් සිදුවුණේ?"

Reading Pleasure Blog For Print
http://sherlockholmesinvestigations.blogspot.com

තරමක් කෝපයෙන් මෙන් දෙළර හැකිළූ සාමදාන විනිශ්චයකාරවරයා, අප ඔහුගේ කාමරයට කැඳවාගෙන ගියේය.

පිරිස එහි ඉදිරිපස ජනේලය දෙසට යද්දී, අනෙක් අයට යාමට ඉඩදී, හෝම්ස් මා සමග මඳක් පමාවිය. එවිට කණ්ඩායමේ පිටුපසින්ම සිටියේ අප දෙදෙනාය. කාමරයට ඇතුළු වූ තැනම කුඩා කනප්පුවක් මත දොඩම් ගෙඩි රැසක් තබා තිබූ බඳුනක් හා වතුර පුරවා තිබූ වීදුරු ඩිකැන්ටරයක් විය. මා ඉමහත් පුදුමයට පත් කරමින්, කිසිවෙකුට නොපෙනෙන සේ, හෝම්ස් කනප්පුව බිමට පෙරළුවේය!

වීදුරු ඩිකැන්ටරය බිම වැටී, මහහඬින් බිඳී ගියේ වීදුරු කැබලි දසත විසුරුවා හරිමිනි. දොඩම ගෙඩි, කාමරය පුරා අස්සක් මුල්ලක් නැර, පෙරළී, විසිරී ගියේය.

"අයියෝ වොට්සන්! දෙවියනේ මොකක්ද මේ ඔබ අතින් සිද්ධ වුණේ? බුමුතුරුණත් අපරාදෙ නාස්ති වුණා." හෝම්ස් වහා කීවේය.

මගේ මිත්‍රයා එවර, මා පිට පැටවූයේ කුමක් හෝ වැදගත් අවශ්‍යතාවයක් නිසා බව මම සිතාගත්තෙමි. අවුල් වූ මනසකින් මම බිම පෙරළුණු දොඩම් ගෙඩි ඇහිදීමට පටන් ගත්තෙමි. අනෙක් අය ද එම ක්‍රියාවලියේම නිරත වූහ. පෙරළා දැමුණු කනප්පුව කෙළින් කොට, ඒ මත තැබූ බඳුනට දොඩම් ගෙඩි එකතුකොට දැමීමට පටන් ගත්තෙමු.

"ආ . . . . මිනිහ කොහේටද අතුරුදන් වුණේ?" පොලිස් නිලධරයා ඇසුවේ දොඩම් ඇහිදීමේ රාජකාරිය අවසන් වූ පසු, හෝම්ස් අප අතර නොමැති බව දුටු විටයි.

"ඔහොම ඉන්න ටිකක්." පැවසූ ඇලෙක්, හෝම්ස් සෙවීමට සූදානම් විය.

"මං හිතන්නේ මේ මිනිහගේ ඔලුව නරක් වෙලා. කෝ තාත්තත් එන්න, මාත් එක්ක; අපි ගිහින් බලමු. මේ මිනිහ කොහේ ගියාද මංදා?"

ඔවුහු කාමරයෙන් පිටව ගියහ. කාමරයේ රැඳී සිටි අපි මුහුණට මුහුණ බලාගත්තෙමු.

"දෙයියම්පා! ඇලෙක් මහත්තයගේ කථාව ඇත්ත. හෝම්ස් මහත්තයට සැදුණු දරුණු අසනීපෙ නිසා මොළයේ ආබාධයක් හැදිලා වෙන්න ඇති . . . ."

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහුගේ කථාවට බාධා කරමින්, ඇලෙක්ගේ කාමරය දෙසින් උදව් ඉල්ලා කෑගසන හඬක් ඇසිණි.

". . . . මිනීමරනවෝ! මෙන්න මාව මරනවෝ! මාව බේරගන්න කවුරුත් නැද්දෝ!!!"

ඒ විලාප හඬ නැගුණේ හෝම්ස්ගෙන් බව මම හඳුනාගතිමි. මම විලාපය ආ දෙසට ක්ෂණයකින් දිව ගියෙමි.

ඇලෙක් කනිංහැම්ගේ කාමරය තුළ හෝම්ස් බිම වැටී සිටියේය. කනිංහැම් පුත්‍රයා, හෝම්ස් බිම පෙරළාගෙන දැතින්ම හෝම්ස්ගේ ගෙල සිර කිරීමට උත්සාහ දරමින් සිටියේය. මේ අතර කනිංහැම් පියා හෝම්ස්ගේ දකුණු අත අඹරවමින් සිටි අයුරු මම දුටුවෙමි. කර්නල් හේටර්, පොලිස් නිලධරයෝ සහ මම හෝම්ස් බේරාගැනීමට ඒ දෙසට පැන්නෙමු. පියපුතු දෙදෙනාගේ ග්‍රහණයෙන් හෝම්ස් ගලවා ගැනීමට අප තිදෙනාට බලවත් උත්සාහයක් දරන්නට සිදුවිය. බිම වැටී සිටි හෝම්ස් හිස එසවූයේ මහත් අපහසුවෙනි. ඔහුගේ මුහුණ සුදුමැලි වී තිබුණු අතර ඔහු දැඩි ශාරීරික වේදනාවකින් පෙළුණු බව මම වටහා ගතිමි.

"ෆොරෙස්ටර් මහත්මයා, ගන්න මේ දෙන්නව සිරභාරයට." හෝම්ස් කීවේ අපහසුවෙන් හුස්ම ගනිමිනි.

"ඒ මොන අපරාධයකටද?"

"විලියම් කර්වන් මරාදැමීමේ අපරාධයට."

කිසිවක් තේරුම් ගැනීමට නොහැකිව පොලිස් නිලධරයා තුෂ්නිම්භූතව බලා සිටියේය.

"මොනවද හෝම්ස් මහත්මයා, ඔබ මේ දොඩවන්නේ? මං හිතන්නේ නෑ, ඔබ ඇත්තටම එහෙම දෙයක් අදහස් කළා කියල . . . ."

"චා චා චා! බලනව මනුස්සයෝ ඒ දෙන්නගෙ මුහුණු දිහා!" හෝම්ස් කීවේ උස්හඬිනි.

තමන් කළ වැරදි, අපරාධකාරයින්ගේ මුහුණු වලින් මේ තරම් හොඳින් පිළිබිඹු වෙන අයුරු, මා කිසිදිනෙක දැක නොතිබිණ. වයස්ගත කනිංහැම්ගේ රැලි වැටුණු මුහුණෙන් දිස්වූයේ, තමා ලත් පරාජය විශ්වාස කිරීමට නොහැකිව කම්පනයට පත් ස්වභාවයකි. එහෙත්

http://sherlockholmesinvestigations.blogspot.com

තරුණ ඇලෙක්ගේ මුහුණෙන් බිහිසුණු සැහැකුගේ රෞද්‍ර බව පිළිබිඹු විය. පොලිස් නිලධරයා නළාව පිඹිද්දී හර්යෝ දෙදෙනෙක් එතැනට දිව ආහ.

"ඔබ දෙදෙනා අත් අඩංගුවට ගැනීම හැරෙන්න, මට වෙන කරන්න දෙයක් නෑ, කනිංහැම් මහත්මයා. මං හිතනවා මෙතැන ලොකු වැරැද්දීමක් වෙලා ඇති කියල. ඒ වුණත් ඔබට . . . .!

ඒයි! ඒකටද ලැස්ති වුණේ? දානව ඔය පිස්තෝලෙ බිම!"

කියමින් පොලිස් නිලධරයා ඇලෙක්ගේ අතට වේගවත් පහරක් එල්ල කළේ එක් නිමේෂයකිනි.

කෝපයෙන් වෙවුලමින් සිටි ඇලෙක්, හෝම්ස්ට වෙඩි තැබීමට, අතට ගත් පිස්තෝලය එම පහරින් බිම පතිත විය.

"එය පරිස්සම් කරගත යුතුයි. මිනීමැරුම නඩු විභාගෙදි ඒ ආයුධය ඔබට ඕනෑ වේවි. ඒ වුණට මෙන්න මේක තමා අපට හුගක්ම වැදගත්." හෝම්ස් පැටලුණු ගුලිවී තිබූ කඩදාසියක් පෙන්වමිනි.

"අර ලියුමේ ඉතිරි කොටස?"

"හරියට හරි."

"කොහේද ඕක තිබුණේ?"

"ඒක තියෙන්න නියමිත තැන තිබුණා. මං ඔබට ඒ ඔක්කොම තේරුම් කරලා දෙන්නම් තව ටිකකින්.

කර්නල් හේටර්. ඔබ දැන් ඉවාට්සන් සමග ආපසු යා යුතුයි. පැයක් ගතවෙද්දි මං ආපසු එන්නම්. පොලිස් පරීක්ෂකවරයාත් මමත් සිරකරුවන් සමග කළයුතු කටයුත්තක් තියෙනවා. ඒ වුණත් දවල් කෑම වෙලාවට මං එන්නම්."

* * *

ෂර්ලොක් හෝම්ස් පොරොන්දු වූ පරිදි දහවල් එක වෙද්දී, හේටර් නිවසට ආපසු පැමිණියේය. සිහින් සිරුරක් තිබූ වයස්ගත මහත්මයෙක් ද හෝම්ස් සමග පැමිණියේය. හොරුන් විසින් කලින් කළ ගෙවල් බිඳුමට ලක්වූ නිවසේ හිමිකරු, ඇක්ටන් මහතා ඔහු බව මට හඳුන්වා දෙන ලදී.

http://sherlockholmesinvestigations.blogspot.com

අයිතියක් තියෙනවා. මං ඒකත් අරගෙන යන්න ගියා. මෝඩයෙක් වගේ මං එදා මගේ දුම්කොළ පසුම්බිය අමතක වෙලා දාලා ගියා.

දැන් මං ඔබට කියන්නම් මේ කථාවේ පුදුමාකාරම කොටස. මං කැබින් කාමරයෙන් එළියට බැස්සා විතරයි, මට ඇහුණා ඒ පැත්තට කවුදෝ එන අඩි ශබ්දයක්. මං ඉක්මනින්ම එතැනම පඳුරු අස්සෙ හැංගුණා. කවුදෝ පුද්ගලයෙක් ඇවිත් කැබින් කාමරයට ඇතුළු වුණා. පීටර් කේරි ඒක ඇතුළෙ හිටි හැටි දැක්කාම, අර මිනිහා යටිගිරියෙන් කෑගැහුවෙ අවතාරයක් දැක්ක වගේ. ඊළඟට ඔහු ආපහු හැරිලා විදුලි වේගයෙන් පැනල දිව්වා. ඔහු කවුද, ආවෙ මොකටද කියන්න මං දන්නෙ නෑ. මං හැතැක්ම දහයක් දුර පයින්ම ගිහිං, ටන්බ්‍රිජ්වෙල්ස් දුම්රියපොළෙන් දුම්රියට නැගලා ලන්ඩනයට ආවා.

ආපහු ඇවිත් අර පෙට්ටිය ඇරලා බැලුවාමයි මං දැක්කෙ, ඒකෙ මුදල් කිසිවක් තිබුණෙ නෑ. ලියකියවිලි වගයක් තිබුණා. ඒව විකුණලා මුදලක් හොයාගන්න බලන්න තරම් මම නිර්භීත වුණේ නෑ. මැර පීටර් භය කරලා මට කීයක් හරි හොයාගන්න තිබුණු අවස්ථාවත් අහිමි වුණා. අතේ සිලිමක් නැතුව මං ලන්ඩනයේ අතරමං වුණා. මට ජීවත්වෙන්න තිබුණු එකම මඟ මගේ රස්සාව විතරයි. තල්මසුන් දඩයමේ යන නැවකට හාපුන්කාරයො ඉල්ලපු දැන්වීම දැකලා, අන්තිමට මෙහෙ එන්න තීරණය කළා. පීටර් කේරිට මරණ දඬුවම දීම ගැන ආණ්ඩුවෙන් මට ස්තුතිවන්ත වෙන්න ඕනෙ. ඔවුනට එල්ලුම් ගහේ තොණ්ඩුවකට යන මුදල ඉතිරි වුණා."

"බොහොම පැහැදිලි කට උත්තරයක්." හෝම්ස් පැවසුවේ පයිප්පය දල්වා ගනිමිනි.

"හොප්කින්ස්. මං හිතන්නේ පුළුවන් තරම් ඉක්මනට ඔබේ සිරකාරයව ආරක්ෂා සහිත තැනකට ප්‍රවාහණය කළොත් හොඳයි. මේ විසිත්ත කාමරය හදිසියකට හිරමැදිරියක් හැටියට යොදාගන්න පුළුවන් තාලෙට සකස්වෙලා නෑ. අපේ බුමුතුරුණෙන් විශාල කොටසක් පැට්රික් කෙයාන්ස් ඔහුගේ පරිහරණය සඳහා වෙන් කරගෙන."

"මං දන්නෙ නෑ හෝම්ස් මහත්මයා මගේ කෘතඥතාවය ඔබට කොහොම පලකරන්නද කියලා? අනෙක ඔබ මේ තරම් විශිෂ්ට ප්‍රතිඵල ලබාගන්නෙ කොහොමද කියලා මට තවමත් තේරුම් ගන්න බෑ."

http://sherlockholmesinvestigations.blogspot.com

ඉරාගෙන, අරං ගියේ අපරාධකරුවා මෙන්න බැ. වෙඩිපහර වැදී, බිම වැටුණු විලියම්ගේ අතෙන් ලියුම උදුරාගන්න කෝ මහුට වෙලාවක්? මහත්වරුනි, මා නිවැරදිද?"

ඊළඟට ලියුම ඉරාගත්තෙ අපරාධකාරයා නෙමෙයි නම්, එය කළේ කවුද? ඔව් එය කළේ ඇලෙක් කනිංහැම් වියයුතුයි. ඒ මොකද වයසක කනිංහැම් තරප්පුව බැහැලා එතැනට එනකොට, සේවකයන් කිහිප දෙනෙක්ම අපරාධය සිදුවූ තැනට ඇවිල්ලා ඉවරයි.

මේක බොහොම සරල කාරණයක්. ඒ වුණත් පොලිස් නිලධරයා ඒක ඒ හැටි සැලකීමකට ගත්තේ නෑ. ඔහු හිතුවා මේ පළාතේ වැදගත්, ධනවත් ප්‍රභුවරු, මේ අපරාධයට කිසිසේත් සම්බන්ධ නැහැ කියල. නමුත් මං පරීක්ෂණයේ ඇත්තටම ස්වාධීනයි. ප්‍රභුවරුන් වුණත් සාමාන්‍ය මිනිසුන් වුණත් මගේ හිතට බලපෑමක් ඇතිවෙන්නෙ නෑ. මං යොමුවෙන්නේ නිරීක්ෂණ වලින් මා යැවෙන දිශාවටයි. ඒ නිසා පරීක්ෂණය මුලදීම ඇලෙක් කනිංහැම් රඟපාපු චරිතය ගැන මගේ හිතේ සැකයක් ඇතිවුණා.

ඊළඟට විලියම් අතේ රැඳී තිබී පොලිස් නිලධරයා අපට ලබාදුන් කඩදාසි කෑබැල්ලට මං අවධානය යොමු කළා. මේක හරිම සුවිශේෂ ලියවිල්ලක් බව මට එස්වරම වැටහුණා. මෙන්න බලන්න. මේක පරීක්ෂා කරල බැලුවාම එහි ඇති අසාමාන්‍යතාවයක් ඔබට පෙනෙන්නෙ නැද්ද?"

"මේ ලිවීමෙ තිබෙනවා හරි අස්වාභාවික ගතියක්" හේටර් පැවසුවේය.

"හිතවත්, මහත්මයා, මේක බැලුවාම කියන්න පුළුවනි, මේක ලියල තියෙන්නේ පුද්ගලයින් දෙදෙනෙකු විසින්, වචන මාරුවෙන් මාරුවට ලිවීමෙන් කියලා.

බලන්න at සහ to යන වචන දෙකේ t අකුරේ හරස් ඉරි කැල්ල. ඒක ශක්තිමත් අතකින්, පැහැදිලිව ලියා ඇති හැටි. ඊළඟට ඒක සංසන්දනය කරල බලන්න quarter සහ twelve යන වචනවල t අකුරු සමග. ඒ t අකුරු වල හරස් ඉරි කැල්ල බොහොම දුර්වල ලෙස, නොසැලකිලිමත් අයුරෙන් ලියූ ඒවා නේද?

http://sherlockholmesinvestigations.blogspot.com

මේ විදියට වචන හතරම විශ්ලේෂණය කළොත් ඔබට පැහැදිලි වේවි learn සහ maybe වචන ලියල තියෙන්නේ ශක්තිමත් අතෙන්; what ? යන වචනය දුර්වල අතෙන් ලියූ එකක්."

"දෙයියෝ සාක්කි! ඔබ මේ කියන කාරණය ඉර පායල එළිය වැටුණ වගේ පැහැදිලිව පෙනෙනවා. ඒ වුණත් මිනිස්සු දෙදෙනෙක් එකතු වෙලා, මේ විධියට ලියුමක් ලියන්නේ මොන අරමුණකින්ද?"

"පැහැදිලිවම නරක අරමුණකින්. මෙතු ලියූ එක් පුද්ගලයෙකුට අනෙකාට විශ්වාස නැහැ. මොන දේ කළත් ඒකෙ වගකීම අනෙකාට සමානව පවරන්න, ඔහු දැඩි අධිෂ්ඨාන කරගෙන ඉන්නවා. මෙයෙන් අපට හිතාගන්න පුළුවනි, "මෙතැනි නායකයා at සහ to යන වචන ශක්තිමත් අතකින් ලියූ තැනැත්තා කියල."

"ඔබ කොහොමද ඒක තීරණය කළේ?"

"ශක්තිමත් අතකින් ලියූ පුද්ගලයා ඔහුගේ වචන ටික මුලින් ලියුවා. ඔහු හිස් තැන් කීපයක් තැබුවා අනෙකාට, එයාගේ වචන ලිවීමට. නමුත් මේ හිස් තැන් හැමවිටකම එතැනට නියමිත වචනවලට ප්‍රමාණවත් වුණේ නැහැ. ඒ නිසා දෙවැනියාට, ඒ කියන්නේ දුර්වල අතකින් ලියූ පුද්ගලයාට සිදුවුණා, නියමිත වචනය, තිබෙන ඉඩ ටිකට අපහසුවෙන් හිරකරලා දමන්න.

ඔහු අපහසුවෙන් එම වචන ලියා ඇති හැටි බලන්න. at සහ to අතර ඇති quarter වචනය අපහසුවෙන් ලියලා, අන්තිම අකුරු ටික තියෙන්නේ නියම පේළියෙන් අහක. තමන්ගේ වචන මුලින් ලියූ තැනැත්තා තමයි මේක සැලසුම් කළ තැනැත්තා. ඒ ගැන කිසි සැකයක් නෑ."

"විශිෂ්ටයි." ඇක්ටන් මහතා කිය.

"මීළඟට අපි එනවා තවත් වැදගත් කරුණකට. ඔබ සමහර විට අහලා නැතුව ඇති; කෙනෙකුගේ අත් අකුරු වලින් පුළුවන් ඔහුගේ වයස නිර්ණය කරන්න. ඒ කියන්නේ අත්අකුරු පිළිබඳ විශේෂඥයෙකුට පුළුවනි යම්කිසි කෙනෙක් ලියූ ඡේදයක් පරීක්ෂා කරලා, එම තැනැත්තා ජීවිතයේ කුමන දශකය පසුකරමින් ඉන්න කෙනෙක්ද යන්න නිගමනය කරන්න. කලාතුරකින් බරපතල අසනීප තත්ත්වයකට ගොදුරුවීම

http://sherlockholmesinvestigations.blogspot.com

හෝ ශාරීරිකව ඇතිවූ දුර්වලතාවයන් නිසා, තරුණ අයගේ අකුරුවල වයස්ගත අයගේ ලියවිල්ලක පෙනුම තිබෙන්න පුළුවන් බව ඇත්තයි.

නමුත් මෙම ලියමනේ අකුරු වල ස්වභාවය තියුණු ලෙස විශ්ලේෂණය කර බැලුවොත් අපට කියන්න පුළුවනි, ශක්තිමත් අතකින් අභීතව ලියූ තැනැත්තා තරුණයෙක් බවත්, අකුරේ හරස් ඉර නොපැහැදිලි ලෙස දුර්වල අතකින් ලියූ තැනැත්තා වයස්ගත පුද්ගලයෙක් බවත්."

"ඇත්තමයි" ඇක්ටන් මහතා කීය.

"තවත් කරුණක් තිබෙනවා මං ඔබට පෙන්වාදීමට කැමැති. ඒක බොහොම සියුම්, ඒත් සිත්ගන්නා සුලු එකක්. මේ අත් අකුරු දෙවර්ගයේම යම් යම් පොදු, සමාන ලක්ෂණ තිබෙනවා. එහෙම සමාන ලක්ෂණ දකින්න ලැබෙන්නෙ සම්බන්ධ ලේ ඥාතීන්ගේ අත් අකුරු වලයි. ඔබට පැහැදිලිව පෙනෙනවා ඇති e අකුර ග්‍රීක් පිළිවෙළට ε කියා ලියා ඇති බව. මේ ආකාරයේ සියුම් ලක්ෂණ රාශියක්ම එක සමාන බව මට හඳුනාගන්න පුළුවන්. එයින් පැහැදිලි වෙන්නේ මෙම ලිවීමට හවුල් වූ දෙදෙනා ලේ ඥාතීන් දෙදෙනෙක් බවයි. මෙම අත්අකුරු වල විශේෂත්වය ගැන මා හඳුනාගත් නිරීක්ෂණ විසිතුනක් තිබෙනවා. විශේෂඥයින් ඇසීමට ප්‍රිය කරන, ඒවා එකක් එකක් ගැන මං මේ වෙලාවේ ඔබට විස්තර කරන්න උත්සාහ කරන්නේ නෑ. නමුත් ඒවායින් මට තහවුරු වුණා, ලියුම ලියලා තියෙන්නේ කනිංහැම් පියා සහ පුතා විසින් කියල.

මීළඟට මං උත්සාහ ගත්තේ අපරාධය පිළිබඳ හෝඩුවාවන් පරීක්ෂා කරලා, ඒවා අපට කොයිතරම් දුරට උදව් කරගන්න පුළුවන්ද බලන්නයි.

මළසිරුර පරීක්ෂා කර බැලුවාම මට හොඳින් පෙනී ගියා, මාරාන්තික වෙඩි පහර එල්ල වෙලා තියෙන්නේ, යාර හතරකට වැඩි දුරක සිට යන්න. විලියම්ගේ ඇඳුම්වල, වෙඩි බෙහෙත් දැවීමෙන් ඇතිවූ කළු පැල්ලම් කිසිවක් තිබුණේ නැහැ. ඒ අනුව මිනිසුන් දෙදෙනා පොර බදමින් සිටියදී සොරා වෙඩි තැබුවා කියා, ඇලෙක් කනිංහැම් කිව් කථාව සම්පූර්ණ බොරුවක් බව ඔප්පු වෙනවා.

අපරාධකාරයා මල්වැට හරහා පැන ගියා කියපු තැන ඇලෙක් පෙන්නුවා. ඔහුගේ පියා ඒ බව ස්ථිර කළා. මං එතැන පරීක්ෂා කරල

http://sherlockholmesinvestigations.blogspot.com

බැලුවා. මල්වැටෙන් එහා පැත්තේ දිඝකඩිත්තක් තිබුණා. එතැන පොළොව මඩ සහිත එකක්. එහෙත් මොනම ආකාරයක වත් පා සටහනක් නම් තිබුණේ නැහැ. පිය පුතු දෙදෙනාම කියන්නේ බොරු බවත්, මොනම අයුරකින් වත් නාඳුනන අපරාධකරුවෙක් මෙහි නොමැති බවත් එයින් සහතුරු වුණා.

මේ මිනීමැරීමේ අරමුණ මොකක්ද? මෙතකට එන්න කලින් ඇක්ටන් මහතාගේ ගෙවල් බිඳීම් ගැන හොයා බලන්න මං තීරණය කළා. කර්නල් අපට කිව්වා ඇක්ටන් මහතුමියා සහ කනිංහැම්ලා අතර කාලයක් තිස්සේ ඉඩම් ආරවුලක් ඇති බව. මට එක්වරම සිතුණේ ඇක්ටන් මහතාගේ නිවසේ පුස්තකාලයට කඩාවැදුණු පුද්ගලයන්, කනිංහැම්ලා වීමට ඉඩ ඇති බව. ඒ මොකටද? නඩුවේදී ඔවුන්ගේ පක්ෂයට ප්‍රයෝජනයට ගත හැකි ලියවිල්ලක් සොරකම් කර ගැනීමට."

"ඒක හරියටම හරි." ඇක්ටන් මහතා කීවේය.

"ඔවුන් භුක්ති විඳින ඔය වතුයායෙන් හරි අඩක්ම අයිති මටයි. ඒකට අදාළ එක කඩදාසියක් ඔවුනට හොරකම් කරගැනීමට ලැබුණා නම්, නඩුවෙන් මම සම්පූර්ණයෙන්ම පරාජය වෙනවා. වාසනාවකට එගේ ඒ ලියවිලි ඔක්කොම මගේ නීතිඥයන් ළඟයි සුරක්ෂිතව තිබුණේ."

"දැන් ඔබට පෙනෙනවා නේද? ඇක්ටන් මහතාගේ නිවස බිඳගෙන ඇතුළු වෙලා, මේ ලියවිලි හොයන්න උත්සාහ කළ පුද්ගලයා කවුද? නිසැකවම තරුණ ඇලෙක්. උවමනා දේවල් හොයාගන්න බැරිවුණාම, මේක සාමාන්‍ය ගෙවල් බිඳුමක් බව පෙන්වන්න ඔවුන් අතට අහුවුණු දේ අරගෙන ගියා. ඒ ටික පැහැදිලියි.

මේ හැමදේකටම වඩා මට හොයාගන්න උවමනා වුණා, විලියම් අතෙන් ඉරාගෙන ගිය ලියුම. විලියම් මිය ගිය වෙලාවෙ ඔහුගේ අතින් නිසැකවම ඇලෙක් එය උදුරාගන්න ඇති කියල මට වැටහුණා. ඊළඟට ඔහු එය තමන් ඒ වෙලාවෙ හෙදර්ට හැඳ සිටි ලිහිල් පිටකබායේ සාක්කුවේ දමාගන්න ඇති. ඒක මට හොඳටම විශ්වාසයි. ඒ වෙලාවෙ ඔහු එය වෙන කොහේ දමන්නද? නමුත් ප්‍රශ්නය තවමත් ඒක එම සාක්කුවෙම තිබෙනවාද යන්න. මේක හොයා බලන්න වටිනා දෙයක්. ඒකට උත්සාහයක් දැරීමේ අරමුණෙන් තමයි මම නිවස පරීක්ෂා කිරීමේ යෝජනාව ඉගනාවේ.

http://sherlockholmesinvestigations.blogspot.com

කුස්සියේ දොර අගදී කනිංහැම්ලා අපට එකතු වුණා. ලියුමේ වැදගත්කම ගැන අප ඔවුනට යන්තමින්වත් දැනගන්න අරින්න නරකයි. දැනගත්තා නම් ඔවුන් ඒක වහාම විනාශ කරනවා. පොලිස් නිලධරයාගේ කටින් එම වැදගත් කරුණ පිටවෙන්නයි ගියේ. මෙය කොහොම හරි නවත්වාගන්න මට උවමනා වුණා. වාසනාවකට වගේ මට ක්ලාන්තයක් හැදිලා කථාව එතැනින් නවත්වන්නත්, ඉන්පසුව එය වෙන අතකට හරවන්නත් මට පුළුවන් කම ලැබුණා.

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ!" කර්නල් හේටර් පැවසුවේ සිනාසෙමිනි.

"ඔබ කියන්නේ අපි හැමෝමදානාම බොහොම කම්පාවට පත්වුණු ඔබගේ අර ක්ලාන්තය, වැඩිප්පුව සම්පූර්ණයෙන්ම බොරු රඟපෑමක් කියලද?"

"මම නම් ඇත්තටම හිතුවේ ඔබේ ස්නායු දුර්වල වීම නිසා ඇතිවුණු රෝගී තත්ත්වයක් කියලයි. එය රඟපෑමක් බව වෛද්‍යවරයෙකුට වත් හඳුනාගන්න බැහැ," මම කීවෙමි.

"ඒ අපස්මාරය, සමහර අවස්ථාවලදී අත්‍යවශ්‍ය වෙන රඟපෑමක්. ඒකෙන් සුවය ලැබුණාට පස්සෙ මට හැකිවුණා, පොඩි උපක්‍රමයක් මඟින් වයසක කනිංහැම් ලවා quarter යන වචනය ලියවන්න. ඒකෙන් මට හැකිවුණා අපට ලැබුණු ලියුම් කැබැල්ලේ එම වචනය එක්ක සසඳලා බලන්න"

"අයියෝ මම ඒකෙදිත් රැවටුණා." මම කීවෙමි.

"ඊළඟට අපි ගියා උඩ තට්ටුවට. ඇලෙක්ගේ කාමරයට ගියාම, මං දැක්කා ඔහුගේ දොරට පිටුපසින්, ඔහු ගෙදරට අඳින පිට කබාය, එල්ලා ඇති හැටි. ඊළඟ කාමරයට ගිහිං කනප්පුව පෙරලා, අවුලක් ඇති කරලා, මං හෙමින්ම ආපසු දිවගියා ඇලෙක්ගේ කාමරයට. ඔබ දොඩම් අහුලන අතරේ මට හැකිවුණා ඔහුගේ කබායේ සාක්කුව පරීක්ෂා කරන්න. මං බලාපොරොත්තු වුණු විධියටම ලියුමේ ඉතිරි කැබැල්ල එහි තිබුණා.

එහෙත් එය අතට ගත්තා විතරයි, කනිංහැම්ලා දෙන්නා මා වෙත කඩාපැන්නෙ යක්කු වගේ. ඇත්තමයි ඔබ තිදෙනා මැදිහත් නොවන්න, ඔවුන් එතැනදී, ඒ වෙලාවෙම මාව මරාදමනවා සිකුරුයි.

http://sherlockholmesinvestigations.blogspot.com

ඇලෙක් මගේ ගෙල මිරිකූ හැටි මට මේ දැනුත් දැනෙනවා වගෙයි. සාමදාන විනිශ්චයකාරතුමා, මගේ අත අනෙක් පැත්තට ඇඹරුවේ කොහොම හරි ලියුම මගේ අතින් උදුරාගන්න. ඔවුන්ගේ අපරාධය ගැන සියල්ල මං තේරුම් ගනිපු බව ඔවුන් දැනගත්තා. ඉතින් ඔවුන්ගේ රහස ආරක්ෂා කරගන්න, මගේ ජීවිතය නැතිකරන්න වුණත් ඔවුන් පසුබට වෙන්නේ නෑ.

විලියම් මරා දැමීමට හේතුව මොකක්ද කියලා, මං පස්සේ වයසක කනිංහැම්ගෙන් ඇහුවා. ඔහු සිටියේ කතා කරන්න පුළුවන් තත්ත්වයේ. ඔහුගේ පුත්‍රයා නම් සිටියේ යක්ෂාවේශ වෙලා. ඒ වෙලාවෙ පිස්තෝලය ඔහුගේ අතට අහුවුණා නම්, එවන කාගෙ හරි බැරි නම්, ඔහු තමන්ගේ මොළය හරි සුණු විසුණු කරගන්නවා. තමන්ට විරුද්ධව සාක්ෂි සම්පූර්ණ බවත්, කිසිම ගැළවීමක් නැති බවත් වටහාගත් සාමදාන විනිශ්චයකාරතුමා පාපෝච්චාරණයක් කළා.

එදා රාත්‍රි ඇක්ටන් මහත්මයාගේ ගෙ බිඳපු දවසෙ, විලියම් හොර රහසේම, කනිංහැම් දෙදෙනා පිටුපසින් ඇවිත් තියෙනවා. ඊට පස්සේ පියපුතු දෙදෙනා භයකරමින්, සියල්ල පොලීසියට හෙළිකරන බවට තර්ජනය කරමින්, අයුතු ලාභ ප්‍රයෝජන ගන්න විලියම් උත්සාහ කරල තියෙනවා. ඇලෙක් කනිංහැම් කියන්නේ ඒ වගේ සෙල්ලම් කරන්න හොඳ මිනිහෙක් නෙමෙයි.

ගෙවල් බිඳින හොර කණ්ඩායමක බිය ගම පුරා පැතිර ගියා. ඒ අවස්ථාවෙන් ප්‍රයෝජනය ගන්න හිතූ ඇලෙක් තීරණය කළා, මේ වෙලාවෙ තමන්ගේ සතුරා විලියම් විනාශ කරන්න. මේ විධියට සියුම් ලෙස සැලැසුම් කිරීම, බලාගෙන ගියාම සෑහෙන දක්ෂකමක්. විලියම්ට ඇමක් දීලා, මධ්‍යම රාත්‍රියේ ඔහුව ගෙන්වාගෙන, ඔහුට රහසේම වෙඩි තැබීමට ඔවුන් සමත් වුණා. අර ලියුමෙන් කැබැල්ලක් ඉරී නොයන්න සියල්ලම ආපසු ගත්ත නම්, තවත් සුළු සුළු දේවල් නිසි පරිදි සැලැසුම් කළා නම්, සැකයක් කොහොමටවත් ඔවුන් වෙත එල්ල නොවෙන්න ඉඩ තිබුණා.

"කෝ ඒ ලියුම?"

ගුළි වී තිබූ ලියුම, හෝම්ස් අපට දිගහැර පෙන්නුවේය.

"ඒක මං හිතූ විධියට එකක්ම තමයි. අපි තවමත් හරියට දන්නෙ නෑ, ඇලෙක් කනිංහැම්, විලියම් කර්වන් සහ ඈනී මොරිසන් තුන්දෙනා

http://sherlockholmesinvestigations.blogspot.com

If you will only come round at quarter-to-twelve to the east gate you will learn what will very much surprise you and maybe be of the greatest service to you and also to Annie Morrison. But say nothing to anyone upon the matter

නැගෙනහිර පැත්තේ දොරටුව වෙත දොළහට කාලක්
වෙද්දී ඔබට පැමිණිය හැකි නම් දැනගන්න ලැබේවි
ඔබ පුදුමයට පත්කරවන තොරතුරක් එයින් සමහර විට
ඔබට සහ ඇනී මොරිසන්ට ලොකු
ප්‍රයෝජනයක් අත්වීමට ඉඩ ඇත. නමුත්
මේ ගැන කාටවත් කිසිවක් කියන්න එපා

http://sherlockholmesinvestigations.blogspot.com

එකට සම්බන්ධ වෙන්නෙ කොහොමද කියලා. නමුත් ප්‍රතිඵලයෙන් පෙනෙනවා, උගුල දක්ෂ ලෙස අටවලා, රවටෙන විධියේ ඇමක් දීලා තිබුණා කියන එක.

මෙන්න බලන්න මං අර කිව් ලේ ඥාති සම්බන්ධය p අකුරේ සහ g අකුරේ පහතට දික්වුණු කොටසේ තියෙන හැටි gate සහ greatest වචන දෙක ගැන ඔබේ අවධානය යොමු කරන්න. ඊළඟට i අකුරට උඩින් තිතක් තියන්න වයසක මනුස්සයා අමතක කරල තිබෙන හැටි බලන්න.

මං හිතන්නේ වොට්සන්, විවේකයක් ගතකොට ශරීරය ප්‍රාණවත් කර ගැනීම සඳහා අප ආ ගමන ඉතාම සාර්ථකයි. හෙට උදේ ලන්ඩනයට ආපසු යද්දි මං යන්නෙ ඉතාම හොඳ ශරීර සුවතාවයෙන්."

Reading Purpose Only

http://sherlockholmesinvestigations.blogspot.com

# කල්‍යාණ මිත්‍රයා

Reading Purpose Only. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# කල්‍යාණ මිත්‍රයා

(ෂර්ලොක් හෝම්ස් විසින්ම ලියන ලද කථාන්තරයකි.)

මගේ අභිරහස් පරීක්ෂණ පිළිබඳව වාර්තා සැපයීම දිගින් දිගටම සිදු කරන ලද්දේ මගේ හිතවත් මිතු දොස්තර ජෝන් වොට්සන් විසින් බව ප්‍රසිද්ධ කරුණකි. මෙම වාර්තා සෑම විටකම පාඨකයින්ගේ සිත්ගන්නා අයුරින් ඉදිරිපත් කිරීම ඔහුගේ එකම අරමුණ විය. විද්‍යානුකූලව යමක් නිරීක්ෂණය කළ හැකි, ඉන්පසුව තර්කානුකූලව නිගමනයන්ට එළැඹුණු හැටි, ඒ ගැන විස්තර සහිතව වාර්තා කළ යුතු බව, මා ඔහුට කීවේ වරක් දෙවරක් නොවේ. එම අඩුපාඩුව පෙන්වා දුන් සෑමවිටම ඔහු තරමක් කෝප වූ බව මගේ සිහියට නැගේ.

"හෝම්ස්. ඔබට එහෙ කුරන තාලෙටම කථාව විස්තර කරන්න ඕනෙ නම්, ඔබේ පරීක්ෂණ ගැන විස්තරයත් ඔබම ලියන්න." ඔහු මට පිළිතුරු දුන්නේ නොරිස්සුම් ස්වරයෙනි.

මා මේ විස්තර කිරීමට යන සිද්ධිය 1903 ජනවාරි මාසයේදී, එනම් බෝයර් යුද්ධය අවසන් වූ අලුත් වූ සිදුවීමක් ලෙස මගේ සටහන් පොතේ සඳහන් වී ඇත. මගේ හිත මිත්‍රයා වූ වොට්සන්, මේරි මෝස්ටන් සමග විවාහයෙන් පසු, මා අත්හැර දමා වෙනත් නිවසක පදිංචියට ගියේය. අප දෙදෙනා අතර වූ ළබැඳි මිත්‍රත්වය දිගු කාලයක් පැවැතිණ. ඒ කාලය තුළ ඔහු ආත්මාර්ථකාමී ලෙස කටයුතු කළ එකම අවස්ථාව මෙය පමණක් බව මා සඳහන් කළ යුතුය.

ඉතින් එදා මා හමුවීමට බේකර් වීදියේ අපේ නිවහනට පැමිණියේ ජේම්ස් එම්. ඩොඩ් නම් උස මහත ඉංග්‍රීසි ජාතික තරුණයෙකි. අව්වට පිළිස්සීම නිසා ඔහුගේ මුහුණ මදක් කළු පැහැ ගැන්වී ඇති බැව් මම නිරීක්ෂණය කළෙමි. අපේ සංවාදය ඇරැඹිය යුත්තේ කෙසේද යන්න ගැන ඩොඩ් මහතාට අවබෝධයක් තිබුණේ නැති අයුරකි. මම ඒ සඳහා ඔහුට උදව් වීමට අදහස් නොකෙළෙමි.

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහුගේ නිහඬතාවය මට නිරීක්ෂණය සඳහා වැඩිපුර කාලය ලබා දුන්නේය.

"ඔබ කාලයක් දකුණු අප්‍රිකාවේ ගතකර ආපසු පැමිණි බවයි පෙනෙන්නෙ?"

"ඔව් මහත්මයා." තරුණයා පැවසුවේ පුදුමයෙනි.

"ඉංග්‍රීසි හමුදාවේ අශ්වාරෝහක සංඥා බලකායේ?"

"හරියට හරි හෝම්ස් මහත්මයා. ඔබ ඉන්ද්‍රජාලිකයෙක් වගේ!"

"හැඩිදැඩි තරුණ මහත්මයෙක් මගේ කාමරයට පැමිණෙනවා. ඔහුගේ මුහුණ අව්වට පිළිස්සී දුඹුරු පැහැ වෙලා. එංගලන්තයේ ඉර අව්වෙන් මේ වගේ දුඹුරු පැහැයක් ලබන්න බැහැ. ඔහුගේ ලේන්සුව තියෙන්නේ සාක්කුවේ වෙනුවට නමාපු කමිස අතේ. ඉතින් ඔහු සේවය කළේ කොහේද කියන එක නිගමනය කිරීම අමාරු නැහැ. ඔබේ මුහුණේ තිබෙනවා කෙටි රැවුලක්. ඒකෙන් තේරෙන්නේ ඔබ සාමාන්‍ය පාබළ හමුදාවේ නෙමෙයි කියලා. රැවුලේ මෝස්තරය අශ්වයින් පිට සංචාරය කරන අයගේ මෝස්තරයක්."

"ඔබට හැම දෙයක්ම පෙනේනවා."

"මටත් පෙනෙන්නේ ඔබට පෙනෙන ප්‍රමාණයම තමා. ඒ වුණත් එය හොඳින් නිරීක්ෂණය කොට නිගමනයන්ට එළැඹීමට, මගේ දැසත් මොළයත් මා පුරුදු පුහුණු කරගෙනයි සිටින්නෙ. ඉතින් ඩොඩ් මහත්මයා ඔබ මෙහේට ආවේ මගේ නිරීක්ෂණ - නිගමන ගැන හදාරන්න නෙමෙයි නෙ, මොකක්ද ඔබට ඇති වී තිබෙන ප්‍රශ්නය?"

"මම යුද සේවයට බැඳුණේ මීට අවුරුදු දෙකකට කලින් 1901 ජනවාරි මාසයේදී. ගොඩ්ෆ්‍රි එම්ස්වර්ත් නම් තරුණයාත් හමුදාවට බැඳුණේ මා සමග එකටමයි. අප දෙදෙනාම බැඳුණේ එකම සංඥා බලකායට. ඔහු තමා කර්නල් එම්ස්වර්ත්ගෙ එකම පුතා. ඔබ සමහර විට කර්නල් එම්ස්වර්ත් ගැන අහලත් ඇති. ක්‍රිමියානු යුද්ධයට සහභාගි වෙලා ඔහු දක්වූ විශිෂ්ට දක්ෂකම් වෙනුවෙන් ඔහු වික්ටෝරියා කුරුසිය පදක්කම දිනාගත්තා. තාත්තගෙ ලේ වලින් ආ සටන්කාමී බව පුතාටත් තිබුණා. ඉතින් ඔහු හමුදාවට බැඳුණු එකේ පුදුමයක් තිබුණේ නෑ.

http://sherlockholmesinvestigations.blogspot.com

ඊට වඩා හොඳ කොල්ලෙක් අපේ රෙජිමේන්තුවටම හිටියෙ නෑ. අපි දෙන්නා අතර දැඩි මිත්‍රත්වයක් ඇතිවුණා. එකට කාල බීලා, දුකටත් සැපටත් එකට මුහුණ දෙන කොට ඇතිවෙන බැඳීම මොන වගේද කියලා ඔබට තේරුම් ගන්න පුළුවන් ඇති. ඔහු තමයි මගේ ප්‍රාණ මිත්‍රයා වුණේ. හමුදාවෙ ඉන්න කොට එහෙම මිත්‍රකමක් කියන්නෙ වචනයෙන් විස්තර කරන්න බැරි තරම් ලොකු මිතුදහමක්. අවුරුද්දක් තිස්සේ, බොහොම දරුණු සටන්වලදී අපි දෙන්නා මුහුණ දුන්නෙ එකටමයි.

ප්‍රිටෝරියාවට නුදුරින් තියෙනවා දියමන්ති කන්ද කියලා තැනක්. ඒකෙදි කළ සටනකදී අලිතුවක්කුවක වෙඩි උණ්ඩයක් වැදිලා ගොඩ්ෆ්‍රි බරපතල තුවාල ලැබුවා. ඔහු වෛද්‍ය ප්‍රතිකාර සඳහා අරගෙන ගිය බවයි මට අහන්න ලැබුණෙ. මට දිගටම සටන් පෙරමුණට යන්න සිදුවුණා. ඔහුගෙන් මට එක ලියුමක් ලැබුණා, කේප්ටවුන් රෝහලේ ඉඳලා. ඊට ටික කලකට පස්සේ තවත් ලියුමක් ලැබුණා. ඒක තැපැල් කරල තිබුණේ සවුත්හැම්ටන් වලින්. ඊට පස්සෙ මාස හයකට වැඩි කාලයක් ගතවුණා, ඔහු ගැන කිසිම ආරංචියක් ලැබුණේ නැහැ. එකම ලියුමක් වත් ඔහු ලියුවෙත් නැහැ. අපේ තිබුණු මිත්‍රත්වයේ හැටියට ගොඩ්ෆ්‍රිගෙන් එහෙම දෙයක් මට බලාපොරොත්තු වෙන්න බෑ.

යුද්ධය අවසන් වෙලා අපට ආපසු එන්න ලැබුණා. මං තීරණය කළා ගොඩ්ෆ්‍රි ගැන සොයා බලන්න. ගොඩ්ෆ්‍රි ඉන්නෙ කොහේද කියල දන්වන්න කියලා මං කර්නල් එම්ස්වර්ත්ට ලියුමක් යැව්වා. ඒකට මට උත්තරයක් ලැබුණෙ නැහැ. ටික දවසක් බලාගෙන ඉඳලා මං ඔහුට ලියුවා, තවත් ලියුමක්. ඔන්න ඒකට ලැබුණා පිළිතුරක්. නමුත් ඒක බොහොම කෙටි, රළු පිළිතුරක්. ඒකෙ කියල තිබුණෙ 'ගොඩ්ෆ්‍රි ලෝකෙ වටේ සංචාරයක ගියා. තවත් අවුරුද්දකටවත් ඔහු ආපසු එන එකක් නැහැ.' එච්චරයි.

මේ පිළිතුරෙන් මං සෑහීමට පත්වුණේ නැහැ හෝම්ස් මහත්මයා. මෙතන මොකක් හරි අස්වාභාවික ගතියක් ඇති බව මට තේරුණා. ගොඩ්ෆ්‍රි හොඳ කොල්ලෙක් බව මං ඔබට කිව්ව නේ. ඔහු ඒ තරම් පහසුවෙන් මිත්‍රයෙක්ව අමතක කරල දමන ජාතියෙ කෙනෙක් නෙමෙයි. තවත් කාරණයක් මං දැන හිටියා. ඒ තමයි ඔහු විශාල ධනයකට උරුමකම් කියූ බව. ඒ වගේම ගොඩ්ෆ්‍රි ඔහුගේ පියාගේ අණසකට ඒ

http://sherlockholmesinvestigations.blogspot.com

තරම්ම කීකරු නොවූ කෙනෙක් බව. තාත්තත් පුතත් අතරේ ඒ හැටි සමගියක් තිබුණේ නැහැ. එයපනු එම්ස්වර්ත් සමහර වෙලාවට ඒකාධිපතියකු ලෙස ක්‍රියා කළ බවත්, ගොඩ්ෆ්‍රි ඊට කැමැත්තක් නොදක්වූ බවත් මං දැන හිටියා.

ඒ නිසා කර්නල් එම්ස්වර්ත්ගෙන් ලැබුණු කෙටි පිළිතුරෙන් මම කොහොමටවත් සෑහීමකට පත්වුණේ නැහැ. මං තීරණය කළා මගේ මිත්‍රයාට අත්වුණු ඉරණම කුමක්ද කියල හොයල බලන්න. නමුත් මගේ පවුලේ පෞද්ගලික ප්‍රශ්න නිසා මේ කටයුත්ත දිනෙන් දින කල් ගියා. ඉතින් මේ වැඩේට බහින්න මට ඉඩක් ලැබුණේ මේ සතියෙයි. දැන් ඉතින් මේ වැඩේ පටන් ගත්ත නිසා මේකෙ කෙළවරක් දකලා මිසක් නවත්වන්න මං කැමැති නැ."

ජේම්ස් ඩොඩ් තරුණයාගේ මුහුණෙන් ප්‍රකාශ වූයේ මිතුරෙක් වෙනුවෙන් ඕනෑම කැපකිරීමක් කිරීමට ඔහු සූදානම් අතර, යමෙක් හා අමනාප වුවහොත් ඉතා දරුණු සතුරෙක් ද විය හැකි බවයි.

"ඉතින් ඔබ මොකද කළේ?"

"මං කල්පනා කළේ මුලින්ම ගොඩ්ෆ්‍රිගේ නිවස වන ටක්ස්බරි ඕල්ඩ් මන්දිරයට ගිහිං හොයල බලන්න. ඔහුගේ පියාගෙන් මං සෑහෙන්න බැට කෑව නිසා, මං කල්පනා කළා මෙවර ඔහුගේ මවට ලිපියක් ලියන්න. ගොඩ්ෆ්‍රි මගේ කල්‍යාණ මිත්‍රයා බවත්, අවස්ථාවක් ලැබුණොත් අපි දෙන්නා එකට මුහුණ දුන්නු නොයෙකුත් අත්දැකීම් ගැනත් ඇයට පැවසිය හැකි බව මං ලිව්වා. වෙනත් අවශ්‍යතාවයක් සඳහා මං ඔය ප්‍රදේශයට පැමිණෙන නිසා, එම්ස්වර්ත් පවුලේ විරුද්ධත්වයක් නැත්නම්, ඔවුන්ගේ ගෙදරට ගොඩවදින්න කැමැති බවත් මං ඇයට දැන්නුවා. මට ඇයගෙන් ලැබුණා සතුටුදායක පිළිතුරක්. ඇය දන්වා තිබුණා ඇගේ නිවසේ, එක් රාත්‍රියකට මට නවාතැන් දීමට සතුටු බව. අන්න ඒ නිසයි සඳුදා මං එහේ ගියේ.

ටක්ස්බරි ඕල්ඩ් මන්දිරය තිබෙන්නේ මහා ඈත පිටිසර, පාළු ගම්මානයක් මැද්දෙ. මොන දුම්රිය පොළකින් බැස්සත් හැතැක්ම පහකට වැඩිදුරක් ගමන් කරලා මිසක් එහේට ළඟාවෙන්න බෑ. මම දුම්රියෙන් බැස්සාමයි දැනගත්තේ, එතැන කුලියට ගන්න අශ්ව කරත්තයක්වත් නොමැති බව. ඉතින් මගේ සූට්කේස් එකත් අතින් එල්ලාගෙන, මං ඒ හැතැක්ම පහම පයින් ගියා. මං ඒ නිවසට ළඟා වෙනකොට ඇඳිරි වැටෙන්නත් පටන් අරගෙන.

http://sherlockholmesinvestigations.blogspot.com

ටක්ස්බරි ඕල්ඩ් උද්‍යානය, මහා විශාල වනාන්තරයක් වගේ උද්‍යානයක්. මන්දිරය පිහිටා තිබුණෙ ඒක මැද්දෙ. ඒක බොහොම පෞරාණික, ඒ වගේම විශාල එකක්. යුග කිහිපයක ගෘහනිර්මාණ ශිල්පයන් අනුව එහි කොටස් වරින් වර නිමවෙලා තිබුණා. මං හිතන්නේ එය එලිසබෙත් යුගයේ දවසයෙන් කළ අත්තිවාරමක් මත, වික්ටෝරියානු යුගයේ සම්පූර්ණ කළ ගොඩනැගිල්ලක්. හැමතැනම අඳුරු සෙවණැලි වලින් පිරුණු මේ මන්දිරය, මහා අභිරහස් තැනක් වාගෙයි මට පෙනුණෙ.

නිවසේ ගෘහ පාලකයා, රැල්ෆ් කියල් ගේ වගේම වයස්ගත වුණු කෙනෙක්. වයස්ගත වූ කාන්තාවක් වූ ඔහුගෙ බිරිඳත් මට හමුවුණා. ගොඩ්ෆ්‍රි කුඩා කාලයේ ඔහුට කවල පොවල ඔහු හදාවඩා ගත්තේ ඇයලු. ඔහු ඉතා ආදරය කළ මේ කාන්තාව දෙවැනි වන්නේ මවට පමණයි කියලා, ගොඩ්ෆ්‍රි කිව්වා මට මතකයි. එම්ස්වර්ත් මහත්මිය, කුඩා සිරුරක් ඇති, සුදුමැලි, කරුණාවන්ත කාන්තාවක්. එහෙදි මගේ හිතට ඇල්ලුවෙ නැත්තේ ගොඩ්ෆ්‍රිගේ පියා කර්නල් එම්ස්වර්ත් පමණයි.

ගෙදරට ගිය හැටියෙම ඔහු මාත් එක්ක රණ්ඩුවකට පැටළුණා. එවේලේම ආපහු හැරිල ගෙදර එන්නයි මට එක්වරම හිතුණෙ. ආයෙත් මට කල්පනා වුණා, සමහර විට ඒක ඔහුගෙ උපායක් වියහැකි බව. මං එවේලේම ආපහු හැරිලා ගියා නම්, ඒක ඔහුට කරන උදව්වක් වීමට ඉඩ ඇති බව මගේ හිත කිව්වා. ටක්ස්බරි ඕල්ඩ් මන්දිරයට ගොඩවැදුණු ගමන් මාව යැවුණේ කර්නල්ගේ කන්තෝරු කාමරයට. යමක් ලියමින් ඔහු මේසය ළඟ වාඩිවෙලා හිටියා. ඔහු ප්‍රමාණයෙන් විශාල, උස, මහත, තරමක් කොන්ද කුදු ගැසුණු පුද්ගලයෙක්. ඔහුගේ මුහුණ පැසුණු දිග රැවුලකින් වැහිලා. නාසය ගිජු ලිහිණියෙකුගේ හොටයක් වගේ උල්, වක් වූ එකක්. එහි ලේ නහර එළියට මතුවී පෙනුණා. ඝන ඇහිබැම අස්සෙන් ඔහු ඇස් මා වෙත යොමු කළේ ගොදුරක් දිහා බලන ගිජුලිහිණියෙක් වගෙයි. ගොඩ්ෆ්‍රි ඔහුගේ පියා ගැන ආදරයෙන් පිහි කළේ බොහොමත්ම කලාතුරකින්. ඒ ඇයිද යන්න, ඒ වෙලාවෙ මට හොඳින් තේරුම් ගැනීමට හැකිවුණා.

"මං කැමතියි දැනගන්න ඔබ මෙහේ ආව ගමනේ හේතුව ඇත්තටම මොකක්ද කියලා?"

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහු කථා කළේ, මොට කියතකින් ලෑලි කපන්නාක් වැනි අමිහිරි, ගොරෝසු හඬකින්.

"ඔබේ බිරිඳට මං එවපු ලියුමේ කියා ඇති මං මෙහේ ආව කාරණය මොකක්ද කියලා."

"ඔව් ඔව්. ඔබ කියල තිබුණ නේ දකුණු අප්‍රිකාවෙදී ගොඩ්ෆ්‍රිව හඳුනාගෙන සිටි බව. ඒ වුණත් ඕක ඇත්තද බොරුද කියල අපි කොහොමද දන්නෙ? ඔය කාරණාව ඇත්තයි කියන්න, ඔබේ කට වචනය පමණයි අපට විශ්වාසෙට ගන්න තියෙන්නෙ."

"මහත්මයා. මගේ සාක්කුවේ තියෙනවා ගොඩ්ෆ්‍රි මට එවූ ලියුම්. මං ඒව ඔබට පෙන්වන්නද?"

"කෝ දෙන්න බලන්න."

මා ඔහු අතට දුන් ලිපි දෙක නොසැලකිල්ලෙන් කියවා බැලූ ඔහු, ඒවා ආපසු මං දෙසට විසි කළා.

"හරි. මොනවද ඔබට දැන් ඉතින් උවමනා කරන්නෙ?"

"මහත්මයා. මං ඔබේ පුත්‍රයා ගොඩ්ෆ්‍රි එක්ක හරිම හිතවත්. අපි දෙන්නා අතරේ තිබුණේ දැඩි මිත්‍ර සම්බන්ධතාවයක්. අපේ ඒ ලෙන්ගතුකම බොහොම වැඩිවුණේ අපි එකට මුහුණ දීපු නොයෙක් නොයෙක් අත්දැකීම් රාශියක් නිසා. ඉතින් එක්වරම ඔහුගේ පැත්තෙන් මේ වගේ නිහඬතාවයක් ආවම, මං විමසිලිමත් වීම පුදුමයක්ද? මං දැනගන්න කැමැතියි ඇත්තටම ඔහුට මොකක්ද සිද්දවුණේ කියල?"

"මහත්මයා. මට හොඳට මතකයි ගොඩ්ෆ්‍රිට මොකක්ද වුණේ කියල ඔබට ලිපියක් මගින් දන්වලා එවූ බව. ඔහු ලෝකය වටේ මුහුදු සංචාරයක ගිහින්. මේ අප්‍රිකාවේ ගතකළ කාල පරිච්ඡේදයේදී ඔහුට මුහුණ දෙන්න සිදුවුණු තත්ත්වයන් තමා ඒකට හේතු වුණේ. ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය බොහොම කණගාටුදායක ලෙස පිරිහී තිබුණා. මමත්, ඔහුගේ මවත් තීරණය කළා, අපේ පුතාට සම්පූර්ණ විවේකයක් සහ පරිසරයේ වෙනසක් අවශ්‍ය බවට. එච්චරයි. ඊළඟට මතක තියාගන්න; තවත් කවුරු හරි මිත්‍රයින්ට මගේ පුතා ගැන තොරතුරු දැනගන්න උවමනා නම් ඔවුන්ටත් මේ ආරංචිය දෙන්න."

"සත්තකින්ම මං එහෙම කියන්නම්. ඒත් මං කැමැතියි දැනගන්න ගොඩ්ෆ්‍රි ලෝකෙ වටේ සංචාරය කළේ කුමන නැව් සමාගමකට

http://sherlockholmesinvestigations.blogspot.com

අයත් නැවකද කියලා? ඒ නැවේ නමත්, ඔහු එංගලන්තයෙන් පිටවී ගිය දිනයත් මට කියන්න. මට විශ්වාසයි නැව් සමාගම මගින් මගේ මිත්‍රයාට ලැබෙන විධියට ලිපියක් මට යවන්න හැකිවේවි කියල."

මගේ මේ ඉල්ලීමෙන් කර්නල් වරයාගේ එක්වරටම මුහුණ පාන්න සිදුවුණේ මහා ගැටලුවකට බව මට තේරුණා ගියා. ඒ විතරක් නෙමෙයි ඒ ප්‍රශ්නයෙන් ඔහු දැඩි කෝපයටත් පත්වුණා. තත්පර කිහිපයක් ඔහු ඇඟිල්ලෙන් මේසයට තට්ටු කරමින් හිටියේ නොඉවසිල්ලෙන්. කෝපය මැඩපවත්වාගෙන, ඊළඟට ඔහු කථා කළේ තීරණාත්මක අයුරෙන්.

"ටොඩ් මහත්තයා, ඔබ මේ ක්‍රියා කරන්නෙ බොහොම වැරදි පිළිවෙළකට. කෙනෙකුට කියන්න පුළුවන්, ඔබ මේ කරන්නෙ ඉතාම දුෂ්ට විධියට අපේ පෞද්ගලික දේවල් වලට ඇඟිලි ගැහීමක් කියලා. මට නං හිතෙන්නේ ඔබ දැන් ඒකෙ සීමාව ඉක්මවා යන්නයි හදන්නේ."

"එමස්වර්ත් මහත්මයා, මං මේ හැම දෙයක්ම කරන්නේ ඔබේ පුත්‍රයා ගැන ඇති සැබෑ සහෝදර ප්‍රේමය නිසයි."

"හරි හරි. ඒ හින්දම තමයි මමත් මෙච්චර වෙලාවක් ඉවසුවේ. දැන් මම ඔබට කියන්න කැමතියි, ඔය කරන විමසීම් හැම දෙයක්ම මෙතැනින් නවත්වන්න කියලා. ඕනෙම පවුලක ඔවුන්ගේ පෞද්ගලික ප්‍රශ්න හා අරමුණු තියෙනවා. ඒවා හැමදෙයක්ම පිට අයට හෙළි කළයුතු ඒවා නෙමෙයි. මොන තරම් හොඳ අරමුණකින් ඉල්ලීම් කළත්, හෙළිකළ නොහැකි ඒවා තිබෙන්න පුළුවනි.

මගේ බිරිඳ බොහොම කැමැති වෙච්ච ගොඩ්ෆ්‍රි දකුණු අප්‍රිකාවේ ගතකළ කාලයේ මුහුණ දුන් අත්දැකීම් ගැන අහන්න. ඔබට පුළුවනි ඔහුගේ අතීතය ඇයට කියාදෙන්න. නමුත් මං ඔබෙන් ඉල්ලා හිටිනවා ගොඩ්ෆ්‍රිගේ වර්තමානය හා අනාගතය ගැන හාරා අවුස්සන්න එපා කියලා. ඒ අනවශ්‍ය දේවල් අහල අපව අපහසුතාවයට පත්කරන්න එපා කියලා."

ඉතින් හෝම්ස් මහත්මයා, ඔන්න ඔය විධියට අපි කථාවේ අවසානයට ආවා. මට එතැනින් එහාට යන්න ක්‍රමයක් තිබුණේ නැහැ. ඒ තත්ත්වය පිළිගන්නා බව අඟවලා මං එතැනින් නැගිට්ටා. නමුත් මගේ හිත ඇතුළේ මං දැඩි අධිෂ්ඨානයක් කරගත්තා. මගේ මිත්‍රයාට අත්වූ ඉරණම හොයාගෙන මිසක් මගේ වැඩ පිළිවෙළ නවත්වන්නේ නැහැ කියලා.

http://sherlockholmesinvestigations.blogspot.com

එදා රාත්‍රිය කිසිම උද්‍යෝගිමත් ගතියක් නොතිබුණු අප්‍රසන්න එකක් වුණා. මේ නිවසේ කෑම කාමරය මහා අන්ධකාර පාළු එකක්. අපි තිදෙනා කෑම ගත්තේ වැඩි කතාබහකින් තොරවයි. ගොඩ්ෆ්‍රිගේ මව දිගින් දිගටම ඇගේ පුතාගේ පරණ තොරතුරු ඇහුවා. ඒත් කර්නල් එම්ස්වර්ත් සිටියේ කිසිදෙයක් නොරුස්සනා ආකාරයට, කේන්තියෙන් වගේ. එතැන පරිසරය මට හොඳටම තිත්ත වුණා. කෑම කාලා ඉවරකළ හැටියෙම, තවත් කතාබහට නොඉඳ මම හැකි ඉක්මනින්ම නිදන කාමරයට ගියා. ඒක පහළ තට්ටුවේ තිබුණු විශාල කාමරයක්. ඉතාම සුළු වශයෙන් ලී බඩු තිබුණු මේ කාමරය ගේ වගේම මුසල පෙනුමක් තිබූ එකක්. නමුත් හෝම්ස් මහත්මයා අවුරුද්දක් දකුණු අප්‍රිකාවේ කැලෑවේ රළු ජීවිතයකට මුහුණ දුන් කෙනෙකුට, නිදාගන්න ලැබෙන තැන ඒ හැටි ප්‍රශ්නයක් නෙමෙයි.

ඒ කාමරයට තිබුණු විශාල ජනේලය ආවරණය කළ තිරරෙදි ඇත් කරලා මං ගෙවත්ත දිහා වීදුරුවෙන් බලාගෙන හිටියා. එය අඩසඳකින් එළිය වුණු, වැහිවලාකුළෙන් තොර, පැහැදිලි අහසක් තිබුණු රාත්‍රියක්. ඊට පස්සේ ගිනි උදුන අසලින් වාඩිවෙලා, මේසය මත තිබුණු ලාම්පුවේ එළියෙන් නවකතා පොතක් කියවන්න මං තීරණය කළා. මට උවමනා වුණේ මගේ හිත මේ මුසල පරිසරයෙන් වෙනත් පැත්තකට යොමු කරන්න. මගේ එම කාර්යයට බාධා කරමින් ගෘහ පාලකයා රැල්ෆ් කාමරයට ආවා. ඔහු ආවේ ගිනි උදුනට දැමීම සඳහා අලුතෙන් අඟුරු තොගයක් අරගෙන.

"මහත්මයා. රෑට අඟුරු ඉවරවෙලා උදුනේ ගින්දර නිමුණොත් ඔබට කරදර වෙනවා. ඒ නිසයි මං වැඩිපුර අඟුරු ගෙනාවේ. මේ පළාතේ දේශගුණය හරි සීතලයි. මේ කාමරය විශේෂයෙන්ම සීතලයි."

කාමරයෙන් පිටවී යාමට සූදානම් වුණු ඔහු මදක් පැකිළුණා. ඔහු මගේ මුහුණ දිහා බලාගෙනයි සිටියේ. ඔහුගේ රැළි වැටුණු මුහුණේ තිබුණේ හරිම ශෝකාතුර බවක්. මට හිතුණා ශෝකයෙන් යටපත් කරගෙන හිටි රහසක් ලතුණු, රැල්ෆ්ගේ මුහුණෙන් පිළිබිඹු වුණාද කියල.

"මට සමාවෙන්න මහත්මයා. ඔබතුමා රෑ කෑම ගන්න වෙලාවේදී අපේ ගොඩ්ෆ්‍රි පුංචි මහත්තයා ගැන කිව්ව කරුණු මටත් ඇහුණා.

http://sherlockholmesinvestigations.blogspot.com

ඔබ අහල ඇති නේද අපේ පුංචි මහත්තයාව, පුංචි කාලෙදි අම්ම කෙනෙක් වගේ රැක බලාගත්තෙ මගේ බිරිඳ බව? ඔහු මටත් හරි ආදරයක් දක්වුවා. මගේ බිරිඳ මව් කෙනෙක් නම්, මමත් පියෙක් වගේ ඔහුගේ දුක සැප බැලුවා. ඔබතුමා කිව්වා නේද අපේ පුංචි මහත්තයට හමුදාවෙ ඉහළ තනතුරක් තිබුණා කියල?"

"ඒක සම්පූර්ණ ඇත්තයි රැල්ෆ්. ඒ තරම් ශ්‍රේෂ්ඨ, නිර්භීත මිනිහෙක් අපේ රෙජිමේන්තුවෙම හිටියෙ නෑ. එක සැරයක් බෝයර්වරුන්ගේ රයිෆල් තුවක්කු වල වෙඩි පහරට ගොදුරු වෙලා මං වැටෙද්දි, ගොඩ්ෆ්‍රි මා බේරගත්තේ ඔහුගේ ජීවිතය පරදුවට තියල. එදා ඒ වෙලාවෙ ඔහු එතැන නොහිටියා නම් ඔබලහකට මං මැරිලා."

වයස්ගත රැල්ෆ් සතුටින් දෑත් පිරිමැද්දා.

"ඔව් මහත්මයා. ගොඩ්ෆ්‍රි පුංචි මහත්මයාගෙ හැටි කවදාටත් එහෙම තමයි. හරිම ධෛර්යවන්තයි. කිසිදේකට භය නෑ. ඔහු මුදුනටම නැගපු නැති ගහක් මේ වත්තෙ කොහේවත් නෑ. ඔහු නිර්භීත කොල්ලෙකුව සිටියා. ඔහු නිර්භීත මිනිහෙකුව සිටියා."

ඒ කතාවට මාව ඉබේම පුටුවෙන් නැගිටුණා.

"මේ බලන්න රැල්ෆ්. ඔබ කිව්ව ඔහු නිර්භීත මිනිහෙකුව සිටියා කියලා. ඔහේ කතා කරන්නෙ හරියට ගොඩ්ෆ්‍රි මැරිලා වගේ. මොකක්ද මෙතන සිද්ධ වෙලා තියෙන්නෙ? මොකක්ද මෙහේ තියෙන අභිරහස. ගොඩ්ෆ්‍රි එම්ස්වර්ත්ට මොකද වුණේ?"

මං වයසක මනුස්සයාගේ උරහිසෙන් තදින් අල්ලාගෙන ප්‍රශ්න කළා. ඔහු මගේ ග්‍රහණයෙන් ගැළැවී ගියේ ඒවාට පිළිතුරු දෙන්න නොකැමැත්තෙන්.

"ඔබ මේ අහන්නෙ මොනවද කියල මට තේරෙන්නෙ නෑ මහත්තයා. පුංචි මහත්තයා ගැන ඔබට තියෙන ප්‍රශ්න ලොකු මහත්තයාගෙන් අහන්න. ඒවාට පිළිතුරු දන්නේ ඔහු. මට මේවට අතදාන්න අයිතියක් නෑ."

එහෙම කියපු රැල්ෆ් සූදානම් වුණේ කාමරයෙන් පිටවෙලා යන්නයි. මං ඔහුගේ අතෙන් අල්ලා ගත්තා.

"මේ අහනවා. මේ ප්‍රශ්නයට උත්තර දුන්නෙ නැත්නම් මං ඔහේට මෙතැනින් යන්න දෙන්නෙ නෑ. නියම පිළිතුර දෙනකං රැ

http://sherlockholmesinvestigations.blogspot.com

එළිවෙනකම්ම හරි ඔහේව මේ විදිහටම අල්ලාගෙන ඉන්නවා. මට කියන්න, ගොඩ්ෆ්‍රි මැරිලද?"

මහලු සේවකයාට මගේ මූහුණ දිහා බලන්න පුළුවන් කමක් තිබුණේ නැහැ. ඔහු මෝහනයට පත්වුණු කෙනෙක් වගේ වුණා. මං කොයිතරමක් ඔහුගෙන් ප්‍රශ්න ඇහුවාද? අන්තිමට ඔහුගේ කටින් පිළිතුරක් ඇදල ගත්තේ බොහොම අමාරුවෙන්.

"මං දෙවියන්ට කියන්නේ ගොඩ්ෆ්‍රි පුංචි මහත්තයා මැරුණා නම් මීට හොඳයි." එහෙම කිව්ව ඔහු මගෙන් ගැලවිලා කාමරයෙන් පිටවී ගියා.

මං යළිත් පුටුවේ වාඩිවුණේ සන්සුන් සිතකින් නම් නෙමෙයි. මහලු සේවකයාගේ වචනවලින් මට එන්න පුළුවන් වුණේ එකම නිගමනයකටයි. පැහැදිලිවම මගේ මිත්‍රයා කුමක් හෝ භයානක අපරාධයක පැටලිලා. එහෙමත් නැත්නම් අඩුම වශයෙන් ඔවුන්ගේ පවුලට ලොකු අවමානයක් ගෙනදෙන විදියේ ප්‍රශ්නයක පැටලිලා. දරුණු ඒකාධිපතියෙක් වන ගොඩ්ෆ්‍රිගේ පියා, පවුලේ නමට අපකීර්තියක් වේවි කියලා පුතාව කොහේ හරි යවලා. නැත්නම් ඔහුව ලෝකයෙන් සඟවලා.

ගොඩ්ෆ්‍රි ක්ෂණිකව තීරණ ගන්නා දඩබ්බර තරුණයෙක්. ඔහු ඇසුරු කරන මිත්‍රයින් ඒ වෙලාවට කරන කියන දෙයට වැඩිදුර හිතා නොබලා එකඟ වෙන කෙනෙක්. මං හිතන්නේ ඔහු නරක ආශ්‍රයට වැටිලා, අනාගත ජීවිතය විනාශ වෙන තත්ත්වයකට පත්වෙලා. ඒක ඇත්තෙන්ම බොහොම කණගාටුදායක දෙයක්. නමුත් කල්‍යාණ මිත්‍රයෙක් හැටියට මගේ යුතුකම ඔහු ගැන හොයා බලන එකයි. මගේ යුතුකම ඔහු පත්වෙලා තිබෙන අපකීර්තිය හෝ කරදරය මොකක්ද කියලා හොයල බලලා, හැකි තරමින් ඔහුට පිහිට වීමයි. මං පුටුවට වෙලා දීර්ඝව මේ විදියට කල්පනා කරලා හිස එසෙව්වා.

දෙයියෝ සාක්කි! හෝම්ස් මහත්මයා මෙන්න ගොඩ්ෆ්‍රි එම්ස්වර්ත් ඉන්නවා මං දිහා බලාගෙන!!

ඔව් හෝම්ස් මහත්මයා. ඔහු සිටියේ මගේ කාමරයේ ජනේලයෙන් පිටත. ඔහුගේ මූහුණ වීදුරුවට තදකරගෙන මා දිහා බලාගෙන හිටියා. මං ඔබට කලින් කිව්වා, මං ජනේලයේ තිර රෙදි දෙපසට කළ බව. ඒ ඉඩ ප්‍රමාණයේම ඔහුගේ මුළු ශරීරයම දකිය

http://sherlockholmesinvestigations.blogspot.com

හැකි වුණා. ඒ ජනේල උඩ සිට පොළොව දක්වාම තිබුණු දිගු ජනේල. ඔහුගේ ශරීරයම මං දුටුවා. නමුත් මා දැඩි විස්මයකට පත් කළේ ඔහුගේ මුහුණ. ඔහුගේ මුහුණ මළමිනියක් මෙන් සුදුමැලි වී තිබුණා. මං ජීවිතේට දැකලා නෑ ඒ තරම් සුදුමැලි මුහුණක්. මට හිතෙන්නේ අවතාරයකට නම් තියෙන්න පුළුවනි ඒ වගේ පාටක්. ඔහු මා වෙත නෙත් යොමු කරගෙනයි සිටියේ. මා ඔහු දෙස බලන බව දැනගත් විහාම ඔහු පිටුපසට පැන්නා. ඊට පස්සේ ඔහු අන්ධකාරයේ අතුරුදහන් වුණා!

මගේ මිත්‍රයාගේ පෙනුමේ, මා දැඩිලෙස කම්පනයට පත්කළ යම්කිසි දෙයක් තිබුණා. හෝම්ස් මහත්මයා. ඒක අර අස්වාභාවික විධියට සුදුමැලි වුණු මුහුණ පමණක්ම නෙමෙයි. ඊට වඩා බොහොම ගැඹුරු සූක්ෂ්ම දෙයක්. ඔහුගේ මුහුණෙන් ප්‍රකාශ වුණේ යම්කිසි අපරාධයක් නිසා ලැජ්ජාවෙන් පසුතැවෙනවා වගේ හැඟීමක්; මහ හොර වංචා සහගත පෙනුමක්. මගේ මිත්‍ර හමුදා හටයාගේ කිසිදාක දක්නට නොතිබුණු බැල්මක්. මේ දර්ශනයෙන් මගේ සිතේ ඇතිවුණේ අප්‍රමාණ භීතියක්, කම්පාවක්.

නමුත් දකුණු අප්‍රිකාවේ බෝයර්වරු එක්ක අවුරුද්දක් දෙකක් දරුණු සටන් වලට මුහුණ දීපු මිනිහෙක්, ඒ හැටි වෙලාවක් භයට හෝ කම්පාවට පත්වෙලා ගත කරන්නෙ නෑ. ගොඩ්ෆ්‍රි ජනේලයෙන් අතුරුදන් වුණු විහාම මං ඒතැනට පැන්නා. ජනේලයේ තිබුණේ මහා පරණ හිරවුණු අගුලක්. ඒක ඇරගන්න මට ටිකක් වෙලා ගියා. ජනේලය ඇරුණු හැටියෙම මං ඒනෙන් එළියට පැනලා දිව්වේ ගොඩ්ෆ්‍රි දුවන්න ඇති කියලා මට හිතුණු පැත්තටයි.

හඳ එළියෙන් මට දකින්න ලැබුණා වත්ත මැදින් වැටී තිබුණු අඩිපාරක්. ඒක සෑහෙන දුරකට වැටී තිබුණු එකක් වගේ මම දුටුවා. විශාල ගස් නිසා සඳ එළියත් ඒ තරමම හොඳින් වැටී තිබුණේ නැහැ. නමුත් ඉදිරියෙන්, තරමක් ඈත යම්කිසිවෙකු චලනය වන ඡායාවක් වගේ මට අඳුරෙම පෙනුණා. මං ඔහුගේ නම කියා කෑගසමින් ඒ පසුපස දිව්වා. නමුත් වැඩක් වුණේ නැහැ. කිසිවෙකු නැවතුණු බවක් පෙනුණෙත් නැහැ. අඩිපාර කෙළවරට ආවාම, ඒක කිහිප අතකට බෙදී ගිය බව මම දුටුවා. ඒ හැම අඩිපාරක්ම කෙළවර වුණේ කුඩා ගෙයකින්. මම මඳක් පැකිළෙමින් තත්පර කිහිපයක් එතැන රැඳී සිටියා. එතකොටම මට ඇහුණා එක ගෙයක දොර වහන ශබ්දයක්.

http://sherlockholmesinvestigations.blogspot.com

ඒකෙන් තේරුණේ මං දැකලා තියෙන්නෙ අවතාරයක් නෙමෙයි කියන එකයි. ගොඩ්ෆ්‍රි මාව දැකලා දුවලා ගිහින් ගේකට වැදිලා දොර වහගත්තා වෙන්න ඇති. ඇත්ත තත්ත්වය ඒකයි යන හැඟීම මගේ හිතට හොඳටම කාවැදුණා.

මට කරන්න වෙන කිසි දෙයක් ඉතුරු වෙලා තිබුණෙ නැහැ. මං ආපහු කාමරේට ඇවිත් නිදාගන්න තැත් කළා. නමුත් දිගින් දිගටම මගේ හිතට ආවෙ, මෙම්ම සිද්ධිමයි. මෙතන සැඟවී ඇති සත්‍යය මොකක්ද? මා දුටු කරුණු අනුව උපකල්පනය කළ හැක්කේ කුමක්ද? මේ විධියට කල්පනා කරමින් මං මුළු රාත්‍රියම ගෙවුවේ නිදි නැතුව.

පහුවදා උදේ මට අඳුනුණා, කර්නල්ගේ රළු භාවය අඩුවෙලා තරමක් සාමකාමී බවකට පැමිණ ඇති ආකාරයක්. මේ ප්‍රදේශයට නුදුරුව නැරඹීමට සුදුසු ස්ථාන කිහිපයක් ඇති බව එම්ස්වර්ත් මහත්මිය මට කිව්වා. මං ඔවුන්ගෙන් ඇහුවා, තවත් එක් රාත්‍රියක් මං එහි නතර වුණොත් ඒක ඔවුනට කරදරයක්ද කියලා. ඔහුගේ හිතට වැඩිය ඇල්ලුවේ නැති වුණත්, නාකි මිනිහා අකමැත්තෙන් ඊට එකඟවුණා. දැන් මගේ හිතේ ඇති සැකය ඉවත් වෙන විධියේ සොයා බැලීමක් කරන්න මට සම්පූර්ණ දවසක් තිබෙනවා. මට හොඳටම විශ්වාසයි, මේ නිවස කිට්ටුව කොහේ හරි තැනක ගොඩ්ෆ්‍රි හැංගිලා ඉන්න බව. නමුත් හරියටම ඔහු ඉන්නෙ කොතැනකද? එහෙම ඉන්න හේතුව කුමක්ද යන එක මම දන්නේ නෑ.

ටක්ස්බරි ඕල්ඩ් මන්දිරය, මහා විශාල, පැරණි, අබලන් වූ එකක්. යුද්ධ හමුදාවේ සම්පූර්ණ බල ඇණියකට මේක ඇතුළේ හැංගෙන්න පුළුවනි, එළියට නොපෙනෙන විධියට. රහස හෙළිකර ගැනීම සඳහා පිරික්සීමට වුවමනා මේ මහ ගෙදර නම්, මට ඒක සතුටුදායක විධියට කරන එක පහසුවෙන්නේ නෑ. නමුත් ගොඩ්ෆ්‍රි හෝ ඒ වගේ කෙනෙක් පැන යනවා දුටු නිවස තියෙන්නෙ මේ මන්දිරයෙන් පිට, උද්‍යානයේ කොහේ හරි. ඒ පැත්ත පරීක්ෂා කරලා, සොයාගත හැක්කේ මොනවාද කියලා මා බැලිය යුතුයි. මට අවහිර කිරීමට කවුරුවත් ආවෙ නැහැ. වයසක මිනිස්සු ඒ ගොල්ලන්ගෙ වැඩකටයුතු වල යෙදිල හිටියා. ඒ මිසක් මං කරන්නෙ මොනවද යන්න හොයන්න ආවේ නැහැ.

ටක්ස්බරි ඕල්ඩ් උද්‍යානයේ කෙළවර කුඩා ගෙවල් කිහිපයක්ම තිබුණා. වත්තේ කෙළවරේම අනෙක් ගෙවල් වලින් වෙන්ව පිහිටා

http://sherlockholmesinvestigations.blogspot.com

තිබුණේ සෑහෙන්න විශාල නිවසක්. වත්ත බලාගන්න උද්‍යාන පාලකයෙකුට සුදුසු අන්දමේ එකක්. කලින්දා රාත්‍රියේ අඳුරේ මං දුවගෙන එද්දී, දොරක් වැහෙන ශබ්දය ඇසුණේ මෙතැනින්ද? මං ඒ පැත්තට හෙමින් හෙමින් ඇවිද ගියා. ඔහේ අරමුණකින් තොරව ගස්කොලං වල සිරි නරඹමින් යන කෙනෙකු වගයි මං ඇවිද්දෙ. ඔන්න මං ඒ හරියට ගියාම, අර ගෙදර දොරටුවෙන් මිනිහෙක් එළියට බැස්සා. ශරීර ප්‍රමාණයෙන් කුඩා, මුහුණේ දිගටි රැවුලක් තිබූ මේ තැනැත්තා කළු පැහැති කබායක් ඇඳ, හිස්වැස්මක් පැළැඳ සිටියා. හැබැයි වත්ත බලාගන්න උයන්පල්ලෙකුගේ පෙනුම නම් ඔහුට තිබුණේ නැහැ. දොර ඇරගෙන මිදුලට බැස්ස ඔහු, මා පුදුමයට පත් කරමින් දොර වහලා යතුර දැම්මා. ඊළඟට යතුර ඔහුගේ සාක්කුවේ දමාගෙන මා දිහා බලාගෙන හිටියේ පුදුමයෙන් වගේ.

"ඔබ මේ පළාතට අමුත්තෙක් වගෙයි?"

"ඔව්. මං කර්නල් එම්ස්වර්ත්ගේ නිවසට ආ අමුත්තෙක්. එතුමාගේ පුත්‍රයා ගොඩ්ෆ්‍රි, දකුණු අප්‍රිකාවේ බෝයර්වරුන්ට විරුද්ධව යුද්ධ කරද්දි අපි දෙන්නා හිටියෙ එකට. ගොඩ්ෆ්‍රි තමා මගේ හොඳම මිත්‍රයා.

මට අහන්න ලැබුණා ගොඩ්ෆ්‍රි කොහේදෝ සංචාරයක ගිහින් කියලා. ඒක අහන්නත් මට කණගාටුයි. ඔහුගේ යාළුව මෙහේ හිටියා නම් කොයි තරම් සන්තෝෂ වේවිද මාව දකින්න."

"ඒක ඇත්ත." අර මිනිහා කිව්වේ අහක බලාගෙන.

"ඔහු මෙහේ ඉන්න කාලයක ආයෙත් එන්නකො මේ පැත්තෙ."

පැවසූ ඔහු හෙමින් හෙමින් යන්න ගියා. ටික වේලාවකින්, ඔහු ගිය පැත්ත දිහා මං ආපහු හැරිලා බැලුවා. මං දැක්කා ඔහු මඟ නැවතිලා පඳුරු අතරින් මා දිහා හොරෙන් බලාගෙන ඉන්න හැටි.

මං එතැන තිබුණු ගේ දිහා පරීක්ෂාවෙන් බැලුවා. ජනේල හැම එකකටම ඇතුළෙන් ඝන තිර රෙදි දමලා, හොඳින් ආවරණය කරලයි තිබුණේ. කෙනෙකුට පෙනෙන්නේ ඒක හිස් වූ ගෙයක් වගේ. මං ඕනෙවට වඩා හාරා අවුස්සන්න ගියොත්, වැඩේ අවුල්වෙන බව මං දැන හිටියා. මට ඒ මැඳුරෙන් පිටවෙලා යන්න කියලා කර්නල් එම්ස්වර්ත් මට නියෝග කරාවී. මේ වෙනකොටත් කවුරු හරි හැංගිලා මා දිහා බලාගෙන ඉන්නවා කියන හැඟීම මගේ සිතට දැනුණා. ඒ

http://sherlockholmesinvestigations.blogspot.com

හින්දා තවදුරටත් පරීක්ෂා නොකර, මං ආපහු ඇවිදගෙන ආවා. එදා රෑ කෑමෙන් පස්සෙ කවුරු කවුරුත් තම තමන්ගෙ කාමර වලට යනතුරු මං බලාගෙන හිටියා. ඊට පස්සේ කිසිම ශබ්දයක් නොකර ජනේලයෙන් පැනලා, අර උදේ දුටු ගේ පැත්තට හැකි ඉක්මනින් ආවා.

මං ඔබට කලින් කිව්වා මේ ගෙදර ජනේල තිරරෙදි වලින් වසා තිබුණු බව. නමුත් දැන් මම දුටුවා වීදුරු පියනට අමතරව ලෑලි ජනෙල් පියන් වලින් ඒවා සම්පූර්ණයෙන්ම ආවරණය කර ඇති බව. නමුත් එක ජනේලයක ලෑලි පියන, එක තැනකින් කැඩී ගිහින්, පළුදු වෙලා. එතැනින් පිටතට එළිය ටිකක් වැටුණා. මං හෙමින්ම එතැනට ගිහිං බැලුවා. වාසනාවකට වගේ තිරරෙද්ද ඇතුළතින් එහා මෙහා වෙලයි තිබුණේ. මට ඒ කාමරය ඇතුළත හොඳින් බලාගන්න හැකියාව ලැබුණා.

ඒක බොහොම ප්‍රසන්න පිරිසිදු තැනක්. හොඳින් දැල්වුණු ලාම්පුවකින් දීප්තිමත් එළියක් කාමරය ඇතුළත විහිදුණා. ගිනි උදුනක් දැල්වුණා. මං බැලූ තැනට හරියටම ඉදිරියෙන් පුටුවක වාඩිවෙලා හිටියේ මං උදේ දැකපු පුද්ගලයා. ඔහු සිගරැට්ටුවක් උරමින් පුවත්පතක් කියවමිනුයි සිටියේ."

"මොකක්ද ඔහු කියවමින් සිටි පුවත්පත?" මම ඇසීමි.

ඔහුගේ කථාවට බාධා කිරීම ගැන මගේ අනුග්‍රාහකයා කැමැත්තක් දැක්වූයේ නැත.

"පුවත්පත මොකක්ද කියනා එක ඒ තරම් වැදගත්ද?"

"ඔව්. හරිම වැදගත්."

"මං ඒක ගැන ඒ හැටි බැලුවෙ නෑ."

"සමහර විට ඔබ දකින්න ඇති, ඒක මේ දිනපතා පුවත්පත් වගේ ලොකු පිටු සහිත එකක්ද- නැත්නම් අර සති අන්ත පුවත්පත් සමග එන කුඩා පිටු සහිත එකක් - ටැබ්ලොයිඩ් ප්‍රමාණයේ එකක්ද කියලා?"

"හරි හරි. ඔබ කිව්වාමයි මතක් වුණේ. ඒක කුඩා පිටු සහිත පත්‍රයක්. ඒ වෙලාවේ මං ඒ ගැන ඒ තරම් හිත යොමු කළේ නැහැ. ඒ මොකද කාමරේ තවත් කෙනෙක් ඉන්න බව මට දකින්න ලැබුණා.

http://sherlockholmesinvestigations.blogspot.com

නමුත් ඔහු වාඩිවෙලා හිටියේ මා එබී බැලූ ජනේලයට පිටුපස හරවාගෙන. මේ දෙවැනි පුද්ගලයා නම් ගොඩ්ෆ්‍රි බව මට සහතිකයි. මට ඔහුගේ මුහුණ පෙනුණේ නෑ. නමුත් ඔහුගේ උරහිස් බෙල්ලේ සිට දෙපසට පහත්වෙලා තිබුණු ආකාරය මට හොඳ හැටි දැකල පුරුදුයි. ඔහු සිටියේ හිනි උඳුන දෙසට තරමක් නැමිලා. මීළඟට මා කළ යුත්තේ කුමක්ද කියලා මං කල්පනා කළා. එතකොටම මට දැනුණා කවුරු හරි මගේ උරහිසට තට්ටු කරන බව. මං ආපසු හැරිල බැලුවා. එතැන හිටියේ කවුද? මා අසල සිටියේ කර්නල් එම්ස්වර්ත්!

"මහත්මයා මේ පැත්තෙන් එන්න." ඔහු බොහොම සිහින් හඬින් මට කිව්වා. ඔහු නිහඬවම මාව කැඳවාගෙන ගියේ ටක්ස්බරි ඕල්ඩ් මන්දිරයට. ඔහු කෙළින්ම මගේ කාමරයට ආවා. ඒ එන ගමන් දුම්රිය කාල සටහනක් සාලයේ මේසය මත තිබී අතට ගත්තා.

"ලන්ඩනය බලා යන දුම්රියක් තියෙනවා හෙට උදේ අටයි තිහට. උදේ අට වෙන කොට අශ්ව කරත්තය ගෙදර ඉස්සරහ දොර ළඟ සූදානමින් තියේවි."

ඔහු දැඩිව කෝපයට පත්වෙලා, කෝපයෙන් වෙවුලමින් සිටියේ. මට නිදහසට කියාගන්න කරුණු කිසිවක් තිබුණේ නැහැ. මගේ මිත්‍රයා ගැන තිබූ හිතවත් කම ගැන මං අමාරුවෙන්, ගොතගසමින් කියන්න උත්සාහ දැරුවා.

"ඔය කතාවලින් කිසි වැඩක් නෑ. අපේ පවුලේ පෞද්ගලික කාරණාවලට තමුසෙ හොස්ස දාලා තියෙන්නේ බොහොම නින්දා සහගත විධියට. අප ඔබව පිළිගත්තේ ආගන්තුකයෙක් හැටියට. නමුත් තමුසෙ ක්‍රියා කළේ ඔත්තුකාරයෙක් හැටියට. මීට පස්සේ මගේ දෑසට පෙනෙන්න මෙහේ එන්නඑහෙම එපා. එච්චරයි මට කියන්න තියෙන්නේ"

ඔහු කීවේ කෝපයෙන් ගොරවමින්. ඒ කතාවට මටත් කේන්ති ගියා හෝම්ස් මහත්මයා. මටත් ටිකක් සැරට කතා කෙරුණා.

"මං ඔබේ පුත්‍රයා මගේ ඇස් දෙකෙන්ම දැක්කා. මට හොඳටම විශ්වාසයි ඔබ ඔබේ පුත්‍රයාව මේ ලෝකෙන් හංගාගෙන ඉන්න බව. ඔබ මේ විධියට ඔහුව හිර කරගෙන ඉඳීමේ තේරුම මොකක්ද කියලා මට නම් තේරුම් ගන්න බෑ. නමුත් ඔහුට නිදහසක් නැති බව හොඳහැටි මට තේරෙනවා. කර්නල් එම්ස්වර්ත් මේ ටික හොඳ හැටි මතක

http://sherlockholmesinvestigations.blogspot.com

තියාගන්න. මගේ කල්‍යාණ මිත්‍රයාගෙ ආරක්ෂාවත්, යහපතත් සතුටුදායකයි කියලා තහවුරු වෙනතුරු, මං මේ ඔක්කොම හොයනවා. මේ අභිරහස මොකක්ද කියලා, මං හාරා අවුස්සනවා. මගේ මේ උත්සාහය ඔහේ කරන කියන කිසිදේකින් නවත්වන්න බෑ."

ඔහුගේ මුහුණ බොහොම භයානක විදියට වෙනස් වුණා. ඔහු කොයි මොහොතේ හෝ මගේ ඇඟට කඩා පැනලා, මට පහර දේවි කියලා මට හිතුණා. ඔහු යෝධයෙක් වගේ විශාල, දරුණු පෙනුමක් තිබූ පුද්ගලයෙකු බව මං ඔබට කිව්වා. මගේ ශරීරයත් දුර්වල නෑ. නමුත් තනිවම පොරබදලා ඔහුව මෙල්ල කරගන්න එක ලේසි වෙන්නෙ නැති බව මට වැටහුණා. කොහොම වුණත්, කෑකෑරෙන වෛරයෙන් ටිකක් වෙලා මං දිහා බලාගෙන සිටි ඔහු, එක්වරම ආපසු හැරිලා කාමරයෙන් පිටවෙලා ගියා. උදේ පාන්දර සූදානම්ව තිබූ අශ්ව කරත්තයෙන් දුම්රියපොළට ඇවිත්, දුම්රියෙන් මං ලන්ඩනයට ආවා. ඊළඟට ඔබේ ආධාර පතා මං කෙළින්ම ආවේ ඔබව හමුවෙන්න."

මගේ අනුග්‍රාහකයා මට ඉදිරිපත් කළ ගැටලුව එයයි. එය විසඳීම සඳහා අපහසුතා ඇත්තේ ඉතා ස්වල්පයක් බව පාඨක ඔබට වැටහෙන්නට ඇත. කොයිතරම් සරල දෙයක් වුවත් එහි සිත් ඇදගන්නා සුලු ලක්ෂණ කිහිපයක් ඇති බව මට පෙනී ගියේය. සුපුරුදු ලෙස, තර්කානුකූලව මෙය විශ්ලේෂණය කිරීම සඳහා මම ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කළෙමි.

"මේ ටක්ස්බරි ඕල්ඩ් මන්දිරයේ සේවක සේවිකාවන් කී දෙනෙක් විතර සිටියද?"

"මට නම් හිතෙනුණේ දෙදෙනෙක් පමණයි. ගෘහ පාලකයත් ඔහුගේ බිරිඳත් විතරමයි. ඔවුන් ජීවත් වුණේ බොහොම චාමෙට."

"අර වෙන්ව තිබුණු නිවසේ සේවකයෙක් හිටියෙ නෑ?"

"නැහැ. අර රැවුලක් වවා ගනිපු පුංචි මනුස්සයා, සේවකයෙකුගේ රාජකාරි ඉටු කළාද මං දන්නෙ නෑ. නමුත් ඔහු ඊට වඩා උසස් තනතුරක කෙනෙක් බවයි පෙනුණේ."

"ඒකෙන් සමහර දේවල් පැහැදිලි වෙනවා. මහගෙදර ඉඳලා අනෙක් ගෙදරට කෑම ගෙනගිය බවක් ඔබට දකින්න ලැබුණේ නැද්ද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව් ඔබ ඒක අහපු නිසා දැන් මට මතක් වෙනවා. වයසක රැල්ෆ්, ආවරණය කළ ලොකු කූඩයක් අරගෙන, වත්ත හරහා අඩිපාර දිගේ අර ගේ දිහාවට ඇවිදගෙන ගිය හැටි මට දකින්න ලැබුණා. මේ ගෙනියන්නෙ කෑම කියල ඒ වෙලාවෙ මගේ හිතට ආවෙ නැහැ."

"ඔබ ආපහු එද්දි ඒ පළාතෙ කාගෙන්වත් එම්ස්වර්ත්ල ගැන විමසීමක් කළේ නැද්ද?"

"ඔව් මං හොයල බැලුවා. මං දුම්රිය ස්ථානාධිපතිවරයාගෙන් ඇහුවා. තානායම භාරකරුගෙන් ඇහුවා. මං නිකමට වගේ ඇහුවෙ, මගේ පැරණි මිත්‍රයෙක් වන ගොඩ්ෆ්‍රි එම්ස්වර්ත් ගැන මොනවද දන්න ආරංචි කියලා. ඔවුන් දෙදෙනාම මට කිව්වෙ එකම කථාවමයි. අප්‍රිකාවේ ඉඳල ආපහු ආව ගමන්ම ලෝකය වටේ සංචාරයක් සඳහා ඔහු පිටත්ව ගිය බව. ඒ කතාව කවුරුත් විශ්වාසයට අරං තිබුණා."

"ඔබේ හිතේ ඇති සැකය ගැන ඔබ ඔවුන්ට මොකුත් කිව්වෙ නැද්ද?"

"නැහැ."

"ඒක බොහොම හොඳයි. මේක සම්පූර්ණයෙන්ම හොයල බලන්න ඕන ප්‍රශ්නයක්. ඔබ සමග ටක්ස්බරි ඕල්ඩ් උද්‍යානයට යන්න මං එනවා මහත්මයා."

"අදම එනවා?"

"අදම නම් එන්න මට කිසිම විදියක් නෑ ඩොඩ් මහත්මයා. නමුත් එන සතියේ මුලදී මං නොවැරදීම එන්නම්." මම කීවෙමි.

මගේ හිතමිත්‍ර වොට්සන් ඔබට පවසා ඇති කථාවක සඳහන්, ග්‍රේමින්ස්ටර් හි ආදිපාදවරයා පැටළී සිටි අවුල, නිරාකරණය කිරීමේ කටයුත්තේ ඒ දිනවල මම යෙදී සිටියෙමි. ඊට අමතරව, තුර්කියේ සුල්තාන්වරයා ඔහුගේ රටේ ඇතිවූ දේශපාලන අභිරහසක් විසඳා දෙන ලෙස ද මගෙන් ඉල්ලා සිටියේය. එය කල් දැමුවහොත් ඔහුට බරපතල දේශපාලන අර්බුදයකට මුහුණ පෑමට සිදුවිය හැකි බැවින් එම සතියම තුර්කිය වෙනුවෙන් ගත කිරීමට මට සිදුවිය.

ඊළඟ සතියේ මුලදීම ජේම්ස් එම්. ඩොඩ් මහතා සමග මම බෙඩ්ෆඩ්ෂයරය බලා පිටත් වී ගියෙමි. මා කලින් සූදානම් කරගත්

http://sherlockholmesinvestigations.blogspot.com

පරිදි මගේ පරණ මිත්‍රයෙක් ද, මේ ගමනට හවුල්වීමට යුස්ටන් දුම්රිය පොළට පැමිණියේය. තරමක් වයස්ගත පුද්ගලයෙකු වූ ඔහු, මුහුණෙන් කිසිදු හැඟීමක් පළ නොකළ ස්වභාවයෙන්ම නිහඬ තැනැත්තෙකි.

"ඉතින් ඩොඩ් මහත්මයා, මේ මගේ පරණ මිත්‍රයෙක්. මේ මහත්මයා අප සමග එහි යෑමෙන් සමහරවිට කිසිම ප්‍රයෝජනයක් නොලැබෙන්නත් පුළුවනි. බාග වෙලාවට ඔහුගේ පැමිණීම අත්‍යවශ්‍ය වෙන්නත් පුළුවනි. ඊට වඩා විස්තර මං දැනට ඔබට කියන්න බලාපොරොත්තුවක් නෑ." මම කීවෙමි.

ඩොඩ් මදක් පුදුමයට පත්වූ නමුත් කිසිවක් විමසීමට තැත් නොකළේය. දුම්රියට නැඟුණු පසු, මම තවත් ප්‍රශ්න කිහිපයක් ඔහුට ඉදිරිපත් කළෙමි.

"ඔබ කිව්වා එදා රාත්‍රි ඔබේ මිත්‍රයා ජනේලයේ වීදුරුවට මුහුණ තියලා බලන කොට ඔබ ඔහුගේ මුහුණ පැහැදිලිවම දුටුවා කියලා. ඔබට හොඳටම විශ්වාසද ඒ ගොඩ්ෆ්‍රි කියලා?"

"මට කිසිම සැකයක් නෑ මහත්මයා. ඔහුගේ නාසය වීදුරුවට තදවෙලයි තිබුණේ. මගේ ලාම්පුවේ එළිය සම්පූර්ණයෙන්ම ඔහුගේ මුහුණට වැටී තිබුණා."

"ඒ ගොඩ්ෆ්‍රිගේ පෙනුම ඇති වෙන කෙනෙක් වෙන්න බෑ?"

"කොහොමටවත් වෙන්න බෑ. ඒ ඔහුමයි."

"නමුත් ඔබ කිව්වා, ඔහුගේ පෙනුමේ වෙනසක්."

"ඔව්, මුහුණේ පාට පමණක්. ඔහුගේ මුහුණ . . . . කොහොමද මං ඒක විස්තර කරන්නෙ? ඔව්, මාළුවෙකුගේ බඩපැත්තෙ තිබෙන සුදුපාට වගේ සුදක් කිව්ව හැකි."

"හැමතැනක්ම සම්පූර්ණයෙන්ම සුදුමැලිද?"

"එහෙමත් නෑ. මං පැහැදිලිවම දුටුවා ඔහුගේ ඇහිබැම. ඒවා ජනෙල් වීදුරුවට තදවෙලා තිබුණේ. ඒවා සාමාන්‍ය පාටට තිබුණා."

"ඔබ ඔහුට කථා කළාද?"

"ඒ මොහොතේ මං කොච්චරම භීතියකට පත්වුණාද කිව්වොත් මට කථාකර ගන්න බැරිවුණා. ඊට පස්සේ මං ඔහු පසුපස එළවාගෙන ගියා. නමුත් වැඩක් වුණේ නෑ."

http://sherlockholmesinvestigations.blogspot.com

බෙඩ්ෆඩ්ෂයර් ප්‍රාන්තයේ නියමිත දුම්රියපොළේදී අපි දුම්රියෙන් බැසීමු. එතැන් සිට ටක්ස්බරි ඕල්ඩ් මන්දිරයට අශ්ව කරත්තයෙන් ගිය ගමනට ද සෑහෙන වේලාවක් ගත විය. හොල්මන් මන්දිරයක් වැනි එහි දොර විවෘත කරන ලද්දේ වයස්ගත රැල්ෆ් විසිනි. දුම්රියපොළේ දී මා අශ්ව කරත්තය කුලියට ගත්තේ, එදින දවස පුරාම එය අවශ්‍යවීමට ඉඩ ඇති බැව් පවසමිනි. කරත්තයට වී, මා ඔහුට අමතන තුරු එහි රැඳී සිටින මෙන්, අප සමග පැමිණි මගේ වයස්ගත මිත්‍රයාගෙන් මම ඉල්ලා සිටියෙමි.

කේඩෑරි වී ගිය ශරීරයක් තිබූ රැල්ෆ් දොර විවෘත කළේය. ඔහු හැඳ සිටියේ රදළ පවුල්වල ගෘහ පාලකයන් සාමාන්‍යයෙන් හඳින කළු කබාය සහ සුදු කළු මිශ්‍ර දිග කලිසමයි. එහෙත් එක් විශේෂ වෙනසක් අපට දකිය හැකි විය. හම් වලින් තැනූ දුඹුරු පැහැති අත්ආවරණ පැළැඳ සිටි ඔහු, අප දුටු සැණින් ඒවා ගලවා, සාලයේ මේසයක් මතට දැම්මේය.

මගේ හිතවත් වොට්සන් ඔබට පවසා ඇති පරිදි, ඉතා සියුම් ගන්ධයක් වුවද ක්ෂණිකව ඝ්‍රාණ ඉන්ද්‍රියයට හසුකර ගැනීමේ අසාමාන්‍ය සංවේදීතාවයක් මා සතුව ඇත. අප මේ නිවසට ඇතුළු වෙද්දී එවැනි සියුම් සුවඳක් හඳුනාගැනීමට මට හැකිවිය. එය නැගුණේ සාලයේ මේසය දෙසින් යයි මට සිතිණි. එහෙයින් මගේ හිස්වැස්ම ඉවත් කොට, එය අතට ගෙන සාලයේ මේසය මත තැබුවෙමි. ඒ සමගම ක්ෂණයකින් හිස්වැස්ම බිමට පෙරළා දැමුවෙමි. අනතුරුව එය අහුලා ගන්නා ආකාරයෙන් මේසය දෙසට පහත් වුණෙමි. රැල්ෆ්ගේ දෑතින් ඉවත් කළ අත්ආවරණ යුගලයට අඩියක් පමණ නුදුරට මගේ නාසය ළං කිරීමට මට හැකිවිණි. සුවිශේෂ සුගන්ධය නැගුණේ අත්ආවරණ වලින් බව මට අවබෝධ විය.

අප නිවසට ඇතුළු වෙද්දී කර්නල් එම්ස්වර්ත් ඔහුගේ කන්තෝරු කාමරයේ නොසිටියේය. රැල්ෆ් අතේ යැවුණු පණිවුඩය ලැබුණු විගස, කර්නල් අප හමුවට පැමිණෙන බව උස් හඬින් නැගුණු අඩි ශබ්දයෙන් අපි දැන ගතිමු. පා පහරක් සමග විවෘත වූ දොරපියන් දෙපසට විසිවී ගියේය. කර්නල් එම්ස්වර්ත් අප හමුවට කඩා පැන්නේ කෝපයෙන් වියරු වූ අයුරෙනි. අප යැවූ ආගන්තුක කාඩ්පත්, අප ඉදිරියේම කැබලි කැබලි වලට ඉරා, බිම දමා, අඩි පොළොවේ හප්පමින් ඒවා පාගා දැම්මේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"අනුන්ගේ දේවල් වලට ඇඟිලි ගහල හාරා අවුස්සන හක්කඩියා. මං තමුසෙට කිව්වෙ නැද්ද මිනිහෝ මගේ වත්තෙ හතර මායිමට එන්න එපා කියල? මං උඹට කිව්ව නේද මගේ පවුලේ දේවල් වලට හොස්ස දාන්න එන්න එපා කියල? උඹ ඊළඟ සැරේ මෙහේට ආවොත් මං උඹට වෙඩි තියනවා. දෙයියම්පා! මං උඹට වෙඩි තියන එක වෙඩි තියනවාමයි!

මහත්තයෝ. ඒ ටික කිව්වේ ඔහේටත් එක්කයි." ඔහු පැවසුවේ මා දෙසට ද හැරෙමිනි.

"ඔහේගේ නින්දා සහගත රක්ෂාව ගැන මං හොඳට දන්නවා. ඔහේගේ ඒ දක්ෂකම් වලින් ප්‍රයෝජන ගන්න වෙන කොහේ හරි තැනක් හොයා ගන්නවා. මෙහේ එහෙම ඉඩක් ලැබෙන්නෙ නෑ." කර්නල් එම්ස්වර්ත් ගිගුරුවේය.

"මහත්මයා, මං කොහොමටවත් මෙතනිං යන්නෙ නෑ. ගොඩ්ෆ්‍රි අර ගෙදරට හිරවෙලා ඉන්නේ ඔබගේ තර්ජන ගර්ජන වලට බයේ නෙමෙයි කියලා, ඔහුගේ කටින් කියන තුරු මං මෙතනින් හෙල්ලෙන්නෙ නෑ."

කර්නල් එම්ස්වර්ත් සීනුව නාද කොට ගෘහ පාලකයා කැඳෙව්වේය.

"රැල්ෆ්, පොලීසියට ටෙලිෆෝන් කරන්න. ඉන්ස්පෙක්ටර්ට කියන්න, ගෙදරට හොරු කඩාවැදිල කියල, පොලිස් භටයන් දෙන්නෙක් එවන්න කියලා."

"මට ඔබට කථාකරන්න එක මොහොතක් දෙන්න මහත්මයා." මම කීවෙමි.

"ඩොඩ් මහත්මයා ඔබ දන්නවා ඇති, පොලීසිය කැඳවලා අපව මේ ගෙදරින් පිටමං කරන්න කර්නල් එම්ස්වර්ත්ට අයිතිවාසිකමක් ඇති බව. ඒ වගේම මහත්මයා ඔබ තේරුම් ගත යුතුයි, ඩොඩ් මහත්මයා ක්‍රියා කරන්නේ ඔහුගේ මිත්‍රයාගේ යහපත වෙනුවෙන් බව.

කර්නල්, මට එක මිනිත්තු පහක් ඔබ සමග කථාකරන්න ඉඩ දෙන්න. මට විශ්වාසයි ඊට පස්සේ ඔබ මේ ප්‍රශ්නය දිහා බලන්නේ වෙනත් ආකාරයකින් බව . . . ."

http://sherlockholmesinvestigations.blogspot.com

". . . . මං ඒ තරම් ඉක්මනට වෙනස් වෙන මිනිහෙක් නෙමෙයි. රැල්ෆ්. මං තමුසෙට කිව්ව වැඩේ කරනවා. මොකද යක්සයො බලාගෙන ඉන්නෙ? ටෙලිෆෝන් කරපං පොලීසියට!"

"ඒ සෙල්ලම් හරියන්නෙ නෑ." මා පැවසුවේ රැල්ෆ්ට නිවස තුළට යෑම අවහිර වන පරිදි දොර වසා එයට හේත්තු වෙමිනි.

"පොලීසිය මේකට ඇඟිලි ගහන්න ආවොත් සිද්ධ වෙන්නේ, ඔහේ ඔය තරම් ලෝකෙට පෙන්වන්න අකමැති දෙය ප්‍රසිද්ධ වෙන එකයි." මම පැවසීමි.

අනතුරුව මගේ සටහන් පොත අතට ගෙන එහි එක් වචනයක් ලියා කර්නල්වරයාගේ දෑසට ළං කළෙමි.

"මෙන්න මේක නිසයි කර්නල් එම්ස්වර්ත් අපි මෙහාට ආවෙ."

මා කඩදාසියේ සටහන් කළ වචනය දෙස ඔහු බලා සිටියේ ඉමහත් පුදුමයෙනි. කෝපයට පත් ලකුණු ඔහුගේ මුහුණෙන් අතුරුදන් විය.

"ඔබ කොහොමද දැනගත්තේ?" ඔහු පුටුවක් මතට ඇද වැටුණේ අපහසුවෙන් හුස්ම අල්ලමිනි.

"ඒව දැනගන්න එක තමයි මගේ වෘත්තිය."

පුටුව මත මඳ වේලාවක් කල්පනා කරමින් සිටි ඔහු දෑත් දෙපසට දිගු කළේ තමා පරාජය භාරගන්නා බව හඟවමිනි.

"හරි. ඔහේලට ගොඩ්ෆ්‍රි බලන්න ඕවමනා නම් ගිහිං බලන්න. ඒක මගේ කැමැත්තෙන් දෙනු අවසරයක් නම් නෙමෙයි. මට තර්ජනය කරලා බලෙන් ලබා ගනිපු එකක්. රැල්ෆ් ගිහිං ගොඩ්ෆ්‍රි මහත්තයටයි කෙන්ට් මහත්තයටයි කියන්න අපි මිනිත්තු පහකින් ඔවුන් බලන්න එනවා කියල."

මිනිත්තු පහකට පසු අප සිටියේ වත්තේ කෙළවර, ඩොඩ් මහතා කලින් සඳහන් කළ නිවස අසලයි. රැවුලක් වවාගත් කුඩා මිනිහෙක් දොර අවහිර වනසේ සිටගෙන සිටියේ විමතියට පත් මුහුණෙනි.

"මොකද කර්නල් හදිසියෙම මේ වගේ තීරණයක් ගත්තෙ? අපේ සැලසුම් ඔක්කොම අවුල්වෙනවා නේද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"මට කරන්න දෙයක් නෑ කෙන්ට් මහත්මයා. ඔවුන් මේ දේට මාව නම්මා ගත්තේ බලෙන්. ගොඩ්ෆ්‍රිව බලන්න අපට පුළුවන්ද?"

"ඔව්. ඔහු ඇතුළෙ සූදානමෙන් ඉන්නවා."

කෙන්ට් මහතා අප ඇතුළත කාමරයට කැඳවාගෙන ගියේය. ගිනි උදුන දෙසට මුහුණ ලාගෙන, අප සිටි දෙසට පිටුපස හරවා ගෙන කිසිවෙක් එහි වාඩිවී සිටියේය. ඒ දුටු විගසම මගේ අනුග්‍රාහකයා ඉදිරියට පැන්නේ ඉමහත් සන්තෝෂයෙනි.

"ගොඩ්ෆ්‍රි! ගොඩ්ෆ්‍රි!! ඔබ හමුවුණේ කොච්චර . . . ."

නමුත් අනෙකා ඩොඩ් මහතාට අතින් සංඥා කළේ තමා දෙසට ළං නොවී ඇත්වන ලෙසටයි.

"ජිමි. මාව අල්ලන්න එපා. ඔහොම ඈතින් ඉන්න ජිමි. ඇයි ඔබ පුදුමයට පත්වෙලා මං දිහා බලාගෙන ඉන්නෙ? ඔබගේ කල්‍යාණ මිත්‍රයාව සිටි සංඥා බලකායේ ලාන්ස් කෝපරල් එම්ස්වර්ත්ගේ කඩවසම් මුහුණ මට නැහැ නේද?"

ඇත්තෙන්ම ඔහුගේ මුහුණේ තිබුණේ ඉතාමත් අස්වාභාවික පෙනුමකි. කලකට පෙර ඔහු ඉතාමත් කඩවසම් තරුණයෙකුව සිටි බවට ලක්ෂණ තවමත් ඉතිරි වී තිබිණ. එහෙත් ඔහුගේ මුහුණේ තැන් කිහිපයක තිබූ දුඹුරු පැහැති පුල්ලි කිහිපයක් හැරුණු විට අන් සෑම තැනක්ම අස්වාභාවික ලෙස සුදු පැහැයකට හැරී, විරූපී වී තිබිණි.

"මෙන්න මේක නිසයි මං අමුත්තන් හමුවෙන්නෙ නැත්තෙ. ඔබ මාව දුටුවත්, මාව පිළිකුල් කරන්නෙ නැති බව මං දන්නව ජිමි. ඒ වුණත් තවත් කෙනෙක් මෙහේ කැඳවාගෙන ආවෙ ඇයි? ඒකටත් මොකක් හරි වැදගත් හේතුවක් ඇති?"

"මට දැනගන්න ඕනැවුණා ගොඩ්ෆ්‍රි, ඔබ මෙහෙම ඉන්නේ, අනුන්ගේ තර්ජන පිට සිරකාරයෙක් හැටියටද කියන එක. එදා ඔබ මගේ කාමරයේ ජනේලයෙන් එබිල බලලා, පැන දිව්වට පස්සේ, ඔබ ගැන හොයන එක අත්හැර දමන්න මට කොහොමටවත් හැකියාවක් තිබුණෙ නෑ."

"රැල්ෆ් මට කිව්වා ඔබ මෙහේ ආව බව. ඔබව හොරෙන් බලාගන්න මට හරිම ආශාවක් ඇතිවුණා. මං හිතුව ඔබ මාව දකින එකක් නැහැ කියල. නමුත් බලාපොරොත්තු නොවුණු විධියට ඔබ

http://sherlockholmesinvestigations.blogspot.com

මාව දුටුවාම මං පැනල දිව්වා. ඔබ ජිමන්ල්ලය-අරින බව මට තේරුණා. ඉතින් මං ඉක්මනට දුවලා ඇවිත් මුගේ ගුහාවේ හැංගුණා."

"මොකක්ද දෙවියනේ ඔබට මේ වෙලා තියෙන්නේ?"

"ඒක ඒ තරම් දිග කථාවක් නෙමෙයි ජිම්. ප්‍රිටෝරියා වලට නුදුරින් නැගෙනහිර දුම්රිය මාර්ගය අසල බෆල් ස්ප්‍රෑට් වල දරුණු සටන් ඇතිවුණා. එහිදී මට තුවාල සිදුවුණු බව ඔබට අහන්න ලැබෙන්න ඇති?"

"ඔව්. මට අහන්න ලැබුණා. නමුත් විස්තර කිසි දෙයක් දැනගන්න ලැබුණෙ නෑ."

"බෝයර් වරුන්ගෙන් අපේ හමුදාවට දැඩි ප්‍රහාරයක් එල්ල වුණා. අපි තුන් දෙනෙකුට හමුදාවේ අනෙක් අයව මඟ හැරුණා. ඒ තුන්දෙනා තමයි අර නට්ට සිම්සන් නමින් කවුරුත් හඳුන්වපු සිම්සන්, ඇන්ඩසන් සහ මම. ඔබට මතක ඇති මේ හභූයෙ තැනින් තැන කැලෑ රොද තිබුණත් තරමක් විවෘත ප්‍රදේශයක්. බෝයරුවරු හැම පැත්තෙන්ම අපව වටකර ගෙනයි සිටියෙ. පඳුරු අතරේ සැඟවෙමින් අපි පැනගන්න උත්සාහ කළා. හැංගිලා ඉඳපු තැනකින් පැනයන්න උත්සාහ කරද්දී උන් එල්ල කළ අලිතුවක්කු ප්‍රහාරයකට අපි ගොදුරු වුණා. අනෙක් දෙන්නම වෙඩි පහරින් එතැනදීම මියගියා. මගේ උරහිසට බරපතල තුවාල සිදුවුණා. මම කොහොම හරි අශ්වයාගෙ පිටේ එල්ලීගෙනම සිටියා. ඌ හැතැක්ම ගණනාවක් මාව අරගෙනම ගියා. අන්තිමට මම ක්ලාන්ත වෙලා අශ්වයා පිටින් බිම ඇද වැටුණා.

මට සිහිය එනකොට ඇඳිරී වැටිලා. තුවාලයෙන් ලේ ගලායාම නිසා මං නැගිට ගත්තේ බොහොම අමාරුවෙන්. ඇගට හරිම අමාරුයි. මම ටිකක් ඉදිරියට ඇවිදගෙන ගියේ ක්ලාන්ත ගතියෙන් වගේ. ඔහොම යනකොට ටිකක් ඈත, විශාල නිවසක් දකින්න ලැබිලා මං පුදුමයට පත්වුණා. එය ජනේල රාශියක් ඇති නිවසක් බව මට ඇතටම දකින්න ලැබුණා.

රෑ වෙගෙන එන නිසා මට දැනුණේ මහ දරුණු සීතලක්. ඔබටත් මතක ඇති ඒ පැත්තේ, මුළු ඇඟම හිරිවැටෙන මාරාන්තික සීතල ගැන. පැය ගණනාවක් එළිමහනේ ගත කරලා, ලේ ගැලූ තුවාලයකින් පීඩාවට පත්වෙලා හිටි මට, ශීතල මගේ ඇට මිදුළු වලට කාවැදෙන හැටි දැනුණා.

http://sherlockholmesinvestigations.blogspot.com

මගේ එකම ගැලවීම තිබුණේ අර ගෙදරට ළඟාවීම මතයි. මම බොහොම අමාරුවෙන්, බිම ඇදී ඇදී වගේ එහාට ළඟාවුණේ අඩ සිහියෙන්. මට යන්තමට මතකයි, තරප්පු නැගලා විවෘතව තිබුණු දොරෙන් විශාල කාමරයකට ඇතුළු වෙනවා. ඒකෙ ඇඳන් පේළියක් තිබෙන හැටි දක්කාම මට ඇතිවුණු සතුට කියා නිමකරන්න බැහැ. ඇඳන් හොඳින් පිළියෙළ කරලා තිබුණේ නැහැ. නමුත් මට ඒක ප්‍රශ්නයක් වුණේ නැහැ. මං බොහොම අමාරුවෙන් ඇඳකට නැගලා, එතැන තිබුණු පොරෝනය ඇදලා අරගෙන, මගේ වෙව්ලන සිරුර වසාගත්තා. මට මතක එච්චරයි; ඊට පස්සේ තදින්ම නින්ද ගියා.

මට ඇහැරුණේ හොඳටම එළිවෙලා. නමුත් මට තේරුණා මං ඇවිත් තියෙන්නේ මහා අද්භූත ස්ථානයකට බව. සුදුහුණු ගාලා තිබුණු විශාල ශාලාවේ, ඇඳන් රාශියක් තිබුණා. මං ඉදිරියේ හිටගෙන හිටියේ ප්‍රමාණයෙන් කුඩා කුරුමිට්ටෙක් වගේ මිනිහෙක්. ඔහුගේ හිස ප්‍රමාණයෙන් හරි විශාලයි. ඔහු විකෘති භාවයට පත් ඔහුගේ දත් සොලවමින් ඕලන්ද භාෂාවෙන් මොනවාදෝ දෙඩෙව්වා. ඔහුට පිටිපස්සෙන් තවත් මිනිසුන් කිහිප දෙනෙක්ම රැස්වෙලා හිටියා. ඔවුන්ගේ ස්වභාවය දුටුවාම මගේ මුළු ඇඟම හිරිවැටිගෙන ගියා. එතැන හිටි එක් කෙනෙක්වත් ස්වාභාවික පෙනුමක් තිබූ අය නෙමෙයි. ශරීරයේ නොයෙක් නොයෙක් තැන් ඉදිමිලා, ගෙඩි වගේ දේවල් හැදිලා, අත්වල ඇඟිලි නොමැති, නොයෙක් නොයෙක් විධියට විකෘති වුණු අය. ඔවුන්ගේ සිනා හඬින් මං හරිම භයකට පත්වුණා.

ඔවුන් කිසිකෙනෙකුට ඉංග්‍රීසි පුළුවන් බවක් පෙනුණේ නෑ. ඕලන්ද භාෂාවෙන් කථා කළ ඔවුන් අතරෙන් එක් මිනිහෙක් ඉදිරියට ඇවිත්, ඔහුගේ විකෘති අත් වලින් මාව ඇඳෙන් ඉවතට තල්ලු කළා. මා තුවාල වෙලා, ලේ පෙරාගෙන හිටි කෙනෙක් බව වත් නොසලකා විලාප නගමින් මාව ඔහුගේ ඇඳෙන් බිමට තල්ලු කරන්න හැදුවේ යකෙක් වගේ. තව ටිකෙන් මං අතින් ඔහුට මොනවා සිදුවෙන්නෙ ඉඩ තිබුණාද මං දන්නෙ නෑ. කොහොම වුණත් ඒ කෑගැසීම ඇහිලා, ළඟ තිබුණ කාමරයක් ඇතුළෙ ඉඳලා වයසක කෙනෙක් එළියට ආවා. ඔහු අර මිනිහාට මොනවාදෝ කියලා, මට ඇඳේ ඉන්න ඉඩ හැරියා.

"දෙවියනේ! ඔබ කොහොමද මෙහාට ආවෙ?" ඔහු ඇසුවා.

http://sherlockholmesinvestigations.blogspot.com

"මොහොතක් ඉන්න! මට පේනවා ඔබේ උරහිසේ බරපතල තුවාලයක් ඇති බව. ඒ වගේම ඔබ අධික වෙහෙසට පත්වෙලා ඇති බව. මම වෛද්‍යවරයෙක්. මං ඔබේ තුවාලයට ප්‍රතිකාර කරන්නම්.

දෙවියනේ! ඔබ දැන් මුහුණ දීලා තියෙන්නේ යුද පිටියේ මුහුණ දුන්නාට වඩා දරුණු අනතුරකට. ඔබ මේ ඇවිත් තියෙන්නේ ලාදුරු රෝහලකට. ඔබ නිදාගෙන තියෙන්නේ ලාදුරු රෝගියෙකුගේ ඇඳේ."

"මං ඔබට තවත් මොනවා කියන්නද ජිම්? අර වෛද්‍යවරයා කිව්වා තමන්ගේ ඇඟේ ලාදුරු රෝගයට ප්‍රතිශක්තියක් ඇතියි කියලා තමන් හිතන බව. නමුත් මං කර ඇතිදේ නම් ඔහු වුණත් කරන්න භය බවත්. ඒ වෛද්‍යවරයා හරි කුරුණාවන්ත පුද්ගලයෙක්. ඔහු මට වෙනම කාමරයක් දීලා, මගේ තුවාලය තරමක් සුවවුණාම මාව ප්‍රිටෝරියා මහ රෝහලට එව්වා.

ඔන්න ඔකයි මගේ ඛේදජනක ඉරණම. මං ආපහු ගෙදර ඇවිල්ලා ටික දවසක් ගතවෙද්දි තමයි මේ රෝගයේ ලක්ෂණ මගේ සිරුරේ මතුවෙන්න පටන් ගත්තේ. මං වෙන මොනවා කරන්නද? අපට විශ්වාසවන්ත සේවකයින් දෙදෙනෙක් ඉන්නවා. වෙනම ජීවත්වෙන්න පුළුවන් කුඩා නිවසක් තියෙනවා. ඉතින් අපි සූදානම් කරගත්තා, ශල්‍ය වෛද්‍යවරයකු වන කෙන්ට් මහතා මා සමග රැඳී සිටීම සඳහා ගෙන්වාගන්න. එහෙම නොකළා නම් මට සිද්ධවන්නේ, මුළු ජීවිතයටම සමාජයෙන් වෙන්වෙලා, ලාදුරු රෝගීන්ට වෙන්වුණු රෝහලක නවතින්න යන්නයි. එහෙම වුණොත් ජීවිතාන්තය දක්වා මට ගැළවීමක් නෑ. ඉතින් සම්පූර්ණ රහසිගතභාවය අවශ්‍යයි. මේ වගේ ගම්බද පාළු පළාතක වුණත් ඒක රහසේ තියාගන්න සිද්ධවුණා. ඒ යන්තමින් හෝ කවුරු හරි දැනගත්තොත්, මහජනයා පැමිණිලි කරන්න ඉඩ තියෙන නිසයි. ඔබට නොකියා සියල්ල හංගන්න සිද්ධවුණේත් අන්න ඒකයි. ඔබට මාව පෙන්වන්න තාත්තා එකඟ වුණේ ඇයිද කියලා මට හිතාගන්න බැහැ."

කර්නල් එම්ස්වර්ත් මා දෙසට ඇඟිල්ල දිගු කළේය.

"පුතා, මට මේ දේ කරන්න සිද්ධවුණේ, මෙන්න මේ මහත්මයා නිසයි. ඔහු අර පොතේ 'ලාදුරු' යන වචනය ලිව්වා. ඔහු ඒ තරම් දුරට කරුණු දන්නවා නම්, හැම දෙයක්ම දැනගන්න අරින එක වඩා හොඳයි කියලා මට හිතුණා."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව් මහත්මයා. කවුද දන්නේ? සමහර විට ඒ නිසා ඔබ හිතුවාට වඩා හොඳ ප්‍රතිඵල අත්වෙන්නත් ඉඩ තියෙනවා. මට අහන්න ලැබුණු විධියට කෙන්ට් මහත්මයා තනියම තවමත් මේ රෝගියා පරීක්ෂා කරල තියෙන්නේ. මට සමාවෙන්න මං මෙහෙම අහනවට; කෙන්ට් මහත්මයා, ඔබ සර්ම කල්ලාපික රෝගවල චර්ම රෝග පිළිබඳ විශේෂඥයෙක්ද?"

"නැහැ මහත්මයා; මම සාමාන්‍ය වෛද්‍යවරයෙක් පමණයි."

"ඔබේ වෛද්‍ය දැනුම සම්පූර්ණ එකක් බවට මගේ කිසිම සැකයක් නැහැ. නමුත් මෙවැනි අවස්ථාවක තවත් වෛද්‍යවරයෙකුගේ මතයක් විමසා බැලීම හොඳයි කියල මං විශ්වාස කරනවා. සමහර විට මෙය අතිශයින්ම ගුප්තව තබාගත යුතු නිසා, කර්නල් එම්ස්වර්ත් වෙනත් වෛද්‍යවරයෙකුට ඔහුගේ පුතාව පෙන්වන්න නැහැ?"

"ඔව්, ඔබ හරි."

"මට තේරුණා. ඒ නිසා මං එක්ක ආවා මගේ විශ්වාස කටයුතු මිනුයෙක්. වරක් ඔහුට ඇතිවූ ගැටලුවකදී මගේ වෘත්තිමය සේවය ඔහුට ලබාදීමට මට හැකිවුණා. ඒ නිසා ඔහු මට සම්පූර්ණයෙන්ම සහතික වෙනවා මෙහි රහස්‍යභාවය ආරක්ෂා කිරීමට. ඔහු කැමතියි වෛද්‍ය විශේෂඥයෙකු හැටියට පමණක් නෙමෙයි, හිතමිතුරෙකු හැටියටත් උපදෙස් ලබාදෙන්න. ඔහුගේ නම සර් ජේම්ස් සෝන්ඩර්ස්."

ඒ නම සඳහන් කළ පමණින්ම කෙන්ට් මහතාගේ මුහුණ ඔප වැටිණි.

"මගේ විරුද්ධත්වයක් නෑ. ඔහු පැමිණ රෝගියා පරීක්ෂා කරනවා නම් ඇත්තෙන්ම මට ගෞරවයක්."

"එහෙම නම් මං ඔහුව කැඳවන්නම්. සර් ජේම්ස් මා සමග ආවත්, දැනට ඔහු අශ්ව කරත්තයේ රැඳිලයි ඉන්නේ. ඔහු රෝගියා පරීක්ෂා කරන තුරු, අපට පුළුවනි කර්නල් එම්ස්වර්ත්ගේ කන්තෝරු කාමරයේ ටිකක් කතාබහ කරන්න."

මගේ හිතවත් වොට්සන් නොමැති අඩුපාඩුව මට හොඳින්ම තේරෙන්නේ මෙවැනි අවස්ථාවලදීය. සියුම් ප්‍රශ්න ඉදිරිපත් කිරීම මගින්, ඔහු පාඨකයාට කුරුණු අවබෝධ කර දෙන්නේ ඉතා සිත් ගන්නා අයුරෙනි. මගේ කථාව, මා ඉදිරිපත් කරන විටදී, එවැනි සිත්ගන්නා සුලු බවක් නොමැති බැව් මම පිළිගනිමි. මගේ කරුණු

http://sherlockholmesinvestigations.blogspot.com

පැහැදිලි කිරීමට සවන්දීම සඳහා, ගොඩ්ෆ්‍රිගේ මව ද අප සමග එකතු වූවාය.

"මේ තරුණයා පියාගේ ආරක්ෂාව යටතේ සැඟවී හෝ සඟවලා බව දැනගත්තාම එයට හේතු ලෙස මට හිතාගන්න පුළුවන් වුණේ කාරණා තුනක් පමණයි.

පළමුවැන්න ඔහු මොකක් හෝ දරුණු අපරාධයක් කර සැඟවී සිටිනවා යන්න. දෙවැන්න ඔහු උන්මත්තක භාවයට පත්වීම නිසා, උන්මත්තකාගාරයකට නොයවා තබාගැනීමට සඟවාගෙන ඉන්නවා යන්න. තුන්වැන්න සමාජයෙන් වෙන්කර තැබිය යුතු බරපතල බෝවෙන රෝගයකට ගොදුරුවීම නිසා මෙසේ සඟවාගෙන ඉන්නවා යන්න.

අපරාධයක් සිදුකිරීමේ සැකය මට ඉක්මනින්ම ඉවත දැමීමට හැකිවුණා. ඒ මොකද විසඳාගන්න බැරිවුණු අපරාධයක් මේ පළාතෙන් වාර්තා වෙලා තිබුණේ නැහැ, සැහෙන කලකින්. ඒ ගැන මට හොඳටම විශ්වාසයි. තවමත් හෙළි නොවූ අපරාධයක් සිදුවෙලා තියමු. එහෙම නම් පවුලේ අය කරන්නේ, ඔහු ගෙදර සඟවාගෙන ඉන්නේ නැතුව හැකිහරම ඉක්මනින් පිටරටකට යවන් එකයි. ඉතින් ඒක ඉවත දැමීමට හැකිවුණා.

ඊළගට හිතා බලන්න තිබුණේ උමතුවීම ගැනයි. ඔහු භාරකරුවකු යටතේ සිටීමත්, ඔහු එදා රාත්‍රියේ දොර අගුළු දැමීමත් අප යොමු කළේ මේ පැත්තටයි. එහෙත් ගොඩ්ෆ්‍රි එදා රාත්‍රී යාළුවා බලන්න ඇවිත් ආපසු ගියා. එහෙම නම් උමතු බවක් වීමට ඉඩකඩ ඉතා අඩුයි. ඊළගට ඩොඩ් මහත්මයා මං ඔබෙන් ඇහුවා, භාරකරුවා කියැවූ පත්‍රයේ ස්වභාවය. එය 'ලැන්සට්' නම් වෛද්‍ය සඟරාව හෝ බ්‍රිතාන්‍ය වෛද්‍ය සඟරාව වුණා නම් ඒක මට ලොකු පහසුවක් වෙන්න ඉඩ තිබුණා. උමතු රෝගියකු වුවත්, නියමිත ස්ථානවලට දැනුම් දීමෙන් පසු වෛද්‍යවරයෙකුගේ අධීක්ෂණය යටතේ නිසි ප්‍රතිකාර ලබාදෙනවා නම්, නිවසේ රඳවාගැනීම නීති විරෝධී නැහැ. අනෙක ඩොඩ් මහතා දුටු මුහුණේ අස්වාභාවික සුදු පැහැය. එවිට මට හිතා බලන්න ඉතුරු වුණේ එකම කුරුණයි.

ඒ තමා ලාදුරු රෝගය. මෙය දකුණු අප්‍රිකාවේ ඒ තරම් දුර්ලභ රෝගයක් නොමෙයි. 'මොනවා හරි අවාසනාවක් නිසා මේ තරුණයාට

http://sherlockholmesinvestigations.blogspot.com

ලාදුරු රෝගය වැළඳිලා ඇති. එහෙම වුණේ නම් මොහුගේ පවුලේ අයට ලොකු ප්‍රශ්නයක් වෙනවා. ඒ මොකද ඔහු ලාදුරු රෝහලකට යවන්න සිද්ධවෙන නිසා.* ඒසේ නොකොට නිවසේ තබාගත්තා නම් ඒ සඳහා අතිශය රහසිගත භාවයක් අවශ්‍ය වෙනවා. ඊළඟට හොඳින් මුදල් ගෙවනවා නම්, රෝගියා භාර අරගෙන ඔහු ගැන සොයා බැලීමට වෛද්‍ය විද්‍යාවට කැපවුණු වෛද්‍යවරයෙක් සොයා ගැනීම ඒ තරම් අපහසු වෙන්නේත් නෑ. අනෙක් කරුණ අඳුරු වැටුණාට පස්සේ රෝගියා නිවාස අඩස්සියක තබාගැනීම අවශ්‍ය වෙන්නෙත් නෑ. මේ හැම කරුණක්ම මාව යොමු කළේ ලාදුරු රෝගය දෙසටයි.

සම සම්පූර්ණයෙන්ම අස්වාභාවික ලෙස සුදු පැහැ ගැන්වෙන එක මෙම රෝගයේ ලක්ෂණයක්. ඉතින් මං තීරණය කළා මේ නිගමනය සම්පූර්ණයෙන්ම ඔප්පු වුණු අයුරින්ම ක්‍රියා කරන්න.

මට පෙනුණා රෝගියා වෙත කෑම ගෙනියන රැල්ෆ්, අත්ආවරණ පළඳින බව. ඒවාට විෂබීජ නාශක දියර ආලේප කරන බව, මගේ ආඝ්‍රාණ ඉන්ද්‍රියයට හඳුනා ගැනීමට හැකිවුණා. ඉතින් මගේ අන්තිම සැකයත් ඉවත් වුණා. ඔබේ රහස මට හෙළි වූ බව පෙන්වීමට එක වචනයක් ලියා පෙන්වීම ප්‍රමාණවත් වුණා. කටින් නොකියා, මා ඒ වචනය ඔබට පමණක් දකිය හැකි වන සේ ලියුවේ ඔබේ රහස මා රැකගන්නා බව ඔප්පු කිරීමටයි."

මා එම කථාන්තරය අවසන් කරද්දී කන්තෝරු කාමරයේ දොර විවෘත විය. රැල්ෆ් විසින් ඇතුළට කැඳවාගෙන එනු ලැබුවේ, සුප්‍රසිද්ධ චර්ම රෝග විශේෂඥයා වන මගේ මිත්‍ර සර් ජේම්ස් සෝන්ඩර්ස් මහතාය. සාමාන්‍යයෙන් කිසිදු සිනහවක් දක්නට නොලැබෙන මේ නිහඬ මිනිසාගේ මුහුණේ අද දක්නට තිබුණේ ප්‍රීතිමත් සිනහවකි; දැඩි උද්යෝගයකි. කර්නල් එම්ස්වර්ත් වෙත කෙළින්ම ගිය ඔහු, කර්නල්ගේ සුරත ගෙන සුභාශිංසනය කළේය.

"මට සාමාන්‍යයෙන් නම් කියන්න තියෙන්නේ නරක ආරංචි පමණයි. හොඳ ආරංචියක් කියන්න ලැබෙන්නේ බොහොමත්ම

* දැන් විරූප වීමකින් තොරව ලාදුරු රෝගය නිට්ටාවට සුවකළ හැකි බව වෛද්‍ය විශේෂඥ මතයයි.

- පරිවර්තක

http://sherlockholmesinvestigations.blogspot.com

කලාතුරකින්. නමුත් අද මම ඔබට කියන්නේ ඉතාම සුභ ආරංචියක්. එය ලාදුරු නෙමෙයි!"

"මොනවා?"

"ඔව්. මෙතන පෙනුමෙන් ලාදුරු වලට සමාන නමුත් සම්පූර්ණයෙන්ම ඊට වෙනස් ඉක්තියෝසිස් නම් රෝගය. මට එය කිසිම සැකයක් නැතිව හඳුනාගන්න හැකියි. ඒ වගේම මෙක කිසිසේත් බෝවෙන රෝගයක් නොවෙයි. අනෙක නිසි වෛද්‍ය ප්‍රතිකාර වලින් මෙයින් බොහෝ දුරට සුවයක් ලබා ගැනීමට හැකියි.

මෙක හරි අහම්බෙන් වුණු සිදුවීමක්! ඔහු ලාදුරු රෝගියෙකුගේ ඇඳේ නිදාගැනීමත්, මේ රෝගයට ගොදුරු වීමත් සිද්ධීන් දෙකක්. එකිනෙක සම්බන්ධයක් නැති සිද්ධීන් දෙකක්. නමුත් එකක් සිදුවුණාට පසු අනෙක සිදුවුණාම, ඔහු බියට පත්වුණා ඔහුට ලාදුරු වැළඳිලා කියල. මේ වෘත්තියේ මා ලැබූ කීර්තියක් ඇත් නම් එයින් මම සහතික වෙන්නම්, මෙය සුවකළ හැකි, බෝ නොවෙන රෝගයක් . . . .

. . . . දෙවියනේ එම්ස්වර්ත් මහත්මිය ක්ලාන්ත වුණා! සන්තෝෂය ඉවසාගන්න බැරුවයි ඇය ක්ලාන්ත වුණේ. කෙන්ට් මහත්මයා ඔබේ අවධානය ඇය වෙත යොමු කරන්න."

Reading Purpose Only

http://sherlockholmesinvestigations.blogspot.com

# රන් පදක්කම

Reading Purpose Only. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com



# රන් පදක්කම

මේ කථාව හාස්‍යයෙන් පිරුණු සුඛාන්තයකැයි ඔබ සමහර විට කීමට ඉඩ ඇත. එහෙත් එය ශෝකාන්තයක් වීමට ද බොහෝ දුරට ඉඩ තිබිණ. කෙසේ වෙතත් සිද්ධිය අවසන් වෙද්දී එක් අයෙක් සිහිවිකල් වී උන්මත්තකයෙකු බවට පත්විය. වෙඩි පහරකට ලක්වී තුවාල සිදුවුවද මම ජීවිතය ගළවා ගතිමි. අනෙකෙකු නීතියේ රැහැණට හසුවිය. සුඛාන්තයක්ද ශෝකාන්තයක්ද යන්න තීරණය කිරීම ඔබට භාර කරමි.

මේ සිද්ධිය වුණු කාල වකවානුව කුමක්දැයි මට හොඳින් මතක ඇත. මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස් වෙත, රජ පවුලෙන් පිරිනමන ලද නයිට් පදවිය ඔහු ප්‍රතික්ෂේප කළේ ද එම මාසයේදීම වීම ඊට හේතුවයි. එංගලන්තයේ රජපවුල වෙනුවෙන් ඔහුගෙන් ඉටුවුණු යම් සේවාවක් අගය කිරීම වස් මෙම උතුම් ගෞරව සම්මානය ඔහු වෙත ප්‍රදානය කිරීමට තීරණය කෙරිණි. රහස්‍ය භාවය සුරැකීම සඳහා හෝම්ස්ගෙන් ඉටුවුණු සේවය කුමක්දැයි අනට මම හෙළි නොකරමි. කෙසේ වෙතත් ඒ, දකුණු අප්‍රිකාවේ බෝයර් යුද්ධය අවසන් වූ 1902 ජූනි මාසයේ අග භාගය බව මට සහතිකය. ෆුල්ස්කැප් පිටුවක ලියැවුණු දිගු ලියුමක් කියවා, එදා උදේ වරුවේ හෝම්ස් අතිශයින් ප්‍රමෝදයට පත්ව සිටියේය.

"වොට්සන්, මගේ මිත්‍රයා. මන්න සල්ලි ටිකක් හොයාගන්න හොඳ අවස්ථාවක්. ඔබ කවදාහරි අහල තියෙනවද ගැරිඩෙබ් කියල නමක් තියෙන කෙනෙක් ගැන?"

"නැහැ. ඇයි?"

ගැරිඩෙබ් කියන නමක් තියෙන කෙනෙක් හොයාගත්තොත් සෑහෙන මුදලක් අපට හම්බකරගන්න පුළුවනි."

"ඒ කොහොමද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒක සෑහෙන්න දිග කථාවක්, ඒ වගේම පුදුමාකාර එකක්. මේ වගේ අපූරු ගතිගුණ ඇති මිනිසුන් ගැන පරීක්ෂණයකට, මීට කලින් අපට මුහුණ දෙන්න ලැබිලා නෑ. මෙක ඒ තරම් සුවිශේෂ එකක්. මෙකට සම්බන්ධ පුද්ගලයා තව ටිකක් වෙලා යද්දි මෙහේට ඒවි. අපට තියෙනවා ඔහු එක්ක කරන්න ලොකු සාකච්ඡාවක්. ඒ නිසා මං මේ ගැන මොකුත් ඔබට දැන් කියන්න යන්නෙ නැහැ. ඒ වුණත් අපට වුවමනා නම අරකයි."

මා අසලම වූ මේසය මත දුරකථන නාමාවලිය තිබිණි. මම එය නිකමට පෙරළා බැලුවෙමි. මා පුදුමයට පත් කරමින්, ඒ අපූරු නම නාමාවලියේ සඳහන්ව තිබිණ.

"හෝම්ස්! මෙන්න තියෙනවා ඔබ හොයන නම."

නාමාවලිය මගේ අතින් ගෙන හෝම්ස් එය කියවා බැලුවේය.

"ගැරිඩෙබ්. එන්. 136 ලිට්ල් රයිඩර් වීථිය, බටහිර ලන්ඩනය. ඔබේ බලාපොරොත්තු කඩකරන්න සිදුවීම ගැන කණගාටුයි වොට්සන්. නමුත් මේ තැනැත්තා තමයි මට අර දිග ලියුම එවූ එක්කෙනා. අපට ඕන කරන්නෙ ඒ නම තියෙන වෙනත් කෙනෙක්."

මේ මොහොතේම හඩ්සන් මහත්මිය තැන්දේසියක තබාගත් ආගන්තුක පත්‍රයක් රැගෙන අපේ ඉසිත්ත කාමරයට ඇතුළු වූවාය. මම එය අතට ගෙන කියවා බැලීමි.

**ජෝන් ගැරිඩෙබ්**

**නීති උපදේශක,**

**මුවර් විල්**

**කැන්සාස්**

**ඇමරිකා එක්සත් ජනපදය**

"ඇයි හෝම්ස් මේ ඉන්නෙ තවත් ගැරිඩෙබ් කෙනෙක්! මේ ඔය ලියුම එවූ පුද්ගලයා නොවෙයි." මම මහත් සතුටෙන් කීවෙමි.

"කණගාටුයි කියන්න. තවත් සැරයක් උත්සාහ කරන්න වොට්සන්. මේ මහත්මයත් දැනටම මේ කතන්දරේට සම්බන්ධ වෙලයි

http://sherlockholmesinvestigations.blogspot.com

ඉන්නේ. ඒ වුණත් මේ වෙලාවේ ඔහු මාව හමුවෙන්න ඒවි කියල නම් මං බලාපොරොත්තු වුණේ නෑ. කොහොම වුණත් අපට දැනගන්න උවමනා තොරතුරු රාශියක්ම කියන්න ඔහුට හැකිවේවි."

අපේ විසිත්ත කාමරයට ඇතුළු වූ නීති උපදේශක ජෝන් ගැරිඩෙබ් මහතා, තරුණ පෙනුමක් තිබූ, තරමක් තරබාරු, මිටි පුද්ගලයෙකු විය. සම්පූර්ණයෙන්ම රැවුල මුඩුකොට සිටි ඔහුගේ මුහුණේ තිබුණේ ළමා පෙනුමක් යයි මට සිතිණි. මුහුණේ නිරතුරුවම දක්නට ලැබුණු සිනහව පියකරු විය. ඔහුගේ සුවිශේෂම ලක්ෂණය ලෙස මා දුටුවේ, සිතේ ඇතිවුණු සෑම හැඟීමක් සමගම චලනය වූ නෙත් යුවලයි. ජෝන් ගැරිඩෙබ් මහතාගේ ඉංග්‍රීසි කතාබහේ පැහැදිලිවම ඇමරිකන් උච්චාරණයක් තිබිණි. එහෙත් එය අපට තේරුම් ගැනීමට අපහසු තරම් පැටලිලි සහගත නොවීය.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා?" ඔහු විමසුවේ අප දෙදෙනාගේම මුහුණු දෙස පරීක්ෂාවෙන් බලමිනි.

"ආ ඔව්! ඔබේ ඡායාරූපවල පෙනුමත් ඔබ පණපිටින් ඉන්නවා වගේම තමයි. මං විශ්වාස කරනවා ඔබට ලියුමක් ලැබෙන්න ඇති කියලා. ඒ මගේ පෙළපත් නාමයම තිබෙන නේදන් ගැරිඩෙබ් මහත්මයාගෙන්. එහෙම නේද?"

"කරුණාකරල මෙතෙන්න වාඩිවෙන්න මහත්මයා." හෝම්ස් කීය.

"අපට කතාබහ කරන්න ගොඩක් දේවල් තියෙනවා. මට ලැබුණු ලියුමෙ සඳහන් ජෝන් ගැරිඩෙබ් ඔබයි එහෙනම්? ඔබ එංගලන්තයේ පදිංචියට ඇවිත් දැන් සෑහෙන කාලයක් ගතවෙනව වගෙයි?"

"ඇයි ඔබ එහෙම කියන්නෙ?" ඇසූ ඔහු හෝම්ස් දෙස හෙළුවේ සැක සහිත බැල්මකි.

"ඔබේ ඇඳුම් පැළඳුම් සම්පූර්ණයෙන්ම එංගලන්තයේ ඒවා." හෝම්ස් පිළිතුරු දුන්නේය. ගැරිඩෙබ් මහතා මුහුණට සිනාවක් නගාගැනීමට උත්සාහ කළේය.

"හෝම්ස් මහත්මයා. ඔබට ඇති ඔය සුවිශේෂ හපන්කම ගැන මං පොත්පත් වල කියවල තියෙනවා. ඒ වුණත් ඔබ දවසක මං ගැනත් ඒ විදියට කියාවි කියල මං කවදාවත් හිතුවෙ නෑ. ඔය කියන කාරණය ඔබ නිගමනය කළේ කොහොමද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබේ කබායේ අරහිස සහ බොත්තම් වල ඉදිරි කොටස නිසා. කබාය ඔය ආකාරයට මහන්නේ එංගලන්තයේ මිසක් ඇමරිකාවේ නොවෙයි. අනෙක සපත්තු කුට්ටමේ මෝස්තරය අනුව එය එංගලන්තයේ එකක් නොකියොත් ඇත්තෙන්ම මා දුර්වලයි."

"හැබෑට? මම නම් හිතුවේ නැහැ ඔය තරම් පැහැදිලිවම මට ඉංග්‍රීසි ජාතිකයෙකුගේ පෙනුමක් ලැබේවි කියලා. මේ ව්‍යාපාර කටයුතු වලට මං එංගලන්තයට ඇවිත් ටිකක් කල් වෙනවා. ඔබ කියන්න වගේ මගේ ඇඳුම් පැළඳුම් සියල්ලක්ම ලන්ඩනයෙන් මිළට ගනිපුවා. ඒවා කොහොම වුණත් මට පෙනෙනවා ඔබට කාලය හුඟක් වටින බව. ඔබේ අතේ තියෙන ඔය ලියමන ගැන අපේ කතාබහ පටන් ගත්තොත් හොඳයි නේද?"

හෝම්ස්ගේ නිරීක්ෂණයන් හා නිගමනයන් මගින් අපගේ අමුත්තා කැළැඹීමට පත්වූ බැව් මම දුටුවෙමි. ඔහුගේ මුහුණේ තිබූ ප්‍රියමනාප බව ද මඳක් අඩුවී ගියා දෝයි මට සිතිණි.

"ඉවසන්න ගැරිඩෙබ් මහත්මයා ඉවසන්න! මේ මගේ හිතවත් වොට්සන් දොස්තර මහත්මයා ඔබට කියලා දේවි, මේ ආකාරයට නිරීක්ෂණ මගින් අප ලබාගන්නා තොරතුරු සමහර වෙලාවට මුළු පරීක්ෂණය සඳහාම වැදගත් වෙන බව. කොහොම වුණත් ඇයි නේදන් ගැරිඩෙබ් මහත්මයා ඔබත් එක්ක ආවෙ නැත්තේ?" හෝම්ස් විමසීය.

"ඒ මිනිහා මොකටද ඔබ මේකට සම්බන්ධ කරගත්තේ?" අපේ අමුත්තා පැවසුවේ තරමක් කෝප වූ ඇයුරෙනි.

"මහත්වරු දෙන්නෙක් අතරේ පෞද්ගලික ව්‍යාපාර ගනුදෙනුවක් තියෙනවා. එක්කෙනෙක් මොකටද ඒකට රහස් පරීක්ෂකයෙකුත් හවුල් කරගන්නේ? මට නම් තේරුම් ගන්න බෑ ඔහු ඔබව මේකට පටලවා ගත්තේ ඇයි කියලා. මං අද උදේ ගියා ඔහුව හමුවෙන්න. එතකොටයි ඔහු මට කිව්වේ, මටත් නොකියාම මේක ෂර්ලොක් හෝම්ස් මහත්මයාට දනුම් දුන් බව. ඒ නිසයි මං මේ ආවෙ. කොහොම වුණත් ඔහුගේ මේ ක්‍රියාව මගේ හිතට එච්චර හරි නෑ."

"ඒ ඔබ ගැන සැකයක් ඇතිවෙලා නෙමෙයි ගැරිඩෙබ් මහත්මයා. ඔහු අදහස් කළේ ඔබ දෙදෙනාටම වැදගත් මේ අරමුණ ඉෂ්ට කර ගැනීමට මගෙන් උදව් ලබාගන්න. ඔහු දන්නවා මට ලෝකෙ හැම පැත්තෙන්ම තොරතුරු ලැබෙන බව. ඉතින් මේ ගැන මගෙන් විමසා සිටීමේ පුදුමයක් නැහැ."

http://sherlockholmesinvestigations.blogspot.com

බෙහෙවින් කෝප වී සිටි අපේ අමුත්තාගේ ස්වභාවය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්විය.

"ඔව්. එහෙනම් ඉතින් කමක් නෑ. මං කැමැති නෑ අපේ පෞද්ගලික කටයුතු වලට පොලීසිය ඇඟිලි ගහනවට. අපට උවමනා කරන මිනිහ හොයාගන්න ඔබ උදව්කරන්න කැමති නම් ඒකෙ කිසි වැරැද්දක් නැහැ."

"ඉතින් මහත්මයා මං කැමැතියි මේක ගැන සම්පූර්ණ විස්තරයක් ඔබේ කටෙන්ම අහගන්න. අනෙක මෙතන ඉන්න මගේ මිත්‍ර දොස්තර වොට්සන් මය ගැන කිසිම තොරතුරක් දන්නෙ නෑ."

ගැරිඩෙබ් මහතා මා වෙත හෙළුවේ මිත්‍රශීලී බැල්මක් නොවේ.

"ඔහු මොකටද මේ ගැන දැනගන්නෙ?" ගැරිඩෙබ් ඇසීය.

"අපි දෙන්නා මේ රාජකාරිය කරන්නෙ එකට."

"හොඳයි. එහෙනම් මං පුළුවන් තරම් කෙටියෙන් මේ කථාව ඔබට කියන්නම්. ඇමරිකා එක්සත් ජනපදයේ, කැන්සාස් ප්‍රදේශයේ කෙනෙකුට නම් ඇලෙක්සැන්ඩර් හැමිල්ටන් ගැරිඩෙබ් කියන්නෙ කවුද කියල අමුතුවෙන් කියන්න ඕනේ නෑ. ඔහු මුලින්ම කළේ නිවාස හා ඉඩම් විකිණීමේ ව්‍යාපාරයක්. ඊට පස්සේ ඔහු අතගැහුවා චිකාගෝවේ තිරිඟු නිෂ්පාදන ව්‍යාපාර වලට. ඒකෙන් ඔහු කියන්න බැරි තරම් විශාල ධනස්කන්ධයක් උපයා ගත්තා. ඊළඟට ඒ මුදල් ඔක්කෝම ටික ඔහු ආයෝජනය කළා ඉඩම් මිළදී ගන්න. ඒ ඉඩම් යාමයේ බටහිර මායිම ඩොජ් බලකොටුව. අර්කන්සාස් ගඟේ ඉවුර දිගේ සැතපුම් ගණනාවක් දිගට මහා යෝධ ප්‍රදේශයක් ඔහු මිළට ගත්තා. ප්‍රමාණයෙන් බැලුවොත් ඒක මේ එංගලන්තයේ ප්‍රාන්තයක් තරම් විශාලයි. ඒකෙන් කොටසක් ගොඩමඩ දෙකටම වගා කළ හැකි සශ්‍රීක ඉඩම්; කොටසක් හරකුන් එළුවන් ඇතිකරන්න යෝග්‍ය තණබිම්; තවත් කොටසක් වටිනා දැවවර්ග වලින් වැසුණු කැලෑව; අනෙක් ප්‍රදේශය ඔක්කොම වටිනා ඛනිජ ඉල්ලම් සහිත පොළොව. මේ වගේ ඉඩම් අයිති කෙනෙකුට සල්ලි ලැබෙන්නේ උල්පතකින් වතුර උනන්න වගේ කියලා අමුතුවෙන් කියන්න ඕනෙ නැහැනේ.

හැබැයි ඔහුට ඥාතීන් නම් කිසි කෙනෙක් හිටියේ නෑ. ඔහුට තිබුණු මේ ගැරිඩෙබ් කියන අසාමාන්‍ය පෙළපත් නාමය ගැන ඔහුගේ

http://sherlockholmesinvestigations.blogspot.com

හිතේ තිබුණෙ පුදුම සතුටක්, ආඩම්බරයක්. ඒකෙන් තමයි අපි දෙන්න හමුවුණේ. ඒ දවස්වල මං ටොපේකා නගරයේ නීතිඥ වෘත්තියේ යෙදිලා හිටියා. එක දවසක් හදිසියේම මේ වයසක මනුස්සයා මාව මුණගැහෙන්න ආවා. මගේ නමත් ගැරිඩෙබ් බව අහලා මිනිහට මැරෙන්න තරම් සන්තෝසයි. ඔහුගේ විනෝදාංශය වෙලා තිබුණේ මොකක්ද දන්නවද? ගැරිඩෙබ් කියන පෙළපත් නාමය ඇති අය හෙවීම.

"ඉලන්දාරියා, අපේ පෙළපත් නාමය තියෙන තව එක මිනිහෙක් මට හොයල දෙනවා." ඔහු කිව්වා.

"මහත්මයා එහෙම කෙනෙක් හොය හොයා මට රටපුරා ඇවිදින්න වෙලාවක් නෑ. මං නීතිඥයෙක්. මං මගේ රැකියාව කළ යුතුයි."

"ඒකෙ ප්‍රශ්නයක් නෑ. මං සැලැසුම් කරලා තියෙන විධියට හැමදේම සිදුවුණොත් ඔබ ඔය බැහැ කියන වැඩේ කරාවි, කැමැත්තෙන්ම. ඒ ගැන කිසි සැකයක් නෑ."

ඔහු මේ විධියට කිව්වාම මුලදී හිතුවේ ඔහු විහිළු කරනවා කියලමයි. නමුත් ඒකෙ සැඟවිලා තිබුණු සත්‍යය මට වැටහුණේ පසුවයි.

මාව හමුවෙලා අවුරුද්දක් ගතවෙද්දී ඔහු මියගියා. ඔහු අන්තිම කැමැති පත්‍රයක් ලියලයි තිබුණේ. මං හිතන්නේ මුළු කැන්සාස් ජනපදයේ ඉතිහාසයේම නෑ ඒ වගේ අරුම පුදුම අන්තිම කැමැති පත්‍රයක්. ඔහුගේ මුළු දේපොළම කොටස් තුනකට බෙදලා තිබුණා. එයින් එක කොටසක් ලියා තිබුණේ මගේ නමට. ඒත් ඒ එක කොන්දේසියක් උඩ. මට භාරවෙලා තිබුණා ගැරිඩෙබ් කියන පෙළපත් නාමය ඇති තවත් දෙන්නෙක් හොයාගන්න. එහෙම හොයාගෙන, අපි තුන්දෙනාටම එකවර ඉදිරිපත් වෙන්න පුළුවන් නම් එක්කෙනෙකුට ලැබෙන මුදල ඩොලර් ලක්ෂ පනහයි.

මේක හරියට කර ගත්තොත් හොඳ වාසි ලැබෙන වැඩක් බව මං තේරුම් ගත්තා. නීතිඥ කාර්යාලය වහල දාලා මං ගැරිඩෙබ් කෙනෙක් හොයමින් රටපුරා ඇවිදින්න පටන් ගත්තා. මං මුළු ඇමරිකා එක්සත් ජනපදයේම, හැම ජනපදයකටම ගිහිං හොයා බැලුවා. කොයිතරම් සියුම් ලෙස පීරලා බැලුවත් එක ගැරිඩෙබ් කෙනෙක්වත් හොයාගන්න බැරි වුණා.

http://sherlockholmesinvestigations.blogspot.com

ඊට පස්සේ මට හිතුණා එංගලන්තයට ඇවිත් මෙහෙ සෝදිසි කරලා බලන්න. ඔන්න ලන්ඩනයේ දුරකථන නාමාවලියෙ තිබිලා එක්කෙනෙක් හම්බවුණා. ඉතින් මං ඔහු හමුවෙන්න ගිහිං හැමදෙයක්ම ඔහුට තේරුම් කරලා දුන්නා. නමුත් ඔහුත්, මා වගේ තනිකඩයෙක්; වයස්ගත කෙනෙක්. ගෑනු නෑදෑයින් කීපදෙනෙක් ඉන්නවාලු. ඒත් කිසිම පිරිමියෙක් නෑ. අන්තිම කැමැති පත්‍රයේ කියලා තියෙන්නේ මේ නම තිබෙන වැඩිහිටි පිරිමි තුන්දෙනෙක් කියලා. ඉතින් ඔබට පෙනෙනවා නේද? ගැරිඩෙබ් කෙනෙකුට ඇබෑර්තුවක් තියෙනවා. හොයලා දුන්නොත් අපි සූදානම් ඔබේ ගාස්තුව ගෙවන්න."

"මං කිව්ව නේද වොට්සන්," හෝම්ස් පැවසුවේ සිනාමුසු මුහුණෙනි.

"මං කිව්ව නේද මෙක හරි පුදුමාකාර කතන්දරයක් කියල, මහත්මයා. මට හිතෙනවා ඔබට කරන්න තියෙන පහසුම වැඩේ, පුවත්පත්වල 'පෞද්ගලික' කියන තීරුවේ දැන්වීම පළකරලා, හොයල බලන එක කියලා."

"මං ඒක කළා හෝම්ස් මහත්මයා. නමුත් කිසිම ප්‍රතිඵලයක් ලැබුණෙ නෑ."

"හැබෑට? මටත් විවේක තියෙන වෙලාවලදී මං ටිකක් හොයල බලන්නම්කො. ඒක හොඳමයි. ඔබ ටොපේකා නගරයෙන් ආව කෙනෙක් බව දැනගන්න ලැබීමත් සතුටක්. මට නිතර ලියුම් එවන කෙනෙක් හිටියා ටොපේකා වල. දැන් නම් ඔහු මියගිහින්. ඔබ සමහර විට දන්නවත් ඇති. දොස්තර ලයිසැන්ඩර් ස්ටාර්? 1890 දී පමණ ඔහු ටොපේකා වල නගරාධිපති තනතුරත් දැරුවා."

"දොස්තර ස්ටාර්? අනේ හරිම හොඳ මනුස්සයා. හදිසියේ මළේ. තවමත් මිනිස්සු ඒ පුද්ගලයාගෙ නාමයට හරියට ගෞරව කරනවා මහත්මයා.

ඉතින් හෝම්ස් මහත්මයා: අපට දැන් කරන්න පුළුවන්, අපේ වැඩකටයුතු කෙරිගෙන යන ආකාරය ගැන ඔබට දැනුම් දීම පමණයි. මං හිතන්නේ දවසක් දෙකක් යද්දි අපට හැකිවේවි අලුත් යමක් ඔබට දැනුම් දෙන්න." එසේ පැවසූ අපේ ඇමරිකානු මිත්‍රයා හිසනමා ආචාර කොට පිටවී ගියේය.

"මට නම් හරිම පුදුමයි වොට්සන්. පුදුමෙනුත් පුදුමයි."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ ඇයි?"

"මං මේ කල්පනා කළේ මේ තරම් පට්ටපල් බොරු, වැල්වටාරම් තොගයක්ම මේ මිනිහා ඇදබාන්නෙ මොන අරමුණෙන්ද කියලා. මට ඔහුගෙන් ඒක අහන්නම හිතුණා. ඒ මොකද සමහර වෙලාවට ඔය වගේ බොරුකාරයින්ව උපහාසෙට ලක් කරන්න ඕනෙ කෙලින්ම මුහුණටම. ඊට පස්සේ මට ආයෙ හිතුණා දැනට මිනිහට දිනුම දෙන්න. අපි ඔහුගේ ලෝක බොරු වලට රැවටුණා කියල හිතාගන්න අරිමු.

ඔන්න ඉන්නවා මිනිහෙක්. එංගලන්තයේ මහපු සූට් එකක් ඇඳගෙන. වැලමිටි හා දණිස් වලින් එය ගෙවීගොස්, රැලිවැටී ඇති ආකාරය අනුව මට කියන්න පුළුවනි, අඩුම වශයෙන් ඒක අවුරුද්දක්වත් ඇඳපු එකක්. නමුත් ඔහුගේ අතේ තිබෙන ලියකියවිලි වල හැටියටත්, කතන්දරයේ හැටියටත් ඔහු ගමබද ඇමරිකානුවෙක්. ඊයේ පෙරේදා නමයි ලන්ඩනයට නැවෙන් ගොඩබැහැල තියෙන්නේ.

පුවත්පත්වල "පෞද්ගලික" තීරුයේ ඔය කියන විධියේ කිසිම දැන්වීමක් මෑත කාලයේ නම් තිබුණේ නෑ, වොට්සන්. ඒක මට හොඳටම විශ්වාසයි. ඔබ දන්නවනේ මං ඔය තීරුයේ එක දැන්වීමක් අත් අරින්නේ නැති බව. ටොපේකා නගරයේ දොස්තර ඇලෙක්සැන්ඩර් ස්ටාර් කියල කෙනෙක් මං ජීවිතේට අහල නෑ. ඔහු ඒ ලණුවත් කැවා. ඔහු කට ඇරියොත් කියන්නෙ බොරුවක්. මං හිතන්නේ මිනිහා ඇත්තටම ඇමරිකන් ජාතිකයෙක්. නමුත් කාලයක් තිස්සෙ ලන්ඩනයේ ජීවත්වෙලා තියෙන්නේ. ඔහුගේ ඉංග්‍රීසි කතාබගේ ඇමරිකන් උච්චාරණය පවා දැන් වෙනස් වෙලා!"

"මොකක්ද මිනිහා දාන්න හදන සෙල්ලම? මිනිහා මොකාටද එන්න හදන්නෙ හෝම්ස්?"

"අන්න ඒක තමයි අපි හොයාගන්න ඕනෙ. මොහු හොම්මර එකේ තක්කඩියෙක් බව නම් මට සහතිකයි. නමුත් ඔහු අතිදක්ෂයෙක් වගෙයි, මට පෙනෙන්නෙ. හොඳයි කමක් නෑ. අපි ඊළඟට හොයල බලමු අපේ අනෙක් ගැරිඩෙබ තවත් මේ වගේ තක්කඩියෙක්ද කියල. ඔහුට දුරකථනයෙන් කථා කරන්න වොට්සන්."

දුරකථන නාමාවලියේ නේදන් ගැරිඩෙබ යන නම යටතේ වූ අංකයට මම ඇමතුවෙමි. අනෙක් කෙළවරෙන් මට අසන්නට ලැබුණේ දුර්වල කටහඬකි.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව්. ඔව්. තේදන් ගැරිඩෙබ් තමයි කථාකරන්නෙ. හෝම්ස් මහත්මයා ඉන්නවද? . . . . මං කැමතියි හෝම්ස් මහත්මයාට ටිකක් කථාකරන්න."

මම රිසීවරය හෝම්ස් අතට දුන්නෙමි.

"ඔව්. ඔව්. ඔහු මෙහේට ඇවිත් ගියා . . . . ඔබත් ඔහුව හරිහැටි අඳුනන්නෙ නැති බව මට අහන්න ලැබුණා . . . . කොච්චර කල්ද? ආ . . . . අවස් දෙකයිද? . . . . ඔව් ඔව් . . . . බොහොම වාසිදායක ගනුදෙනුවක් බව නම් තැබෑව. අද හැන්දෑවේ ඔබ ගෙදර ඉන්නවද? . . . . ඒක හොඳයි . . . . ඔව් . . . . ඇමරිකන් ගැරිඩෙබ් මහත්මයා අර වෙලාවට ඔහේ ඉන්න එක්ක නැහැ නේද? . . . . අන්න හොඳයි. අද හැන්දෑවෙම අපි එන්නම් ඔබව හමුවෙන්න. ඔහු නැතිව ඔබත් එක්ක ටිකක් කථාකරන්න මං කැමතියි. මාත් එක්ක දොස්තර වොට්සන් එනවා. අපි හැන්දෑවෙ හය වෙද්දි ඔහේට එන්නම්. ඇමරිකන් නීතිඥයට අපි එන බව කියන්න එපා . . . . ඔව් . . . . ඒක හොඳයි. ආයුබෝවන්."

බැස යන සැඳෑ හිරුගේ එළියෙන් බටහිර ලන්ඩනය ආලෝකමත් වෙද්දී, අපි ලිට්ල් රයිඩර් වීථිය සොයා ගමන් ගත්තෙමු. එය එඩ්ග්වෙයාර් වීථියෙන් ඈයිබුණු කුඩා පටුමගකි. එහි අංක 136 දරන නිවස, ජෝජ් රාජ් සමයේ ඉදිකෙරුණු පුරාණ තට්ටු ගොඩනැගිල්ලකි. අපේ අනුග්‍රාහකයා ජීවත් වූයේ මෙහි බිම් මහලේය. ඔහුගේ නම සඳහන්ව තිබූ, දුර්වර්ණ වූ පිත්තල නාම පුවරුව වෙත හෝම්ස් මගේ අවධානය යොමු කළේය.

"සෑහෙන කාලයක් තිස්සේ මිනිහා මෙහේ ඉඳලා තියෙනවා වොට්සන්. කිසි සැකයක් නැතුව මිනිහාගේ නම ඇත්ත වශයෙන්ම ගැරිඩෙබ්. ඒක අපි මතක තබාගතයුතු වැදගත් කරුණක්."

මෙම පැරණි නිවසේ ඉහළ තට්ටුවල බොහෝ පදිංචිකරුවන් වාසය කළ බව, නාමපුවරු වලින් අපට දැකගත හැකිවිය. මෙය පවුල් පිටින් ජීවත් වූ තට්ටු නිවාස සංකීර්ණයක් නොව, අපිළිවෙළට ජීවත්වූ අවිවාහකයන්, තේවාසිකව සිටි නිවහනකි. දොරට තට්ටු කළ විට එය විවෘත කරන ලද්දේ අපේ අනුග්‍රාහකයා විසිනි.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා සහ දොස්තර වොට්සන් මහත්මයා නේද? කරුණාකර එන්න ඇතුළට.

http://sherlockholmesinvestigationz.blogspot.com

මට සමාවෙන්න, දොර විවෘත කොට ඔබව පිළිගැනීමට මගේ සේවිකාව නොසිටීම ගැන. හවස හතර වෙන කොට ඇගේ රාජකාරි වෙලාව අවසන්. ඒ නිසා ඇය ගෙදර යනවා."

නෙද්දන් ගැරිඩෙබ් මහතා වයසින් අවුරුදු හැටකටත් වැඩි, උස, මඳක් කුදු ගැසුණු ශරීරයක් තිබූ තැනැත්තෙකි. ඔහුගේ ශරීරය ඉතා කෙට්ටු, දුර්වල එකක් බව පෙනිණ. ව්‍යායාමයකින් තොරව, නිවස තුළටම වී කාලය ගත කිරීම නිසාදෝ, ඔහුගේ සම පාණ්ඩු පැහැති එකක් විය. ඝන රාමුව සහිත විශාල උපැස් යුවළත්, නට්ට හිසත්, නිකටේ එළු රැවුලත් නිසා ඔහුට තිබුණේ තරමක් විකාර පෙනුමකි.

ඔහුගේ කාමරය ද හිමිකරුවා මෙන්ම විස්මය දනවන එකක් විය. එය කුඩා කෞතුකාගාරයක් ලෙස විස්තර කිරීම වඩාත් නිවැරදි යයි සිතමි. කාමරය වටේටම වූ වීදුරු අල්මාරි වල, තට්ටු පුරවා තිබුණේ භූගර්භ විද්‍යාත්මක හා වෛද්‍ය විද්‍යාත්මක නිදර්ශක වලිනි. ප්‍රධාන දොර දෙපස වූ අල්මාරි දෙකක, සංරක්ෂණය කළ සමනලයින් රැසක් විය. කාමරය මැද තිබූ මේසය මත, නොයෙක් විද්‍යාවන්ට අයත් නිදර්ශක හා සුන්බුන් ද, ප්‍රබල කාච සහිත අන්වීක්ෂයක් ද විය. විවිධ අල්මාරිවල තැන්පත් කොට තිබූ, විවිධ ක්ෂෙත්‍ර වලට අයත් පෞරාණික දේවල් දුටු මම විස්මයට පත්වීමි. මෙම පුද්ගලයා ක්ෂෙත්‍ර ගණනාවකම හසළ දැනුමක් ඇත්තෙක් බව නිසැකය. එක් වීදුරු පෙට්ටියක සකස් කොට තිබුණේ, පෞරාණික රන් රිදී හා ලෝකඩ කාසි රැසකි. ඊට එහායින් ආදි මානවයින් භාවිත කළ පාෂාණමය මෙවලම්ය. තවත් විශාල වීදුරු අල්මාරියක් පුරවා තිබුණේ ප්‍රාග් ඓතිහාසික, පාෂාණීභූත සත්ත්වයින්ගේ ඇටකැබලි සහ දත්ය. විවෘත රාක්ක මත පැරිස් බදාමයෙන් නිර්මාණය කොට තිබූ ආදි මානවයන්ගේ හිස්කබල් පේළියකි. ඒවා නියැන්ඩර්තාල්, ක්‍රෝමැග්නන්, හයිඩල්බර්ග් ආදී වශයෙන් නම් කොට තිබිණි. ඔහු, අතේ තිබූ මෘදු සම් කැබැල්ලකින් පැරණි කාසියක් ඔප දමමින් සිටියේය.

"සිරැකියුසයන්ගේ ස්වර්ණමය යුගයේ භාවිත කළ කාසියක්. මගේ අදහස නම් ඔවුන් බොහොම උසස් ජීවන තත්ත්වයක සිටි අය. ඒත් සමහරු කියන්නෙ ඇලෙක්සැන්ඩර් යුගයේ ඊට වඩා හොඳ තත්ත්වයක් තිබුණා කියල.

ඔය ඉස්සරහින් තියෙන පුටුවෙන් වාඩිවෙන්න හෝම්ස් මහත්මයා. ආ . . . . ඔහොම ඉන්න. මම ඒකෙ තියෙන අස්ථි කැබලි

http://sherlockholmesinvestigations.blogspot.com

ටික අයින් කරන්නම්. වොට්සන් මහත්මයා . . . ඔබට කොහේද මං වාඩිවෙන්න දෙන්නෙ . . . . ආ ඔය තියෙන පුටුවෙ තබා ඇති ජපන් බඳුන පැත්තකට තල්ලු කරලා වාඩිවෙන්න. මහත්මයා ඔබට පෙනෙනවා නේද මාව වට කරගෙන තිබෙන දේවල් ? මේ මං මුළු ජීවිත කාලයක් තිස්සේ එකතු කරගත්තු, මං ආසා කරන දේවල්. මට ප්‍රතිකාර කරන දොස්තර මහත්මයා කියනවා, මං ටිකක් ඇවිදින්න යන්නෙ නැති එක ශරීරයට නරකලු. මගේ සිත ඇද බැඳ තබාගන්න, මේ තරම් දේවල් තියෙද්දි මං ඇවිදින්න යන්නෙ මොන එකකටද මහත්මයා? මේ එක කැබිනෙට්ටුවක තියෙන, බඩු ක්‍රමානුකූලව සකස් කරලා, ඒවල විස්තර සටහන් කරන්න මට සම්පූර්ණ මාස තුනක් ගතවෙනවා."

හෝම්ස් හිස කරකවමින් වට පිට බැලුවේ මහත් උනන්දුවෙනි.

"ඔබ කියන්නේ ඔබ කොයි වෙලාවකවත් මේ කාමරයෙන් එළියට බහින්නේ නෑ කියලද?"

"පෞරාණික දේවල් අලෙවි කරන සහ වෙන්දේසි කරන සද්බි හෝ ක්‍රිස්ටි ආයතන වලට මං ඉඳල හිටල අශ්ව කරත්තයෙන් ගිහින් එනවා. ඒ ඇරුණාම මං මේ ගෙදරින් කොහේටවත් යන්නෙ නැති තරමයි. මං ඒ තරම් ශක්ති සම්පන්න කෙනෙක් නෙමෙයි. මගේ පර්යේෂණ හරිම සිත් ඇදගන්නා සුලුයි. කාලය ගෙවී යනවා දැනෙන්නෙ නෑ. ඉතින් අර මහත්මයගෙ කතාව අහලා මගේ හිතේ ඇතිවුණු සන්තෝෂය, ඔබට හිතාගන්න පුළුවන් නේද හෝම්ස් මහත්තයා? පුදුමාකාර, අදහාගන්න බැරි වාසනාවක්.

අපට ඕනෙ කරන්නෙ ගැරිඩෙබ් නම තියෙන තව එක්කෙනෙක් විතරයි. එතකොට සියල්ලම සම්පූර්ණයි. මං හිතන්නෙ නෑ තවත් ගැරිඩෙබ් කෙනෙක් හොයාගැනීම ඒ තරම් අමාරු වේවි කියල. මටත් සහෝදරයෙක් හිටියා. ඔහු දැන් මියගිහින්. මං ඔබට ලියුමක් යැව්වේ, ඔබත් මහ අරුම පුදුම පරීක්ෂණ කරන කෙනෙක් නේ; ඒකයි. නමුත් අර ඇමරිකන් මහත්මයා, ඔහුගෙන් අහන්නේ නැතුව ඔබට ලියුමක් යැව්වට, මට හරියට දොස් කිව්වා. මට ඔහුගෙන් අහල ඉන්න තිබුණා. නමුත් මගේ අරමුණ වුණේ මේ වැඩට ඔබෙන් උදව්වක් ලබාගන්න."

"මං හිතන්නෙ ඔබ ක්‍රියා කරල තිබෙන ආකාරය ඉතාමත් නිවැරදියි මහත්මයා. ඒ වුණත් ඔය ඇමරිකා එක්සත් ජනපදයේ තිබෙන ඉඩකඩම් අත්පත් කරගන්න, ඔබ ඔය තරම් ආසද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"කොහොමටවත් නෑ හෝම්ස් මහත්මයා. මං මේ රැස්කරලා තිබෙන පුරාවස්තු අත්හැර දාලා, කොහේවත් යන්න මට කිසිම උවමනාවක් නෑ. නමුත් මේ ඇමරිකන් මහත්මයා කියනවා, දේපළ අපට හිමිවුණු හැටියෙම, මට මුදල් ගෙවලා මගේ ඉඩකඩම් කොටස ඔක්කොම ඔහු මිළට ගන්නවාලු. ඔහු කිව්වා ඒ ඉඩම ටිකට ඔහු ඩොලර් ලක්ෂ පනහක් දෙන්නම් කියලා. වටිනා පුරාවස්තු කොතෙකුත් විකුණන්න තියෙනවා. ඒත් මගේ අතේ පවුම් හාරපන්සීයක් නැති නිසා, මට ඒවා අත්පත් කරගන්න කිසිම ක්‍රමයක් නෑ. නිකං හිතන්නකො; ඩොලර් ලක්ෂ පනහක් ලැබුණොත් කොහොමට හිටීවිද? මගේ පුරාවස්තු කෞතුකාගාරය එංගලන්තයේ අංක එකට එනවා සිකුරුයි."

ඉවසාගත නොහැකි සතුට නිසා නේදන් ගැරිඩෙබ් මහතාගේ දෙනෙත් ප්‍රීතියෙන් බබලන්නට විය. තමාගේ පෙළපත් නාමය ඇත්තෙකු සොයාගැනීම සඳහා ඔහු ඕනෑම දුෂ්කර ක්‍රියාවක යෙදීමට සූදානම් බව අපට පැහැදිලි විය.

"මං වොට්සන් මහත්තයත් එක්ක මෙහේ ආවෙ ඔබ හොඳින් හඳුනාගන්නා අරමුණෙන්. ඔබේ පර්යේෂණ කටයුතු වලට බාධා කරන්න මගේ බලාපොරොත්තුවක් නෑ. ඒ වුණත් මං කැමැතියි මගෙන් උපදෙස් ඉල්ලන අය සමීපව හඳුනාගන්න. මං අර ඇමරිකන් මහත්තයගෙන් අසා දැනගත්තා, ඔබ ඔහුව දැනහඳුන ගත්තෙ මේ සතියෙ කියල. මෙවැනි කෙනෙක් ඉන්නවද කියල ඔබ මීට කලින් දන්නෙ නෑ?"

"කවදාවත් අහලවත් නෑ. ඔහු මුලින්ම මෙහේ ආවෙ, ගිය අඟහරුවාදා?"

"ඔහු බේකර් වීථියේ අපේ නිවහනට ඇවිත් මා හමුවුණු බව ඔබට දැනුම් දුන්නද?"

"ඔව්. එතනිං ඔහු කෙළින්ම ආවේ මාව හමුවෙන්න. ඔහුට බොහොම සැරට කේන්ති ගිහින් තිබුණා."

"මේ ගැන ගතයුතු යම් ක්‍රියාමාර්ගයක් ගැන ඔහු ඔබට යෝජනා කළාද?"

"නැහැ."

"ඔබගෙන් මුදලක් ලබාගත්තද? නැත්තං ඉල්ලුවද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"නැහැ. කොහොමටවත් මුදල් ඉල්ලුවෙ නෑ."

"ඔබට හිතෙන්නේ නැද්ද මේ සිද්ධිය ගැන මොකක් හරි සැකයක්? ඔහුගේ මොකක් හරි යටි අරමුණක්?"

"මොකුත් නෑ හෝම්ස් මහත්තයා."

"ඔබ ඔහුට කිව්වද, මෙහේදි ඔබව හමුවෙන්න දුරකථනයෙන් අපි සැලැසුම් කරගත් බව?"

"ඔව් මං කිව්වා."

බලාපොරොත්තු කඩවූ ස්වභාවයක් හෝම්ස්ගේ මුහුණෙන් දිස්විය. ඔහු දිගින් දිගටම කල්පනා කිරීමට පටන් ගත්තේය. හෝම්ස් විශාල ගැටළුවකට මැදිවී ඇති ආකාරයක් මම දුටුවෙමි.

"ගැරිඩෙබ් මහත්මයා. ඔබ මේ එකතු කර තිබෙන පුරාවස්තු අතර හුඟක් වටිනා දේවල් කිසිවක් තිබේනවාද?"

"නැහැ මහත්මයා. එවැනි දෙයක් එකතු කරගන්න තරම් මං පොහොසතෙක් නෙමෙයි. මේක හොඳ එකතුවක් බව ඇත්තයි. ඒත් ඒ තරම් වටිනා එකක් නෙමෙයි."

"හොරු මේ ගේ බිඳගෙන ඇතුළුවේවි කියලා ඔබට බයක් නෑ?"

"කොහොමටවත් නෑ."

"ඔබ මේ නිවසේ පදිංචි වෙලා කොයිතරම් කාලයක් වෙනවද?"

"අවුරුදු පහක් පමණ."

හෝම්ස්ගේ හරස් ප්‍රශ්න ඇසීමට බාධා කරමින්, කිසිවෙකු නොනවත්වා දොරට තට්ටු කරන හඬක් ඇසිණි. අපේ අනුග්‍රාහකයා දොර විවෘත කළ වහාම ඔහු ඇතුළට කඩා වැදුණේය. ඒ ඇමරිකන් නීති උපදේශක ජෝන් ගැරිඩෙබ්ය.

"ඔන්න වැඩේ හරි!" ඔහු කෑගැසුවේ පුවත්පතක් ඔසවා පෙන්වමිනි.

"මං හිතුවා රෑ වෙන්න කලින් ඔබව හමුවෙන්න පුළුවන් වේවි කියලා. නේදන් ගැරිඩෙබ් මහත්මයා, පිළිගන්න මගේ උණුසුම් සුභ පැතුම්! ඔබ දැන් විශාල ධනවතෙක්. අපේ ගනුදෙනුව ඉතාම සතුටුදායක

http://sherlockholmesinvestigations.blogspot.com

විධියට කෙළවර වෙන බවයි පෙනෙන්නේ, හෝම්ස් මහත්මයා. ඔබට නම් කියන්න තියෙන්නේ අනවශ්‍ය ලෙස කරදර කරන්න සිදුවීම ගැන කණගාටුයි කියන එක විතරයි."

ඔහු අපේ අනුග්‍රාහකයා වෙත පුවත්පත භාර දුන්නේය. එහි තිබූ විශාල වෙළෙඳ දැන්වීමක් වටා රවුමක් ඇඳ සලකුණු කොට තිබිණි. හේදන් ගැරිඩෙබ් ඒ දෙස ඇඹිපිය නොහෙළා බලා සිටියේ පුදුමයෙනි. අපි දෙදෙනා ද එම දැන්වීම දෙසට අවධානය යොමු කළෙමු. එහි මෙසේ සඳහන් විය.

**හොවාඩ් ගැරිඩෙබ්**

**කෘෂිකාර්මික යන්ත්‍ර නිෂ්පාදකයෝ**

*කරල් කපා මිටි බඳින යන්ත්‍ර, අස්වැන්න නෙළන යන්ත්‍ර, වාෂ්ප බලයෙන් හා අතෙන් ක්‍රියාකරවන නගුල්, කොළමඩින යන්ත්‍ර, ගොවිපොළේ පාවිච්චියට සුදුසු කරත්ත, කරත්ත සඳහා ලෑලි කට්ටු සහ අනෙකුත් සියලුම කෘෂි උපකරණ. තල ළිං කැණීම සඳහා ඇස්තමේන්තු සපයනු ලැබේ.*

**විමසන්න.**

**හොවාඩ් ගැරිඩෙබ්**

ග්‍රොව්නර් ගොඩනැගිල්ල,

ඇස්ටන්.

"අති විශිෂ්ටයි! එහෙනම් අපේ තුන්වෙනි මිනිහත් හම්බවුණා." වයස්ගත ගැරිඩෙබ් මහතා පැවසුවේ දැඩි සන්තෝෂයෙනි.

"මං බර්මිංහැම් ප්‍රදේශයෙන් විමසලා බැලුවා." ඇමරිකන් ජාතිකයා කථාව ඇරඹුවේය.

"එහේ ඉන්නවා මගේ නියෝජිතයෙක්. මේ දැන්වීම තියෙන පත්තරේ මිනිහා මට එව්ලා තිබුණා. අපි ඉක්මන් කරලා මේ පුද්ගලයා මුණගැහිලා වැඩේ කෙළවරක් කරන්න ඕනෙ. මං ඔහුට ලියුමකින්

http://sherlockholmesinvestigations.blogspot.com

දන්නුවා, හෙට හවසට නේදන් ගැරිඩෙබ් මහත්මයා ඔහුව හමුවෙන්න එනවා කියල, ඔහුගේ කාර්යාලයට."

"මේ වැඩේට මම නොගිහින් බැරිද?"

"හෝම්ස් මහත්මයා, ඔබ මොකද කියන්නේ? ඔබට හිතෙන්නේ නැද්ද වඩාත් නුවණැති ක්‍රියාමාර්ගය ඒකයි කියලා? මං මේ පුදුමාකාර කථාවක් කියමින් ඇවිදින ඇමරිකන් ජාතිකයෙක්. ඔහු මාව විශ්වාස කරාවිද? ඔබ, වැදගත්, ඒටේ පිළිගැනීමක් ඇති ඉංග්‍රීසි ජාතිකයෙක්. ඔබ කියන කථාවේ යම්කිසි වැදගත් කමක් ඇති බව ඔහු විශ්වාස කරාවි. ඔබට අවශ්‍ය නම් මටත් ඔබ සමඟ එන්න තිබුණා. නමුත් හෙට මට කාර්ය බහුල දිනයක්. ඔබට යම් විදියකින් ප්‍රශ්නයක් ඇතිවුණොත් මං එයත් එන්නම්."

"මං අවුරුදු ගණනාවකින් ඔය වගේ දුර ගමනක් ගිහිං නැහැ මහත්මයා."

"ඕක ඔය තරම් අමාරු එකක් වෙන්නෙ නැ නේදන් මහත්මයා. ඔබට යන්න, එන්න තියෙන දුම්රිය පිටත්වෙන වෙලාවල් ගැන මං හොයල බැලුවා. ඔබ හෙට දවල් දොළහට මෙහෙන් පිටත්වෙලා දුම්රියේ යන්න. මාත් එන්නම් දුම්රියපොළට. දවල් දෙක පහුවෙද්දී ඔබට බර්මිංහැම් ප්‍රදේශයට ළඟාවෙන්න පුළුවන් වේවි. ඊළඟට හැන්දෑවෙම ඔබට ආපහු එන්නත් පුළුවනි.

ඔබට කරන්න තියෙන්නෙ මෙච්චරයි. හවස හතරට මේ හොවාඩ් ගැරිඩෙබ් මහත්තයව හම්බවෙන්න. අපේ කාරණය ඔහුට පහදලා දෙන්න. ඊළඟට සත්‍ය වශයෙන්ම එහෙම කෙනෙක් ජීවත්ව ඉන්න බවට ඔහුගෙන් දිවුරුම් ලොත්තරයක් ලබාගන්න. දෙයියම්පා! මං ඇමරිකන් මහාද්වීපයේ මැද ඉඳල මේ තරම් දුරකතරක් ගෙවාගෙන මෙහේ ආවා. ඔබට මේ හැතැක්ම සියයක් විතර දුරක් ගිහිල්ලා කරන්න තියෙන්නෙ සුළු කොටසයි. ඒක සම්පූර්ණ කළාම වැඩේත් ඉවරයි."

"සම්පූර්ණ ඇත්ත." හෝම්ස් කීවේ එම අදහස අනුමත කරමිනි. "මේ මහත්තයා කියන කථාව හරියටම හරි."

නේදන් ගැරිඩෙබ් මහතා උරහිස් හැකිළුවේ, වෙනත් විකල්පයක් නොමැති නම් තමා එම රාජකාරිය අපහසුවෙන් වුවද භාරගන්නා බව හඟවමිනි.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබ ඔය තරම් තදින්ම කියනවා නම් මං යන්නම්. මගේ ජීවිතේට ඔබ ලබාදුන්නු වාසනාවේ හැටියට මං කොහොමද මේක ප්‍රතික්ෂේප කරන්නෙ?"

"එහෙනම් ඒක තීන්දුයි නේද? ඒ වැඩකටයුතු ඉවර වෙලා, මට සම්පූර්ණ වාර්තාවක් එවන්න අමතක කරන්න එපා." හෝම්ස් කීය.

"මං ඒක නොවරදවාම ඉටු කරන්නම් හෝම්ස් මහත්මයා." ඇමරිකන් ජාතිකයා පැවසුවේ තම ඔරලෝසුව දෙස බලමිනි.

"මට වැඩකටයුතු රාශියක් තියෙනවා. එහෙනම් මම යන්නම්. ගැරිඩෙබ් මහත්මයා ඔබ බර්මිංහැම් බලා පිටත්ව යන වෙලාවට මමත් දුම්රිය පොළට එන්නම්.

හෝම්ස් මහත්මයා ඔබත් මේ ගමන් ගෙදර යන්නද හැදුවෙ? යමු මාත් එක්ක .... ආ .... ඔබ දැන්ම එන්නෙ නැ? එහෙනම් ශුභ රාත්‍රියක්. හෙට රෑට අපි හමුවෙනකොට කථා කරන්න හොඳ හොඳ දේවල් තියේවි."

හෝම්ස්ගේ කැළඹී තිබුණු මුහුණ යථා තත්ත්වයට පත්වූයේ ඇමරිකන් ජාතිකයා නිවසින් පිටවී ගිය පසුවයි.

"ගැරිඩෙබ් මහත්මයා. ඔබේ පෞරාණික දේවල් එකතුව නම් ඉතාම අනර්ඝ එකක්. මටත් මේක විවේකීව බලාගන්න ලැබෙනවා නම් කොයිතරම් වාසනාවක්ද? මගේ වෘත්තියේ හැටියට, හැම විධියකම දැනුම මට ඉතා ප්‍රයෝජනයක් වෙනවා. ඔබේ මේ කාමරය ඒ විධියේ දැනුම ගබඩාවක් කිව්ව හැකි." හෝම්ස් පැවසුවේය.

අපේ අනුග්‍රාහකයාගේ මුහුණ සතුටින් ඔප වැටිණි.

"ඔබ ඉතා බුද්ධිමත් පුද්ගලයෙක් බව මට නිරතුරුවම අහන්න ලැබෙනවා හෝම්ස් මහත්මයා. ඔබට හැම දෙයක්ම පෙන්වලා විස්තර කරල දෙන්න ලැබෙනවා නම් ඒක මට සතුටක්. ඔබට විවේකයක් තියෙනවා නම් මේ දැන් වුණත් මට එය කළ හැකියි."

"අවාසනාවකට වගේ මට දැන් ඒ වැඩේට වෙලාවක් නැහැ ගැරිඩෙබ් මහත්මයා. නමුත් ඔබේ මේ ප්‍රදර්ශන භාණ්ඩ හැම එකක්ම ඉතාම හොඳින් වර්ගීකරණය කරලා. ඒවා පිළිබඳ විස්තර ලියූ පත්‍රිකා යටින් අලවලා තියෙනවා. ඉතින් විස්තර කිරීමක් අවශ්‍ය නැ. මෙව කියවලා මට හැමදේයක්ම තේරුම් ගන්න පුළුවනි. මට හෙට මේ

http://sherlockholmesinvestigations.blogspot.com

පැත්තෙ එන්න ඉඩක් ලැබුණොත්, මං ඇවිත් මේවා බලාගන්නට ඔබේ විරුද්ධත්වයක් නැද්ද?"

"කිසිම විරුද්ධත්වයක් නෑ. ඔබේ පැමිණීම මට විශාල ගෞරවයක් හෝම්ස් මහත්මයා. හැබැයි මම අර ගමන යන නිසා, හෙට හවස් වරුවට ගේ වහල තියෙයි. යතුරු තියෙන්නේ සෝන්ඩර්ස් මහත්මිය අතේ. ඇය හවස හතර වෙනතුරු බිම් මහලේ රැඳී ඉන්නවා. ඇය ඇගේ යතුරෙන් මෙතැන ඔබට විවෘත කරල දේවි."

"හෙට හවස නම් මට හිටෙනවයි. ඔබ මේ ගැන සෝන්ඩර්ස් මහත්මියට කියල තිබ්බොත් ඔක්කොම හරි. ඒක නෙමෙයි මහත්මයා. ඔබ මේ නිවස බදු ගත්තේ මොන වෙළඳ සමාගමෙන්ද?"

"එඩ්ග්වෙයා පාරේ හොලෝවේ සහ ස්ටීල් සමාගමෙන්. ඇයි ඇහැව්වේ?"

"ගෙවල් සම්බන්ධයෙන් කථා කරනකොට මමත් පුරා විද්‍යාඥයෙක් වගේ. මං මේ කල්පනා කළේ මේ ගොඩනැගිල්ල, ඈන් රැජිනගේ කාලෙ හදපු එකක්ද, ජෝර්ජ් රජ්ජුරුවන්ගෙ කාලෙ හදපු එකක්ද කියලා?"

"නිසැකවම ජෝර්ජ් යුගයේ."

"හැබෑට? මට හිතුණේ ඊටත් ටිකක් කලින් හදපු එකක්ද කියලා. හොඳයි ඔබට ආයුබෝවන්. හෙට ඔබ බර්මිංහැම් යන ගමන සර්ව ප්‍රකාරයෙන්ම සාර්ථක වේවා!"

නිවාස කුලියට දෙන සමාගම සොයාගන්නත් රෑ බෝවී තිබූ බැවින්, එය වසා තිබිණ. අපි ආපසු බේකර් වීථියේ අපේ නිවහනට පැමිණියෙමු. හෝම්ස් යළිත් මේ මාතෘකාව ගැන කථාව ඇරඹුවේ රාත්‍රී ආහාරයෙන් පසුවයි.

"අපේ පුංචි ගැටලුව දැන් විසඳී අවසාන වෙගෙනයි එන්නෙ. මේකට විසඳුම මොකක්ද කියලා ඔබට දැන් තේරිලා ඇති වොට්සන්?" හෝම්ස් ඇසීය.

"මට නම් මේකෙ අගක්, මුලක්, කිසි දෙයක් තේරෙන්නෙ නෑ."

"මුල නම් පැහැදිලිවම පෙනෙනවා වොට්සන්. අග හරිය බලාගන්න පුළුවනි හෙට වෙනකොට. අර පත්තරේ තිබුණු දැන්වීමේ ඔබට මොකුත් අමුත්තක් හේම පෙනුණෙ නැද්ද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"මට පෙනුණා එක් දෙයක්. අත්තඳුල්වලට එහි යොදා තිබුණු ඉංග්‍රීසි වචනයේ අක්ෂර වින්‍යාසය වැරදියි. PLOUGH යනුවෙන් යෙදිය යුතු වචනය එහි තිබුණේ PLOW කියලා."

"මොනවා? ඔබ ඒයත් නිරීක්ෂණය කළාද වොට්සන්? ඔබ දූන් එන්න එන්නම දියුණු වෙනවා. ඔව්. නඟුලට PLOW කියලා ලිව්වාම ඒ එංගලන්තයේදී කැඩිච්ච ඉංගිරිසි. නමුත් ඇමරිකාවෙ නිවැරදි ඉංගිරිසි. පුවත්පත් කාර්යාලය කරල තියෙන්නේ ඔවුනට දූන්වීම, ලැබුණු හැටියටම මුද්‍රණය කරපු එකයි. අර කරත්තවලට යොදන ලෑලි තට්ටුවට BUCK BOARD කියලා තිබුණේ. ඒකත් එංගලන්තයේ නෙමෙයි, ඇමරිකාවේ බහුලව ව්‍යවහාර වෙන වචනයක්. අනික නළ ළිං ගැන සඳහන් කරල තිබුණා. නළ ළිං වැඩිපුරම යොදාගන්නෙ ඒ ගොල්ල මිසක් අපි නෙමෙයි. ඒක තනිකරම ඇමරිකන් මාදිලියේ වෙළඳ දූන්වීමක්. නමුත් පෙන්වන්න උත්සාහ අරගෙන තිබෙන්නේ එංගලන්තයේ වෙළඳ සමාගමකින් පළකළ එකක් හැටියට. ඒකෙන් ඔබ තේරුම් ගත්තෙ මොකක්ද?"

"මට හිතෙන්නේ මේක අර ඇමරිකන් නීතිඥයගෙ වැඩක්. නමුත් ඔහුගේ අරමුණ මොකක්ද කියන එක නම් මට තේරුම් ගන්න බෑ."

"ඒක නොයෙක් විදියට පැහැදිලි කරන්න පුළුවනි. නමුත් අපට පැහැදිලිවම පෙනෙන හේතුව නම් ඇමරිකන්කාරයට ඕනැවුණා, අර වයසක මනුස්සයාව ඇනහුට පිටත් කරලා යවන්න. ඔහු යන්නේ තේරුමක් නැති ගමනක් කියන්න මගේ කටටත් ආවා. ආයෙ මට හිතුණා ඔහු මෙතැනින් ඉවත්වෙලා ඉන්න එක වඩාත් හොඳයි කියලා. එතකොට වේදිකාව වඩාත් විවෘතයි; රඟදක්වන නළුවන්ට වැඩකටයුතු පහසුයි. හෙට තමයි වොට්සන් - ඔව් හෙට සියල්ල තීරණය වේවි."

ෂර්ලොක් හෝම්ස් පසුවදා උදෑසනින්ම අවදි විය. ඔහු ඉක්මනින් සූදානම් වී නිවසින් පිටවී ගියේය. හෝම්ස් ආපසු පැමිණියේ බොහෝ ප්‍රමාද වී දහවල් කෑම වෙලාවටයි. ඔහුගේ මුහුණෙන් පිළිබිඹු වූයේ සිත් කැළැඹුණු ස්වභාවයකි.

"මේක මං හිතුවටත් වඩා බරපතල බොහොම දුරදිග යන වැඩක් වොට්සන්. ඔබට අන්තුරු ඇඟවීමක් කරල තියෙන එක සාධාරණයි.

http://sherlockholmesinvestigations.blogspot.com

මං මේ ඔබව ඇදගෙන යන්න හදන්නේ බොහොම අන්තරායදායක රාජකාරියකට. ඒක සිහි තබාගැනීම වැදගත්."

"ඇයි හෝම්ස්, මීට ඉස්සරත් අපි දෙන්න හවුලේ මේ වගේ දේවල් වලට සහභාගි වෙලා තියෙනවා නෙ. මේ පළවෙනි එක නෙමෙයි නේ. අපි හිතමු මේක අන්තිම එකත් නෙමෙයි කියලා. ඒ වුණත් මොකක්ද මේ සැරේ වෙනදාට වඩා තිබෙන අන්තරායදායක බව?"

"මේ සැරේ අපි මුහුණ දෙන්නෙ නොම්මර එකේ දරුණු අපරාධකාරයෙකුට. මං අඳුන ගත්තා නීති අපදේශක ජෝන් ගැරිඩෙබ් කියන්නේ ඇත්තටම කවුද කියලා. ඔහු තමයි මිනීමරු එවන්ස්."

"මං ඔහු ගැන මොකුත්ම දන්නෙ නෑ?"

"ඒකෙ පුදුමයක් නෑ. පහුගිය කාලයේ හිටි සුප්‍රසිද්ධ අපරාධකරුවන් ගැන සම්පූර්ණ වාර්තාවක් සිහියේ තබාගැනීම ඔබේ වෘත්තියට අදාළ නැහැනේ. මං ගියා අපේ මිත්‍රයා ලෙස්ට්‍රේඩ් හමුවෙන්න, ස්කොට්ලන්ඩ්යාඩ් රහස් පොලීසියට. මගේ හිතේ විශ්වාසයක් තිබුණා, අපේ මිත්‍ර ජෝන් ගැරිඩෙබ් ගැන තොරතුරු එතැන ලිපිගොනු වල සටහන් වෙලා ඇති කියල.

ස්කොට්ලන්ඩ්යාඩ් එකේ තියෙනවා නෙ තක්කඩින් හා මිනීමරුවන්ගේ ඡායාරූප, ස්ථිරව ප්‍රදර්ශනයට තබා තිබෙන 'කලා භවනක්.' හිතුවා වගේම මෙන්න ඒකෙ ඉන්නවා අපේ ඇමරිකන් මිත්‍රයා, ලස්සන හිනාවක් දාගෙන. ඔහුගේ ඡායාරූපය යටින් සඳහන් කරල තියෙනවා; ජේම්ස් වින්ටර් නොහොත් මෝක්‍රොෆ්ට් හෙවත් මිනීමරු එවන්ස්' කියලා. මිනිහගෙ ලිපිගොනුවෙන් කාරණා ටිකක් මං සටහන් කරගෙන ආවා." හෝම්ස් කවරයක් සාක්කුවෙන් එළියට ඇද්දේය.

"වයස අවුරුදු හතළිස් හතරයි. උපන් බිම - චිකාගෝව. එක්සත් ජනපදයේදී මිනිසුන් තිදෙනෙකුට වෙඩිතබා මරාදමා ඇති බවට වාර්තා වී ඇත. හිරෙන් නිදහස් වීමට හැකිවූයේ දේශපාලන බලපෑම් නිසයි. 1893 දී ලන්ඩනයට සංක්‍රමණය විය. 1895 ජනවාරි මාසයේදී වෝටලූ පාරේ රාත්‍රි සමාජ ශාලාවක, කාඩ් ක්‍රීඩාකරමින් සිටි තැනැත්තකු සමග ඇතිවූ ආරවුලක් නිසා එවන්ස් විසින් ඔහුට වෙඩිතබා මරා දමන ලදී. මියගිය පුද්ගලයා චිකාගෝවෙන් පැමිණි සුප්‍රසිද්ධ හොර නෝට්ටු මුද්‍රණ කරුවෙකු වූ රොජර් ප්‍රෙස්කොට් බව හඳුනා ගැනිණි.

http://sherlockholmesinvestigations.blogspot.com

කෝලාහලය පටන්ගෙන, මුලින් ගිනිඅවිය එල්ල කරන ලද්දේ ප්‍රෙස්කොට් විසින් බවත්, එවන්ස් වෙඩිතැබූ ඇත්තේ ඉන්පසුව බවත් ඔප්පු විය. ඒ අනුව ඔහුට හිමිවූ පස් අවුරුදු සිරදඬුවම නිමවී 1901 දී මිනීමරු එවන්ස් හිරෙන් නිදහස් විය. ඔහු පොලිස් අධීක්ෂණය යටතේ ජීවත්වන අතර ඉන්පසු මේ දක්වාත් කිසිදු අපරාධයකට චෝදනා ලබා නැත. ඉතාමත් දරුණු අන්තරායකාරී පුද්ගලයෙකි. සාමාන්‍යයෙන් ඔහු ආයුධ ළඟ තබාගන්නා අතර, එයින් ක්ෂණිකව වෙඩි තැබීමට එවන්ස් කිසිසේත් නොපැකිළෙයි."

"මොකක්ද මිනිහා මේ සැරේ දාන්න හදන සෙල්ලම?"

"ඒකත් ටික ටික පැහැදිලි වෙමින් එන්නෙ. මං ගියා හේදන් ගැරිඩෙබ් අර නිවස කුලියට ගනිපු සමාගමට. ඔවුන්ගෙන් තොරතුරු ටිකක් මට දැනගන්න ලැබුණා. හේදන් ගැරිඩෙබ් මේකෙ පදිංචියට ඇවිත් අවුරුදු පහක් ගතවෙන බව ඇත්තයි. ඊට කලින් අවුරුද්දක් විතර ඒ කොටස වහලා තිබුණලු, කුලියට ගන්න කිසිකෙනෙක් නොහිටි නිසා. ඊටත් කලින් කුලියට අරගෙන ඉඳල තියෙන්නේ වෝල්ඩ්‍රන් කියල කෙනෙක්ලු. වෝල්ඩ්‍රන්ගේ හැඩරුව ඒ කාර්යාලයේ සේවකයන්ට මතක තිබුණා. ඔහු එක්වරම අතුරුදන් වුණාලු. ඊටපසු ඔහු ගැන කිසිම ආරංචියක් ලැබිල නැහැ. වෝල්ඩ්‍රන් තරමක් කළු පැහැති සමක් හා මුහුණ පුරා වැඩුණු රැවුලක් තිබූ උස පුද්ගලයෙක්ලු. ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ තිබෙන තොරතුරු අනුව, එවන්ස්ගෙන් වෙඩිකාල මැරුණු ප්‍රෙස්කොට්ටත් තිබුණේ එම ස්වරූපයමයි. ඉතින් වෝල්ඩ්‍රන් කියන නමින් මේ ගෙයි පදිංචිව හිටියේ ඇමරිකන් ජාතික ප්‍රෙස්කොට්මයි කියල අපට තාවකාලික උපකල්පනයකට එන්න පුළුවනි. එතකොට ඔබට පෙනෙනවා නේද ඒ කාරණා දෙක සම්බන්ධ කෙරෙන පුරුකක් ඇති බව?"

"මොකක්ද ඒ පුරුක?"

"ඒක අපි ගිහින් බලන්න ඕනෑ." හෝම්ස් ලාච්චුවක් විවෘත කොට රිවෝල්වර දෙකක් අතට ගෙන එකක් මා අතට දුන්නේය.

"අපේ මිත්‍රයා ඔහුට පටබැඳී තිබෙන නමේ පිළිවෙළටම ක්‍රියාකරන කෙනෙක් නම් අපිත් ඒකට සූදානමින් යන්න ඕන. මං ඔබට නිදාගන්න පැයක් දෙන්නම් වොට්සන්. එතකොට අපට ලිට්ල් රයිඩර් වීථිය බලා පිටත්වෙන්න වෙලාව හරි."

http://sherlockholmesinvestigations.blogspot.com

නේදන් ගැරිඩෙබ් මහතාගේ පැරණි නිවස වෙත අප ළඟාවන විට සවස හතර වී තිබිණි. ගොඩනැගිල්ල භාරව සිටි සෝන්ඩර්ස් මහත්මිය එතැනින් පිටත්වී යාමට සූදානමින් සිටියාය. ගෙහිමියා විසින් දනුම් දී තිබූ පරිදි, නිවසේ දොර විවෘත කොට අපට එහි ඇතුළුවීමට ඇය ඉඩ සැලසුවාය. පිටව යද්දී දොර තදින් වැසීමෙන් අගුළු නිසිලෙස ක්‍රියාත්මක වන බව ඇය පැවසුවාය. පූර්වසිද්ධ නරඹා අවසානයේ දොර නිසි පරිදි වසා යෑමට හෝම්ස් පොරොන්දු විය.

මිනිත්තු කිහිපයකට පසු ඇය ජනේලය පසුකර පිටවී යන අයුරු අපි දුටුවෙමු. නිවසේ පහත මාලයේ ඉතිරි වූයේ අප දෙදෙනා පමණි. හෝම්ස් ඉක්මනින් නේදන් ගැරිඩෙබ්ගේ කෞතුකාගාරය පිරික්සා බැලුවේය. අඳුරු මුල්ලක් සමීපයේ පිහිටි එක් විශාල අල්මාරියක් වෙත ඔහුගේ අවධානය යොමු විය. එය තබා තිබුණේ බිත්තියට මඳක් ඉදිරියෙනි. ඒ අනුව අල්මාරිය හා බිත්තිය අතර අඳුරු හිඩැසක් විය. සැඟවී සිටීම සඳහා අපි එතැන තෝරා ගත්තෙමු. මීළඟට හෝම්ස් තම සැලැස්ම කෙදිරිලි හඬින් මට විස්තර කිරීමට පටන් ගත්තේය.

"එවන්ස්ට ඕනෑ වුණා මේ වයසක මනුස්සයව කොහොම හරි කාමරයෙන් පිටකරල තියන්න. ඒ ටික පැහැදිලියි. මේ මනුස්සයා ලෙහෙසියෙන් මෙතැනින් පිටවෙලා යන්නේ නැති නිසා, ඒක කරන්න එවන්ස්ට සෑහෙන සැලැස්මක් අවශ්‍ය වුණා. ගැරිඩෙබ් කථාව මිනිහ නිෂ්පාදනය කළේ, ඒ අරමුණෙන්. කොහොම වුණත් මේ වගේ සූක්ෂ්ම වැඩ පිළිවෙළක් සැලසුම් කළ එකෙන්ම තේරෙනවා මිනිහා හරි දක්ෂයෙක්."

"ඒත් මොනවද ඔහුට ඕන වෙලා තියෙන්නෙ?"

"අන්න ඒක තමයි අපටත් බලන්න තියෙන්නෙ? ඒක අපේ වයස්ගත අනුග්‍රාහකයාට අයිති දෙයක් නම් වෙන්න බෑ. එවන්ස්ට උවමනා කරන්නෙ බොහොම වෙලාවට, ඔහු අතින් මැරුම් කාපු ප්‍රෙස්කොට්ට අයත්ව තිබූ දෙයක් වෙන්න පුළුවන්. සමහර විට ඔවුන් දෙදෙනා හවුලේ කළ අපරාධයකට සම්බන්ධ දෙයක් වෙන්නත් පුළුවනි. මොකක් වුණත් ඒ අභිරහස තියෙන්නේ මේ කාමරය තුළමයි. මං මුලින් හිතුවේ මේ වයසක මනුස්සයා නොදැනුවත්වම, හුඟක් වටිනා දෙයක් ඔහුගේ කෞතුක වස්තු එකතුවේ ඇති කියලයි. නමුත් රොජර් ප්‍රෙස්කොට් මේකෙ වාසය කළා කියන්නේ, මෙතන ඊට වඩා

http://sherlockholmesinvestigations.blogspot.com

බොහොම බරපතල කාරණයක් මුල්වෙලා ඇති. ඉතින් වොට්සන් අපි තව ටික වෙලාවක් ඉවසීමෙන් බලා ඉඳිමු."

අපට එතරම් වේලාවක් බලා සිටීමට සිදු නොවීය. ගොඩනැගිල්ලේ පිටත දොර විවෘත වී, යළි වැසෙන ශබ්දය ඇසිණි. අපි ඉක්මනින් අඳුරු මුල්ලේ සැඟවුණෙමු. මීළඟට අප සැඟවී සිටි කෞතුකාගාර කාමරයේ දොර අගුළෙන් තිහුණු හඬක් නැගිණි. මොහොතකින් ඇමරිකන් ජාතිකයා එහි ඇතුළුවිය. හඬක් නොනැගෙන සේ ඔහු දොර හෙමින් වසා දැම්මේය.

එක්වරක් කාමරය සිසාරා බැල්මක් හෙළූ ඔහු, සියල්ල නිශ්චල බවට සැකහැර ගත්තේය. මීළඟට තම කබාය ගලවා පසෙකට දමා කාමරය මැද පිහිටි මේසය වෙත ගියේ ඔහු, එය කාමරයේ එක් පසෙකට ඇද්දේය. ඔහු ක්‍රියා කළේ තමා කළයුතු දේ මේ යයි හොඳින් දන සිටි අයෙකු පරිද්දෙනි. අනතුරුව ඔහු බිම අතුරා තිබූ බුමුතුරුණ කපා, එය එක් පැත්තකට රෝල්කර දැම්මේය. ඉන්පසු තම සාක්කුවෙන් ඉස්කුරුප්පු නියනක් හා ඇණ කිඹිපයක් එළියට ගත් ඔහු, කාමරයේ පොළොවට සවිකොට තිබූ ලෑලිවල ඇණ ගැලැවීමට පටන් ගත්තේය. මිනිත්තු කිහිපයකදී ලෑලි ඉවත්වන හඬක් ඇසිණ. ස්වල්ප වේලාවකින් කාමරය මැද පොළොවේ, චතුරශ්‍රාකාර වළක් නැතහොත් කුහරයක් අපි දුටුවෙමු. ඉටිපන්දමක් ගෙන එය දැල්වූ ඇමරිකන් ජාතිකයා, තත්පර කිහිපයකින් එම කුහරය තුළට බැස, අපේ දර්ශන පථයෙන් ඈත්විය.

ක්‍රියාකාරී වීමට මේ අපේ අවස්ථාවයි. හෝම්ස් සංඥාවක් ලෙස මගේ අතට තට්ටු කළේය. ඉතා ප්‍රවේගමෙන් සැඟවී සිටි තැනින් එළියට පැමිණ, කාමරය මැද වූ වළ දෙසට ශබ්ද නොනැගෙන සේ ගමන් කළෙමු. එහෙත් අපේ බරට, බිම අතුරා තිබූ ලෑලි වලින් ශබ්දයක් නැඟෙන්නට ඇත. කුහරය තුළින් එළියට ආවේ කැළැඹුණු මුහුණක් සහිත එවන්ස්ගේ හිසයි. ඔහුගේ මුහුණ ක්ෂණික කෝපයෙන් රතුවූ අයුරු අපි දුටුවෙමු. තම හිසට පිස්තෝල දෙකක් එල්ල වී ඇති බැව් දුටු එවන්ස් මුහුණට සිනහවක් ආරූඪ කරගත්තේය.

"හොඳයි. හොඳයි. හෝම්ස් මහත්මයා. මං පිළිගන්නවා ඔබ මට වඩා දක්ෂයෙක් බව්." එවන්ස් පැවසුවේ විවරයෙන් එළියට පැමිණෙමිනි.

http://sherlockholmesinvestigations.blogspot.com

"මගේ වැඩ පිළිවෙළ කල් තියාම වටහාගෙන, මුල ඉඳලම මාව අල්ලන්න උගුලක් ඇටෙව්වා. ඔබ . . . .!!"

එක් ක්ෂණයකින් තම අපුව දෙසින් ඔහු රිවෝල්වරයක් එළියට ඇද ගත්තේ විදුලි වේගයෙනි. ඇසිපිය හෙළන සැණින් මිනීමරු එවන්ස් වෙඩි පහර දෙකක් අප වෙත එල්ල කළේය!

මගේ කකුලේ කලවා ප්‍රදේශය ගිනියම් කළ යකඩයකින් පුළුස්සා දමනු ලැබුවාක් මෙන් වේදනාවට පත්විය. ඒ සමගම විදුලි වේගයෙන් ක්‍රියාත්මක වූ හෝම්ස්, එවන්ස්ගේ හිසට පිස්තෝලයේ මිටෙන් දරුණු පහරක් එල්ල කළේය. හිසට වූ තුවාලයෙන් මුහුණ පුරා ලේ පෙරාගෙන, ඔහු බිම ඇද වැටෙනු ඇහුරු මඹ ලාත්තමින් දුටුවෙමි. ඉක්බිතිව මා බිම ඇද වැටුණා විය යුතුය. ඊළඟ මොහොතේ මා දුටුවේ හෝම්ස් මා වත්තම් කරගෙන පුටුවක හාන්සි කළ අයුරුයි.

"ඔබට ලොකු තුවාලයක් නෑ නේද වොට්සන්? දෙයියන්ගෙ නාමෙන් කථා කරන්න! ඔබට බරපතල අමාරුවක් නැහැ නේද? කථා කරන්න වොට්සන්! දෙවියන්ගේ නාමෙන් කථා කරන්න! . . . . වොට්සන්?"

තුවාල සිදුවුවාට කම් නැත. එකක් නොව මෙවැනි තුවාල කිහිපයක් සිදුවුවද කම් නැත. ෂර්ලොක් හෝම්ස්ගේ සිතේ මා වෙත තිබූ දැඩි හිතෛෂීභාවය, අව්‍යාජ සහෝදර ප්‍රේමය මේ අවස්ථාවේදී ප්‍රකාශ විය.

මා වැටී සිටින හැටි දැක, හෝම්ස්ගේ සෘජු විවෘත දෑස් අඳවන් වූ අයුරුත්, කිසිවිටෙක නොසැලෙන දෙතොල්, වෙව්ලන අයුරුත් මම එක් මොහොතක දුටුවෙමි. ඔහුගේ කුරුණාබර හදවතේ හැඟීම් නොසඟවා ප්‍රකාශ වනු මා දුටු එකම අවස්ථාව මෙයයි.

"ඒක සුළු දෙයක් හෝම්ස්. මං හිතන්නේ මාංශ පේශියකට උඩින් සුළු තුවාලයක් විතරයි."

සාක්කුවේ තිබූ පෑන පිහිය ඉවතට ගත් ඔහු, මගේ කලිසම කැපුවේ තුවාලය විවෘත වන අයුරෙනි. අනතුරුව ඔහු එතැන පරීක්ෂා කළේය.

"ඔබ හරි. ගැඹුරට තුවාල වෙලා නෑ." ඔහු පැවසුවේ සැනසුම් සහගතවයි.

http://sherlockholmesinvestigations.blogspot.com

මීළඟට හෝම්ස් රවා බැලුවේ අපහසුවෙන් බිම හිඳගත් එවන්ස් දෙසයි.

"දෙයියම්පා! ඒ තුවාලය ගැඹුරට නොගිය එක උඹටත් හොඳට ගියා. උඹ වොට්සන්ව මැරුව නම් මේ කාමරයෙන් එළියට යන්නේ උඹේ මළකඳ මිසක් උඹ පණපිටින් නොමෙයි. දැන් මොනවද උඹට නිදහසට කියන්න තියෙන්නෙ?

එවන්ස්ට ප්‍රකාශ කිරීමට කිසිවක් නොතිබිණි. පොළොව යටට තැනුණු කුටිය වෙත හෝම්ස් එබී බලද්දී, ඔහුගේ අතට වාරුවී මම ද එදෙස බැලුවෙමි.

එය එවන්ස් දැල්වූ ඉටිපන්දමෙන් ආලෝකමත් විය. එහි ලෑලි දොරක් සාදා තිබුණේ අඩගාව වූ පිටෙක විවෘත කිරීමට පහසුවන අයුරෙනි. කුටිය ඇතුළත වූයේ මළ බැඳුණු යන්ත්‍රෝපකරණ රාශියකි. ඒ අසලම කඩදාසි මිටි කිහිපයක්, විවිධ හැඩයේ හා වර්ණවල බෝතල් රාශියක් ද විය. කුඩා මේසයක් මත කුඩා ප්‍රමාණයේ පාර්සල් කිහිපයක් තැන්පත් කොට තිබිණි.

"මුද්‍රණ යන්ත්‍රාලයක්. හොර නෝට්ටු අච්චු ගහපු කෙනෙකුගේ යන්ත්‍ර සූත්‍ර." හෝම්ස් කීය.

"ඔව් මහත්මයා. ලන්ඩනයේ සිටි අති විශිෂ්ටතම හොර නෝට්ටුකාරයාගේ මුද්‍රණාලය." එවන්ස් පැවසුවේ අපහසුවෙන් නැගිට පුටුවක් මත හිඳගනිමිනි.

"මේ තමයි ප්‍රෙස්කොට්ගේ මුද්‍රණ යන්ත්‍ර. මේසය උඩ කුඩා පාර්සල් වගයක් තියෙනව නේද? ඔතන තියෙනවා පවුම් සීයේ නෝට්ටු දෙදාහක්. අපි පොඩි ගනුදෙනුවක් කරමු මහත්මයා. ඔබට කැමති තරමක් ඔය නෝට්ටු අරගන්න. මට මෙතැනින් යන්න ඉඩ දෙන්න."

හෝම්ස් සිනාසීමට පටන් ගත්තේ මහ හඬිනි.

"අපි ඒ වගේ ගනුදෙනු කරන්නෙ නෑ එවන්ස්. ඔහේ කරන අපරාධ වලින් බේරිලා යන්න, මේ රටේ කපොලු මොකුත් නෑ. මේ ප්‍රෙස්කොට් කියන මිනිහ වෙඩි තියල මැරුවෙ තමුසෙ නේද?"

"ඔව්. මම තමයි. හැබැයි මං ඒකට අවුරුදු පහක් හිරේ ගහගත්තලයි ආවෙ. ඌ මට වෙඩි තියන්න පිස්තෝලය එල්ල කළා. මං ඊට කලින් කොකා ගැස්සුවා. ඒකට ආණ්ඩුවෙන් මාව යැව්වා අවුරුදු පහකට

http://sherlockholmesinvestigations.blogspot.com

හිරේට. හරි නම් මහත්මයා මං මේ රටට කළ සේවයට මට විශාල රන් පදක්කමක් සුප් පිඟානක් තරම් ලොකු රන් පදක්කමක් පිරිනමන්නයි තිබුණේ.

මේ ලෝකෙ ජීවත්වෙන කිසිම මිනිහෙකුට බෑ, එංගලන්ත මහ බැංකුවේ පවුම් නෝට්ටු, ප්‍රෙස්කොට් අච්චු ගහපු පවුම් නෝට්ටු වලින් වෙන්කරලා හඳුනාගන්න. මං ඌට වෙඩි නොතිබ්බා නම්, මුළු ලන්ඩනයේම ප්‍රෙස්කොට් උගේ ප්‍රහාර නෝට්ටු උතුරුවනවා, ගංවතුර ගලන ගණනට. ඌ ඒවා මුද්‍රණය කළේ කොහේද කියලා දන හිටි එකම මිනිහා මමයි. ඉතින් මට මෙතනට එන්න ඕන වුණේ ඇයි කියලා ඔබට හිතාගන්න පුළුවන් නේද. ඊළඟට ඔබට හිතාගන්න පුළුවන්ද මගේ හිතේ ඇතිවුණු කේන්තිය, මේ අමුතු නමක් තියෙන වයසක මිනිහා එක්ක.

ඒ යකා මෙතෙ පැළවෙලා වගේ, කොයි වෙලාවක වත් කාමරයෙන් එළියට ගියේ නෑ. මිනිහව එළියට යවන්න මට පොඩි ගැටයක් ගහන්න සිද්ධ වුණා. මට දැන් හිතෙනවා ප්‍රෙස්කොට්ට දීපු බෙහෙතම මෙයාටත් දුන්න නම් වැඩේ ඉවරයි නේද කියලා. ඒ වුණත් මං අනුකම්පා සහගත හදවතක් ඇති කෙනෙක් හෝම්ස් මහත්මයා. අනිත් මිනිහා අතේ ආයුධයක් නැත්තං මගේ පිස්තෝලය පත්තු කරන්න මට හිතෙන්නෙ නෑ."

කොහොම වුණත් හෝම්ස් මහත්මයා. මොකක්ද මං මෙතැන කරල තියෙන වැරැද්ද? මං ප්‍රහාර නෝට්ටු මුද්‍රණ යන්ත්‍ර පාවිච්චි කළෙත් නෑ; අර නාකි මනුස්සයට කරදරයක් හිරිහැරයක් කළෙත් නෑ. ඔබ කොහොමද මාව හිරේ අරින්නේ?"

"මිනීමැරීමට තැත් කිරීමට." හෝම්ස් පිළිතුරු දුන්නේය.

"තමුසෙ හිරේ අරින්න ඕන චෝදනාව උඩද කියන එක තීරණය කිරීම අපේ රාජකාරියක් නෙමෙයි. දැනට නම් අපට ඕන කරන්නේ ඉතා සුන්දර කුමුත්තාන්සේව හිරභාරයට ගැනීම පමණයි. වොට්සන් ස්කොට්ලන්ඩ්යාඩ් එකට දුරකථන පණිවුඩයක් දෙන්න."

* * *

මිනීමරු එවන්ස් හා ඔහුගේ ගැරිඩෙබ්වරු තුන්දෙනා පිළිබඳ කථාව එයයි. වයස්ගත නේදන් ගැරිඩෙබ් මහතා ඩොලර් ලක්ෂ

http://sherlockholmesinvestigations.blogspot.com

පනහක් ගැන සැදූ අහස් මාලිගය කඩා වැටීමෙන් සිහිකල්පනාව නරක් වී උමතු භාවයට පත්විය. අන්තිම වරට අපට අසන්නට ලැබුණේ ඔහු බ්‍රික්ස්ටන්හි උන්මත්තකාගාරයක ප්‍රතිකාර ලබන බවයි.

ප්‍රෙස්කොට්ගේ හොර නෝට්ටු මුද්‍රණාලය හමුවීම ගැන රහස් පොලිස් නිලධරයෝ බලවත් සතුටට පත්වූහ. ප්‍රෙස්කොට්ගේ මරණයෙන් පසු කිසිම අයුරකින් සොයා ගැනීමට නොහැකි වූ මෙම යන්ත්‍ර හමුවීම තමනට අප්‍රමාණ සැනසිල්ලකැයි උසස් නිලධරයෝ පැවසූහ.

මිනීමරු එවන්ස් පැළැඳීමට ආශාවෙන් සිටි, සුප් පිඟානක් තරම් ලොකු රන්පදක්කම ඔහුට පැළැඳවීමට තරම් පොලිසිය සතුටෙන් සිටියත්, අධිකරණය දැරුවේ වෙනත් අදහසකි. මිනීමරු එවන්ස් යළිත් වරක් මහරැජිනියගේ 'නවාතැන් මඳුවනට' යැවීම සුදුසු බව අධිකරණයේ තීරණය විය

Reading Purpose Only

http://sherlockholmesinvestigations.blogspot.com

# මැර පීටර්

Reading Purpose Only. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# මැර පීටර්

1895 වසර මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතාට බොහෝ කාර්ය බහුල කාලයක් වූ බව මට හොඳහැටි මතකය. මේ අවදියේ දී බොහෝ සුප්‍රසිද්ධ පුද්ගලයෝ තම ගැටලු විසඳා ගැනීම සඳහා, හෝම්ස් සොයා බේකර් වීථියේ අපේ නිවහන මඩින ඇදී ආහ. රහස් පරීක්ෂණ වෘත්තියට ඇති දැඩි ආශාව නිසාම, එය රැකියාව ලෙස තෝරාගත් හෝම්ස්, එහි යෙදුණේ දැඩි කැපවීමෙනි. ඉතා කලාතුරකින් හැර අන් සෑම විටකම ඔහු තම අනුග්‍රාහකයන්ගෙන් අය කළේ සුළු ගාස්තුවකි. ළමා කොල්ලය පරීක්ෂණයේ දී හෝල්ඩනස් සාමිවරයාගෙන් නම්, ඔහු විශාල මුදලක් අය කළ බව සඳහන් කළ යුතුය.

ටොස්කා නම් අග්‍රාජගුරු ප්‍රසාදීන් වහන්සේ අද්භූත ලෙස මරණයට පත්වීම පිළිබඳව විශේෂ පරීක්ෂණයක් පැවැත්වීමට, හෝම්ස් වතිකානුවට ගියේ ද මේ වසරේදීය. ඒ ශුද්ධෝත්තම පාප් වහන්සේගේ ආරාධනයෙනි. නැගෙනහිර ලන්ඩනයටම අපකීර්තියක් ගෙනා, විල්සන් නම් කුප්‍රකට අපරාධකරුවා, හෝම්ස් විසින් අත්අඩංගුවට ගැනුණේද 1895 දීමය. වුඩ්මන්ස් ලී ගම්මානයේ විසූ පීටර් කේරිගේ අභිරහස් මරණය පිළිබඳව පරීක්ෂණය ද හෝම්ස්ට භාරවූයේ මේ කාලයේ බව මගේ සටහන් පොතේ සඳහන්ව ඇත. මෙම සිද්ධිය එංගලන්තයේ ඉමහත් ප්‍රසිද්ධියට පත්වූ එකකි. ඒ පිළිබඳව මා සඳහනක් නොකොළොත් ෂර්ලොක් හෝම්ස්ගේ අභිරහස් පරීක්ෂණ පිළිබඳ වාර්තා පොත කිසිසේත් සම්පූර්ණ නොවනු ඇත.

මගේ මිත්‍රයා ජූලි මාසයේ මුල සතියේදී, දිනකට පැය කිහිපයක්ම අපේ නිවහනෙන් බැහැරව සිටියේය. මේ අතර මැරවර, රස්තියාදුකාර පෙනුම ඇති පුද්ගලයෝ කිහිප දෙනෙක්ම 'කපිතාන් බැසිල්' ගැන විමසමින් අපේ නිවසට පැමිණියහ. හෝම්ස් වෙනත් නමකින් පෙනී සිටිමින්, වෙස්වලාගෙන, යම්කිසි පරීක්ෂණයක යෙදෙන බව මම

http://sherlockholmesinvestigations.blogspot.com

තේරුම් ගතිමි. ඔහුගේ වෙස්මාරු කිරීමේ කටයුතු සඳහා, නැන් පහකට නොඅඩු ගණනක් ලන්ඩනයේ තිබිණි.

එදා උදෑසන ආහාර වේල ද නොගෙන මගේ මිත්‍රයා නිවසින් පිටවී ගොසිනි. මා උදේ ආහාරය ගනිමින් සිටියදී ඔහු නිවසට ගොඩ වැදුණේ ඉතා අසාමාන්‍ය පෙනුමක් තිබූ ආයුධයක් ද රැගෙනයි. බරින් වැඩි, දිගු හෙල්ලක හැඩය ගත් එම ආයුධයේ එක් කෙළවරක තියුණු උලක් හා ඒ වටා කුඩා උල් රාශියක් ද විය. මෙම ආයුධය කිහිල්ලේ රඳවාගෙන හෝම්ස් කාමරයට ඇතුළුවිය.

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ! මොන්වා හෝම්ස්? ඔබ ඔය ආයුධයත් ඔය විධියට අරගෙනද මේ ලන්ඩන් නගරය හරහා ඇවිදගෙන ආවෙ?"

"මං මස්කඩ කාරයා ළඟට ගිහිං ආවා."

"මස් කඩේට?"

"ඔව්. ඒ වගේම මට දැන් හුරි බඩගින්නක් දැනෙනවා. උදෑසන ආහාරයට කලින් ව්‍යායාම කරන්න කියන උපදේශය ඉතාම වටිනා එකක්. මං ඔනෙ ඔට්ටුවක් අල්ලන්නම් මං යෙදුණු ව්‍යායාමය මොකක්ද කියල ඔබට කියන්න බෑ?"

"මට හිතාගන්න අමාරුයි."

හෝම්ස් සිනාමුසු මුහුණින් කෝපි පෝච්චියෙන් තම කෝප්පයට වත්කර ගත්තේය.

"වොට්සන් ඔබ ඇලඩයිස්ගෙ මස් කඩේ පිටුපස ඉස්තෝප්පු කාල්ලට ගිහිං බැලුව නම් බලාගන්න තිබුණා; වහලේ එල්ලපු මැරිච්ච ඌරෙකුට, එක් මහත්තයෙක් පිස්සුවෙන් වගේ පහර දුන් හැටි. ඒ මහත්තයා මමයි වොට්සන්.

මං ඒකෙන් එකක් තේරුම් ගත්තා. ඒ තමයි මං මොන තරම් මහන්සියක් ගත්තත්, ඌරාගේ ශරීරය විනිවිද ගිහිං ඌව බිත්තියට අමුනන්න තරම් ජවය ඇති, ඇවුළුම් බිලී (හාපූන්) පහරක් යවන්න මට හැකියාවක් නැති බව. වොට්සන් ඔබත් කැමතිද උත්සාහ කරල බලන්න?"

"මම නම් කොහොමටවත් ඒක උත්සාහ කරල බලන්න කැමති නෑ. මොන කාරණාවක් නිසාද හෝම්ස් ඔය වගේ වැඩක යෙදුණේ?"

http://sherlockholmesinvestigations.blogspot.com



133 "දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ! මොනවා හෝම්ස් ඔබ ඔය ආයුධයක් අරගෙනද . . . !"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ මොකටද දන්නවද? වුඩ්මන්ස් ලී ගම්මානයේ සිදුවුණු අභිරහස් මරණයට ඔය වැඩේ යම් ආකාරයකින් සම්බන්ධයි කියල හිතන්න කරුණු තියෙනවා."

මේ අවස්ථාවේ ඔහුගේ කථාවට බාධා කරමින් කිසිවකු අපේ විසිත්ත කාමරයට ඇතුළු විය. ඒ අපේ හිත මිත්‍ර, ස්කොට්ලන්ඩ්යාඩ් රහස් පොලීසියේ පරීක්ෂක ස්ටැන්ලි හොප්කින්ස්ය.

". . . . ආ හොප්කින්ස්. ඔබ එවූ විදුලි පණිවුඩය මට ඊයේ රෑ ලැබුණා. ඔබ කොයි මොහොතේ හෝ මෙමහේ ඒවි කියල මං බලාගෙනයි හිටියේ. කඩු කෑම ටිකක් . . . ."

"බොහොම ස්තූතියි හෝම්ස් මහත්මයා. මං උදේ පාන්දරින්ම කෑම කාලයි ආවෙ. පොලිස් කාර්යාලයට වාර්තා කරන්න තිබුණු නිසා, මං ඊයෙම ලන්ඩනයට ආවා."

"මොනවද ඔබට වාර්තා කරන්න තිබුණේ?"

"අලුත් කරුණු මොකුත් නෑ මහත්මයා. මේ දක්වා පරීක්ෂණය සම්පූර්ණයෙන්ම අසාර්ථකයි."

"ඔබට අලුතෙන් කිසිම දෙයක් හොයාගන්න බැරි වුණාද?"

"මොකුත්ම හොයා ගන්න බැරිවුණා."

"අනේ හැබැට? මටත් හිතයි ඔය සිද්ධිය ගැන ටිකක් හොයල බලන්න."

"ඔබ මේ පරීක්ෂණයේ දී මට උදව් වෙන්න කැමති වුණොත්, ඒක දෙයියො බැලුව වගේ වැඩක් හෝම්ස් මහත්මයා. එක අඩියක් ඉදිරියට තියන්න පිළිවෙළක් නැතුව, මං සම්පූර්ණයෙන්ම එරිලයි ඉන්නේ. දෙයියන්ගෙ නාමෙන් මට ටිකක් උදව් කරන්න හෝම්ස් මහත්මයා. මේ අභිරහස විසඳගන්න ලැබුණොත්, ඒක මට රැකියාවෙන් උසස් වෙන්න හොඳ අවස්ථාවක්."

"හොඳයි හොඳයි. බලමුකෝ මොනවද කරන්න පුළුවන් කියල. ඔය සිද්ධිය ගැන පුවත්පතේ තිබුණු විස්තර මං කියෙව්වා. මරණ පරීක්ෂණයේ දී තිබුණු සාක්ෂිත් මං කියෙව්වා. ඒක හෙමෙයි. මරණය සිදුවුණු තැන වැටිලා තිබිල හම්බවුණු දුම්කොළ පසුම්බිය ගැන ඔබ මොනවද හොයා ගත්තේ? ඒකෙවත් නැද්ද මොකුත් හෝඩුවාවක්?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒක මැරුණු මනුස්සයගේම පසුම්බිය මහත්මයා. ඔහුගේ නමේ මුල් අකුරු 'P. C' කියල ඒකෙ සඳහන් වෙලා තිබුණා. ඒ පසුම්බිය සීල් මත්ස්‍ය සමෙන් මැසූ එකක්. මියගිය තැනැත්තාත් ඉස්සර සීල් සහ තල්මසුන් දඩයම් කළ නැවක සේවය කළ කෙනෙක් නේ."

"ඔහු දුම්බොන පයිප්පය හමුවුණේ නෑ?"

"අපට පයිප්පය නම් හොයාගන්න බැරිවුණා. ඔහු ඒ තරම් තදින් දුම්බිපු කෙනෙක් නෙමෙයිලු. බාග වෙලාවට ඔහුගේ මිත්‍රයින් සඳහා දුම්කොළ ටිකක් ළඟ තියාගෙන ඉන්න ඇති."

"ඔව්, එහෙම වෙන්නත් පුළුවනි. මං ඔය පරීක්ෂණය කරනවා නම් ඒක පටන් ගන්නේ ඔතැනින්. ඒ නිසයි මං ඔබෙන් ඒ ගැන ඇහැව්වෙ. කොහොම වුණත් මේ අංගේ මිත්‍ර දොස්තර වොට්සන්, මේ සිද්ධිය ගැන කිසිම දෙයක් දන්නෙ නෑ. මේ සිද්ධිය ඇතිවුණු අනු පිළිවෙළින් ආයෙ සැරයක් අහගත්තොත් මටත් ඒක ප්‍රයෝජනවත් වේවි. ඒ හින්දා සිද්ධ වුණේ මොකක්ද, කියලා අපට කෙටියෙන් කියන්න හොප්කින්ස්."

පොලිස් නිලධරයා තම සාක්කුවෙන් කඩදාසියක් එළියට ගත්තේය.

"මියගිය තැනැත්තාගේ ජීවිතයේ වැදගත් කාල වකවානු මෙහි සඳහන් වෙලා තියෙනවා. කපිතාන් පීටර් කේරි උපත ලැබුවේ 1845 දී. මියයන විට ඔහුගේ වයස අවුරුදු පනහයි. ඔහු බොහොම නිර්භීත, ඒ වගේම සාර්ථක සීල් සහ තල්මසුන් දඩයම් කරන්නෙක්ව සිටියා. 1883 අවුරුද්දේදී ඔහු 'සී යුනිකෝන්' නම් තල්මසුන් දඩයම් කරන නෞකාවේ කපිතාන් තනතුර දැරුවා. මේ යාත්‍රාවේ ඔහු කළ ගමන් රාශියක්ම ඉතාම සාර්ථක වූ ඒවා. ඊළඟ අවුරුද්දේ එනම් 1884 දී ඔහු විශ්‍රාම ගත්තා. ඊට පස්සේ අවුරුදු කිහිපයක් එහෙ මෙහෙ සංචාරය කළ ඔහු, පසුව සසෙක්ස් ප්‍රාන්තයේ නිවසක් මිළට ගෙන එහි පදිංචි වුණා. පහුගිය අවුරුදු හයම ඔහු පදිංචි වෙලා හිටියේ වුඩ්මන්ස් ලී නම් මේ ගමේ, ඔහුගෙ නිවසේ. හරියටම සතියකට කලින් ඔහුගේ මරණය සිදුවුණෙත් එහි.

මේ පුද්ගලයා ගැන හරිම සුවිශේෂ කාරණා කිහිපයක් තිබෙනවා. සාමාන්‍ය ජීවිතයේදී ඔහු බොහොම නිශ්ශබ්ද, ආගමට ගරු කළ නිතරම බුම්මාගෙන ඉන්න කෙනෙක්. ඔහුගේ ගෙදර වාසය කරන්නේ කේරිගේ

http://sherlockholmesinvestigations.blogspot.com

බිරිඳ, අවුරුදු විස්සක් වයසැති ඔවුන්ගේ දියණිය, සහ සේවිකාවන් කිහිප දෙනෙක් පමණයි. මේ අන්තිමට කීව් සේවිකාවන් නම් නිතර නිතර රැකියාවෙන් අස්වෙලා ගියා; අලුත් සේවිකාවන් බඳවා ගන්න සිද්ධවුණා. ඊට හේතුවුණේ ඒ ගෙදර තිබුණු ඉවසන්න බැරි අප්‍රසන්න පරිසරය.

පීටර් කේරි මත්පැනට ඇබ්බැහි වූ කෙනෙක්. ඔහු හැමදාම මත්පැන් පානය නොකළත්, කළ දාට තිරිසනෙක් වගේ හැසුරුණු කෙනෙක්. සිහි විකල්වනතුරු නොනවත්වා මත්පැන් පානය කළ ඔහු, මහ රෑට පවා බිරිඳත්, දියණියත් ගෙදරින් එළවා දැම්මා. ඔහු ඔවුන් එළෙව්වේ අශ්වයින්ට තළන කසයෙන් පහර දෙමින් බව ප්‍රසිද්ධ කරුණක්. ඔවුන් දෙදෙනාට, ගෙයි දොරකඩ ඉඳලා වත්තේ ගේට්ටුව ළඟට යනතුරු කසයෙන් පහර දුන්නු බව ගමේ හැමදෙනාම දන්නවා. කාන්තාවන් දෙදෙනා රාත්‍රි කාලය පුරා වේදනාවෙන් නගන විලාපය ඒ අවට ගම්වාසීන්ට සාමාන්‍ය දෙයක්.

ඔහුගේ මේ අශිෂ්ට හැසිරීම ගැන අවවාද කරන අදහසින් ගමේ දේවගැතිතුමා පීටර් කේරි හමුවෙන්න ගියා. මේ වයස්ගත දේවගැතිතුමාටත් පීටර් කේරි දරුණු ලෙස පහර දුන්නා. ඒ වරදට ඔහුට උසාවියෙනුත් දඬුවම් ලැබුණා. කෙටියෙන් කියනවා නම් හෝම්ස් මහත්මයා, ඔබට කේරිට වඩා බිහිසුණු පුද්ගලයෙක් හොයාගන්න උවමනා නම් රටපුරා ලොකු රවුමක් ඇවිදලා, හොයල බලන්න වෙනවා.

නැවේ කපිතාන් තනතුර දරද්දීත් ඔහු මේ වගේම භයංකර පුද්ගලයෙක් බව මට අහන්න ලැබුණා. නාවික ක්ෂේත්‍රයේ සගයන් අතර ඔහුව හැඳින්වුණේ මැරි පීටර් නමින්. ඒ නම ඔහුට ලැබුණේ ඔහුගේ මරුමූසු පෙනුම නිසාම නොවෙයි; අලුගෝසුවකු වැනි දරුණු ස්වභාවය නිසා. මේ පළාතේ ඔහුගේ අසල්වාසීන් සහ දන්නා හඳුනන හැම කෙනෙක්ම කේරිට අන්තයටම පිළිකුල් කළා. ඔවුනට හැකි සෑම වෙලාවකම ඔහුව මගහැරලා ගියා. ඔබට කියන්න හෝම්ස් මහත්මයා, ඔහුගේ මේ අවාසනාවන්ත මරණය ගැන, එක වචනයකින් හරි දුක්වෙන කෙනෙක් තවම නම් මට හමුවුණේ නැහැ.

පීටර් කේරි තමන්ගේ නිවසෙන් පිටත, ගෙවත්තේම, ලෑලි වලින් කුඩා කුටියක් සාදවාගෙන තිබුණා. ඒක ඔහුටම වෙන්වුණු එකක්. 'කැබින් කාමරය' නමින් ඔහු හැඳින්වූ මේ කුටිය තිබෙන්නේ නිවසට

http://sherlockholmesinvestigations.blogspot.com

යාර දෙතුන් සියයක් දුරින්. කේරි හැමදාම රෑට නිදාගත්තෙත් එහිමයි. එය අඩි දහසයක් පමණ දිග අඩි දහයක් පමණ පළල, තනිකාමරයේ එකක්. ඔහු එතැනින් පිටවෙලා කොහේ ගියත්, හැමවිටම එහි දොර යතුරු දමලා, යතුරු සාක්කුවේ දමාගෙනයි ගියේ. ඔහු කිසිකෙනෙකුට ඒකට ඇතුළු වෙන්න ඉඩ තැබුවේ නැහැ. එය පිරිසිදු කරගැනීම පවා කළේ තමන්මයි.

මේ කුටියේ දෙපැත්තහ බිත්ති දෙකක ජනේල දෙකක් තිබුණත් ඒවා කවදාවත් විවෘත කළේ නැහැ. ඒවා ඇතුළතින් ජනෙල් තිර රෙදි වලින් ආවරණය කරලයි තිබුණේ. මෙයින් එක ජනේලයක් තිබෙන්නේ මහපාර පැත්තට. කැබින් කාමරය ඇතුළේ රාත්‍රියට පහන් දැල්වෙද්දී, ඒ බව පාරේ යන එන අයට හොඳට පෙනෙනවා. ඒ වෙලාවට මිනිසුන් කතාවෙනවා පීටර් කේරි මොනවා කරනවද දන්නෙ නෑ කියල. පශ්චාත් මරණ පරීක්ෂණය වෙලාවේ අපට ලැබුණු සුළු සාක්ෂි කිහිපය ලැබුණෙත්, මෙන්න මේ ජනේලයෙන් දුටු දේවල් තමයි.

මේ ගමේ වැසියෙක් වන ස්ලේටර් වෘත්තියෙන් පෙදරේරුවෙක්. ඔහුගෙන් හොඳ සාක්ෂියක් ලැබුණා. ඔහු මිනීමැරුම සිදුවූ දාට දින දෙකකට කලින්, මධ්‍යම රාත්‍රියේ මේ අසපෙදෙස පසුකරල ගමන් කරල තියෙනවා. ඔහු සාක්ෂියේදී මෙහෙම කිව්වා.

"මං කේරිගේ කුටිය ඉදිරිපිට පාරේ ගමන් කරන විට වෙලාව පාන්දර එකට පමණ ඇති. ඒ වෙලාවෙ නිකමට වගේ මං ඒ කුටිය දිහා බැලුවා. පාර පැත්තට තිබුණු ජනේලයේ හතරැස් කොටුවක හැඩේට දීප්තිමත් ආලෝකයක් තිබුණා. ජනෙල් වීදුරුව මතට මිනිස් හිසක හෙවණැල්ලක් වැටිල තිබුණා. ඒ නාසය, නිකට ආදිය පෙනෙන සේ පැත්තට හැරුණු මුහුණක්. නමුත් ඒ මුහුණ පීටර් කේරිගේ නොවන බව මට දිවුරන්න පුළුවන්. ඒ මොකද මං කේරිව හොඳින් හඳුනනවා. ඔහුගේ හිසේ හැඩය මීට වඩා හුඟක් වෙනස්. මේ ඉදපු පුද්ගලයත් මුහුණ පුරාම රැවුලක් වවපු කෙනෙක්. නමුත් ඔහුගේ නිකටේ තිබුණු රැවුල කෙටියි. එය ඉදිරිපසට දික්වී නැමී තිබුණු බව, මං ජනෙල් වීදුරුව මත වැටුණු සෙවණැල්ලෙන් හොඳ හැටි දුටුවා. කේරිගේ තිබුණේ මීට වඩා හුඟක් දිග රැවුලක්. අනෙක එය පහතට දික්වුණු එකක්."

ස්ලේටර්ගේ සාක්ෂියෙන් එහෙම කියැවුණත් අපි අමතක නොකළ යුතු කරුණු දෙකක් තිබෙනවා. එකක්, ඔහු ගමේ තැබෑරුමේ

http://sherlockholmesinvestigations.blogspot.com

පැය දෙකක් පමණ ගතකරලයි මේ වෙලාව වෙනකොට හිටියේ. ඒ නිසා මත්පැන් පානය කරලා ඉන්න ඇති. අනෙක මහපාරේ ඉඳල මේ කියන ජනේලයට තරමක් දුරයි. තවත් ප්‍රධාන කරුණක් නම් ස්ලේටර් මේ විස්තර කියන්නේ සඳුදා රාත්‍රී ඔහු දුටු දෙයක් ගැනයි. මරණය සිදුවුණේ බදාදා.

අඟහරුවාදා දවස පුරාම, පීටර් කේරි ඉඳල තියෙන්නේ බොහොම දරුණු ස්වභාවයකින්. නොනවත්වාම මත්පැන් පානය කර ඇති ඔහු, තිරිසන් සතෙක් වගේ කෲර ලෙස හැසිරෙමින් සිටි බවයි මට අහන්න ලැබුණේ. මේ අයුරින් ඔහු නිවස තුළ කලබල කරද්දි, කේරි මහත්මිය දියණිය සමඟ නිවසෙන් පැන ගිහින් තියෙනවා. කේරි ඔහුගේ කුටියට ගිහින් තිබෙන්නේ හොඳටම හැන්දෑවෙලා.

අඟහරුවාදා රෑ - ඒ කියන්නේ බදාදාට එළිවෙන්න පාන්දර දෙකට පමණ, කුටිය දෙසින් මහ විලාප හඬක් ඇහිල තියෙනවා. එය ඇසුණේ මේ වෙනකොට ගෙදර ඇවිත් හිටි කේරිගේ දියණියට. නමුත් මත්පැන් බී වෙරිවෙලා, කේරි මේ අයුරින් කෑගැසීම, විලාප නැඟීම සාමාන්‍ය දෙයක් නිසා කවුරුත් ඒ ගැන සැලකීමක් කළේ නෑ. උදේ හතට අවදි වූ සේවිකාවක් දැකලා තිබෙනවා, අසාමාන්‍ය ලෙස කුටියේ දොර විවෘතව තිබෙනවා. නමුත් කේරිගේ කුරිරු ගතිගුණ ගැන හොඳහැටි දන්නා නිසා, ඇය හෝ වෙනත් කිසිවෙක් ඔහු ගැන සොයා බලන්න ගියේ නැහැ. ඉරමුදුන් වන වෙලාවටත් කුටිය දෙසින් කිසිම ශබ්දයක් නොනැඟුණු නිසා, සේවිකාවක් ගිහිං විවෘතව තිබුණු දොරෙන් කුටිය තුළට එබී බැලුවා. දකින්න ලැබුණු දර්ශනයෙන් අප්‍රමාණ භීතියට පත්වෙලා ඇය හැඬ දිව්වාලු. පැයක් ඇතුළත එතැනට ළඟාවෙන්න මට හැකිවුණා.

හෝම්ස් මහත්මයා ඔබ දන්නවා මම ලෙහෙසියෙන් කම්පනයට පත්වෙන තාලේ කෙනෙක් නෙමෙයි. බොහොම දරුණු මිනීමැරුම් හා හදිසි අනතුරු, මං දැකල තියෙනවා. නමුත් ඇත්තම කියන්නම්. මං ඒ කුටිය තුළට ඔළුව දැම්මාම නම් දැඩි තිගැස්සීමකට පත්වුණා.

කුටිය පිරිලා හිටි මැස්සන් හා නිලමැස්සන්ගෙන් නැඟුණු නාදය නිසා එතැනින් නිකුත් වුණේ ක්‍රියාකාරී මී වදයකින් නැග එන්නාක් වැනි ශබ්දයක්. එහි පොළොවත් බිත්තියත් ලේ වලින් වැහිලා තිබුණේ, හරියට ගව ඝාතකාගාරයක වගේ. එය ඇතුළත හරියටම නැවක කැබින් කාමරයක් වගේ. ඇතුළට ගියාම අපට හිතෙන්නේ නැවක්

http://sherlockholmesinvestigations.blogspot.com

ඇතුළත ඉන්නවා වගේ හැඟීමක්. නැව්වල විධියට බිත්තියේ ඉහළින් සවිකළ ඇඳක් එක් තැනක. තවත් තැනක, මුහුදු පෙට්ටගම්, මුහුදු ගමන් මාර්ග දක්වෙන යාත්‍රික සිතියම්, 'සී යුනිකෝන්' නම් ඔහුගේ නැවේ අලංකාර සිතුවමක්. තවත් තැනක ලොකු රාක්කයක් පුරා ගොඩ ගහල තිබුණේ නැව්වල දකින්න ලැබෙන ලොග් පොත්. මෙතැන හරියටම නැවක කපිතාන් වරයාගේ කුටිය වගෙයි. මේ හැම දෙයකටම මැදින් කපිතාන් කේරී සිටියා. ඔහුගේ මුහුණ වේදනාවෙන් විරූපී වූ භයංකර හැඟීම් ප්‍රකාශ කළා. වානේ වලින් තැනුණු හාපූනය - තියුණු උලක් සහිත, බර, ඇවුළුම් බිලිය, කේරීගේ පපුව මැදින් පසාකරගෙන ගොස් තිබුණා. එය ඔහුගේ ශරීරය විනිවිද ගොස්, පිටුපස ලෑලි බිත්තියේත් අඟල් ගණනක් ඇතුළට කිඳාබැස තිබුණා. කේරී බිත්තියට ඇමිණී හිටිමේ අල්පෙනෙත්තකින් කාඩ්පතකට සවිකළ සමනලයෙක් වගෙයි. ඔහුගේ කටින් අර විලාපය පිටවූ මොහොතේම ඔහු මියයන්නට ඇති.

ඔබේ පරීක්ෂණ ක්‍රම මං හොඳින් හදාරල තියෙනවනේ හෝම්ස් මහත්මයා. ඒ නිසා කිසිම දෙයක් තිබූ තැන්වලින් වෙනස් කිරීමට පෙර මගේ පරීක්ෂණය ආරම්භ කළා. ඒ වගේම බැලුවා ඇතුළත හා පිටත බිමත්; කිසිම තැනක කිසිම අඩි සටහනක් නෑ."

"ඔබ අදහස් කරන්නෙ අඩි සටහන් ඔබට දකින්න ලැබුණෙ නෑ කියන එකද?"

"මට සහතික කරලා කියන්න පුළුවන් හෝම්ස් මහත්මයා, එහි කිසිම අඩි සටහනක් තිබුණෙ නෑ."

"යාළුවා, මං අපරාධ පරීක්ෂණ විශාල ගණනක් කරල තියෙනවා. ඒත් අහසෙන් පියාඹාගෙන ආ සත්තෙකු කළ අපරාධයක් තවමත් මට දකින්න ලැබිල නෑ. අපරාධකාරයා දෙපයින් යන කෙනෙක් නම්, ඔහුගේ පාදයෙන් හෝ පාවහන් වලින් පොළොවේ ඇතිවූ මොනවා හරි ලකුණක්, පළුදු වීමක්, සීරීමක් නැත්නම් බඩු එහා මෙහා වීමක් තිබිය යුතුයි. හැබැයි ඉතින් ඒක හොයාගන්න පිළිවන් වෙන්නේ, එතැන සූක්ෂ්ම ලෙස පරීක්ෂාවට භාජනය කරන පරීක්ෂකයෙකුට පමණයි. හැම අතකටම ලේ විසිවුණු, මේ වගේ කාමරයක, අපට උදව්වෙන්න පුළුවන් කිසිම සලකුණක් නෑ කියන එක, විශ්වාස කරන්නත් බැහැ. මරණ පරීක්ෂණයේ සාක්ෂි වලින් මට තේරුම්

http://sherlockholmesinvestigations.blogspot.com

ගියේ, එතැන තිබී යම් යම් සුවිශේෂ චන්ෂුන් කිහිපයක් ඔබටත් හමුවුණු බව?"

"හෝම්ස් මහත්මයා. ඒ වෙලාවෙ ඔබ එතැනට කැඳවන්නෙ නැතුව මං කළේ ලොකු මෝඩ කමක්. දැන් ඉතින් ඉහිරුණු කිරට අඬලා වැඩක් නෑ. විශේෂ අවධානයක් යොමු කළ යුතු දේවල් කිහිපයක්ම හමුවුණු බව ඇත්තයි.

එයින් පළමුවෙනි එක තමා පේටර් කේරි මරා දමීම සඳහා යොදාගත්ත හාපූනය. මේක මුලින්ම තිබිල තියෙන්නෙ ලෑලි කුටියෙම බිත්තියට සවිකළ රාක්කයක. මේ වගේම තවත් හාපූන දෙකක් රාක්කයේම ඉතිරිවෙලා තිබුණා. මෙම හාපූනයේ කඳේ කැටයම් කරලා තියෙනවා. 'සී යුනිකෝන් නෞකාව, ඩන්ඩී' යනුවෙන්..මෙකෙන් අපට හිතාගන්න පුළුවනි, මේ මිනීමැරුම ක්ෂණික කෝපය නිසා කළ එකක් කියල. අපරාධකාරයාට කේන්ති ගියාම, අතට අහුවෙන හරියේ ඔහුට දකින්න ලැබුණු පළවෙනි ආයුධයම ඔහු ප්‍රයෝජනයට ගත්තා.

ඊළඟට තවත් කාරණයක්, අපරාධය සිද්ධ වුණේ රෑ දෙකටයි. නමුත් පීටර් කේරි හැඳ සිටියේ රෑ නින්දට යනකොට අඳින ඇඳුම නෙමෙයි. ඔහු අමුත්තෙකු හමුවෙන්න සූදානම් වෙන විධියට සම්පූර්ණයෙන්ම හැඳ පැළැඳගෙන සිටියා. ඒක තවදුරටත් ඔප්පු වෙනවා; මේසය උඩ තිබුණා රම් බෝතලයක් සහ පාවිච්චි කළ වීදුරු දෙකක්."

"ඔව්. ඔබේ ඒ නිගමන දෙකටම මටත් සම්පූර්ණයෙන්ම එකඟවෙන්න පුළුවනි. කාමරයේ තිබුණු ඒකම මත්පැන් වර්ගය රම්ද? තවත් වෙනත් මත්පැන් වර්ග මොනවත් තිබුණාද?"

"ඔව්. මුහුදු පෙට්ටගමක් තුළ විස්කි සහ බ්‍රැන්ඩි අඩංගු බෝතල් තිබුණා. නමුත් ඒවා විවෘත කරලවත් තිබුණේ නැහැ. ඒ නිසා ඒකෙ ඒතරම් වැදගත් කමක් මා දකින්නෙ නෑ."

"විවෘත නොකොට තිබුණත්, එම මත්පැන් තිබුණු එකේ යම් වැදගත් කමක් තියෙනවා. කමක් නෑ. අපරාධයට සම්බන්ධ කමක් තියෙනවා කියල ඔබ කියන දේවල් ගැන, මොනවාද ඔබ හොයාගනිපු අනික් කරුණු?"

"අර දුම්කොළ අසුරා තිබූ පසුම්බිය මේසය උඩ තිබුණා."

"මේසයේ කොයි හරියෙද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"මේසය මැද්දෙම. එය සීල් ඇස්සා හමින් තැනූ එකක්. එය ගැටගැසීමට හම් පටියක් තිබුණා. පසුම්බියේ ඇතුළත 'P.C' යනුවෙන් ලියා තිබුණා. නාවිකයන් පාවිච්චි කරන වර්ගයේ බොහොම සැර දුම්කොළ අවුන්ස භාගයක් පමණ පසුම්බිය ඇතුළේ තිබුණා."

"විශිෂ්ටයි. තව මොනවාද?"

මීළඟට ස්ටැන්ලි හොප්කින්ස් තම සාක්කුවෙන් දුඹුරු පැහැති සටහන් පොතක් එළියට ගත්තේය. එහි පිටකවරය බොහෝ සෙයින් ගෙවී, පළුදු වී තිබුණු අතර, ඇතුළත පිටු ද දුර්වර්ණ වී තිබිණි.

එහි පළමුවැනි පිටුවේ J.H.N. 1883 යනුවෙන් සඳහන් විය. මෙම සටහන් පොත මේසය මත තැබූ හෝම්ස්, ඔහුටම සුවිශේෂ වූ ආකාරයට එය පරීක්ෂණයට ලක් කළේය. හොප්කින්ස් සහ මම දෙපසින් බලා සිටියෙමු.

දෙවැනි පිටුවේ C.P. R යන අකුරු සහ ඊළඟ පිටු කිහිපයේම අංක රාශියක් සඳහන් විය. තවත් පිටුවක 'ආජෙන්ටයින්' යනුවෙන්ද, තවත් පිටුවල 'කෝස්ටරිකා' 'සැන්පාවුලෝ' යනුවෙන් ද ලියා තිබිණ. ඒ සෑම ලියවිල්ලකටම පසු, යම් රහස් ලකුණක් ද, අංක රාශියක් ද සඳහන් විය.

"මේ සටහන් පොත ගැන හොප්කින්ස්ගෙ අදහස මොකක්ද?"

"මට පෙනෙන හැටියට මේක කොටස් වෙළඳපොළේ, තැන්පතු සහතික වල ලේඛනයක්. J.H.N කියන්නෙ කොටස් වෙළෙඳපොළේ තැරැව්කරුවෙකුගේ නමේ මුල් අකුර වෙන්න ඇති. C.P.R කියන්නේ ඔහුගේ අනුග්‍රාහකයා වෙන්න ඇති."

"C.P. R. කියන්නේ Canadian Pacific Railways - කැනේඩියන් පැසිෆික් දුම්රිය සේවය වෙන්න බැරිද?" හෝම්ස් ඇසීය.

දත්මිටි කෑ හොප්කින්ස් තම දකුණු අතේ මිට මොළවා, තම කලවටම පහරක් එල්ල කරගත්තේය.

"මං මහා මෝඩයෙක්; ඒක තේරුම් ගන්න බැරිවුණා නේ. ඔබේ විසඳීම නිවැරදියි හෝම්ස් මහත්මයා. එතකොට අපට විසඳන්න තියෙන්නේ J.H.N කියන අකුරු විතරයි.

මම කොටස් වෙළඳපළේ 1883 කාලයේ පරණ ලියකියවිලි ඔක්කොම පරීක්ෂා කරලා බැලුවා. ඒත් මේ මුල් අකුරු වලින්

http://sherlockholmesinvestigations.blogspot.com

හැඳින්වෙන විධියේ නමක් ඇති කෙනෙක් මට හොයාගන්න බැරිවුණා. කොටස් වෙළඳපොළේ අභ්‍යන්තරව අලෙවිකරණයේ යෙදුණු නැරැව්කරුවන්ගේ පමණක් නොවෙයි, පිටතින් සම්බන්ධ අයගේ නාම ලේඛනය පවා මං පරීක්ෂා කරල බැලුවා. ඒත් මෙවැනි නමක් ඇති කෙනෙක් ගැන හෝඩුවාවක් මට ලැබුණේ නෑ. මට හිතෙන්නේ මේ මුල් අකුරු ඇති පුද්ගලයා වෙන්න පුළුවනි අපරාධය සිදුවුණු අවස්ථාවේ මෙතැන සිටි අනෙක් තැනැත්තා. හෝම්ස් මහත්මයා ඔබත් ඊට එකඟවෙනවා ඇති.

අනික් කාරණය, විශාල වටිනාකමකින් යුත්, කොටස් වෙළඳපොළේ සුරැකුම් පත් විශාල ගණනක ලේඛනයක් මෙතැනට ගෙන ඒමෙන්ම අපට හිතාගන්න පුළුවනි, මේ මිනීමැරුමට හේතුව කුමක්ද කියලා."

හොප්කින්ස් මෙම කරුණු ඉදිරිපත් කළ විට ෂර්ලොක් හෝම්ස්ගේ මුහුණේ ද යම් නිශ්චිත පෙනීමක් මම දුටුවෙමි.

"ඔබ ඉදිරිපත් කළ කාරණා දෙකම මං පිළිගන්නවා. මරණ පරීක්ෂණයේදී මේ සටහන් පොත සාක්ෂියට ඉදිරිපත් වෙලා තිබුණේ නැහැනෙ. ඉතින් ඒ අනුව, අපරාධය ගැන මා හිතාගෙන හිටි දේවල් දැන් සම්පූර්ණයෙන්ම වෙනස් වෙනවා. මෙහි සඳහන් ආයෝජන සුරැකුම් පත් හොයාගන්න ඔබ උත්සාහයක් දැරුවද?"

"අදාළ කාර්යාල වලින් ඒ ගැන හොයා බලන්න අපි දැනටමත් ආරම්භ කරලයි තියෙන්නෙ. දකුණු ඇමරිකානු කොටස් හිමිකරුවන්ගේ සම්පූර්ණ නාම ලේඛනය තියෙන්නේ දකුණු ඇමරිකාවෙ. ඒවා ගැන තොරතුරු ලැබෙන්න සති කිහිපයක් ගතවේවි."

තම උත්තල කාචය අතට ගත් හෝම්ස්, එය ආධාරයෙන් සටහන් පොතේ කවරය පරීක්ෂා කිරීමට පටන් ගත්තේය.

"මේ කවරයේ දුර්වර්ණ වූ පැල්ලමක් තියෙනවා . . . ."

"ඔව් මහත්මයා ඒක ලේ පැල්ලමක්. මං ඔබට කිව්වෙ ඔය පොත ඇහිඳ ගත්තෙ බිම වැටිල තිබිල කියල."

"ලේ පැල්ලම තිබුණේ පොතට යටින්ද? එහෙමත් නැත්නම් පොත උඩද?"

"පොත තිබුණේ පැත්තට, බිත්තියේ ලෑලි වලට හේත්තු වෙලා. ලේ පැල්ලමකට උඩින්."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒකෙන් ඔප්පු වෙන්නේ පොත බිම වැටිල තිබෙන්නේ අපරාධය සිදුවුණාට පසුව බවයි."

"හරියටම හරි හෝම්ස් මහත්මයා. මං එය තේරුම් ගත්තෙත් ඔය ආකාරයටමයි. මං හිතන්නේ ඔය සටහන් පොත බිම වැටෙන්න ඇත්තේ, අපරාධකරුවා පෙනිහ්. ඒ මොකද එය තිබුණේ දොර අසල."

"මියගිය කේරි සතු ලියකියවිලි අතර තිබිලා, මෙහි සඳහන් සුරැකුම් පත් මොනවත් හම්බවුණේ නැද්ද?"

"නැහැ මහත්මයා."

"මෙය යම්කිසි දෙයක් මංකොල්ල කෑමේ අරමුණෙන් සිදුකළ අපරාධයක් කියල ඔබ හිතනවද?"

"නැහැ මහත්මයා. කිසිම දෙයක් සොරකම් කළ බවට ලකුණක් වත් නැහැ."

"හැබැට? මේක බොහොම සිත් ඇදගන්නා සුලු සුවිශේෂ පරීක්ෂණයක් නොවැ? එතැනට බිම තිබී පිහියක් හමුවුණාලු, නේද?"

"ඔව්. කොපුවක දමූ පිහියක් මියගිය පුද්ගලයාගේ දෙපා ළඟ තිබී හමුවුණා. කේරි මහත්මිය හඳුනාගත්තා ඒ පිහිය ඇගේ ස්වාමිපුරුෂයා සතු එකක් හැටියට."

හෝම්ස් කිසිත් නොකියා මඳ වේලාවක් කල්පනා කළේය.

"හොඳයි. මං හිතන්නේ මට ඔය සිද්ධිය වුණු තැනට ඇවිත් පරීක්ෂා කරල බලන්න සිද්ධ වෙයි."

හොප්කින්ස්ගේ සතුට නිම්හිම් නැතිවිය.

"බොහොම ස්තුතියි මහත්මයා. ලොකු උදව්වක්. ඔබේ පැමිණීමෙන් මගේ හිතෙන් සෑහෙන බරක් ඉවත් වෙනවා."

"සතියකට කලින් නම් මේක බොහොම ප්‍රයෝජනවත් ගමනක් වෙන්න තිබුණා. නමුත් දැන් . . . .? දැන් වුණත් මගේ ගමන නිෂ්ඵල එකක් වේවි කියල මං කියන්නෙ නෑ. වොට්සන් විවේකයක් තියෙනවා නම් ඔබත් එන්න. හොප්කින්ස් අශ්වකරත්තයකට කථා කරන්න. පැය කාලක් යද්දී අපි දෙන්න සූදානම්."

* * *

http://sherlockholmesinvestigations.blogspot.com

කලින් මහ වනයක්ව පැවැති එම ප්‍රදේශයේ කඳු බෑවුමක කපිතාන් පීටර් කේරිගේ ගෘහය පිහිටා තිබිණ. ගල් වලින් තැනූ මිටි නිවසක් වූ එයට, ළඟාවීම සඳහා පාර වැටී තිබුණේ කුඹුරු මැදිනි. වත්තේ එක කෙළවරක, පාරට සමීපව ලෑලි වලින් තැනූ කුටිය පිහිටා තිබිණි. එහි තුන් පැත්තක් සමීපයේ වූයේ මල් පඳුරු කිහිපයකි. අනෙක් පැත්ත ජනේලයක් හා දොරක් සහිතව පාර දෙසට මුහුණ ලා තිබිණි. මිනීමැරුම සිදුවී ඇත්තේ මෙතැන්ය.

ස්ටැන්ලි හොප්කින්ස් මුලින්ම, අප ගල් වලින් තැනූ නිවස වෙත කැඳවා ගෙන ගියේය. කේරි මහත්මිය අප හමුවට පමුණුවන ලදී. වයස්ගත කාන්තාවක් වූ ඇගේ, රැලිවැටුණු මුහුණෙන් පිලිබිඹු වූයේ අවුරුදු ගණනාවක් තිස්සේ ඇයට මුහුණ පෑමට සිදුවූ වධහිංසා සහ කරදර කම්කටොලුයි. ඇය සමගම ඇගේ දියණිය ද එහි සිටියාය. රන්වන් පැහැති කෙස් කලඹක් තිබූ ඒ සුදුමැලි තරුණිය අපට පැවසුවේ, තම පියාගේ මරණයගැන ඇය සතුටුවන බවයි. පියා මරා දමූ තැනැත්තා කවුරු හෝ වේවා, ඔහුට තමාගේ ආශිර්වාදය හිමිවන බව කේරි මෙනෙවිය තවදුරටත් කීවාය.

අපි එතැනින් ඉවත් වී අපරාධය සිදුවූ කැබින් කාමරය පරීක්ෂා කිරීම සඳහා ගියෙමු. එහි බිත්ති සියල්ල ලෑලි වලින් නිමකොට තිබිණි. තම සාක්කුවේ තිබූ යතුරක් ඉවතට ගත් හොප්කින්ස්, දොර විවෘත කිරීමට සූදානම්ව, අගුළ දෙසට හිස පහත් කළේය. මිළඟට දොර විවෘත කිරීමේ කාර්යය අත්හිටවූ ඔහු, යතුරු කට දෙස නිහඬව බලා සිටියේ මහත් පුදුමයෙනි.

"කවුරු හරි හොර යතුරක් හෝ එවැනි මොකක් හරි දමල මේ දොර අරින්න හදලා තියෙනවා, හෝම්ස් මහත්මයා."

එහි කිසිදු සැකයක් නොවීය. දොරේ ආලේප කළ තීන්ත බෙහෙවින් සීරී තිබුණු අතර, යතුරු කට අවට ලෑල්ල තදින් කැපී, පළුදු වී තිබිණ. හෝම්ස් ජනේලය ද පරීක්ෂා කර බැලුවේය.

"කවුරු හරි මේ ජනේලයත් කඩන්න උත්සාහ කරල තියෙනවා. ඇතුළට රිංගන්න හදපු හොරා මොකෙක් වුණත් එයාගෙ වැඩේ සාර්ථක වෙලා නැහැ. මට පෙනෙන හැටියට ගෙවල් බිඳීමේ කාර්යයේ බොහොම අදක්ෂයෙක් එගෙයි." හෝම්ස් කීය.

http://sherlockholmesinvestigations.blogspot.com



145 "හරි පුදුමාකාර වැඩක් නේ. මට දිවුරන්න පුළුවනි. ඊයේ හැන්දෑවෙ මේ වගේ කිසිවක් තිබුණේ නෑ."

"මෙක හරි පුදුමාකාර වැඩක් නෙ. මට දිවුරන්න පුළුවනි, ඊයෙ හැන්දෑවෙ, දොරේ මේ වගේ සලකුණු කිසිවක් තිබුණෙ නෑ." හොප්කින්ස් කිය.

"ගමේ කාට හරි කුතුහලයක් ඇතිවුණාද දන්නෙ නෑ මෙකෙ ඇතුළෙ තියෙන්නෙ මොනවද කියල බලන්න." මම කීවෙමි.

"මං හිතන්නෙ නෑ. දොරකින් ජනේලයක් කඩාගෙන ඇතුළට එනවා තියා, මේ ගමේ කිසිකෙනෙක් කේරි මැරුම් කාපු තැනට ඒවි කියල, මේ තරම් ඉක්මනට. ඔබ මොකුවද මේ තැන හිතන්නෙ හෝම්ස් මහත්මයා?"

"මං හිතන්නේ අපි හරි වාසනාවන්තයි."

"ඔබ හිතන්නේ ඔහු ආයෙමත් ඒවි කියලද?"

"බොහොම දුරට එහෙම වෙන්න ඉඩ තියෙනවා. ඔහු ඊයෙ රෑ එන්න ඇත්තෙ කුටියෙ දොර අගුළු දාල නැතුව ඇති කියන විශ්වාසයෙන්. නමුත් අගුළු දාලා තිබුණ දුටුවාම, එය කඩන්න උත්සාහ කළේ, ළඟ තිබුණ කුඩා පෑන් පිහියක ආධාරයෙන්. ඒක හරි ගියේ නෑ. ඉතින් ඊළඟට ඔහු මොකක්ද කරන්නෙ?"

"ඊළඟ රාත්‍රියේ එනවා වඩාත් හොඳ ආයුධ අරගෙන."

"අන්න හරි. ඔහුව පිළිගන්න අද රෑට අපි මෙහේ රැඳී නොසිටියොත් ඒක අපේ වැරැද්ද. ඊට කලින් මං කැමතියි කැබින් කාමරේ ඇතුළත පරීක්ෂා කරල බලන්න."

ඛේදජනක සිදුවීමේ සුන්බුන් ඉවත් කර තිබිණ. එහෙත් එහිවූ ලී බඩු හා අනෙකුත් උපකරණ, අපරාධය සිදුවූ දිනයේ තිබූ අයුරින්ම තැබීමට හොප්කින්ස් නිසම කොට ඇත. හෝම්ස් පැය දෙකක් තිස්සේ දැඩි අවධානයකින් මුළු කුටියම පරීක්ෂාවට ලක් කළේය. එහි වූ ලොකු කුඩා සෑම දෙයක්ම හොඳින් සෝදිසි කිරීමට ඔහු අමතක නොකළේය. පරීක්ෂණය අතර මගදී නැවැත්වූයේ එක් අවස්ථාවක පමණි.

"හොප්කින්ස්, මේ බලන්න. මෙන්න මේ රාක්කයේ, මෙන්න මෙතැන තිබිලා ඔබ මොනවා හරි ඉවතට ගත්තද?"

"නෑ. මං කිසිම දෙයක් ඉවතට ගත්තෙ නෑ; එහා මෙහා කළේ වත් නෑ."

http://sherlockholmesinvestigations.blogspot.com

"කවුරු හරි, මොනවා හරි අරමගහා තියෙනවා. රාත්කයේ අනෙක් තැන් වලට වඩා එතැන දුවිලි ඉතාමහොම අඩුයි. ඒක පොතක් නැත්නම් පෙට්ටියක් වෙන්න පුළුවනි. හොඳයි කමක් නෑ. මට ඊට වඩා නම් මොකුත් හොයාගන්න අමාරුයි.

වොට්සන් අපි යමු මේ ලස්සන වනරොදේ ටිකක් ඇවිදල එන්න. මේ කැලෑමල් වල, කුරුල්ලන්ගේ සුන්දරත්වය බලමින් අපට පැය කීපයක් ගත කරන්න බැරිවෙන්නෙ නෑ. අද නැන්දෑවෙ මෙතැනදීම අපි යලින් හමුවෙමු හොප්කින්ස්. ඊයෙ රෑ ආපු මහත්තයව අද රෑට මුණ ගැහෙන්න පුළුවන්ද කියලා බලමුකො."

පීටර් කේරිගේ කුටීර කාමරය අසල අප සැඟවී ගත්තේ රාත්‍රී එකොළහටයි.

"අපි දොරේ අගුළු හොඳා, දොර බාගෙට ඇරල තියමුද හෝම්ස් මහත්මයා?" හොප්කින්ස් ඇසීය.

"නෑ නෑ. එහෙම හොඳ නෑ. ඔහුගේ හිතේ සැකයක් ඇතිවෙන්න පුළුවනි. සාමාන්‍ය විධියට අගුළුදාලා තියමු."

"ඔබේ කැමැත්තක්."

"දොරේ අගුළ අරින්න ඉතාමහොම පහසු එකක්. හොඳ ශක්තිමත් පිහිතලයක් හෝ නියනක් තමයි ඒකට අවශ්‍ය. දැන් අපි කුටියෙන් පිටත හැංගිලා බලාගෙන ඉඳිමු. අර තියෙන මල්පඳුරු අතරෙ සැඟවුණාම, ඔහු කොහොමටවත් අපව දකින්නෙ නෑ. බලමු ඔහුගේ මේ රාත්‍රී ගමනේ අරමුණ මොකක්ද කියලා."

රාත්‍රියේ සෑහෙන වේලාවක් අපට බලා සිටීමට සිදුවිය. දිය බිමට එන සතෙකු දඩයම් කගෙනීම සඳහා, දියකඩිත්තක් අසල රැක සිටිනා දඩයක්කාරයන් මෙන් අපි බලා සිටියෙමු. අඳුරේ සැඟවී අප වෙත එන පුද්ගලයා කවරෙක්ද? දිවි ගලවා ගැනීම සඳහා අප සමග දරුණු ලෙස සටන් වැදීමට සූදානම් ව්‍යාඝ්‍රයෙක්ද? එසේත් නැත්නම් සටන් කිරීමට ශක්තියක් නැති දුර්වල සිවලෙක්ද?

තරමක් ඈතින් පිහිටි ගමේ පල්ලියේ ඔරලෝසුව, පැය භාගයෙන් භාගයට නාදවෙන අයුරු අපට ඇසන්නට ලැබිණි. රාත්‍රිය ගෙවී යන අයුර පිළිබඳව අප දැනුවත් කලේ එයයි. මධ්‍යම රාත්‍රිය පසුවෙද්දී පොද වැස්සක් ඇද හැළෙන්නට පටන් ගත්තේය.

http://sherlockholmesinvestigations.blogspot.com

අලුයම දෙකයි තිහේ කණිසම ළඟා වෙද්දී අවට පැවතියේ දැඩි අන්ධකාරයකි. ගේට්ටුව දෙසින් සිහින් හඬක් ඇසිණි. අපි කන් දීගෙන සිටියෙමු. කිසිවෙකු ගේට්ටුවෙන් ඇතුළුවූවා විය යුතුය. යළිත් පැවතියේ මඳ නිහඬතාවයකි. මීළඟට කිසිවෙකු ප්‍රවේශමෙන් අඩි තබන ශබ්දය ද, ලෝහ අඬු වලින් නිකුත්වන 'කර කර' ශබ්දයක් ද ඇසිණ. කුටියේ දොර අසල සිටගෙන සිටි කිසිවෙකු, එහි අගුළ විවෘත කිරීමට උත්සාහ ගන්නා බව අපි තේරුම් ගත්තෙමු. මෙවර ඔහු වඩාත් හොඳ ආයුධ යොදාගන්නා විය යුතුය. සරනේරු වලින් නිකුත්වන ශබ්දය සමග දොර විවෘත වන හඬ ඇසිණ. ගිනිකූරක් පත්තු කොට ඒ සමගම ඉටිපන්දමක් දල්වන ලදී. කැබින් කාමරය තරමක් ආලෝකමත් විය. තුනී ජනෙල් රෙද්ද තුලින් අපි ඒ දෙසට නෙත් යොමු කළෙමු.

රාත්‍රියේ පැමිණි අමුත්තා තරුණයෙකි. කෙට්ටු දුර්වල පුද්ගලයෙකු වූ ඔහුගේ වයස, අවුරුදු විස්සකට වැඩි නොවීය. කළු පැහැති උඩු රැවුල නිසා ඔහුගේ මුහුණේ සුදුමැලි බව වඩාත් කැපී පෙනිණි. මිනිසෙකු මෙ තරම් භයට පත්ව සිටිනු අයුරු මා කිසිදිනෙක දැක නැත. ඔහුගේ වෙව්ලීම දැත් හා දෙපා වලට පමණක් සීමා වූයේ නැත; දත්ඇඳි පවා එකට ගැටුණේ ශබ්දයක් නිකුත් කරමිනි. මහත්මයකු ලෙස හොඳින් හැඳ පැළැඳ සිටි එම තරුණයා කැප් තොප්පියක් පැළැඳ සිටියේය. බියපත් වූ දෑසින් ඔහු කුටිය ඇතුළත වටේටම පරීක්ෂා කරන අයුරු අපි බලා සිටියෙමු.

මීළඟට ඉටිපන්දම මේසයේ කොනක සවිකළ ඔහු, අපේ දර්ශන පථයෙන් ඉවත් විය. අනතුරුව යළිත් මේසය වෙත පැමිණියේ තරමක් විශාල පොතක් අතැතිවයි. එය, රාක්කයක අසුරා තිබූ නැව් වල සටහන් තැබීමට ගන්නා ලොග් පොතක් බව අපි දුටුවෙමු. අනතුරුව, ඔහු එහි පිටු ඉක්මනින් පෙරළාගෙන ගියේය. තමාට අවශ්‍ය පිටුව පෙරළුණු වහාම මහත් අවධානයකින් ඔහු එය කියවාගෙන ගියේය. එහි සඳහන්ව තිබූ දෙයින් ඔහු කෝපයට පත්වූවා නිසැකය. එක්වරම අතේ මිට මෙළවූ ඔහු, බලාපොරොත්තු කඩවූ අයුරින් එය වසා දැම්මේය. ලොග් පොත රාක්කයට දමූ ඔහු ඉටිපන්දම නිවා දමා කුටියෙන් එළියට බැසීමට සූදානම් විය.

තරුණයාට එක අඩියක් එළියට තැබීමට අවසර නොලැබිණ. ස්ටැන්ලි හොප්කින්ස් එක්වරම තරුණයාගේ කමිස කර ළඟින් දැඩිව

http://sherlockholmesinvestigations.blogspot.com

අල්ලා ගත්තේය. භීතියට මෙන්ම දුක් වේදනාවට ද, පත් හඬක් ඔහුගේ මුවෙන් පිටවිය.

ඉටිපන්දම යළිත් දල්වන ලදී. තමා අසුවූයේ පොලිස් නිලධරයෙකුගේ ග්‍රහණයට බව දුටු තරුණයා, ක්ලාන්ත වූවාක් මෙන් අසල තිබූ මුහුදු පෙට්ටගම මත හිඳගත්තේය.

"ඉලන්දාරියා! කියහන්ව බලන්න තමුසෙ කවුද කියලා? මොනවද තමුසෙ මෙහේ හොයන්නෙ?" හොප්කින්ස් ඇසීය.

"ඔබ . . . . ඔබ . . . . සියලු දෙනා රහස් පරීක්ෂකවරු වෙන්න ඇති මං හිතන්නෙ. ඔබ හිතාගෙන ඉන්නෙ කපිතාන් කෙරීගේ මරණයට මාත් සම්බන්ධයි කියලද? මං ඔබට දිවුරලා කියන්නම්. මගේ ඒට සම්බන්ධයක් නෑ. මං අහිංසකයෙක්."

"ඒව අපි පස්සෙ බලාගමු. මුලින් කියනවා තමුසෙගෙ නම මොකක්ද කියලා."

"ජෝන් හෝප්ලි නෙලිගන්."

ෂර්ලොක් හෝම්ස් සහ හොප්කින්ස් ඔවුන්ගේ මුහුණට මුහුණ බලාගත් අයුරු මම දුටුවෙමි.

"තමුසෙ මොනවද මෙහේ කරන්නෙ?"

"මට ඒක කියන්න පුළුවනි. නමුත් ඒක රහසක් හැටියට තබාගන්න පුළුවන්ද?"

"කොහොමටවත් බෑ."

"එහෙම නම් මොන හේතුවක් නිසාද මං මේව ඔබට කිව යුත්තේ?"

"නොකිව්වොත් අර මිනීමැරුම සම්බන්ධයෙන් ඔබට විරුද්ධව චෝදනා එල්ල වේවි. ඒක ඔබේ භාරකට හිටින්න පුළුවනි.

තරුණයා දිග සුසුමක් හෙළුවේය.

"හොඳයි මං කියන්නම්. මේ දේ මම හෙළිකළ යුතුම දෙයක්. ඒ වුණත් මේ අපකීර්තිමත් සිද්ධිය යළිත් වරක් ප්‍රසිද්ධියට පත්වීම හිතට ලොකු කණගාටුවක්. මහත්වරුනි ඔබ අහල තියෙනවද ඩෝසන් සහ නෙලිගන් ගැන?"

http://sherlockholmesinvestigations.blogspot.com

හොප්කින්ස් එවැන්නක් කිසිදිනෙක අසා නැති බව ඔහුගේ මුහුණ දුටු මම තේරුම් ගතිමි. එහෙත් හෝම්ස්ගේ මුහුණේ එක්වරම ඇති වූයේ දැඩි උනන්දුවකි.

"ඔබ කියන්නේ බටහිර එංගලන්තයේ පවත්වාගෙන ගිය ඩෝසන් සහ නෙලිගන් බැංකුව ගැනද? ඔවුන් රත්පවුම් දශලක්ෂයක තැන්පත් මුදල් සමග බංකොලොත් වුණා. ඒකෙන් කෝන්වෝල් ප්‍රාන්තයේ ජනතාවගෙන් හතරයක් පමණ සම්පූර්ණයෙන් අනාථ වුණා. ඊට පස්සේ නෙලිගන් අතුරුදන් වුණා."

"හරියට හරි. ඒ නෙලිගන් තමයි මගේ තාත්තා. බැංකුවේ අනෙක් අධ්‍යක්ෂකවරයා වුණු ඩෝසන් ඒ කාලෙ වෙනකොට විශ්‍රාම අරගෙනයි හිටියේ. ඒ නිසා මේ විනාශයේ සම්පූර්ණ වගකීම පැවරුණේ මගේ තාත්තාගෙ පිට.

එතකොට මට වයස අවුරුදු දහයයි. ඒ වුණත් අප හැමදෙනාටම අත්වුණු ලැජ්ජාව, අවනම්බුව හොඳ හැටි තේරුම් ගැනීමට මට හැකියාව තිබුණා. රට පුරාම ප්‍රසිද්ධියට පත්වුණේ, මගේ තාත්තා තැන්පත් මුදල් වංචාකරල, සුරැකුම් පත් ඔක්කොමත් අරගෙන රටින් පැනල ගියා කියල. නමුත් ඇත්ත ඒක නෙමෙයි. තාත්තා බලාපොරොත්තු වුණා, ඔහුට සුළු කාලයක් ලැබුණොත්, මුදල් තැන්පත් කළ හැමෝගෙම මුදල් සම්පූර්ණයෙන්ම ආපසු ගෙවන්න. තාත්තව හිරභාරයට ගන්න වරෙන්තු නිකුත් වුණා. ඉතින් ඔහු තමන්ගේම කුඩා යාත්‍රාවට නැගලා නෝර්වේ රටට පැන යන්න තීරණය කළා.

තාත්තා, මගේ අම්මගෙන් සමුගත්තු ඒ රාත්‍රිය මට තවමත් හොඳට මතකයි. ඔහු අරගෙන යන සුරැකුම් පත් වල සම්පූර්ණ ලේඛනයක් ඔහු අපට දුන්නා. තාත්තා දිවුරලා කිව්වේ, කලබලකාරී තත්ත්වය සංසිඳුනාට පස්සේ ආපසු ඇවිත්, හැමදෙනාටම දියයුතු මුදල් ආපසු දෙනව කියල. තාත්තා එදා රෑ ගෙදරින් ගියා ගියාමයි. ඊට පස්සෙ ඔහු ගැන කිසිම ආරංචියක් ලැබුණේ නෑ. ඔහුත්, ඔහු ගමන්ගත් යාත්‍රාවත් සම්පූර්ණයෙන්ම අතුරුදන් වුණා. මාත්, අම්මත් අන්තිමට හිතාගත්තෙ නැවත් එක්කම තාත්තා මුහුදුබත් වුණා කියලයි.

ව්‍යාපාරික කටයුතුවල නියැලෙන අපේ පවුලේ හිතවතෙක් ඉන්නවා. මෑතකදී අපට ඔහුගෙන් එක් විශේෂ කාරණයක් දැනගන්න ලැබුණා. ඒ තමයි දැන් ටික කාලයක සිට, තාත්තා එදා රාත්‍රී අරගෙන

http://sherlockholmesinvestigations.blogspot.com



 ඒ අවාසනාවන්ත තරුණයා ක්ලාන්ත වූ අයුරක් මම දුටුවෙමි.

http://sherlockholmesinvestigations.blogspot.com

ගිය සුරැකුම් පත්, යළිත් වරක් ලන්ඩනයේ අලෙවි වන බව. ඔබට හිතාගන්න පුළුවන්ද මහත්මයා, අප කොයිතරම් පුදුමයකට පත් වුණාද කියල ඒක අහලා. මාස ගණනක් තිස්සේ හොයල හොයලා, මට දැනගැනීමට හැකිවුණා මේවා ලන්ඩනයේ අලෙවියට ආවෙ කාගෙන්ද කියල. ඒ කපිතාන් පීටර් කේරිගෙන්.

මං ඔහු ගැන තොරතුරු හොයල බැලුවා. ඔහු තල්මසුන් දඩයම් කරන නැවක කපිතාන් හැටියට සේවය කරලා විශ්‍රාම ගත් අයෙකු බව මට අහන්න ලැබුණා. ඔහු උත්තර ධ්‍රැවයෙ අවට ආක්ටික් මුහුදේ දඩයම් චාරිකාවක යෙදිලා ආපහු එංගලන්තයට යාත්‍රා කළ කාලයේම තමයි, මගේ තාත්තා නෝර්වේ බලා යාත්‍රා කළේ. ඔය කාලේ බොහොම දරුණු කුණාටු හමපු කාලයක්. විශේෂයෙන්ම දකුණෙ ඉඳල උතුරු දෙසට, වේගවත් සුළිසුළං හැමූ බව අපට අහන්න ලැබුණා. සමහර විට තාත්තා යාත්‍රා කළ රුවල් නැව, කුණාටුවට අහුවෙලා උතුරට ගසාගෙන යන්න ඇති. සමහර විට පීටර් කේරිගේ නැව ඔහුට හමුවෙන්නත් ඇති. එහෙම නම් මගේ තාත්තට මොකද වුණේ? සුරැකුම් පත් අලෙවියට ආවෙ කොහොමද? ඒ ටික පීටර් කේරිගෙන් දැනගන්න පුළුවන් වුණා නම්, තාත්තා ඒවා කිරීවත් නොවිකුණු බව මට අහගන්න තිබුණා. ඒ මොකද ඔහු ඒවා අරගෙන යද්දී පෞද්ගලික ලාභ ප්‍රයෝජනය සඳහා ඒවා විකිණීමේ අරමුණක් තිබුණේ නැහැ.

මේ ගැන විස්තර හොයා ගන්න, කපිතාන් කේරි හමුවෙන අදහසින් මම මේ සසෙක්ස් ප්‍රාන්තයට ආවා. එතකොටම තමයි මේ ඛේදජනක මරණය සිද්දවුණේ. මරණ පරීක්ෂණය ගැන පුවත්පත්වල තිබුණු වාර්තාවල, කේරිගේ මේ කුටිය ගැන සඳහන් වෙලා තිබුණා. ඔහු යාත්‍රා කළ නැව්වල ලොග් පොත් පවා ආරක්ෂිතව තිබෙන බව දැක්වුණා.

එතකොට මට හිතුණේ 'සී යුනිකෝන්' යාත්‍රාව 1883 අගෝස්තු මාසයේ යෙදුණු මුහුදු ගමන ගැන තියෙව්වොත්, තාත්තාට අත්වුණු ඉරණම ගැනත් දැනගැනීමට හැකිවේවි කියලයි. ඊයෙ ඇවිත් දොර අරින්න බැරිවුණු නිසා මං අද ආවා. දැන් මම පරීක්ෂා කරල බලන කොට ලොග් පොතේ ඔය චකවානුවට අදාළ පිටු ටික කවුරු හරි ඉරාගෙන."

"එපමණක්ද ඔබට කියන්න තියෙන්නෙ?" හොප්කින්ස් ඇසීය.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව් එපමණයි."

"කියන්න වෙන මොකුත්ම නෑ?"

"නැහැ."

"ඔහේ මුලින්ම මෙහේට ආවෙ ඊයෙ ද? ඊට කලින් මෙහේ ඇවිත් නෑ?"

"නැහැ."

"එහෙනම් මේක ගැන ඔබට කියන්න තියෙන්නෙ මොනවද?"

J. H. N යයි මුල් අකුරු සඳහන්, ලේ පැල්ලම් සහිත සටහන් පොත හොප්කින්ස් ඉදිරිපත් කළේය.

ඒ අවාසනාවන්ත තරුණයා ක්ලාන්ත වූ අයුරක් මම දුටුවෙමි. දෑතින් මුහුණ වසාගත් ඔහුගේ මුළු සිරුරම වෙව්ලන්නට පටන් ගත්තේය.

"කොහේ තිබිලාද ඔබට ඒක ලැබුණේ? මං හිතුවේ ඒක නැවතිලා ඉඳපු හෝටලේදී මගේ අතින් නැතිවුණා කියලයි."

"හරි ඉලන්දාරියා. ඔය කිව්වා ඇති. ඔහේට කියන්න තියෙන ඉතුරු හරිය උසාවියෙදී කියන්න. දැන් යමු මාත් එක්ක පොලීසියට.

ඉතින් ෂර්ලොක් හෝම්ස් මහත්මයා, මගේ උදව්වට ආවට, ඔබටත් ඔබේ මිත්‍රයාටත් බොහොම ස්තුතියි. දැන් බලාගෙන ගියාම ඔබ මෙහි නොහිටියත් මේ පරීක්ෂණය සාර්ථකව විසඳන්න මට හැකියාව තිබුණා. කොහොම වුණත් ඔබේ පැමිණීම ගැන මං කෘතඥ වෙනවා. ඔබ වෙනුවෙන් කාමර වෙන්කර තියෙනවා බ්‍රැම්බල්ටයි හෝටලයේ. එහෙනම් අපි යමු."

* * *

"හොඳයි වොට්සන් ඔබට මොකක්ද මේ පරීක්ෂණය ගැන හිතෙන්නෙ?

හෝම්ස් ඇසුවේ පසුදා උදෑසන අප ලන්ඩනය බලා පිටත්ව එද්දීය.

"මට නම් හිතෙන්නේ මෙය සිදුකෙරීගෙන යන ආකාරය ගැන ඔබ කොහොමවත් සෑහීමකට පත්වෙලා නැති වගයි."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව් වොට්සන්. මම සෑහීමකට පත්වෙලා නැත්තෙ ස්ටැන්ලි හොප්කින්ස් ගැනයි. ඔහු මෙතැනදී යොදාගන්න ක්‍රමයට මට කොහොමටවත් එකඟ වෙන්න බෑ. ඔහු මීට වඩා බුද්ධිමත් අයුරින් පරීක්ෂණය කරාවී කියල මං බලාපොරොත්තු වුණා. රහස් පරීක්ෂකයෙක් වුණාම සිද්ධියකට වෙන්න පුළුවන් හැම පැත්තක් ගැනම කල්පනා කරන්න ඕන. වෙනත් විකල්ප ගැනත් සලකා බලන්න ඕන. ඒවටත් ඉඩ තියන්න ඕන. අපරාධ පරීක්ෂණයේ පළමුවෙනි මූලධර්මය ඒකයි."

"මොකක්ද ඔය ඔබ කියන විකල්ප විසඳුම?"

"මං දැනට ක්‍රියාකාරී වෙන්න යන්නේ අන්න ඒ මාර්ගයේ තමා. මට හරියටම කියන්න බෑ. සමහර විට ඒක අසාර්ථක වීමටත් ඉඩ තියෙනවා. ඒ වුණත් මං ඒකෙ අන්තිම කෙළවර දක්වාම හොයල බලනවා."

අප බේකර් වීදියේ නිවසට ළඟාවන විට හෝම්ස් නමට ලිපි කිහිපයක්ම ලැබී තිබිණි. එයින් එකක් විවෘත කළ හෝම්ස්, මහ හඬින් සිනාසීමට පටන් ගත්තේ මා විස්මයට පත්කරමිනි.

"විශිෂ්ටයි වොට්සන්! ඔන්න අර විකල්ප මාර්ගයේ පොඩි සාර්ථකත්වයක් ඇවිත්. ඔබ ළඟ විදුලි පණිවුඩ පෝරම තියෙනවද? මෙන්න මේ පණිවුඩ ටික ඉක්මනට ලියාගන්න."

*"සම්නර්. නාවික නියෝජිත. රැට්ක්ලිෆ් මාවත.*

*හෙට උදේ දහයට මෙතැනට මිනිසුන් තුන්දෙනෙකු එවන්න.*

*බැසිල්.*

"ඒක තමයි වරාය ප්‍රදේශයේ පාවිච්චි වෙන මගේ නම. ඊළඟ එක ලියාගන්න.

*"ස්ටැන්ලි හොප්කින්ස්, 46 ලෝඩ් වීථිය, බ්‍රික්ස්ටන්.*

*හෙට උදේ නවයහමාරට උදේ ආහාරය සඳහා පැමිණෙන්න. ඔබගේ පැමිණීම වැදගත්. අපහසු නම් විදුලි පණිවුඩයකින් දන්වන්න.*

*ෂර්ලොක් හෝම්ස්.*

http://sherlockholmesinvestigations.blogspot.com

පසුගිය දවස් දහයක් තිස්සේ මේ පරීක්ෂණය මගේ හිතට වධ දුන්නා. දැන් ඉතින් ඒක මගේ මනසින් අයින් කරගන්න පුළුවනි. මං හිතන්නේ හෙට වෙනකොට මේක සම්පූර්ණයෙන්ම ඉවරයක් කරල දාන්න පුළුවනි.

පසුවදා උදේ හරියටම නවයයි තිහට පොලිස් පරීක්ෂක හොප්කින්ස් අපේ නිවහනට ළඟාවිය. හඩ්සන් මහත්මිය විසින් පිළියෙල කොට තිබූ, අනගි උදෑසන ආහාර වේලක් අනුභවයට අපි සූදානම් වුණෙමු. පරීක්ෂණයේදී තමා ලැබූ සාර්ථක ප්‍රතිඵල ගැන හොප්කින්ස් සිටියේ ඉමහත් සතුටෙනි.

"ඔබ හිතන්නේ ඔබේ විසඳීම සම්පූර්ණයෙන්ම නිවැරදියි කියලද?" හෝම්ස් ඇසීය.

"මීට වඩා හොඳට සාක්ෂි සම්පූර්ණ වුණු, කිසිම පටලැවිල්ලක් නැති නඩුවක් මට කවදාවත් ලැබිල නැහැ හෝම්ස් මහත්මයා."

"ඕක ඔය තරම් ඇහැදිලි ලෙස ඔප්පු වෙන බවක් මට නම් පෙනුණෙ නෑ."

"මොනවා අහනවාද හෝම්ස් මහත්මයා? මට කාරණා රාශියක්ම සොයාගැනීමට හැකිවුණා.

මේ නෙලිගන් ඉළන්දාරියා, අපරාධය සිදුවුණු දවසේම එහේ ඇවිත් බ්‍රැම්බල්ටයි හෝටලයේ නවාතැන් ගත්තා. ඔහු කියල තිබුණේ ගොල්ෆ් ක්‍රීඩා කරන්න ආවා කියලයි. ඔහුට කාමරයක් ලැබී තිබුණේ පහළම තට්ටුවේ. ඒ කියන්නේ රෑ දවල් ඕන වෙලාවක, කාටවත් නොදැනී කාමරයෙන් පිටවෙලා යන්න ඔහුට හැකියාව තිබුණා. එදා රෑ ඔහු පීටර් කේරි හමුවෙන්න වුඩ්මන්ස් ලී පෙදෙසට ගියා. කැබින් කාමරයේදී ඔහු කේරිව හමුවුණා. සණ්ඩුවක් ඇතිවුණා. ඒක කෙළවර වුණේ පීටර් කේරි, නෙලිගන්ගේ හාපූන් පහරෙන් මැරුම් කෑමෙන්. සිදුවුණු දෙයින් භීතියට පත්වුණු ඔහු පැනල දිව්වා.

සුරැකුම් පත් ගැන සඳහන් කරල තිබුණු සටහන් පොත ඔහු ගේන්න ඇත්තෙ කේරිගෙන් ප්‍රශ්න කරන්නයි. නමුත් පැන දුවද්දී පොත කැබින් කාමරය තුළ වැටුණා. ඔබ දකින්න ඇති අර සමහර අංක ඉදිරියේ ලකුණක් දාලා තිබුණු හැටි. ලන්ඩනයේදී හමුවුණු සහතික වල අංක තමා ඒ ලකුණු කරල තිබුණෙ. නෙලිගන් කියන විධියටම ඔහුට උවමනාව තිබුණා ඉතුරු සහතික පත් ටික ලබාගන්න. ඔහුගේ

http://sherlockholmesinvestigations.blogspot.com

අරමුණ වී තිබුණේ තාත්තාගෙ නමට ඇඹිවූ කැළල මකා දමන්න. දින කිහිපයක් හෙලිගන් කුටියට එන්නෙ නැතිව සිටියත්, ආයෙමත් දොර අගුළු කඩාගෙන ආවෙ ඒ තොරතුරු ටික හොයාගන්න. මේක බොහොම සරලයි, පැහැදිලියි. එහෙම නේද හෝම්ස් මහත්මයා?"

හෝම්ස්ගේ මුහුණේ සිනහවක් මතුවිය.

"මට නම් ඔතන එකම ප්‍රශ්නයයි තියෙන්නෙ හොප්කින්ස්. අර වගේ බරින් වැඩි හාපුන් හෙල්ලක්, ශරීරය විනිවිද යවන්න ඔබ උත්සාහ කරල තියෙනවද . . . . . නෑ? ෂා! ෂා! මහත්මයා මේ වගේ රහස් පරීක්ෂණ වල යෙදෙද්දී, සියුම් දේවල් ගැන හොඳ අවධානයක් යොමු කරන්න ඕන. අහන්න මගේ යාළුවා, වොට්සන් ගෙන්. ඔය ක්‍රීඩාව පුහුණු වෙන්න මං සම්පූර්ණ උදේ වරුවක් ගත කළා. ඒක බොහොම අමාරු වැඩක්. ඒ සඳහා ඔබේ අතේ මාංශ පේශි සියල්ලක්ම බොහොම ශක්තිමත් වෙන්න ඕනෙ. ඒ විතරක් නෙමෙයි මේ බර ආයුධය නිවැරදි එල්ලයට යවන්න හොඳ පළපුරුද්දක් තියෙන්නත් ඕන. පීටර් කේරිට මරු කැඳවූ හෙල්ල පහර නම් බොහොම වෙගවත් එකක්. ඒකෙ කොයි තරම් ජවයක් තිබුණාද කිව්වොත්! හාපූනය පීටර් කේරිගේ ශරීරය විනිවිද ගියා පමණක් නෙමෙයි. එහි තලයේ ඉදිරි කොටස සම්පූර්ණයෙන්ම ලෑලි බිත්තිය ඇතුළට කිඳා බැස්සා. ඔබ හිතනවද මේ පාණ්ඩු පාට ඉලන්දාරියට පුළුවන් කියල ඒ තරම් හපන්කමක් කරන්න?

ඊළඟට ඊ. දෙගොඩ හරි ජාමෙ කේරි එක්ක හවුලෙ රම් පානය කළේ මේ තරුණයාද? මිනීමැරුමට දින දෙකකට කලින් අර ස්ලේටර්ට ජනෙල් වීදුරුවෙ අමුත්තෙකුගේ මුහුණේ හෙවණැල්ල දකින්න ලැබිල තිබුණා. ඒ නෙලිගන් කියල ඔබ හිතනවද? නෑ නෑ හොප්කින්ස්. ඒ වෙනත් කෙනෙක්. ඔහු කවුරු වුණත් බොහොම බිහිසුණු පුද්ගලයෙක්. අපි හොයාගන්න ඕන අන්න එයා."

ෂර්ලොක් හෝම්ස් කරුණු ඉදිරිපත් කරද්දී පොලිස් නිලධරයාගේ මුහුණ අඳුරු වී ගියේය. උසස්වීමක් පිළිබඳ සිහින මැවූ ඔහුගේ ලෝකය කඩා බිඳ වැටෙන අයුරු ඔහුට මැවී පෙනුණා නොඅනුමානය.

"ඒ වුණාට එදා ඊ. කැබින් කාමරය තුළට නෙලිගන් ඇවිත් තියන බව හොඳටම පැහැදිලියි. ඒක ඔබට නැහැ කියන්න බෑ. අර සටහන් පොතෙන්ම ඒ බව ඔප්පු වෙනවා. ඔබට මෙතැන අඩුපාඩු

http://sherlockholmesinvestigations.blogspot.com

හොයාගන්න පුළුවන් බව ඇත්තයි. ඒත් ජූරි සභාවක් ඒත්තු ගන්වන්න ප්‍රමාණවත් සාක්කි මා ළඟ තියෙනවා.

හෝම්ස් මහත්මයා, අපරාධකාරයා බවට මං තීරණය කළ පුද්ගලයා මගේ භිරභාරයට අරං ඉවරයි. ඔබ කියන්නෙ මහ බිහිසුණු පුද්ගලයෙක් ගැන . . . . කෝ එයා?"

"එයාද? මං හිතන්නේ අයා,මේ වෙලාවෙ අපේ තරප්පු පෙළ නැගගෙන මේ කාමරේ දිහාට එනව ඇති. වොට්සන් අර ලාච්චුව ඇතුළෙ තියෙන පිස්තෝලය ළඟියට අරං, ඔබට පහසුවෙන් ගන්න පුළුවන් හරියෙන් තියාගන්න."

එසේ පැවසූ හෝම්ස් පුටුවෙන් නැගිට, කිසිවක් ලියා තිබූ කඩදාසියක් මේසය මත තැබීය.

"හරි. අපි සූදානම් දැන්."

අපේ නිවහසේ පහළ දොරටුව අසල ගොරෝසු කටහඬින් කිහිප දෙනෙකු යමක් විමසන හඬ ඇසිණි. මීළඟට දොර විවෘත කරගෙන ඇතුළුවූයේ හඩ්සන් මහත්මියයි.

"හෝම්ස් මහත්මයා. මිනිස්සු තුන්දෙනෙක් ඇවිත් අහනවා කපිතාන් බැසිල් ඉන්නේ මෙහෙද කියලා?"

"ආ . . . . හරි හරි. හඩ්සන් මහත්මිය ඔවුන් වරකට එක්කෙනා බැගින් මෙහේට එවන්න."

තරප්පුව නැග ඇවිත් දොරටුවෙන් ඇතුළුවූයේ මුහුණ දෙපස රැවුළක් වවාගත් සිහින් පුද්ගලයෙකි. හෝම්ස් තම සාක්කුවේ තිබූ ලිපියක් අතට ගත්තේය.

"මොකක්ද ඔබේ නම?"

"ජේම්ස් ලැන්කැස්ටර්."

"මට කණගාටුයි ලැන්කැස්ටර්. අපි රැකියාවට කෙනෙක් බඳවාගෙන අවසන්. ඔබට කරදර වෙන්න සිදුවුණාට මෙන්න මේ පවුම් භාගය තියාගන්න. කරුණාකරල ඔය ළඟ තියෙන කාමරයට වෙලා මිනිත්තු කිහිපයක් වාඩිවෙලා ඉන්න පුළුවන්ද?"

ලැන්කැස්ටර් කාමරයට ඇතුළු වූ පසු, දෙවැන්නා තරප්පු පෙළ නැග අපේ කාමරයට පැමිණියේය. උස සුදුමැලි තැනැත්තෙකු වූ ඔහු

http://sherlockholmesinvestigations.blogspot.com

හියු පැටින්ස් නමැත්තෙකි. ඔහුට අ ඳවුම භාගයක් හිමිවූ අතර, මිනිත්තු කිහිපයක් රැඳී සිටීම සඳහා කාමරයට යැවිණි.

තුන්වැන්නා සුවිශේෂ පෙනුමක් තිබූ අයෙකි. බුල්ඩෝග් වර්ගයේ සුනඛයෙකුගේ වැනි ඔහුගේ දරුණු මුහුණ, ඝන රැවුලකින් වැසී තිබිණි. ඝනට වැඩී තිබුණු ඇහිබැම යටින් දිස්වූයේ නිර්භීත, තියුණු දෑසකි. උසින් අඩි හයක් පමණ වූ ඔහු ශක්තිමත් ශරීරයක් තිබූ අයෙකු බව අපි දුටුවෙමු. නාවිකයින් කරන අයුරින් ආචාර කොට, ඔහු සිරුවෙන් සිටගත්තේය.

"ඔබේ නම?"

"පැට්රික් කෙයාන්ස්."

"හාපූන් කරුවෙක්ද?"

"ඔව් මහත්මයා. මුහුදු ගමන් විසිපහකට සහභාගි වෙලා තියෙනවා."

"ඩන්ඩි වලින් පිටත් වූ ගමන් වෙන්නැති?"

"ඔව් මහත්මයා."

"පඩිය කීයක් ඕනෙද?"

"මාසෙට පවුම් අටයි."

"හොඳයි. ඔබට වහාම සේවයට බැඳෙන්න පුළුවන්ද?"

"මගේ ඇඳුම් ටික සූදානම් කරගෙන එන පමාව විතරයි."

"කෝ ඔබේ සහතික?"

ඔහු සාක්කුවට අත දමා, දුර්වර්ණ වූ, තෙල්, කුණු තැවරුණු කඩදාසි කිහිපයක් එළියට ගත්තේය. ඒවා පෙරළා බැලූ හෝම්ස් ඉක්මනින් එය ආපසු දුන්නේය.

"ඔහේ තමයි මට ඕන කරන නියම මිනිහා. අර මේසය උඩ තියෙන්නෙ, අපේ රැකියාවට බැඳීමේ ගිවිසුම. ඒකට අත්සන් කරන්න පුළුවන් නම් ඔබට වහාම රැකියාව ලැබෙනවා."

කාමරය හරහා ගමන් ගත් ඔහු ලියවිල්ල අත්සන් කිරීමට පෑන අතට ගත්තේය.

"මං අත්සන් කරන්න ඕන මෙතනද මහත්මයා?" ඔහු විමසුවේ මේසය දෙසට පහත් වෙමිනි.

http://sherlockholmesinvestigations.blogspot.com



159 “මං අත්සන් කරන්න ඕන මෙතනද මහත්මයා?”

http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස් නැගිට ඔහු වෙත ගොස් මේ තැනැත්තාගේ උරහිසට ඉහළින් එබී බැලුවේය. අනතුරුව ඔහුගේ බෙල්ල දෙපැත්තෙන් තම දෑතම යැවූ හෝම්ස්,

"දැන් ඔක්කොම හරි," යයි කීය.

මට මුලින් අසන්නට ලැබුණේ, වානේ අගුලක් ක්‍රියාත්මක වන 'ක්ලික්' හඬකි. ඊළඟ මොහොතේ කෝපයෙන් වියරු වූ කොටියකු නගන ආකාරයේ මහා ගර්ජනා හඬක් ඇසිණ. ඒ සමගම ඔහු ෂර්ලොක් හෝම්ස්ව බිම පෙරළා ගත්තේය. දෙදෙනාම කාමරයේ බිම පෙරළෙමින් පොර බැදීමට පටන් ගත්හ.

නාවිකයා අප්‍රමාණ කාය ශක්තියකින් හෙබි පුද්ගලයෙකු විය. ඔහුගේ දෑත් වලට ප්‍රයෝගකාරීව විලංගු දැමීමට හෝම්ස් සමත් වූ බව සැබෑය. එහෙත් ඔහු හෝම්ස් බිම පෙරළාගෙන, වෙඩි කෑ කොටියෙකු මෙන් සටන් කළේ මෙල්ල කිරීමට අපහසු අයුරෙනි. හොප්කින්ස් හා මා නාවිකයාගේ නළලට පිස්තෝල එල්ල කළ පසු තවදුරටත් සටන් කිරීම නිශ්ඵල බව ඔහු වටහාගත්තේය. ඔහුගේ දෙපා, වහාම කඹ වලින් බැඳ දැමීමට අපි පියවර ගත්තෙමු.

මේ මල්ලව පොර සටනින් පසු හති දමමින් අපි යළිත් අසුන් ගත්තෙමු.

"මට සමාවෙන්න හොප්කින්ස්. හඩ්සන් මහත්මිය ඉතා ප්‍රණීත ලෙස සකස් කළ බිත්තර බැදුම දැන් සීතල වෙලා ඇති. කොහොම වුණත් උදේ ආහාරයේ ඉතිරි කොටස දැන් වඩාත් සතුටින් අනුභව කරන්න පුළුවනි. ඇයි ඔබේ පරීක්ෂණය ජයග්‍රාහී ලෙස අවසන් කළා නේ."

කිසිවක් කථාකර ගත නොහැකිව හොප්කින්ස් ෂර්ලොක් හෝම්ස් දෙස බලා සිටියේ මහත් පුදුමයෙනි.

"මට තේරෙන්නෙ නෑ ඔබට කොහොම ස්තුති කරන්නද කියල හෝම්ස් මහත්මයා. මට පෙනෙන විදියට මං මුල ඉඳලම කටයුතු කරල තියෙන්නෙ මෝඩයෙක් වගේ. මට දැන් තේරෙනවා; මං හොඳට සිහිතබා ගතයුතු විශේෂ කරුණක් තිබෙනවා. ඒ ඔබතුමා ගුරුවරයා බවත්, මං තවමත් ඔබේ ශිෂ්‍යයා බවත්. ඒත් මට තවමත් තේරුම් ගන්න බැරි, ඔබ මේ දේ කළේ කොහොමද? මේක අපරාධයට සම්බන්ධ වෙන්නෙ කොහොමද කියල?"

http://sherlockholmesinvestigations.blogspot.com

"කමක් නෑ හොප්කින්ස්, කමක් නෑ. අපි ඔක්කොම මේ වගේ දේවල් ඉගෙන ගන්නෙ අත්දැකීමෙන්. මේ පරීක්ෂණයෙන් ඔබ උගත යුතු මුල්ම පාඩම තමයි, විකල්ප විසඳුමක් තිබීමට ඉඩ ඇති බව අමතක නොකිරීම. ඔබ අර තරුණ නෙලිගන් ගැනම හිත හිතා හිටිය මිසක් පීටර් කේරිගේ මිනීමරුවා පැට්රික් කෙයාන්ස් ගැන හිතන්න මොහොතක් ගත කළේ නෑ."

අපේ කථාවට බාධා කරමින් මතුවී ආවේ නාවිකයාගේ ගොරෝසු කටහඬයි.

"මේ බලනවා උන්නැහේ. තමුසෙලා මේ විදියට මාව කුදලලා හිරිහැර කිරීම ගැන මම දොස් කියන්නෙ නෑ. ඒ වුණත් කොයි දේ සම්බන්ධයෙනුත් ඒකට ගැළපෙන නියම වචනය පාවිච්චි කළ යුතුයි. ඔහේල කියන්නෙ මං පීටර් කේරිගේ මිනීමරුවා කියල; නමුත් මං කියන්නෙ මං ආත්මාරක්ෂාවට සටන් කරල මට ඔහුව මරා දමන්න සිදුවුණා කියල. අන්න ඒකයි වෙනස. ඔහේල හිතනව ඇති මං මේ කියන්නෙ බොරු කියල, මං කතාවක් ගොතනවා කියල."

"අපි එහෙම හිතන්නෙ නෑ කෙයාන්ස්. ඔබට කියන්න තියෙන ඔක්කොම අපට කියන්න. අපි කැමතියි අහගෙන ඉන්න."

"ඔව් ඒක දැන්ම කියල තිබුණු තරමට හොඳයි. දෙවියන්ගෙ නාමයෙන් මං මේ කියන හැම දෙයක්ම ඇත්ත. මැර පීටර් කියන්නෙ මොන වගේ මිනිහෙක්ද කියන එක මං හොඳින් දැන හිටියා මහත්මයා. ඔහු මාව මරන්න පිහිය ඇදලා ගත්තාම, ආත්මාරක්ෂාවට මං ඔහුගේ හදවතට හාපූනයක් යැව්වා. එහෙම නොකළා නම් ඒ වෙලාවේ මැරුම් කන්නේ මම. කොහොම වුණත් ඒකෙ වෙනසක් නෑ. මැර පීටර්ගේ පිහිය වෙනුවට අද හෙට්ම එල්ලුම් ගහේ තොණ්ඩුව මගේ බෙල්ල වටේ හිරවේවි."

"ඔබ කොහොමද කෙයාන්ස් මේකට සම්බන්ධ වුණේ?" හෝම්ස් ඇසීය.

"මං ඔබට මුල ඉඳලම කියන්නම්. මාව පොඩ්ඩක් වාඩිකරවන්න; එතකොට මට කථා කරන්න පහසුයි.

මේක සිද්ධ වුණේ 1883 අගෝස්තු මාසෙදි. 'සී යුනිකෝන්' යාත්‍රාවේ කපිතාන් පදවිය දැරුවේ පීටර් කේරි. මං තමයි ඒකෙ හාපුන් කරු. උත්තර සාගරයේ තල්මසුන් දඩයම් කිරීම අවසන් කරලා අයිස්

http://sherlockholmesinvestigations.blogspot.com

කඳු වලින් බේරිලා අපි ආපසු ගම්රටවල් බලා යාත්‍රා කරමිනුයි හිටියේ. ඒ දවස්වල දකුණු දිගාවෙන් මහා තද කුණාටුවක් හැමුවා. මේකට අහුවෙලා උතුරට ගසාගෙන ගිය කුඩා යාත්‍රාවක් අපට හමුවුණා. ඒකෙ හිටියේ එකම මිනිහෙක් විතරයි. ඔහුත් නාවිකයෙක් නෙමෙයි. ඔහු අපට කිව්වේ, රළ මුහුදේ නැව ගිලේවි කියලා භය වෙලා, නාවිකයන් ඔහුව අත්ඇරලා, ජීවිතාරක්ෂක පහුරක නෝර්වේ වලට යාත්‍රා කළා කියල. මං හිතන්නේ එවුන් ඔක්කොම මුහුදුබත් වෙන්න ඇති.

ඉතින් අපි මේ පුද්ගලයා අපේ නැවට ගත්තා. ඔහුගේ බඩු බාහිරාදිය වශයෙන් තිබුණේ එක් කුඩා යකඩ පෙට්ටියක් පමණයි. කපිතාන්ගේ කැබින් කාමරේට වෙලා මේ නැනැත්තා පැය ගණනාවක් කපිතාන් එක්ක කතාබහ කළා. අපට ඔහුගෙ නම වත් දැනගන්න ලැබුණෙ නෑ. අපි ඔහුව බේරාගෙන දෙවැනි දවසෙ රාත්‍රියෙ, ඔහු නැවෙන් අතුරුදන් වුණා.

ඔහු නැවෙන් මුහුදට පැනලා සිය දිවි නසාගන්න ඇති; එහෙමත් නැත්නම් ප්‍රචණ්ඩ කුණාටුවට නැව පැද්දෙද්දි ඔහු මුහුදට වැටෙන්න ඇති කියලයි කතාව ගියේ. නමුත් මේ පුද්ගලයාට අත්වුණු ඉරණම මොකක්ද කියලා හරියටම දැන හිටියේ එකම එක නැනැත්තයි. ඒ තමයි මම. එදා මධ්‍යම රාත්‍රියේදී පීටර් කේරි මේ අහිංසක මනුස්සයාගේ කකුල් දෙක කඹ වලින් බැඳලා, ඔහුව මුහුදට විසිකරන හැටි මගේ දෑස් වලින්ම දැක්කා. ඒ, අපි බ්‍රිතාන්‍යයේ උතුරු කෙළවරේ ෂෙට්ලන්ඩ් දූපත් වල, පහන් කණුවේ එළිය දකින්න, දින දෙකකට කලින්.

කොහොම වුණත් මේ කාරණාව මං කාටවත් හෙළි කළේ නෑ. මොකක්ද වෙන්නෙ කියල මමත් බලාගෙනයි හිටියෙ. අපි ආපහු ඇවිත් ස්කොට්ලන්තයට ගොඩ බැස්සට පස්සෙ, ඒ සිද්ධිය සම්පූර්ණයෙන්ම යට ගහන්න කේරිට පුළුවන් වුණා. ඒ මොකද කාගෙන් වත් ප්‍රශ්නයක් මතු වුණේ නෑ. නාඳුනන කෙනෙක් නැවට ගොඩ නැගලා, පස්සේ හදිසි අනතුරකින් මැරුණා. ඒකෙන් කාටවත් ප්‍රශ්නයක් ඇතිවුණේ නෑ. ඒ ඉක්මනින්ම පීටර් කේරි නෞකා කපිතාන් වරයෙකු ලෙස රැකියාව කිරීමෙන් ඉවත් වුණා. ඔහු පදිංචිව ඉන්නේ කොහේද කියලා, මං අවුරුදු ගණනාවක් තිස්සේ හෙව්වා. ඊයෙ පෙරේදා තමයි මට ඒක හොයාගන්න පුළුවන් වුණේ. කපිතන් කේරි අර දරුණු අපරාධය කළේ, අර නැනැත්තාගේ කුඩා යකඩ පෙට්ටියේ

http://sherlockholmesinvestigations.blogspot.com

තිබුණු දේවල් නිසා වෙන්න ඇති කියලා මං සැක කළා. බොහොම ඉක්මනට රැකියාවෙන් ඉවත් වුණේ ඒ ගනුදෙනුව සරුසාර වුණු නිසා වෙන්න ඇති. ඉතින් මම කට වහගෙන නිශ්ශබ්දව ඉන්නවට, මට හොඳ ගණනක් ගෙවන එක ඔහුගේ යුතුකමක්.

කේරි පදිංචි කොහේද කියල මට දැනගන්න ලැබුණා ලන්ඩනයේදී මට හමුවුණු නැවියෙකුගෙන්. ඉතින් මං කේරි හමුවෙන්න ආවේ මේකට ගණනක් කථා කරගන්න අදහසින්. පළමුවෙනි දවසේ රාත්‍රියේ ඔහු බොහොම සාධාරණ විධියට කථා කළා. මුහුදේ දුක්විඳින මේ ජීවිතය අත් ඇරදාන්න පුළුවන් විධියෙ ගණනක් මටත් දෙන්න ඔහු කැමති වුණා. දවස් දෙකකට පස්සේ ඇවිත් ඒ ගනුදෙනුව ඉවර කරන්න අපි එකඟතාවයකට ආවා.

අපි ඒ යොදා ගත්තු දවසෙ මං ගියා ඔහු හමුවෙන්න. මං යනකොටත් ඔහු හොඳටම බීලා, හරි කේන්තියකින් හිටියේ. අපි එකට වාඩිවෙලා රම් බිබී සාමදානෙන් කතාබහ කළා; ඉස්සර කාලෙ නැව්වල ගෙවූ ජීවිතය ගැන තමයි කතා කළේ. නමුත් බීමත්කම වැඩිවෙන්න, වැඩිවෙන්න, ඔහුගේ මුහුණෙන් ප්‍රකාශ වුණු හැඟීම මගේ හිතට කොහොමටවත් ඇල්លුණේ නෑ. බිත්තියේ සවිකරල තිබුණු හාපූන් දිහාවටත් මගේ ඇහැ වරින් වර ගියා. මේ ආයුධය මට ඕනෑ වේවිදෝ කියල හැඟීමක් මගේ හිතට ඇතුළු වුණා.

අන්තිමට ඔහු පටන් ගත්තේ නැද්ද යක්ෂයෙක් වගේ කේන්තියෙන් මට කඩා පැනලා බණින්න. මගේ මුහුණට කෙළ ගහලා ඔහු මට සාප කරන්න පටන් ගත්තා. මං දැක්කා ඔහුගේ ඇසේ නැකැරෙන වෛරය. ඒ වෛරයෙන් මාව මරන්න සූදානම් වෙන හැටි මට තේරුණා. මොහොතකින් ඔහු ඇදලා ගත්තා හම් කොපුවක දැමූ මහ උල් පිහියක්. ඒත් ඔහුට පිහිය කොපුවෙන් ඉවතට ගන්න ලැබුණේ නෑ; මං ඊට වඩා ඉක්මන් වුණා. හාපූනය ඔහු හරහා ගමන් කළේ විදුලි වේගයෙන්.

දෙවියනේ! ඔහු ඒ වෙලාවෙ විලාප නැගූ හැටි. ඒ වෙලාවෙ ඔහුගෙ මුහුණ! එදා ඉඳල මට එක මොහොතක් සැනසිල්ලෙ නිදාගන්න ලැබුණේ නෑ. අවතාරයක් වගේ ඔහුගේ මුහුණ එන්නේ විලාප නගමින්. එදා හාපූනය වැදුණු ගමන් කුටිය හැමතැනම ලේ ගලා ගියා. මම එහෙමම හිටියා. කිසි කෙනෙක් ආවෙ නෑ. වටපිට බලනකොට මං දැක්කා අර කුඩා යකඩ පෙට්ටිය. පීටර් කේරිට වගේම මටත් ඒකෙ

http://sherlockholmesinvestigations.blogspot.com

අයිතියක් තියෙනවා. මං ඒකත් අරගෙන යන්න ගියා. මෝඩයෙක් වගේ මං එදා මගේ දුම්කොළ පසුම්බිය අමතක වෙලා දාලා ගියා.

දැන් මං ඔබට කියන්නම් මේ කථාවේ පුදුමාකාරම කොටස. මං කැබින් කාමරයෙන් එළියට බැස්සා විතරයි, මට ඇහුණා ඒ පැත්තට කවුදෝ එන අඩි ශබ්දයක්. මං ඉක්මනින්ම එතැනම පඳුරු අස්සෙ හැංගුණා. කවුදෝ පුද්ගලයෙක් ඇවිත් කැබින් කාමරයට ඇතුළු වුණා. පීටර් කේරි ඒක ඇතුළෙ හිටි හැටි දැක්කාම, අර මිනිහා යටිගිරියෙන් කෑගැහුවෙ අවතාරයක් දැක්ක වගේ. ඊළඟට ඔහු ආපහු හැරිලා විදුලි වේගයෙන් පැනල දිව්වා. ඔහු කවුද, ආවෙ මොකටද කියන්න මං දන්නෙ නෑ. මං හැතැක්ම දහයක් දුර පයින්ම ගිහිං, ටන්බ්‍රිජ්වෙල්ස් දුම්රියපොළෙන් දුම්රියට නැගලා ලන්ඩනයට ආවා.

ආපහු ඇවිත් අර පෙට්ටිය ඇරලා බැලුවාමයි මං දැක්කෙ, ඒකෙ මුදල් කිසිවක් තිබුණෙ නෑ. ලියකියවිලි වගයක් තිබුණා. ඒව විකුණලා මුදලක් හොයාගන්න බලන්න තරම් මම නිර්භීත වුණේ නෑ. මැර පීටර් භය කරලා මට කියන් හරී හොයාගන්න තිබුණු අවස්ථාවත් අහිමි වුණා. අතේ සිලිමක් නැතුව මං ලන්ඩනයේ අතරමං වුණා. මට ජීවත්වෙන්න තිබුණු එකම මග මගේ රැකියාව විතරයි. තල්මසුන් දඩයමේ යන නැවකට හාපූන්කරුවො ඉල්ලපු දැන්වීම දැකලා, අන්තිමට මෙහේ එන්න තීරණය කළා. පීටර් කේරිට මරණ දඬුවම දීම ගැන ආණ්ඩුවෙන් මට ස්තුතිවන්න වෙන්න ඕනෙ. ඔවුනට එල්ලුම් ගහේ තොණ්ඩුවකට යන මුදල ඉතිරි වුණා."

"බොහොම පැහැදිලි කට උත්තරයක්." හෝම්ස් පැවසුවේ පයිප්පය දල්වා ගනිමිනි.

"හොප්කින්ස්. මං හිතන්නෙ පුළුවන් තරම් ඉක්මනට ඔබේ සිරකාරයව ආරක්ෂා සහිත තැනකට භාරදුන්නොත් හොඳයි. මේ විසිත්ත කාමරය හදිසියකට හිරමැදිරියක් හැටියට යොදාගන්න පුළුවන් තාලෙට සකස්වෙලා නෑ. අපේ බුමුතුරුණෙන් විශාල කොටසක් පැට්රික් කෙයාන්ස් ඔහුගේ පරිහරණය සඳහා වෙන් කරගෙන."

"මං දන්නෙ නෑ හෝම්ස් මහත්මයා මගේ කෘතඥතාවය ඔබට කොහොම පළකරන්නද කියලා? අනෙක ඔබ මේ තරම් විශිෂ්ට ප්‍රතිඵල ලබාගත්තෙ කොහොමද කියලා මට තවමත් තේරුම් ගන්න බෑ."

http://sherlockholmesinvestigations.blogspot.com

"සරලව කියනවා නම්, ලැබුණු ඉඟිවලින් ඔස්සේ මුල ඉඳලම නිවැරදිව පරීක්ෂණයේ යෙදීමෙන්. සමහර විට අර සටහන් පොත මට ඒ වෙලාවෙ ලැබුණා නම්, මගේ නිගමන වැරදි මාර්ගයක යන්නත් ඉඩ තිබුණා. නමුත් මට අහන්න ලැබුණු හැම දෙයක්ම මාව එක් දිශාවකටයි යොමු කළේ. හාපූනය පාවිච්චි කිරීමට අවශ්‍ය දැඩි ශක්තිය, එය භාවිත කිරීමේදී දක්වා තිබුණු දක්ෂතාවය, බීමට ගනිපු රම් සහ වතුර, සීල් මත්ස්‍යා සමින් තැනූ දුම්කොළ පසුම්බිය, සැර දුම්කොළ, මේ සැම එකකින්ම පෙන්නුම් කළේ නාවිකයෙක්; බොහොම දුරට තල්මස් දඩයමේ යෙදෙන්නෙක්.

පසුම්බියේ P. C කියන අකුරු පීටර් කේරි කියන නම වෙනුවෙන් නොවන බව මට මුලදීම දැනුනු ගියා. ඒ මොකද කේරි දුම්බිව්වෙ නෑ. කුටියේ තිබිල පයිප්පයක් හමුවුණේත් නෑ. අපරාධයට වගකිව යුතු පුද්ගලයාගේ නමේ මුල් අකුරුත් P. C වීම අහම්බෙන් වුණු දෙයක් බව මට වැටහුණා.

ඔබට මතකද මං ඇහුවා නැබින් කාමරයේ විස්කි සහ බ්‍රැන්ඩි තිබුණද කියලා? එවැනි මත්පැන් තිබියදී, ඒවා අනාබී රම් බොන්නේ, නාවිකයො හැරුණාම කියෙන් කී අඳනාද? ඒකෙන් මට තහවුරු වුණා අපරාධකාරයා නාවිකයෙක් බව."

"ඔබ කොහොමද ඔහුව හොයා ගත්තෙ?"

"හිතවත් මිත්‍රයා, තර්කානුකූලව කරුණු නිගමනය කරගෙන යද්දි ඒක බොහොම සරල එකක් වෙනවා. අපරාධකාරයා නාවිකයෙක් නම් ඔහු කේරි සමග 'සී යුනිකෝන්' යාත්‍රාවේ ගිය කෙනෙක් විය යුතුයි. ඒ මොකද කේරි වෙනත් යාත්‍රාවක ගමන් කළ බවක් මට අහන්න ලැබුණෙ නෑ. ඉතින් මං දවස් තුනක් තිස්සේ ඩන්ඩි නගරයට විදුලි පුවත් යැව්වා. ඒකෙන් මට හොයාගන්න පුළුවන් වුණා 1883 දී 'සී යුනිකෝන්' යාත්‍රාවේ කාර්ය මණ්ඩලයේ නම්. ඒ නම් අතර පැට්‍රික් කෙයාන්ස් කියන නම හමුවුණා. ඊළඟට ඔහුගේ රැකියාව හාපූන්කරු බව දැනගත්තාම, මගේ පරීක්ෂණය බොහොම දුරට සම්පූර්ණ වුණා.

මං හිතුවා ඔහු ලන්ඩන්වල සිටීමට සෑහෙන ඉඩක් ඇති කියලා. මෙහෙම අපරාධයක යෙදුණු කෙනෙක් ටික කාලයකට හරි රටෙන් පිටවෙලා ඉන්න බොහොම කැමැතියි. ඉතින් මම ලන්ඩනයේ නැව් කටයුතු කෙරෙන නැඟෙනහිර කෙළවරට වෙලා, ආක්ටික් සාගරයේ

http://sherlockholmesinvestigations.blogspot.com

තල්මසුන් දඩයම් කරන්න චාරිකාවක් සංවිධානය කළා. කපිතාන් බැසිල් යටතේ ඉහළ වැටුපකට නැවේ සේවයට බඳවා ගන්න හාපූන්කරුවන් හෙව්වා. පේනවා නේද ප්‍රතිඵලය!"

"පුදුමාකාරයි! විශිෂ්ටයි!" හොප්කින්ස් කීය.

"හැකි ඉක්මනින් අර තරුණයා, නෙලිගන්ව නිදහස් කරන්න හොප්කින්ස්. මං හිතන්නේ ඔබ ඔහුගෙන් සමාව අයැද සිටිය යුතුයි. අර යකඩ පෙට්ටිය සුරැකුම් පත් සමග නෙලිගන්ට ආපසු භාරදිය යුතුයි. පීටර් කේරි විකුණපු ඒවා නම් ගියා ගියාමයි. නඩු විභාගය සඳහා ඔබට මා අවශ්‍ය වෙනවා නම් . . . . අපේ ලිපිනය, නෝර්වේ රටේ කොහේ හරි වේවි. අපි ඒක ඔබට පස්සේ දන්වා එවන්නම්."

http://sherlockholmesinvestigations.blogspot.com

# ලේ සලකුණ

Reading Purpose Only. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# ලේ සලකුණ

"අපරාධ පරීක්ෂණ විශේෂඥයාගේ දෘෂ්ටි කෝණයෙන් බලන විට, දැන් ලන්ඩනය හරිම කම්මැලි, නිදිමත නගරයක් වෙලා. ඒ මොකද දැන් ලන්ඩනයේ අපරාධයක් සිද්ධවෙන්නේ නැති තරමයි." හෝම්ස් කීය.

"මං හිතන්නෙ නෑ රටේ වැදගත් පුරවැසියෝ වැඩිදෙනෙක් ඔබේ මතයට එකඟ වේවි කියල." මම පිළිතුරු දුන්නෙමි.

අපි බේකර් වීදියේ නිවහනේ උදේ ආහාරය ගනිමින් සිටියෙමු. මගේ බිරිඳගේ හදිසි මරණයෙන් පසු, මා පවත්වාගෙන ගිය පෞද්ගලික වෛද්‍ය චිකිත්සාගාරය විකුණා දැමීමට මම තීරණය කළෙමි. එය විකුණා දමා, නමා සමග බේකර් වීථියේ නවාතැනේ විසීමට පැමිණෙන මෙන් ෂර්ලොක් හෝම්ස් ද මගෙන් ඉල්ලා සිටියේය. කෙන්සිංටන් ප්‍රදේශයේ තිබූ මගේ ශල්‍යාගාරය මිළට ගත්තේ වර්නර් නම් තරුණ වෛද්‍යවරයෙකි. මා ඉල්ලා සිටි තරමක් ඉහළ මුදල, හෙට්ටු කිරීමකින් හෝ පැකිලීමකින් තොරව ඔහු එක්වරම ගෙවමින් මා පුදුමයට පත් කරමිනි. මට වාසිසහගත වූ එම ගනුදෙනුව පිළිබඳ සත්‍ය පසුබිම මට දැනගැනීමට ලැබුණේ ඊට අවුරුදු කිහිපයකට පසුවයි. දොස්තර වර්නර් හෝම්ස්ගේ දුර ඥාතියෙකි. මගේ ශල්‍යාගාරය මිළදී ගැනීම සඳහා තරුණ වෛද්‍යවරයාට මුදල් ලබාදී ඇත්තේ මගේ මිත්‍රයා විසිනි.

මා යළිත් බේකර් වීථියේ නිවහනේ පදිංචියට පැමිණි කාලයේ, රහස් පරීක්ෂණ කිහිපයක්ම මගේ මිත්‍රයාට භාර වී ඇති බව සටහන් පොත් පරීක්ෂා කිරීමේදී පෙනී යයි. හිටපු ජනාධිපති ජුවාන් මුරිලෝ පිළිබඳ සිද්ධිය ඉන් එකකි. 'ෆ්‍රයිස්ලන්ඩ්' නම් ඕලන්ද නෞකාව පිළිබඳ භයානක පරීක්ෂණයේදී, අප දෙදෙනා මරණය පෙනි පෙනී අපේ ජීවිත ගලවා ගත්තේ අනූනවයෙනි.

http://sherlockholmesinvestigations.blogspot.com

මගේ මිතුරා හාන්සි පුටුවේ සිටුවාසට හේත්තු වී උදෑසන පුවත්පත කියවමින් සිටියේය. බලාපොරොත්තු නොවූ අයුරින් සීනුව දිගින් දිගටම නාද වන්නට පටන් ගත්තේ, අප පුදුමයට පත් කරමිනි. මීළඟට අපට අසන්නට ලැබුණේ කිසිවකු මහ හඬින් අපේ දොරට තට්ටු කරන හඬයි. දොර විවෘත වුණු වහාම ඔහු ගේ ඇතුළට කඩා වැදුණු ශබ්දයත්, තරප්පුව වේගයෙන් නැග එන හඬත් අසන්නට ලැබිණි. මොහොතකින් අපේ විසිත්ත කාමරය තුළට කඩා වැදුණේ තරුණයෙකි. හතිදමමින් සිටි මේ තරුණයාගේ තිබුණේ සිහි විකල් වූ පෙනුමකි. අප හමුවට පැමිණි තම අසංවර ලීලාව පිළිබඳව සමාව අයැදිය යුතු යයි, අපේ මුහුණු දුටු විගස ඔහුට තේරුම් යන්නට ඇත.

"මට සමාවෙන්න හෝම්ස් මහත්මයා" ඔහු උස් හඬින් කීවේය.

"මට බනින්න එපා මහත්මයා. මට මාගෙට පිස්සු. මං තමයි අර අවාසනාවන්ත ජෝන් හෙක්ටර් මැක්ෆාලේන්."

ඔහු තම නම ශබ්ද නගා පැවසුවේ, ඔහුගේ පැමිණීමට හේතුව තම නමෙන් අපට තේරුම් ගැනීමට හැකිවේ යයි විශ්වාසයෙන් විය යුතුය. එහෙත් මගේ මිතුරාගේ මුහුණේ නම් ඊයට කිසිදු ප්‍රතිචාරයක් මම නුදුටුවෙමි.

"හිත සන්සුන් කර ගන්න මැක්ෆාලේන් මහත්මයා." හෝම්ස් පැවසුවේ හාන්සි පුටුව තරුණයා වෙතට ළං කරමිනි.

"ඔබේ මනස මහත් කැළැඹීමකට පත්වී ඇති බව මට පෙනෙනවා. මගේ හිතමිත්‍ර දොස්තර වොට්සන් නම් මේ තත්ත්වය සඳහා ඔබට ස්නායු සන්සුන් කරන ඖෂධයක් නියම කරනවා නොඅනුමානයි.

පහුගිය දවස් ටිකේ තිබුණේ හරි ග්‍රීෂ්මයක්. ඔතන තිබෙන ඔය පුටුවේ ටිකක් වාඩිවෙන්න. කලබල නැතුව හෙමින් සැරේ මට කියන්න ඔබ කවුද කියලා; මොනවද ඔබට උවමනා කියලා. ඔබ මුලින්ම නම කිව්වෙ මට ඔබව හඳුනාගැනීමට හැකිවේවි කියල වෙන්න ඇති. නමුත් ඔබ අවිවාහකයෙක්, නීතිඥයෙක්, සහ ඇදුම රෝගයට නිතර ගොදුරු වෙන පුද්ගලයෙක් බව ඇරෙන්න, වෙන කිසිම දෙයක් මං ඔබ ගැන දන්නෙ නෑ."

http://sherlockholmesinvestigations.blogspot.com

මගේ මිත්‍රයාගේ නිරීක්ෂණ හා නිගමනයන්ට එළැඹීමේ ක්‍රමය අනුව මේ දේවල් වටහාගත් හැටි මම ද තේරුම් ගත්තෙමි. තරුණයාගේ ඇඳුම්වල අපිරිසිදු හා අවුල් ස්වභාවය නිසා ඔහු අවිවාහකයෙකු බව ද, නීතිඥයින් භාවිතයට ගන්නා කඩදාසි මිටිය නිසා වෘත්තිය ද, ආශ්වාස ප්‍රශ්වාස කිරීමේ දී දක්වූ අපහසුතාවය නිසා ඇදුම රෝගය ගැන ද පැවසීමට හෝම්ස්ට හැකියාව ලැබෙන්නට ඇත. කෙසේ වෙතත් මෙම නිගමන වලින් තරුණයා විස්මයට පත්විය.

"ඒ ඔක්කොම හරියට හරි මහත්මයා. ඊට අමතරව මං තමයි මේ මොහොතේ ලන්ඩනයේ ඉන්න අවාසනාවන්තම පුද්ගලයා. දෙවියන්ගේ නාමෙන් මට පිටුපාන්න එපා හෝම්ස් මහත්මයා. මං මේ ඔබට කියන්න හදන කථාව ඉවර කරන්න කලින් ඔවුන් මෙතැනට ඒවි; ඇවිත් මාව හිරභාරයට ගන්න හදාවි. අනේ එහෙම වුණොත් මට මගේ කථාව අවසන් කරන්න ඉඩක් ලබාදෙන්න. එතකොට මට සම්පූර්ණ සත්‍යය හෙළිකරන්න පුළුවනි. ඊළඟට ඔබ මා වෙනුවෙන් මේ ගැන හොයා බලන්න භාරගත්තොත්, මට සන්තෝෂයෙන් හිරකූඩුවට යන්න පුළුවනි."

"ඔබව හිරභාරයට ගන්න? ඒ මොකටද?"

"පහළ නෝවුඩ්හි ජෝනාස් ඕල්ඩ්ඒකර් මහතා මරා දැමීමේ චෝදනාවට!"

මගේ මිත්‍රයාගේ මුහුණේ මතු වූයේ අනුකම්පා සහගත බැල්මකි.

"දෙයියෝ සාක්කි! ගැටලු සහගත, සූක්ෂ්ම මිනීමැරුම් ලන්ඩන් නගරයෙන් තුරන්වෙලා වගෙයි කියලා මගේ මිත්‍ර වොට්සන්ට මං කිව්වා විතරයි."

තරුණයා ඉදිරියට නැමී, හෝම්ස්ගේ උකුල මත තිබූ 'ඩේලි ටෙලිග්‍රාෆ්' පුවත්පත අතට ගත්තේය. එහි මැද පිටුව හැරවූ ඔහු:

"මේ තියෙන්නෙ හෝම්ස් මහත්මයා. මං මෙහේ ආවෙ මොකටද කියලා, ඔබ මේ ටික කියෙව්වා නම් දැනගන්න තිබුණා. මං එය ඔබට කියවන්නම්. ඔන්න අහගන්න සිරස්තලය.

http://sherlockholmesinvestigations.blogspot.com

## "පහළ නෝවුඩ්හි අද්භූත සිදුවීමක්!
## සුප්‍රසිද්ධ ගොඩනැගිලි නිර්මාණකරු අතුරුදන් වෙයි!

මිනිමැරීමේ හා කඩාකප්පල්කාරී කටයුත්තකට උත්සාහයක්?

අපරාධකරුවා පිළිබඳ හෝඩුවාවල් හමුවේ."

ඔය හෝඩුවාව පසුපස තමා ඔවුන් මාව හොයාගෙන එන්නෙ හෝම්ස් මහත්මයා. ලන්ඩන් පාලම දුම්රිය පොළේ ඉඳල ඔවුන් මා පිටිපස්සෙන් ආවා. ඔවුන් ඉන්නේ මාව අත්අඩංගුවට ගන්න වරෙන්තුව ලැබෙන තෙක් බව මං දන්නවා. අනේ මේ වේදනාව උහුලගන්න බැරුව මගේ අම්මා මැරෙයි! අනේ දෙවියනේ මගේ අම්මා මේ දුක කොහොම ඉවසන්නද?" ඔහු පැවසුවේ බලවත් කම්පාවෙනි.

මිනීමරුවෙකු යයි චෝදනා ලබන මේ තරුණයා දෙස මම විමසිල්ලෙන් බැලුවෙමි. වයස අවුරුදු විසිපහක් පමණ වූ ඔහු කඩවසම් තරුණයෙකි. නිල් පැහැති දෙඇස්, රැවුල සම්පූර්ණයෙන්ම මුඩුකළ මුහුණක්, හා රන්වන් පැහැති හිසකෙස් තිබූ ඔහුගෙන් දිස්වූයේ වැදගත් පවුලක මහත්මයෙකුගේ පෙනුමකි.

"අපට අපතේ අරින්න කාලයක් නැහැ වොට්සන්. ඔබට පුළුවන්ද පුවත්පතේ ඔය කියන ප්‍රවෘත්තිය කියවන්න?"

මම පුවත්පතේ එම ප්‍රවෘත්තිය කියවීමට පටන් ගතිමි.

"ඊයේ රාත්‍රී හෝ අද හිමිදිරි පාන්දර පහළ නෝවුඩ්හි බිහිසුණු අපරාධයක් සිදුවූ බවට කරුණු හෙළිවී ඇත. ජෝනාස් ඕල්ඩ්එකර් මහතා මෙම ප්‍රදේශයේ සුප්‍රසිද්ධ පුද්ගලයෙකි. ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවකු ලෙස මහත් ප්‍රසිද්ධියක් උසුලන ඔහු, අවුරුදු ගණනාවක් තිස්සේ එම වෘත්තියේ යෙදී සිටියේය.

අවුරුදු පනස් දෙකක් වයසැති, අවිවාහකයෙක් වන ඕල්ඩ්එකර් මහතා, පදිංචිව සිටියේ සිඩන්හැම් හි ඩීප්ඩීන් මන්දිරයේය. ඔහු තරමක් අමුතු ගතිපැවතුම් ඇති පුද්ගලයෙකු බව සමහරුන්ගේ මතයයි. තම වෘත්තියෙන් විශාල ධනයක් උපයාගත් නිසා, ඔහු අවුරුදු කිහිපයකට පෙර, ඉදිකිරීම් ක්ෂේත්‍රයෙන් විශ්‍රාම ගත්තේය. කෙසේ වුවද ඔහුගේ නිවසට නුදුරෙන් තවමත් දැව ගබඩා කළ විශාල ලී මඩුවක් පිහිටා ඇත. ඊයේ රාත්‍රී දොළහට පමණ දැව මඩුවේ ගොඩගසා තිබූ ලී ගොඩකට ගිනි ඇවිළී ඇතැයි පණිවුඩයක්, ගිනිනිවන හමුදාව වෙත

http://sherlockholmesinvestigations.blogspot.com

ලැබී තිබේ. ඒ අනුව ගිනි නිවන යන්ත්‍ර ඉක්මනින්ම මෙම ස්ථානයට පැමිණ ඇත. එහෙත් ගිනි ඇවිළුණු වියළි දැව, නිවා දැමීම පහසු කටයුත්තක් වූයේ නැත. එම ලී ගොඩ සම්පූර්ණයෙන්ම දැවී විනාශයට පත්විය.

මේ දක්වාත් පෙනෙන්නට තිබුණේ මෙම සිද්ධිය සාමාන්‍ය හදිසි ගිනිගැනීමක් පමණක් බවයි. නමුත් දරුණු අපරාධයක් මෙතැන සිදුවී ඇති බවට සාක්ෂි මතුවීමට පටන් ගෙන ඇත. මෙම නිවස හිමිකරුවා ගින්න සිදුවූ ස්ථානයෙන් අතුරුදහන් වී සිටීම කාගේත් විමතියට කරුණක් විය. ඔහු පිළිබඳව සොයාබැලීම වහාම අරඹන ලදී. ඕල්ඩ්එකර් මහතා නිවසේ හෝ අවට කිසිම තැනක නොසිටියේය.

අනතුරුව ඔහුගේ කාමරය පරීක්ෂාවට ලක්කරන ලදී. එම රාත්‍රියේ ඔහු ඇඳේ නිදාගත් බවට සලකුණු කිසිවක් නොතිබිණි. ලියවිලි හා මුදල් තැන්පත් කරන යකඩ සේප්පුව විවෘතව තිබූ අතර, වැදගත් ලියකියවිලි කිහිපයක් කාමරයේ විසුරුවා දමා තිබී හමුවිය. එපමණක් නොව, මාරාන්තික පොරබැදීමක සලකුණු හා කුඩා ලේ පැල්ලම් කිහිපයක් ද කාමරයේ දැකිය හැකි විය. කාමරයේ තිබී හමුවූ ඕක් ලීයෙන් තැනූ සැරයටියේ මිටේ ද ලේ සලකුණු කිහිපයක් විය. ජොනාස් ඕල්ඩ්එකර් මහතා, එදින රාත්‍රියේ තම කාමරයේදී කිසියම් පුද්ගලයෙකු හමුවීමට සූදානම් කරගෙන තිබූ බව අපට දැනගන්නට ලැබිණි. ජෝන් හෙක්ටර් මැක්ෆාලේන් නම් මොහු, ලන්ඩනයේ නීතිඥවරයෙකි. ඕක් සැරයටිය ද ඔහුට අයත් එකක් බවට හඳුනාගෙන ඇත.

ජෝන් හෙක්ටර් මැක්ෆාලේන් මහතා මධ්‍යම නැගෙනහිර ලන්ඩනයේ, අංක 426 දරන තැන් පිහිටි ග්‍රේෂාම් ගොඩනැගිල්ලේ, ග්‍රැහැම් සහ මැක්ෆාලේන් නීතිඥ ආයතනයේ කනිෂ්ඨ අධ්‍යක්ෂක වරයායි. මෙම අපරාධය සිදුකිරීමට හේතුව ලෙස සැලකිය හැකි, වැදගත් සාක්ෂි කිහිපයක්ම සොයාගෙන ඇති බව පොලීසිය පවසයි. කෙසේ වෙතත් මහජනතාව විශ්මයට පත් කළ හැකි, තවත් සොයාගැනීම් කිරීමට ඉඩ ඇති බවට පොලීසිය විශ්වාසය පළ කරයි.

පසුව:

ජොනාස් ඕල්ඩ්එකර් මහතා ඝාතනය කිරීම සම්බන්ධයෙන්, ජෝන් හෙක්ටර් මැක්ෆාලේන් මහතා සිරභාරයට ගෙන ඇතැයි, පත්‍රය මුද්‍රණයට යද්දී මේ දැන් අපට ලැබුණු ආරංචියකින් පැවසේ. අධිම

http://sherlockholmesinvestigations.blogspot.com

වශයෙන් ඔහු සිරභාරයට ගැනීමට වරෙන්තු පවා නිකුත් කොට අවසන් බව, පොලිස් ආරංචි මාර්ග ස්ථිර කළේය.

නෝවුඩ් සිද්ධිය පිළිබඳව දිගින් දිගටම පැවැත්වෙන පරීක්ෂණ වලින් තවත් කරුණු රාශියක් සොයාගැනීමට පොලීසිය සමත් වී ඇත. ඒ අවාසනාවන්ත ගෘහ නිර්මාණ ශිල්පියාගේ නිවසේ පහත මාලයේ, අනාරක්ෂිත විශාල ජනේල විවෘතව තිබුණු අතර, යම්කිසි බරින් වැඩි පොදියක්, ඒ තුළින් ලී මඩුව දක්වා ඇදගෙන ගිය බවට සලකුණු හමුවී ඇත. මීට අමතරව දැව පිළිස්සීමෙන් සෑදුණු අඟුරු අතරේ, දැවීගිය මනුෂ්‍ය ශරීරයක කොටස් යැයි සිතිය හැකි, ජෛන්ද්‍රිය සුන්බුන් ද සොයාගනු ලැබිණ.

ඕල්ඩ්එකර් මහතා ඇගුගේ නිදන කාමරයේදීම පොල්ලකින් පහර දී කුරිරු ලෙස ඝාතනය කොට, මළසිරුර ලී මඩුව වෙත ඇදගෙන ගොස්, එහි දමා, සලකුණු සියල්ල මකා දැමීමේ අරමුණෙන් ගිනිතබන්නට ඇතැයි විශ්වාස කෙරේ. අපරාධ පරීක්ෂණයේ කටයුතු භාරවී ඇත්තේ, ස්කොට්ලන්ඩ්යාඩ් රහස් පොලීසියේ ප්‍රවීණ නිලධරයකු වන ලෙස්ට්‍රේඩ් මහතාටයි."

දෑත්වල ඇඟිලි තුඩු එකට තබාගෙන, දෑස් පියාගෙන, හෝම්ස් සියල්ල සාවධානව අසා සිටියේය.

"බොහොම වැදගත්, සිත් ඇදගන්නා සුළු කරුණු කිහිපයක් මේ සිද්ධියේ තිබෙනවා. මං මුලින්ම මැක්ෆාලේන් මහත්මයාගෙන් දැනගන්න කැමතියි, මෙන්න මේ කාරණාව. ඔබව හිරභාරයට ගැනීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි තිබියදීත්, ඔබ කොහොමද මේ විදියට බේරිලා ඉන්නේ?"

"මහත්මයා, මං මගේ දෙමව්පියන් සමග ජීවත්වෙන්නේ, බ්ලැක්හීත් ප්‍රදේශයේ 'ටොරිංටන් ලොජ්' නම් නිවසේ. ජොනාස් ඕල්ඩ්එකර් මහත්මයා සමග බොහොම රෑ වෙනකං රාජකාරියක යෙදෙන්න තිබුණු නිසා, මං ඊයෙ රෑ නෝවුඩ්හි හෝටලයක නවාතැන් ගත්තා. එහේ ඉඳල මං අද උදේ මගේ රැකියාවට එන්නයි පිටත් වුණේ.

මං මේ කිසිම දෙයක් දැනගෙන හිටියෙ නෑ. පුවත්පතක් අරගෙන දුම්රියේදි ඒක කියවද්දියි මං සිද්ධිය දැනගත්තේ. මං මුහුණ දීල ඉන්නේ භයානක, අන්තරායදායක තත්ත්වයකට බව තේරුම් ගියාම, මට

http://sherlockholmesinvestigations.blogspot.com

එක්වරම හිතුණේ ඔබේ පිහිට පතන්නයි. මං ගෙදර හිටිය නම්, එහෙමත් නැත්නම් කාර්යාලයේ හිටිය නම් මෙලහකට පොලිස් අත්අඩංගුවට පත්වෙලා. ඒකෙ සැකයක් නෑ. ලන්ඩන් පාළම ළඟ ඉඳලම කෙනෙක් මා, ලුහුබැඳ එන බව මට තේරුණා . . . . දෙයියන්ට ඔප්පු වෙච්චාවේ! මොකක්ද මහත්මයා ඒ ශබ්දේ?"

ඒ අපේ සීනුව නාද වූ ශබ්දයයි. ඒ සමග වේගයෙන් අඩි තබමින් අපේ ලෑලි තරප්පු පෙළ දිගේ උඩු මහලට නගින කිසිවෙකුගේ බර බූට්ස් සපත්තුවල ශබ්දය අසන්නට ලැබිණි. මොහොතකින් දොර අසල අප දුටුවේ අපේ පැරණි මිත්‍රයකු වන පොලිස් පරීක්ෂක ලෙස්ට්‍රේඩ්ය. ඔහු පිටුපසින් නිල ඇඳුමෙන් සැරසුණු පොලිස් භටයන් දෙදෙනෙකු ද සිටිනු මම දුටුවෙමි.

"ජෝන් හෙක්ටර් මැක්ෆාලේන් මහත්මයාද?" ලෙස්ට්‍රේඩ් විමසුවේය.

අපේ අවාසනාවන්ත අනුග්‍රාහකයාගේ මුහුණ, අවතාරයක් දුටු අයෙකුගේ මෙන් සුදුමැලි විය. ඔහු නිරායාසයෙන්ම අසුනෙන් ඉහළට එසවුණේය.

"පහළ නෝවුඩ්හි ජොනාස් ඕල්ඩ්කර් මහතා මරාදැමීම ගැන මා ඔබව අත්අඩංගුවට ගන්නවා."

තමාගේ සියලු බලාපොරොත්තු කඩවූ බවක් තරුණයාගේ මුහුණේ පිළිබිඹු විය. ක්ලාන්ත වූවාක් මෙන් ඔහු ආපසු පුටුව මතටම ඇද වැටිණි.


"ලෙස්ට්‍රේඩ්, මොහොතක් ඉන්න." හෝම්ස් ඔහුට බාධා කළේය.

"මොහු හිරභාරයට ගැනීම තව පැය භාගයක් පමණ ප්‍රමාද වුණොත්, ඒකෙන් ඔබට අවාසියක් වෙන්නෙ නෑ. මේ මහත්මයා සූදානම් වුණේ, මේ පුදුමාකාර සිද්ධිය සම්පූර්ණයෙන්ම අපට කියන්නයි. සමහර විට ගැටලුව විසඳාගන්න ඔහුගේ කථාව උදව් වෙන්නත් පිළිවන්."

"ගැටලුව විසඳාගන්න නම් කිසිම අමාරුවක් නෑ." ලෙස්ට්‍රේඩ් පිළිතුරු දුන්නේය.

"ඒත් කමක් නෑ ලෙස්ට්‍රේඩ්. ඔබගෙන් අවසර ලැබෙනවා නම්, මං හරිම කැමතියි මේ කථාව ඔහුගේ කටින්ම අහන්න."

http://sherlockholmesinvestigations.blogspot.com



175 "....ජොනාස් ඔල්ඩ්ඒකර් මහතා මරාදැමීම ගැන මං ඔබව අත්අඩංගුවට ගන්නවා."

http://sherlockholmesinvestigations.blogspot.com

"හෝම්ස් මහත්මයා. ඔබ එවැනි ඉල්ලීමක් කළාම මං කොහොමද ප්‍රතික්ෂේප කරන්නෙ? ඔබ පහුගිය කාලයේ වරක් හෝ දෙවරක් පොලීසියට උදව් කරපු කෙනෙක්. ඉතින් කොහොමද මං ඔබේ ඉල්ලීම අහක දාන්නෙ?

ඒ කොහොම වුණත් මං දිගටම මගේ සිරකාරයා ළඟ රැඳී ඉන්නවා. ඒ වගේම ඉලන්දාරියා, ඔබ කියන ඕනෑම දෙයක් ඔබට විරුද්ධව සාක්ෂි හැටියට උසාවියට ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ බව මතක් කරන්න මං කැමැතියි." ලෙස්ට්‍රේඩ් කීය.

"මං ඊට වඩා කැමැති දෙයක් නෑ." මැක්ෆාලේන් පිළිතුරු දුන්නේය.

"මං ඔබට ආයාචනය කර සිටිනවා, මං කියන දේ අහගෙන ඉඳලා, සත්‍යය කුමක්ද යන්න වටහා ගන්න කියලා."

"මං දෙන්නම් ඔයාට පැය භාගයක්." ලෙස්ට්‍රේඩ් පැවසුවේ ඔහුගේ ඔරලෝසුව දෙස බලමිනි.

තරුණයා කථාව ඇරඹුවේය.

"මං මුලින්ම කිව යුතුයි, මේ ජෝනාස් ඕල්ඩ්ඒකර් එක්ක දැන හඳුනගන්න කමක් මගේ තිබුණේ නැහැ; ඔහු ගැන කිසිම තොරතුරක් මං දැන හිටියෙත් නැහැ. ඒ වුණත් ඔහුගේ නම, මට අහලා හුරුපුරුදු නමක්. ඒකට හේතු වුණේ මගේ දෙමව්පියන් බොහෝ කාලයකට පෙර, ඔහුව හොඳින් දැන හැඳින සිටි බව මං අහල තිබුණා. කලකට පෙර ඔහු සමග යම් ආශ්‍රයක් තිබුණු බවත්, කුමක් හෝ ප්‍රශ්නයක් නිසා ඒ යාළුකම බිඳිල ගිහින්, හිත් නොහොඳ වූ බවත් මට අහන්න ලැබුණා. ඉතින් ඊයේ හවස තුනට පමණ මේ ජෝනාස් ඕල්ඩ්ඒකර් මාව හමුවෙන්න, මගේ කාර්යාලයට ආවම මං හරි පුදුමයකට පත්වුණා. මං ඊටත් වඩා පුදුමයට පත් වුණේ ඔහු එහි ආව කාරණය කිව්වාමයි. ඔහුගේ අතේ නොපැහැදිලි අත් අකුරින් යමක් සටහන් කළ කඩදාසි කිහිපයක් තිබුණා. මෙන්න ඒවා. ඔහු මේ කඩදාසි මගේ මේසය මත තැබුවා.

"මෙන්න මැක්ෆාලේන් මහත්මයා මගේ අන්තිම කැමැති පත්‍රය. මං කැමතියි ඔබ ඒක නීත්‍යානුකූල ලියවිල්ලක් ලෙස සකස් කරනවා දකින්න. ඔබ ඒ රාජකාරිය කරන තුරු මං මෙහෙන් වාඩිවෙලා බලාගෙන ඉන්නම්."

http://sherlockholmesinvestigations.blogspot.com

ඉතින් මම ඔහුගේ කඩදාසියට පිටපත් කරමින් ලියවිල්ල සකස් කිරීම ඇරඹුවා. ඔබට හිතාගන්න පුළුවන්ද මහත්වරුනි, ඒකෙ සඳහන්ව තිබූ දේ දැක්කම මට ඇතිවුණු පුදුමය? එහි සඳහන්ව තිබුණේ, දේපොළෙන් ඉතාම සුළු කොටසක් හැරෙන්නට, අනෙක් නිශ්චල, චංචල සම්පූර්ණ දේපළම ඔහු මගේ නමට ලියා තිබුණු බවයි. ඔහු ශරීර ප්‍රමාණයෙන් කුඩා, උගුඩුවෙක් වැනි කපටි පෙනුමක් තිබූ අයෙක්.

"මට මේක විශ්වාස කරන්නත් අමාරුයි, ඕල්ඩක්කර් මහත්මයා. ඔබේ මරණයෙන් පසු, හැම දෙයක්ම මගේ නමට ලිව්වේ ඇයි? මම මාව හඳුනන්නෙවත් නැහැනේ" මං ඔහුට කිව්වා.

"මැක්ෆාලේන් මහත්මයා, ඔබ මාව හඳුනන්නෙ නැති බව ඇත්තයි. නමුත් තරුණ කාලෙ ඉඳලම මං ඔබේ මවත් පියාත් දෙදෙනාම හොඳින් හඳුනනවා. සෑහෙන කාලයක් අපි ළඟින් ආශ්‍රය කළා. ඊළඟට මට අහන්න ලැබුණා, ඔබ බොහොම උත්සාහයෙන් දියුණු වෙන්න හදන, හොඳ ගතිගුණ ඇති තරුණ නීතිඥයෙක් බව. මට කාත් කවුරුවත් නැහැ. මං අවිවාහකයි; ළඟම ඥාතීන් කිසිවෙක් නැහැ. ඉතින් මං තීරණය කළා මේ දේපළ ඔබේ නමට ලියන්න. මං මැරුණු කාලෙක සුදුසු පුද්ගලයෙක්ගෙ අතට මගේ දේපළ ලැබෙනව නම් ඒක මගේ හිතට සතුටක්." ඔහු කිව්වා.

"හොඳයි . . . . හොඳයි . . . . ඔබේ කැමැත්තක්. මං ඔබට ස්තූති කරනවා. ඒ ඇරෙන්න මං වෙන මොනවා කරන්නද?" මම ගොත ගහමින් අමාරුවෙන් කිව්වා.

අන්තිම කැමැති පත්‍රය ලිවීමේ වැඩ කටයුතු අවසන් වුණා. නිසිපරිදි ඒකට අත්සන් යෙදුවා. සාක්ෂියට අත්සන් කළේ මගේ ලිපිකරුවා. මේ තියෙන්නේ ඒම ලියවිල්ල සැකසීම සඳහා මා පිළියෙළ කළ දළ කෙටුම්පත.

"මෙන්න ඕල්ඩක්කර් මහත්මයා, ඔබේ ඉල්ලීම පරිදි මා අන්තිම කැමැති පත්‍රය සකස් කළා."

"බොහොම ස්තූතියි." ඔහු කිව්වා.

"ඒක නෙමෙයි. ඔබට අවශ්‍ය නම්, නීති උපදෙස් ගන්න ඕන කරන ලියවිලි රාශියක් මගේ ගෙදර තියෙනවා. ඔය ගොඩනැගිලි බදු ඔප්පු, ඉඩම් ඔප්පු, දේපළ උගසට තියාපු උගස් ඔප්පු, ඔය වගේ

http://sherlockholmesinvestigations.blogspot.com

නීතිඥයෙකුට පමණක් කියවලා තේරුම් ගන්න පුළුවන් ලියකියවිලි. ඔබ මේව හැම එකක්ම කියවලා, මට තේරුම් කරල දෙන්න ඕනෙ. ඒ වැඩෙන් ඉවරයක් කරන තුරු මගේ හිතට සැනසීමක් නැහැ. ඉතින් මැක්ෆාලේන් මහත්මයා, අද රාත්‍රියට ඔබට මගේ නිවසට එන්න පුළුවන් නම්, ඒක මට කරන ලොකු උදව්වක්. අන්තිම කැමැති පත්‍රයත් ඒ එනකොට අරගෙන එන්න. එහෙනම් නොවරදවාම අද හැන්දෑවෙ නෝවුඩ්වල අපේ නිවසට එන්න. මං ඔබ එනතුරු බලාගෙන ඉන්නවා."

හැබැයි එක වැදගත් කරුණක් මතක තියාගන්න ඕනෑ. මේ ගැන එක වචනයක් වත් ඔබේ අම්මට හෝ තාත්තාට කියන්න එපා. දන්නවනේ වයසක අයගෙ හැටි. පොඩි දේටත් කලබල වෙනවා. ඔප්පු ලියන කටයුතු ඔක්කොම කරල අවසන් වෙලා, අපි මේක ඔබේ අම්මටත් තාත්තාටත් දැනුම් දෙමු. ඒකෙන් අපි ඔවුන් එක්වරම පුදුමයට පත්කරමු."

"හොඳයි. ඔබේ ඉල්ලීමේ හැටියට මං අද රෑට එන්නම්. කීයටද මං එන්න ඕනෙ?"

"ඔබ රෑ නවය වෙනකොට අපේ ගෙදරට ආවම හොඳටම ඇති. අපි ඔබටත් එක්ක රෑ කෑම සූදානම් කරනවා. ඉතින් රෑ කෑම ගන්න මං ඔබ එනතුරු බලාගෙන ඉන්නවා.

ඔබ ඊට කලින් එන්න එපා. වෙනත් වැඩකටයුතු රාශියකත් යෙදෙන්න තියෙන නිසා, මට නිවසෙන් පිටත යන්න සිදුවේවි. හොඳයි එහෙනම් මතක තියාගන්න. මේ ගැන එක වචනයක්වත් අම්මල තාත්තලට කියනව හේමු නෙමෙයි."

ඔහු ඒ ගැන මාව පොරොන්දු කරවා ගත්තා. ඔබට තේරෙනව නේද හෝම්ස් මහත්මයා, මං පත්වෙලා හිටි තත්ත්වය. මං කොහොමද ඒ වෙලාවෙ ඔහුගේ ඉල්ලීම තිසිදෙයක් ප්‍රතික්ෂේප කරන්නෙ. මං වෙනුවෙන් විශාල පරිත්‍යාගයක් කරන මේ පුද්ගලයාගෙ සුළු ඉල්ලීමක් ඉටුකිරීම මගේ යුතුකම නේද?"

"ඉතින් ඔබ මොකද කළේ?" හෝම්ස් ඇසීය.

"මං ගෙදරට විදුලි පණිවුඩයක් යැව්වා. මගේ ව්‍යාපාරයේ රාජකාරි කටයුත්තක් නිසා ගෙදර ඇවිත් යන්න වෙලාවක් නැහැ; වැඩකටයුතු ඉවර වෙද්දි නුගක් රෑ වෙන්න ඉඩ තියෙනවා. මං

http://sherlockholmesinvestigations.blogspot.com

කොයිතරම් ඒ වේද කියල දන්න කියන්නනම් බැහැ කියල දෙමව්පියන්ට දන්නුවා.

ඉතින් ඊයෙ හවස මම හෝවුඩ්වල ඕල්ඩ්එක්කර්ගෙ නිවස හොයාගෙන පිටත්වෙලා ගියා. නිවස හොයාගැනීම තරමක් අමාරු වුණා. ඒ හින්දා නිවසට යනකොට රෑ නවයහමාර විතර වෙන්න ඇති. ඔහු . . . ."

". . . . මේක කියන්න. කවුද ගෙදර දොර ඇරියෙ?" හෝම්ස් ප්‍රශ්න කළේය.

"මැදි වයසේ කාන්තාවක්. මං හිතන්නෙ ගෘහ පාලිකාව වෙන්න ඇති."

"ඇය ඔබේ නම ඇහුවා කොට ඔබව ඇමතුවද?"

"ඇත්තෙන්ම ඔව්."

"හොඳයි. කථාව දිගටම කියන්න."

"මේ කාන්තාව මාව විසිත්ත කාමරයට කැඳවාගෙන ගියා. එහි අඩු වියදමකින් පිළියෙල කළ සුළු භෝජනයක් සූදානම්ව තිබුණා. ඊට පස්සේ ජෝනාස් ඕල්ඩ්එක්කර් මහත්මයා මාව ඔහුගේ නිදන කාමරයට කැඳෙව්වා. එහි තිබුණා බර යකඩ සේප්පුවක්. ඔහු ඒ තුළින් ලියකියවිලි රාශියක් එළියට ගත්තා. ඒවා බොහොමයක් අපි දෙන්නා කියවමින් පරීක්ෂා කර බැලුවා. මේ වැඩ කටයුතු අවසන් වෙනකොට රාත්‍රී එකොළහත් දොළහත් අතර ඇති.

"මේ වෙලාව වෙනකොට මගේ ගෘහ පාලිකාව නින්දට ගිහිං ඇති. ඇයට නිකරුණේ කරදර කරන්න උවමනා නැහැ. මං ඔබට නිවසෙන් එළියට යාමට ඉඩ සලස්වන්නම්." ඕල්ඩ්එක්කර් කිව්වා.

ඔහුගේ කාමරයේ ජනේලය මේ වන්විටත් විවෘතවයි තිබුණේ. මේවා ප්‍රංශ මෝස්තරයේ ජනේල නමින් හඳුන්වන, ඉතා උස දොරවල් වගේ ජනේල. යකඩකූරු හෝ යකඩ ග්‍රිල් නොමැති මේ ජනේලයක් හරහා කෙනෙකුට පහසුවෙන් නිවසෙන් පිටතට යා හැකියි. ඔහු තමන්ගේ කාමරයේ ජනේලයෙන් මට එළියට යන්න ඉඩකඩ සැලසුවා.

"ජනේලය ආවරණය කරන තිරය මේ වෙලාවෙ පහත දමලද තිබුණේ?"

"මට හරියට මතක් නෑ. මං හිතන්නේ බාගෙට වගේ පහත දමල තියෙන්න ඇති. ඔව්. ඔව්. මට දැන් මතකයි. ඔහු තිර රෙද්ද

http://sherlockholmesinvestigations.blogspot.com

එසෙව්වා, ජනේලය විවෘත කිරීම සඳහා. මං යන්න පිටත්වෙලා බලන කොට මගේ සැරයටිය තිබුණේ නෑ. මං ඒක හොයන විට ඔහු කිව්වා:

"ඔක හොයන්න දැන් මහන්සි වෙන්න එපා පුතා. දැන් ඉතින් මීට පස්සේ නිතරම වගේ ඔබට මට මුණ ගැහේවි. සැරයටිය හමුවුණාම මං ඒක පරෙස්සම් කරලා අරන් තියන්නම්. ඔබ ඊළඟට මෙහේ ආව දවසට ඒක දෙන්නම්"

ඔහු එහෙම කිව්වාම මං තවදුරටත් ඒක හොයන්න උත්සාහ කළේ නැහැ. ඉතින් මං ඔහුගෙන් සමුගත්තා. මං එනකොටත් යකඩ සේප්පුව විවෘතව තිබුණා. ලියවිලි ඔක්කොම වගේ එළියට ඇදපු ගමන් මේසය උඩ තිබුණා.

හුඟක් රෑ බෝවුණු නිසා මට ආපසු බ්ලැක්හීත් වලට යන්න වෙලාවක් තිබුණේ නෑ. ඉතින් මං ඇනලි ආම්ස් නම් තානායමේ නතරවුණා. එතැනින් එහාට මං මොකුත් දන්නෙ නෑ, අද උදේ පුවත්පත බලනතුරු."

හෝම්ස් මහත්මයා. ඔබට අහන්න ප්‍රශ්න එහෙම මොකුත් තියෙනවද?" ලෙස්ට්‍රේඩ් ඇසීය.

හෝම්ස් මේ කථාවට සවන් දීගෙන සිටියේ වරක් හෝ දෙවරක් දෙබැම ඉහළට ඔසවා තම විස්මය පළකරමිනි.

"දැනට මගෙන් මොකුත් ප්‍රශ්න නැහැ. මං බ්ලැක්හීත් වලට ගිහිං ආවට පස්සෙ ප්‍රශ්න ඉදිරිපත් කරන්නම්." හෝම්ස් පිළිතුරු දුන්නේ ලෙස්ට්‍රේඩ්ටයි.

"ඔබ අදහස් කරන්න ඇත්තේ නෝවුඩ්?" ලෙස්ට්‍රේඩ් ඇසීය.

"ආ . . . . ඔව් ඔව් . . . . ඒක තමයි මං අදහස් කළේ" හෝම්ස් පැවසුවේ මට තේරුම් ගැනීමට අපහසු වූ සිනහවක් ද සමගයි.

තමාට කිසිසේත් අවබෝධ කරගැනීමට දුෂ්කර දේ වටහා ගැනීමට හෝම්ස්ගේ සැතක් මෙන් තියුණු බුද්ධියට හැකි බව ලෙස්ට්‍රේඩ් දැන සිටියේය. එය අත්දැකීමෙන් දැන සිටියත් ඒ බව ප්‍රසිද්ධියේ පිළිගැනීමට ලෙස්ට්‍රේඩ් මැලි බවක් දැක්විය.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා. මටත් ඔබ එක්ක වචන කිහිපයක් කථා කරන්න තියෙනවා. ආ . . . මැක්ෆාලේන් මහත්මයා. මගේ

http://sherlockholmesinvestigations.blogspot.com

පොලිස් භටයන් දෙදෙනෙක් ඔය ඇඳුරටුව ළග ඉන්නවා. ලොකු අශ්ව කරත්තයකුත් ඔබ සඳහා සූදානමෙන් තියෙන්නෙ . . . ."

කලකිරීමට පත් බැල්මක් අප දෙස හෙළූ තරුණයා, කාමරයෙන් පිටවී යාමට සූදානම් විය. පොලිස් භටයන් ඔහු කුලී රථයට නග්ගවා ගන්නා අයුරු අපි බලා සිටියෙමු. ලෙස්ට්‍රේඩ් තවදුරටත් අප සමග රැඳී සිටියේය.

ඔල්ඩ්ඒකර්ගේ අන්තිම කැමැති පත්‍රය සැකසීමට උදව්කරගත් කඩදාසි කිහිපය අතට ගත් හෝම්ස්, මුලින්ම එය දැඩි අවධානයකින් කියවා බැලුවේය.

"මේ ලියවිල්ලේ තැඳගත් ලක්ෂණ සමහරක් හඳුනාගන්න පිළිවන්. බලන්න ලෙස්ට්‍රේඩ් එහෙම නේද කියලා."

හෝම්ස් පැවසුවේ එය ලෙස්ට්‍රේඩ් දෙසට දිගු කරමිනි. එහෙත් එය කියවූ පොලිස් නිලධරයා තමාල රැලි කරගත්තේ ගැටලුවක පැටළුණු අයකු ලෙසයි.

"මට පළමුවෙනි පේළි කිහිපය කියවන්න පුළුවනි හෝම්ස් මහත්මයා. දෙවැනි පිටුවේ මැද හරියේ කියවන්න පුළුවනි. ඒ වගේම අන්තිමට තිබෙන පේළි දෙක තුන. ඒවා නම් අච්චු අකුරු වගේ පැහැදිලියි. ඒ අතරතුර ලියල තියෙන ඒව නම් හොඳටම නොපැහැදිලි අත්අකුරු. තුන්පොළක් විතර තියෙනවා මට කොහොමටවත් කියවන්න බෑ."

"මොකක්ද ඔබ ඒකෙන් තේරුම් ගන්නේ?"

"මට මොකුත් තේරුම් ගන්න බැහැ හෝම්ස් මහත්මයා. ඔබ?"

"ලෙස්ට්‍රේඩ්. මේක ලියලා තියෙන්නේ දුම්රියක ගමන් කරද්දී. හොඳ පැහැදිලි අකුරෙන් ලියල තියෙන්ව නේද? ඒ හරිය දුම්රිය පොළක දුම්රිය නවත්වා තිබියදී. ඉතාම අපැහැදිලි අත්අකුරු - දුම්රිය ගැස්සෙමින් ඉතා වේගයෙන් ගමන් කරද්දී. මේ ලිවීම කරල තියෙන්නේ, අගනුවරට තදාසන්න මාර්ගයක ගමන් කළ දුම්රියකදී කියල, විද්‍යානුකූලව මෙය විශ්ලේෂණය කරන විද්‍යාඥයෙකුට කියන්න පිළිවන්. එහෙම නැතුව මේ තරම් ඉක්මනට නැවතුම් පොළ රාශියක් තිබෙන්නෙ කොහේද අගනුවරට ආසන්නව මිසක්? මෙම අන්තිම කැමැති පත්‍රයේ දළ කෙටුම්පත සකස් කරන්න මුළු දුම්රිය ගමනම ගත කළා

http://sherlockholmesinvestigations.blogspot.com

කියල අපි උපකල්පනය කරමු. දුම්රිය සිලාශාම් එකක් නම්, නෝවුඩ් හා ලන්ඩන් පාළම අතර . . . ."

"හෝම්ස් මහත්මයා. ඔබ ඔය සිද්ධාන්ත ඉදිරිපත් කරන්න පටන් ගත්තාම, මට නම් ඒවා කිසිදේක අගක් මුලක් තේරුම ගන්න බෑ. ඕක කොහොමද මේ අපරාධයට සම්බන්ධ වෙන්නෙ?"

"ඇයි ඒකෙන් මේ තරුණයාගේ කතන්දරයේ නිවැරදි බව ඔප්පු වෙනවා. ඒ කියන්නේ ඕල්ඩ්ඒකර් උන්නැහේ ඔහුගේ අන්තිම කැමැති පත්‍රය සකස් කරලා තියෙන්නේ ඊයේ දුම්රියෙන් ගමන් කරද්දී! හරිම පුදුමයි නේද?

බොහොම වැදගත් ලියවිල්ලක් වන තමන්ගේ අන්තිම කැමැති පත්‍රය ලිවීම, හොඳ සැලකිලිමත් පිළියෙළ, දුම්රියක යනඑන ගමන් කරන්නෙ මොන මිනිහද? ඒකට හේතුව මෙකයි. ඕල්ඩ්ඒකර් දැනගිටියා මේ අන්තිම කැමැති පත්‍රය සෘජු වශයෙන්ම ඒ තරම් ප්‍රයෝජනයකට ගැනෙන එකක් නොවන බව."

"කොහොම වුණත්, ඒ ගමන්ම ඔහු තමන්ගේ මරණ වරෙන්තුව ලියාගත්තා දුම්රියේදී!" ලෙස්ට්‍රේඩ් කීය.

"ඔබට හිතෙන්නේ එහෙමද ලෙස්ට්‍රේඩ්?"

"ඇයි ඔබට එහෙම හිතෙන්නේ නැද්ද?"

"ඔව්. ඒක වෙන්නත් පිළිවන්. නමුත් මේ සිද්ධිය මට තවමත් පැහැදිලි නැහැ . . . ." හෝම්ස් පිළිතුරු දුන්නේය.

"පැහැදිලි නෑ? මේකත් පැහැදිලි නැත්නම් මොකක්ද හෝම්ස් මහත්මයා ඔබට පැහැදිලි?

ඉලන්දාරියෙක් ඉන්නවා. ඔහුට දැනගන්න ලැබෙනවා යම්කිසි වයස්ගත පුද්ගලයෙක් මියගිය වහාම, තමාට විශාල ධනස්කන්ධයක් උරුමවෙන බව. තරුණයා මොකද කරන්නේ? ඔහු කාටවත් කියන්නේ නැතුව, මොනවා හරි හේතුවක් හොයාලා, මේ වයසක මනුස්සයා හමුවෙන්න සූදානම් කරගන්නවා. කවදාටද? එදාම රාත්‍රි කාලයේදී. ගෙදර ඉන්නෙ තවත් එකම නැනැත්තායි. ඒ ගෘහ පාලිකාව. ඇය නින්දට යනතුරු ඔහු ඉවසනවා.

ඊළඟට ඕල්ඩ්ඒකර්ගෙ කාමරේදී කාගෙන්වත් අවහිරයක් නැතුව, ඔහුව මරා දමනවා. මළසිරුර ලී මඩුවට ඇදගෙන ගිහිං, එය ගිනිබත්

http://sherlockholmesinvestigations.blogspot.com

කරලා තරුණයා පැනල යනවා. ඔහු ඕහිං හෝටලයක නවාතැන් ගන්නවා. ඕල්ඩ්ඒකර්ගෙ නිදන කාමරයේ සහ සැරයටියේ ලේ සලකුණු තිබෙන්නේ ඉතාම සුළු වශයෙන්. අපරාධකාරයා කල්පනා කරන්න ඇති, ඔහු කළ මිනීමැරුමෙන් ලේ ගලා ගියේ ඉතා ස්වල්ප වශයෙන් කියලා. ඔහු බලාපොරොත්තු වෙන්න ඇති, මළසිරුර දවා විනාශ කළොත්, ඔහුගේ අපරාධයේ සියලුම සලකුණු මකාදමන්න පුළුවන් කියලා. මේ ටික ඔබට පැහැදිලි නැද්ද?"

"මගේ හිතවත් මිත්‍රයා." හෝම්ස් කථාව ඇරඹුවේය.

"ප්‍රශ්නය වෙලා තියෙන්නෙ ලෙස්ට්‍රේඩ්, මේක ටිකක් උවමනාවට වඩා පැහැදිලියි. ඔබ එක් මොහොතකට හිතන්න ඔබ මේ තරුණයාගෙ තත්ත්වයට පත්වෙලා හිටිය කියල. ඔබට මහා ධනස්කන්ධයක් හිමිකර දෙන අන්තිම කැමති පත්‍රයක් ඔබම ලියනවා. එය ලියූ දවසෙම රාත්‍රිය ඔබ යොදාගන්නවාද ඒ වයස්ගත පුද්ගලයා මරාදමන්න? ඔබට පෙනෙන්නෙ නැද්ද ඒක බොහොම අන්තරායදායක පියවරක් කියල? ඊළඟට මෙම අපරාධය කරන්න ඔබ තෝරාගන්නවද, ඔබ නිවසේ ඉන්න බව තවත් කවුරු හරි හොඳින් දන්නා වෙලාවක්? ඇයි ඔබට නිවසට ඇතුළුවෙන්න දොර ඇරලා දුන්නෙත් සේවිකාවක්. ඊළඟට ඔබ මිනීමරුවා බව ඔප්පු වෙන ඔබේ සැරයටිය නිවසේ දමලා යද්දී, මළසිරුර විනාශකර දමන්න ඔබ ඔය තරම් උත්සාහයක් ගන්නවද? ඔබේ අවංක හැඟීම හෙළිකරන්න ලෙස්ට්‍රේඩ්. මේ ආකාරයට දේවල් සිද්ධවෙන්න පුළුවන්ද?"

"සැරයටිය ගැන කියනවා නම් හෝම්ස් මහත්මයා, ඔබ දන්නවා, කලබලයට පත්වෙන අපරාධකාරයින් අතින් කොතෙකුත් ඔවැනි අතපසුවීම් සිදුවෙනවා. සැරයටිය අමතක වෙලා නිවසෙන් එළියට ආ ඔහු, ඒක ගන්න ආපසු යන්න හයවුණා. ඒක එහෙම නෙමෙයි කියන්න මොකක්ද හෝම්ස් මහත්මයා ඔබ ඉදිරිපත් කරන උපකල්පනය?"

"මං දෙන්නම් උපකල්පන දුසිම් භාගයක්. උදාහරණයක් වශයෙන් මෙන්න මේක බොහෝ දුරට සිදුවිය හැකි එකක්. වයසක මනුස්සයා වැදගත් ලියවිලි ටික තරුණයාට පෙන්වමින් ඉන්නවා. නිවස අසලින් යන දුප්පත් රස්තියාදුකාර මැරවරයෙක්, ජනෙල් වීදුරුව තුලින් මෙය දකිනවා. ඇයි ජනෙල් තිරය වහලා තියෙන්නෙ බාගෙට.

http://sherlockholmesinvestigations.blogspot.com

තරුණයා නිවසෙන් පිටුවෙලා ගියාම මොහු ඇතුළු වෙනවා. කවුද? අර රස්තියාදුකාර මැරවරයා. ඔහුට කාමරයේ දකින්න ලැබෙන අර සැරයටිය අරගෙන වයසක මනුස්සයාට ඒකෙන් පහරදී මරා දමනවා. ඊළඟට ඔහු මළසිරුර ගින්නෙන් විනාශ කර දමලා පැන යනවා."

"රස්තියාදුකාරයා මොකටද මළ සිරුර ගිනි තියලා විනාශ කරන්නෙ?"

"එහෙනම් මැක්ෆාලේන් මොකටද මළසිරුර ගිනි තියලා විනාශ කරන්නේ?"

"සාක්ෂි මකා දමන්න."

"එහෙම නම් රස්තියාදුකාරයාටත් හිතෙනවා මෙතැන මිනීමැරුමක් සිදුවෙලා තියෙනවා කියන කරුණ සඟවන්න."

"එතකොට රස්තියාදුකාරයා කිසිදෙයක් අරං නොගියෙ ඇයි?"

"ඒ මොකද ඔහුට ඒ ලියවිලි ගෙනිහිං වැඩක් නෑ. ඒව විකුණාගන්න බෑ."

ලෙස්ට්‍රේඩ් අවිනිශ්චිතව හිස දෙපැලුම්වේය.

"හොඳයි. එහෙම නම් ෂර්ලොක් හෝම්ස් මහත්මයා; ඔබ ඔබේ රස්තියාදුකාර මැරවරයාව හොයන්න. අපි අපේ මිනිහාව හිරභාරයේ තබාගන්නවා. ඉදිරියේදී අපට බලන්න පුළුවනි කවුද නිවැරදි කියලා.

මෙන්න මේ වැදගත් කාරණයත් ඔබ හිතට ගන්න හෝම්ස් මහත්මයා. අප දන්නා තරමින් ඕල්ඩ්ඒකර් සතුව තිබූ ලියවිලි කිසිම දෙයක් අතුරුදන් වෙලා නෑ. ඇයි? ඒවා අතුරුදන් කරන්න කැමති නැති, ලෝකෙ ඉන්න එකම පුද්ගලයා තමා මැක්ෆාලේන් තරුණයා. ඇයි, ඕල්ඩ්ඒකර්ගෙ ධනය සියල්ලම නීතියෙන් ඔහුට අයිතිවෙද්දී, අර ලියවිලි සියල්ලම ඔහුට අවශ්‍ය වෙනවා. මේ ලියවිලි නිසා දේපොළ පහසුවෙන්ම ඔහුට හිමිවෙනවා."

මේ ප්‍රකාශයෙන් මගේ මිත්‍රයා දුර්මුඛ වූ බව පෙනිණ.

"ලෙස්ට්‍රේඩ්. සාක්ෂි නම් එකත්තම යොමු වෙලා තියෙන්නෙ, ඔබ ඉදිරිපත් කරන කල්පිතයට පදනම් වෙන ආකාරයට බව මම පිළිගන්නවා; මං ඔබට කියන්නේ මෙතැන, තවත් වෙනස් විධියේ සිද්ධියක් වුණත් වීමට ඉඩ ඇතියි කියලයි. ඔබ කියන්න වගේ ඉදිරි

http://sherlockholmesinvestigations.blogspot.com

කාලයේදී ඔක්කොම නිහඬ වේවි. ඔබට ඉඩ දවසක් අද දවස ඇතුළත මං නෝවුඩ් වලට ඇවිත් ඔබේ හපන්කම් බලන්න උත්සාහ කරන්නම් කො."

පොලිස් නිලධරයා අපෙන් සමුගෙන පිටත්ව ගියේය. අසුනෙන් නැගී සිටි හෝම්ස්, දවසේ නිර්මිත නියමිත වැඩ කටයුතු සඳහා සූදානම් විය. ඔහුගෙන් දිස්වූයේ ප්‍රියමනාප රාජකාරියක යෙදීමට සූදානම් වන පුද්ගලයෙකුගේ නොඉවසිල්ලකි.

"වොට්සන් මං කලින් කිව්වා වගේ මුලින්ම යන්න ඕනෑ බ්ලැක්හීත් වලට."

"ඇයි නෝවුඩ් වල අපරාධය සිද්දවුණු තැනට යන්නෙ නැත්තෙ?"

"මොකද දන්නවද? මෙතැන ඇත්තටම සුවිශේෂ සිදුවීම් දෙකක් එක ළඟින්ම සිදුවෙලා තිබෙනවා; එකක් පිටුපස එකක්. පොලීසිය ඔවුන්ගේ සම්පූර්ණ අවධානය යොමු කරන්නේ දෙවැනි සිදුවීමට. ඒ මොකද එතැන තමයි අපරාධයක් සිද්දවුණු බව පැහැදිලිවම පෙනෙන්නේ. නමුත් මට පෙනෙන හැටියට, තර්කානුකූලව අප පටන්ගත යුත්තේ අංක එකෙන්. ඒ තමයි තරුණයාගේ බොහොම කලබලේට සැලසුම් කරපු අන්තිම කැමැති පත්‍රයට සහ එවැන්නක් ලබන්න කිසිසේත් වාසනාවක් නොතිබූ, නමුත් හදිසියේ එවැන්නක උරුමකාරයා වූ පුද්ගලයාගෙන්." හෝම්ස් නැවසුමේ නැඳපැළැඳ ගනිමිනි.

"මමත් එන්නම් ඔබ සමග බ්ලැක්හීත් යන ගමනට?" මම ඇසීමි.

"නෑ මිත්‍රයා. මං හිතන්නේ නෑ මට ඔබේ උදව් අවශ්‍ය වේවි කියල."

"ඔබේ පරෙස්සම කොහොමද හෝම්ස්?"

"නෑ වොට්සන්. මං හිතන්නෙ නෑ, මට අනතුරක් එල්ල විය හැකි, භයානක තත්ත්වයක් තියේවි කියල. එහෙම බිහිසුණු තත්ත්වයකට මුහුණ දෙන්න ඉඩක් තිබෙනවා නම්, ඔබව දාලා තනියෙන් යන්න මං හිතෙකිං වත් හිතනවාද?

අද හැන්දෑවෙම ආපහු එන්න මං බලාපොරොත්තු වෙනවා. ඊට කලින්, මගෙන් ආධාර ඉල්ලාගෙන ආපු මේ අවාසනාවන්ත තරුණයා වෙනුවෙන් යමක් කරන්න හැකිවේවි කියල මං විශ්වාස කරනවා."

http://sherlockholmesinvestigations.blogspot.com

මගේ මිත්‍රයා ආපසු පැමිණෙන විට බොහෝ රෑ වී තිබිණ. ඔහුගේ මුහුණෙන් මට දකින්නට ලැබුණේ, අතිශයින් කැළැඹීමට පත්වූ, බලාපොරොත්තු කඩවූ ලකුණුයි. කම්පනයට පත් තම ස්නායු සන්සුන් කරගැනීමේ අටියෙන් දෝ, හෝම්ස් පැයක් තිස්සේ වයලීනය වාදනය කළේය. ගමනේ තොරතුරු මා සමග කීවේ ඒ සියල්ල අවසන් කළ පසුයි.

"හැම දෙයක්ම සිද්ධ වෙන්නෙ වැරැදි පිළිවෙළට වොට්සන්. මං ලෙස්ට්‍රේඩ්ට මගේ නියම හැඟීම පෙන්නුවේ නෑ. නමුත් ජීවිතේ පළමුවෙනි වතාවට මට හිතෙනවා, මේ පාරේ නම් ලෙස්ට්‍රේඩ් හරි, අපි වැරැදියි කියලා. මගේ හිත නම් දිගින් දිගටම කියන්නෙ මැක්ෆාලේන් නිවැරදි කාරයෙක් කියලා. නමුත් සාක්ෂි හැමදෙයක්ම මතුවෙලා තියෙන්නෙ, ඔහු වැරදි කාරයෙක් ලෙස ඔප්පු වෙන ආකාරයට. බ්‍රිතාන්‍යයේ ජූරි සභාවල් ලෙස්ට්‍රේඩ් ඉදිරිපත් කරන පැහැදිලි සාක්ෂි පිළිගන්නවා මිසක්, මං ඉදිරිපත් කරන උපකල්පනයන් පිළිගන්න තරම් බුද්ධිමත් නෑ."

"ඔබ බ්ලැක්හීත් වලට ගියාද?"

"ඔව් වොට්සන්. මං මැක්ෆාලේන්ලගෙ නිවසට ගියා. තරුණයාගේ පියා ගිහින් තම පුතාව හොයාගෙන. තරුණයාගෙ මව ගෙදර හිටියා. මට බොහොම ඉක්මනටම ඇගෙන් දැනගන්න ලැබුණා ඕල්ඩ්ඒකර් ගැන තොරතුරු."

"මොනවද ඇය කිව්වේ?"

"වයස්ගත මැක්ෆාලේන් මහත්මිය, නිල් පැහැති දෑස් ඇති කරුණාවන්ත කාන්තාවක්. නමුත් අසාධාරණ විධියට පුතා මේකට පැටලීම ගැන ඇය භයවත්, කෝපයටත් පත්වෙලා හිටියේ. තරුණ මැක්ෆාලේන් අතින් මේ අපරාධය සිදුවෙන්න ඇති කියලා ඇය කොහොමටවත් පිළිගන්නෙ නෑ.

ඒ වගේම ඕල්ඩ්ඒකර් මේ විධියට කවුරු හරි අතින් ඝාතනය වීම ගැන ඇය පුදුම වෙන්නෙත් නෑ. ඔහුගේ මරණය ගැන ඇගේ හිතේ කිසි කණගාටුවකුත් නෑ. ඇත්තටම කියනව නම්, මැක්ෆාලේන් මහත්මිය ඕල්ඩ්ඒකර් ගැන මට කිව්ව දේවල් ලෙස්ට්‍රේඩ්ට ඇහුණා නම්, ඇගේ පුතාට විරුද්ධ චෝදනාවෙ ඔහු තවත් හිරවෙනවා. ඇය

http://sherlockholmesinvestigations.blogspot.com

කිව් කරුණු ඇගේ පුතුයා දැනගත්තා නම් ඔහුගේ හිතේ ඕල්ඩ්ඒකර් ගැන ලොකු ක්‍රෝධයක් ඇතිවෙව්.

"හෝම්ස් මහත්මයා. ඕල්ඩ්ඒකර් කියන්නේ කපටිකමේ අන්තයට ගිය, තිරිසන් ගතිගුණ ඇති අධමයෙක්. තරුණ කාලයේ ඉඳන්ම ඔහුගේ ස්වභාවය ඒකයි. තවමත් එහෙමමයි."

මැක්ෆාලේන් මහත්මිය ඔහුව විස්තර කළේ ඒ විධියට.

"ඔබ එහෙනම් ඕල්ඩ්ඒකර් මහත්තයාව තරුණ කාලෙ සිටම හඳුනනවා ඇති?" මං ඇහුවා.

"මං ඔහු ගැන හොඳින් දැනගෙන හිටියා මහත්මයා. ඇත්තම කියනවා නම් තරුණ කාලෙදී ඔහු සමග මගේ ආදර සම්බන්ධයක් තිබුණා. නමුත් දෙවියන්ට පිංසිද්ධවෙන්න මං ඔහුව අත්හැර දැම්මා. ඊළඟට ඔහුට වඩා හොඳ ගොඩක් දුප්පත්, ඒත් ගුණයහපත් මනුස්සයෙක්ව කසාද බැන්දා.

මං ජෝනාස් ඕල්ඩ්ඒකර් සමග විවාහවෙන්න, විවාහ ගිවිසගෙනයි සිටියේ හෝම්ස් මහත්මයා, ඔහු ඉතාම අධම, නීච පුද්ගලයෙක්. කුරුල්ලන් රාශියක් ඇතිකළ විශාල කූඩුවකට ඔහු නපුරු බළලෙක් දැමූ හැටි ගැන මට වරක් අහන්න ලැබුණා. ඔහුගේ කෲර ස්වභාවය ගැන මං කොයිතරම් අයට පත්වුණාද කිව්වොත්, ඔහු සමග තිබුණු සම්බන්ධතාවය මං සම්පූර්ණයෙන්ම අත්හැර දැම්මා. දැන් බලන්න මෙන්න මේක."

මැක්ෆාලේන් මහත්මිය ලාච්චුවක් විවෘත කොට, එහි තිබුණු ඡායාරූපයක් ඉවතට ගෙන මට පෙන්නුවා. ඒක කාන්තාවකගේ ඡායාරූපයක්. කිසිවකු ඒක පිහියකින් කපා, කොටා, මුහුණ විරූපී වෙන විධියට සමහර තැන් කපා, උල්පප්පා දමා තිබුණා.

"මේ මගේ ඡායාරූපය හෝම්ස් මහත්මයා. මෙන්න මේ විධියට ඒක කපා, කොටා, විකෘති කරලා, මට ඒක එවල තිබුණේ මගේ විවාහ මංගල්‍යය දවසේ උදේ."

"කොහොම වුණත් ඔහු දැන් ඒ තරහ සම්පූර්ණයෙන්ම අමතක කරල දාමල ඇති. ඔහු සතු සම්පූර්ණ දේපොළම ඕල්ඩ්ඒකර් ඔබේ පුතාගේ නමට ලියල තියෙන්නේ."

"මටවත් මගේ පුතාටවත් ජෝනාස් ඕල්ඩ්ඒකර්ගෙන් තඹ කාසියක දෙයක් එපා එපාමයි. ඔහු පණ පිටින් හෝ මැරිල හෝ

http://sherlockholmesinvestigations.blogspot.com



188 "මේ මගේ භාර්යාවයි හෝම්ස් මහත්මයා"

Reading Purpose Only Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

කිසිම දෙයක් අපට එපා. දෙවියන් වහන්සේට මේ හැම දෙයක්ම පෙනෙනවා හෝම්ස් මහත්මයා. කුරිරු අධම පුද්ගලයාට උන්වහන්සේ දඬුවම් කළා වගේම, ඕල්ඩ්එක්කර්ගේ ලේ මගේ පුතාගේ අත්වල ගෑවිලා නැති බව උන්වහන්සේ ලෝකයට පෙන්වා දේවි." ඇය කිව්වා.

ඉතින් වොට්සන් ඊළඟට මම ගියා නෝවුඩ් වලට. ඕල්ඩ්එක්කර්ගෙ ඩීප්ඩීන් මන්දිරය, ලොකු ගෙවත්තක් මැද්දෙ තිබෙන, ලොකු නවීන පන්නයේ බංගලාවක්. නිවස ඉදිරිපිට ලස්සන මල්වැල් වලින් අලංකාර කරල තියෙනවා. මේ මගේ සටහන් පොතේ තිබෙන්නේ, ගෙවත්තේ හා නිවසේ දළ සටහන. ගෙයින් දකුණු පැත්තට වෙන්න, ඒ වගේම පාරේ ඉඳන් තරමක් දුරින් තමයි අර ලී මඩුව තියෙන්නේ. ගින්න ඇතිවෙලා තිබෙන්නෙ එතැනයි. වම්පැත්තෙ තිබෙන ජනේලය තමා ඕල්ඩ්එක්කර්ගෙ කාමරේ ජනේලය. පාරේ ඉඳගෙන බැලුවාම, මේ ජනේලය හරහා කාමරය ඇතුළත බලන්න පුළුවනි. මට අද සොයාගැනීමට හැකිවුණු එකම සැනසිලිදායක කරුණ ඒකයි.

ලෙස්ට්‍රේඩ් අද නෝවුඩ් වලට ගිහිං හිටියෙ නෑ. නමුත් ඔහුගේ ප්‍රධාන කොස්තාපල්වරයා, පරීක්ෂණයේ ඉතිරි කොටස පවත්වලා. ඔවුනට මහා නිධානයක් වගේ වටිනා සාක්ෂි රැසක් මතුවෙලා.

උදේ වරුවෙම ඔවුන් කරලා තියෙන්නෙ, ලී මඩුවේ දැවීගිය තැන සුන්බුන් සියුම් ලෙස පරීක්ෂා කිරීමයි. ලී අඟුරු හා අළු අතරේ තිබිලා මුලින් ඔවුනට හමුවුණේ, දැවීගිය මනුෂ්‍ය හෝ සත්ත්ව ශරීරයක සුන්බුන් ටිකක්. ඊට අමතරව අද දුර්වර්ණ වූ කවාකාර ලෝහ කැබලි කිහිපයක් හමුවෙලා තිබෙනවා. මං ඒවා හොඳින් පරීක්ෂා කරල බැලුවා. කිසිම සැකයක් නෑ, ඒ කලිසමක බොත්තම්. එයින් එක බොත්තමක 'හයාම්ස්' කියන නම සඳහන් කර තිබෙන බව මට හඳුනා ගැනීමට හැකිවුණා. ඔවුන් තමා ඕල්ඩ්එක්කර්ගෙ ඇඳුම් මහන්නේ.

ඊළඟට මම ගෙදර මිදුල සහ උද්‍යානය පරීක්ෂා කරල බැලුවා. පහුගිය දවස්වල තිබුණු නියඟෙන්, පොළොව යකඩ තහඩුවක් වගේ වියළිලා. අඩි සටහන් කිසිවක් නෑ. යම්කිසි පොදියක් හෝ සිරුරක් ලී ගොඩ දිහාට ඇදගෙන ගිය බවට ඇතිවී තිබුණු සලකුණු හැරෙන්න, වෙන කිසිදෙයක් නෑ. මං පැයක් පමණ මහන්සි වෙලා, හැම්තැනක්ම දැඩි පරීක්ෂාවට ලක් කළා. ඒත් කිසිදෙයක් හොයාගන්න බැරිවුණා.

ඊට පස්සෙ මම නිදන කාමරයට ගිහිං, එය ඇතුළත පරීක්ෂා කළා. ඔය කියන ලේ පැල්ලම් තිබුණෙ, බොහොම පුංචි වගයෙන්,

http://sherlockholmesinvestigations.blogspot.com

යන්තමින් ලේ තැවරීම කියල කියන්න පුළුවනි. නමුත් ඒවා අලුත් ලේ පැල්ලම් බව නම් ඇත්තයි. සැරයටියෙත් ලේ තිබුණේ ඉතාම ස්වල්ප වශයෙන්. සැරයටිය අයත් මැක්ෆාලේන්ට බව ඔහු පිළිගන්නවා. බුමුතුරුණ මත වැදී ඇති පා සටහන් මම පරීක්ෂා කර බැලුවා. එහි තිබුණේ ඕල්ඩ්ඒකර්ගේ හා මැක්ෆාලේන් තරුණයාගේ පා සටහන් පමණයි. ඒකත් ලෙස්ට්‍රේඩ්ලාගේ පැත්තට ලකුණක්. ඔවුනට දිගින් දිගටම ලකුණු වැටෙද්දී, අපට පක්ෂව කිසිදෙයක් ලැබුණේ නෑ.

යන්තමින් හෝ බලාපොරොත්තුවක් ඇතිකර ගත හැකි එකම දෙයයි හමුවුණේ. ඒකත් ඒ හැටි වැදගත් කියන්න බැහැ. යකඩ සේප්පුවේ තිබුණු හා එයින් එළියට ගනිපු ලියවිලි මට පරීක්ෂා කරන්න ලැබුණා. ඒ ලියවිලි හැම එකක්ම වගේ කවර ඇතුළට දමලා ලාකඩවලින් මුද්‍රා තබලයි තිබුණේ. පොලිසිය එයින් එකක් දෙකක් විවෘත කරල තිබුණා. මට පෙනුණු හැටියට ඒවා ඒ තරම් විශාල වටිනාකමක් තිබුණු ඒවා නෙමෙයි. ඕල්ඩ්ඒකර්ගෙ බැංකු ගිනුම් පොතේ වත් ඔය කියන තරම් මහ විශාල ධනයක් තැන්පත් බවක් සඳහන්ව නැහැ.

කොහොම වුණත් ඔක්කොම ලියකියවිලි නම් එතැන නොතිබුණු බව මට වැටහුණා. සමහර වටිනා දේපළ ඔප්පු ගැන සඳහන් කර තිබූ කඩදාසි මට හමුවුණා. ඒත් එම ඔප්පු කිසිවක් තිබුණේ නැහැ. ඒවා මැක්ෆාලේන් හොරකම් කරගෙන ගියා කියල හිතන්න පුළුවන්ද? නමුන්ට බොහොම ඉක්මනට නීතියෙන්ම උරුම වෙන්න තිබෙන දෙයක් හොරකම් කිරීමට මොන මිනිහද පෙළඹෙන්නෙ? අපට මෙන්න මේ කාරණය ඔප්පු කරගන්න පුළුවන් නම් ඒක ලෙස්ට්‍රේඩ්ලට අවාසිදෙන එකක්.

වෙන මොකුත්ම මට හොයාගන්න බැරිවුණාම මං ගෘහපාලිකාව එක්ක කථා කරල බැලුවා. ඇය ලෙක්සිංටන් මහත්මිය. මිටි, බොහොම නිශ්ශබ්ද කාන්තාවක්. මා දිහා බැලුවෙත්, කථා කළෙත් බොහොම සැකයෙන් වගේ. ඇයට උවමනාවක් තිබුණා නම්, අපට හෙළිකළ යුතු කරුණු බොහොමයක් ඇය දන්නා බව මට වැටහුණා. ඒක මට හොඳටම විශ්වාසයි. නමුත් ඈ කිසිදෙයක් කියන්නේ නෑ. ඉටිරූපයක් වගේ නිහඬවම ඉන්නවා.

"ලෙක්සිංටන් මහත්මිය ඔබද, මැක්ෆාලේන් මහත්මයාව දොර විවෘත කරල ඇතුළට ගත්තෙ?" මං ඇහුවා.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව් මහත්මයා. හරියට රෑ නවයහමාරටයි ඒ. ඔහු වෙනුවෙන් දොර අරින්න කලින් මගේ ඇත් පණනැති වුණා නම්, කොයිතරම් එකක්ද දෙවියනේ!"

"ඔබ නිදාගන්න ගියේ කොයි වෙලාවෙද?"

"රෑ දහයහමාරට විතර."

"මේ ඕල්ඩ්ඒකර් මහත්මයාගෙ කාමරයෙන්, මොනවද ඔබේ කාමරයට ඇහුණු ශබ්ද?"

"මට කිසිම ශබ්දයක් ඇහුණේ නැහැ මහත්මයා. මගේ කාමරය තිබෙන්නේ ගෙයි අනෙක් පැත්තේ කෙළවරේ."

"මැක්ෆාලේන් ඔහුගේ ස්ලෑසට්ටිය දමා ගිය බව ඔබ දුටුවේ කොහොමද?"

"ඔහු තොප්පිය සහ සැරයටියත් ඉස්තෝප්පුවේ දාලා ගිහින් තිබුණා."

"මෙවැනි විපතක් සිදුවී ඇතිබව ඔබ දැනගත්තේ කොයි වෙලාවෙද?"

"ගින්නක් ගින්නක්! කියල කවුදෝ කෑගහන කොටයි මට ඇහැරුණේ. අනේ දෙවියනේ! අපේ අහිංසක මහත්තයාව මරා දමලා!"

ඇය හඬන්න පටන් ගත්තා.

"ඕල්ඩ්ඒකර් මහත්මයාට තරහකාරයෝ එහෙම හිටියද?"

"තරහකාරයෝ නැත්තෙ-කාටද මහත්මයා? ඒ වුණත් අපේ මහත්මයා තමන්ගේ පාඩුවේම හිටියා මිසක්, අනෙක් අය එක්ක ආශ්‍රයකට ගියේ නෑ. ව්‍යාපාර.සම්බන්ධයෙන් මිනිස්සු එක්ක කතාබහ කළා මිසක් ආශ්‍රයකට ගියේ-නෑ."

"පොලිස් නිලධරයන්ට ලී ගොඩේ අළු අතරේ තිබිල හමුවුණු බොත්තම් ගැන ඔබට මොනවද කියන්න තියෙන්නෙ?"

"ඒකෙ කිසිම සැකයක් නෑ. අපේ මහත්මයා රෑට අඳින ඇඳුම්වල බොත්තම් ඒ."

"ඔබට යන්තම්වත් ශබ්දයක් ඇහෙන්නේ නැතුව, ලී ගොඩ සම්පූර්ණයෙන්ම ගිනි ඇවිළුණේ කොහොමද?"

"ලී දඬු ඔක්කොම හොඳටම වියළී ගිහින් තිබුණේ. අපට මාස ගණනකින් වැස්සක් තිබුණේ නෑ මහත්මයා. වේළුණු පිදුරු ගොඩක්

http://sherlockholmesinvestigations.blogspot.com

වගේ ඔක්කොම ගිනිගත්තා. මං එතැනට යනකොට කිසිදෙයක් පෙනුණෙ නෑ. එකම ගිනි ජාලාවක් විතරයි මං දුටුවේ."

"ඔබේ මහත්මයත් ගින්නට අහුවුණා කියල ඔබ කොහොමද දැනගත්තේ?"

"ගිනි ඇවිළුණු තැනින් මස් පිළිස්සෙන පුළුටු ගඳක් ආවා. ගිනිනිවන හමුදාවෙ අයට තමයි ඒ ගඳ මුලින්ම ආවෙ. පස්සේ මටත් දැනුණා."

"ඕල්ඩකර් මහත්මයා අන්තිම කැමැති පත්‍රයක් ලිවීම ගැන, ඔහුගේ යකඩ සේප්පුවේ තිබුණු ඔප්පු ආදිය ගැන, ඔබට මොනවද කියන්න පුළුවන්?"

"ඒ ලියවිලි ගැන නම් මං මොකුත් දන්නෙ නෑ මහත්මයා. ඔහුගේ පෞද්ගලික දේවල් ගැන මට කිසිදෙයක් කියලත් නෑ. මං අහන්න ගියෙත් නෑ." ඇය කතාව අවසන් කළා.

ඔන්න වොට්සන් ඔගේ පරීක්ෂණයේ අසාර්ථකත්වය පිළිබඳ වාර්තාව. ඒ වුණත් . . . ඒ වුණත්," හෝම්ස් එහුමග් දෑත් මිට මෙළවීමට පටන් ගත්තේ, යමක් කිරීමට තමා තුළ ඇති දැඩි අධිෂ්ඨානය පෙන්නුම් කරමිනි.

"මං දන්නවා මෙතැන මොකක් හෝ වැරැද්දක් සිදුවෙලා තිබෙනවා. මට ඒක හොඳටම විශ්වාසයි. මගේ මොළේට ඒක හොඳටම දැනෙනවා. මොකක් හරි වැදගත් කාරණයක් එළියට ආවෙ නැහැ. අර ගෘහපාලිකාව; ඒ ගැනි ඒක හොඳටම දන්නවා. ඇගේ දෑස්වල තිබුණා හොර බැල්මක්. ඒකෙන් තේරෙන්නෙ මොකක් හරි වැරදි වැඩක් ගැන ඇය දන්නවා. නමුත් හෙළිකරන්නෙ නැහැ කියන එකයි. නමුත් දැන් ඉතින් ඒ ගැන කථාකිරීම වැඩක් නෑ. අපේ වාසනාවට මොකක් හරි පොටක් පෑදුණේ නැත්නම්, මේක එකතුවෙන්නෙ අපේ අසාර්ථක වූ පරීක්ෂණ ගොඩට."

"මැක්ෆාලේන් තරුණයාගේ අහිංසක පෙනුම නිසා ජූරියෙන් යම් සහනයක් ලැබෙයිද?"

"ඒක මහා අන්තරායදායක තර්කයක් වොට්සන්. ඔබට මතකද 87 අවුරුද්දෙ, ඔහුව බේරාදෙන්න කියල අප ළඟට ආව බර්ට් ස්පෙන්ස්? ඉරිදාට පල්ලියේ දහම් පාසලේ, ආගම ධර්මය උගන්වන

http://sherlockholmesinvestigations.blogspot.com

අහිංසක තරුණයා; නමුත් ඒ වගේ දරුණු මිනීමරුවෙක් අපට කවදාවත් හමුවුණාද?"

"ඒක හැබෑව."

"මේ ගැටලුවට වෙනත් විකල්ප විසඳුමක් අප හොයා නොගත්තොත්, මේ තරුණයා ඉවරයි. ඔහුට විරුද්ධව ඉදිරිපත් වෙන සාක්ෂි වල කිසිම අඩුපාඩුවක් පළුද්දක් නෑ. පරීක්ෂණය ඉදිරියට ගෙන යද්දී, ඒවා තවත් ශක්තිමත් වෙන බව නිසැකයි.

ආ . . . . ඒක නෙමෙ වොට්සන්. තවත් පොඩි කාරණාවක් මං හොයාගත්තා. අපේ ඉදිරි පරීක්ෂණය අරඹන්න සුදුසු තැනක්. මං ඕල්ඩ්ඒකර්ගේ බැංකු ගිනුම ගැන සඳහන් පොත් පරීක්ෂා කළා. ගිනුමෙ ඉතුරු වෙලා තියෙන්නෙ සුළු මුදලයි. ඒකට හේතුව, මේ පහුගිය අවුරුද්ද මුළුල්ලේම ඔහු කොර්නේලියස් නම් මහත්මයෙකුට විශාල වශයෙන් මුදල් ගෙවල තියෙනවා. ඉදිකිරීම් ක්ෂෙත්‍රයෙන් විශ්‍රාම ගනිපු ඕල්ඩ්ඒකර්, කොර්නේලියස් නම් පුද්ගලයාට විශාල ගණන්වල චෙක් ලියුවෙ ඇයි කියල, අපි හොයාගන්න ඕන. කවුද මේ කොර්නේලියස්? ඔහු සමහරවිට තැරැව්කාරයෙක් වෙන්නත් පුළුවනි. නමුත් කුමකටද ඔහුට මුදල් ගෙව්වේ? ඒ අයුරින් විශාල වශයෙන් මුදල් ගෙවන්න හේතුවුණු කරුණු, ඔහුගේ ගනුදෙනු සටහන් වලින් හෝ අනෙක් ලියවිලි වලින් මට හොයාගන්න බැරිවුණා. අනෙක් හැමදෙයක්ම අසාර්ථක වුණත්, මං බැංකුවට ගිහිං හොයන්න ඕන, මේ චෙක්පත් මාරුකර ගනිපු කොර්නේලියස් මහත්මයා කවුද කියලා. ඒ වුණත් මගේ හිතේ ලොකු සැකයක් තියෙනවා වොට්සන්; මේ ගැටලුව අවසන් වෙන්නෙ ලෙස්ට්‍රේඩ් අපේ අනුග්‍රාහකයාව එල්ලුම් ගස් යැවීමෙන්. ඒක ස්කොට්ලන්ඩ්යාඩ් එකට ලොකු ජයග්‍රහණයක් වේවි.

එදින රාත්‍රියේ ෂර්ලොක් හෝම්ස්ට කොහොමම් හොඳින් නින්ද ගියාදයි මම නොදනිමි. එහෙත් පසුදා උදෑසන, ඔහු සුදුමැලි වී බලවත් කලකිරීමකට පත්ව සිටි අයුරු මට දකින්නට ලැබිණි. මා උදේ ආහාරය සඳහා පැමිණි විට, ඔහුගේ දෑස් වටා අඳුරු පැහැ ගැන්වී තිබුණු අතර, පුවත්පත් කිහිපයකම අලුයම මුද්‍රණ බිමුතුරුණ මත වැටී තිබිණි. විවෘත කළ විදුලි පණිවුඩයක් මේසය මත විය.

"මෙන්න බලන්න වොට්සන්." ඔහු විදුලි පණිවුඩය මා වෙතට විසි කළේය. එය නෝවුඩ් සිට එවන ලද්දක් බව මම දුටුවෙමි.

http://sherlockholmesinvestigations.blogspot.com

*"අලුත්, ඉතා වැදගත් සාක්ෂියක් අපට ලැබුණා. මැක්ෆාලේන් අපරාධකරු බව ස්ථිරයි. ඔබේ පරීක්ෂණය අත්හැර දමන්න.*

*ලෙස්ට්‍රේඩ්."*

"මේ කියන හැටියට තත්ත්වය බොහොම බරපතලයි වගේ." මම කීවෙමි.

"ඒ තමයි ලෙස්ට්‍රේඩ් ඔහුගේ ජයග්‍රහණයේ ගීතය ගායනා කරන හැටි. ඒ වුණත් පරීක්ෂණය අත්හැර දමන්න වුවමනාවක් නෑ. ඒ වැඩේට තව කල් තියෙනවා.

අලුතෙන් හමුවුණු, ඒ ඇගේ ලාක්ෂි කියන ඒවා දෙපැත්ත කැපෙන ආයුධ වගෙයි වොට්සන්. ඔය ලෙස්ට්‍රේඩ් හිතන දිශාවකට වඩා වෙනත් දිශාවකටත් කැපුම් පහර ගමන් කරන්න පුළුවනි. ඉක්මන් කරල ඔබේ කෑම කන්න. අපි දෙන්නම ගිහිං බලමු මොනවද අපට කරන්න පුළුවන් කියලා. මට හිතෙනවා අද නම් මට ඔබේ සහයෝගය අවශ්‍යමයි කියලා."

මගේ මිත්‍රයා උදේ ආහාරය ගැනීමෙන් වැළැකී සිටියේය. ඔහුගේ මෙම අපූර්ව ගති පැවතුම් ගැන මම දැන සිටියෙමි. රහස් පරීක්ෂණයක උච්ඡම අවස්ථාවට පැමිණි කල ඔහු ආහාර ප්‍රතික්ෂේප කළේය. තම ශරීරයේ සැඟවී තිබුණු ආත්ම ශක්තිය ගැන හෝම්ස් දැඩි විශ්වාසයක් තැබුවේය. ශරීරයට ආහාර නොලැබීම නිසා, ක්ලාන්ත වී බිම ඇද වැටෙන තුරුම ඔහු කිසිවක් ආහාරයට ගත්තේ නැත.

මගේ වෛද්‍ය විද්‍යාත්මක තර්ක ඉදිරිපත් කරමින් මම කිහිප වාරයක්ම මෙයට විරෝධය පළ කළෙමි. එහෙත් ඒ සෑමවිටකම ඔහු පැවසුවේ,

"මගේ මොළය හා ස්නායු වේගයෙන් ක්‍රියාකරවීම සඳහා රුධිරය අවශ්‍යයි. කෑම දිරවීම සහ අවශෝෂණය සඳහා රුධිරයෙන් කොටසක් යවන්න මට පුළුවන් කමක් නෑ." මෙම උදෑසන ද ඔහුගේ උදේ කෑම පිඟානට අතවත් නොතැබීම ගැන මම පුදුමයට පත් නොවීමි.

අප නෝවුඩ්හි ඩීප්ඩීන් මන්දිරය වෙත ළඟාවෙද්දී මිනීමැරුමේ සුලමුල දැනගැනීමේ රිසියෙන් අසල්වාසීහු කිහිප දෙනෙක් ගේට්ටුව අසල රැස්වී සිටියහ. ලෙස්ට්‍රේඩ් අප ඉදිරියට ආවේ ජයග්‍රාහී ලීලාවෙනි.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඉතින් හෝම්ස් මහත්මයා, ඔබට හැකිවුණාද අප වැරැදියි කියල ඔප්පු කරන්න? කෝ අර ඔබ හොයමින් සිටි රස්තියාදුකාර මැරවරයා, තක්කඩියා හම්බවුණාද?"

"මං මොකක්වත් අවසන් තීරණයකට ඇවිත් නෑ." හෝම්ස් පිළිතුරු දුන්නේය.

"ඒ වුණාට අපි නම් ඊයෙම අවසන් තීරණයකට ආවා. ඒ තීරණය නිවැරදි බව ඔප්පුවෙන සාක්ෂි ඔන්න අඳත් හමුවෙලා තියෙනවා. මේ සැරේ නම් අප ඔබට වඩා සැඟහන්න ඉදිරියෙන් කියලා, පිළිගන්න සිද්ධවෙනවා නේද හෝම්ස් මහත්මයා?"

"ලෙස්ට්‍රේඩ්, ඔබ මොනවා හරි සුවිශේෂ හොයාගැනීමක් කරල වගෙයි, මේ තරම් සන්තෝෂයෙන් කථා කරන්නේ?"

ලෙස්ට්‍රේඩ් මහ හඬින් සිනාසුණේය.

"අප වගේම තමයි ඔබත්. පරාජය වුණාම ඒක භාරගන්න කැමති නෑ. කොයි මිනිහට වුණත් හැමදාමත් දිනන්න බෑ; එහෙම නේද වොට්සන් මහත්මයා?

කරුණාකරල මේ පැත්තෙන් මා සමග එන්න මහත්වරුනි. මං ඔබට පෙන්වන්නම්, අපරාධකාරයා ජෝන් මැක්ෆාලේන් බවට මට සහතික වෙන්න පුළුවන් බව."

ඔහු බරාඳය මැදින් අපව කැඳවාගෙන ගියේ අඳුරු ඉස්තෝප්පුව දෙසටයි.

"අපරාධය කළායින් පස්සෙ, මැක්ෆාලේන් තමන්ගේ හිස්වැස්ම ගන්න එන්න ඇත්තේ මෙතැනට. ඔන්න බලන්න . . . . මේ!" ඔහු එක්වරම ගිනිකූරක් දල්වූයේ ප්‍රේක්ෂකයන් මවිතයට පත් කිරීමට තැත්කරන ඉන්ද්‍රජාලිකයකු මෙනි.

ගිනිකූරේ ආලෝකයෙන් සුදුහුණු ගෑ බිත්තියේ තිබූ ලේ සලකුණක් අපට පැහැදිලිව දැකගත හැකි විය. ලෙස්ට්‍රේඩ් තම දල්වෙන ගිනිකූර එයට තවත් ළං කළේය. එය ලේ සලකුණක් පමණක් නොව ලේ තැවරුණු මහපටැඟිල්ලක සලකුණක් බව අපි දුටුවෙමු!

"ඔබේ අර කුඩා දේ විශාල කරල බලන කාචය අරගෙන මේකත් බලන්න හෝම්ස් මහත්මයා."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව්. මම ඒකෙන් බලන්න තමයි මේ සූදානම් වෙන්නෙ." හෝම්ස් පිළිතුරු දුන්නේය.

"ඔබ අහල ඇති දෙදෙනෙක්ගෙ ඇඟිලි සලකුණු එක සමාන නැති බව?"

"ඔව් මම අහල තියෙනවා."

"හොඳයි එහෙම නම්, මෙයාගෙ ළඟ තිබෙන ඇඟිලි සලකුණු සටහන එක්ක, ඕක සංසන්දනය කරල බලන්න. මේක මැක්ෆාලේන්ගෙ ඇඟිලි සලකුණු සටහන. අද උදේ රත්කළ ඉටි මතට ලබාගත්තා මගේ නියමයෙන්."

ඉටි මතට ගෙන තිබූ සලකුණ, බිත්තියේ වූ ලේ සලකුණට ළංකොට, ආලෝකය හොඳින් දල්වා, යළි යළිත් පරීක්ෂා කරන ලදී. සලකුණු දෙකම එකම ඇඟිල්ලෙන් ඇතිවූ සටහන් බව උත්තල කාචය නොමැතිව වුවද පැහැදිලිව දැකගත හැකි විය. අපේ අවාසනාවන්ත අනුග්‍රාහකයාගේ අවසානය එය බව මම වටහා ගතිමි.

"ඔන්න ඒකෙන් අවසන් තීන්දුව ලැබුණා." ලෙස්ට්‍රේඩ් කීවේ ජයග්‍රාහී හඬෙනි.

"ඔව් ඒකෙන් ඔක්කොම තීන්දුයි."

හෝම්ස් පැවසීය. ඔහු එසේ කියද්දී කටහඬේ ස්වරය යන්තමින් වෙනස් වූ අයුරු මගේ කනට හඳුනා ගැනීමට හැකිවිය. මම ආපසු හැරී හෝම්ස් දෙස බැලීමි. ඔහුගේ මුහුණෙන් දිස්වූයේ පාලනය කරගැනීමට ඔහු දැඩි උත්සාහයක් දැරූ අප්‍රමාණ සතුටකි. මගේ මිත්‍රයාගේ දැස් බබළන්නට පටන් ගත්තේ තාරකා විලසින් යයි මට සිතිණ.

"අනේ දෙවියනේ! මේ වගේ දෙයක් හිතාගන්න කාටද පුළුවන්? අර ඉලන්දාරියා බැලූ බැල්මට කොයිතරම් අහිංසකයෙක් වගේද පෙනෙන්නෙ. මතුපිටින් පෙනෙන පළියටම කාරණයක් විශ්වාසයට ගන්න එපා කියල, ඒකෙන් අපට හොඳ පාඩමක් උගන්වනවා. හොඳයි නැද්ද ලෙස්ට්‍රේඩ්?"

ඔව් ඔව්. අපේ සමහර මිනිස්සු ටිකක් දැනගත්තාම හිතනවා, ඔක්කොම දන්නවා, අන්තයටම දන්නවා කියල."

උඩගු ලීලාවෙන් ලෙස්ට්‍රේඩ් දුන් පිළිතුරේ ගැබ්ව තිබුණේ තියුණු උපහාසයකි. එහෙත් අපට ඊට කළ හැක්කක් නොවීය.

http://sherlockholmesinvestigations.blogspot.com



197 එය, ලේ තැවරුණු මහපට්ඇඟිල්ලක සලකුණක් බව අපි දුටුවෙමු.

http://sherlockholmesinvestigations.blogspot.com

"බලන්න ලෙස්ට්‍රේඩ්, මැක්ෆාලේන්-ඉලන්දාරියා, රාක්කයේ තිබුණු තොප්පිය ගන්න ගිහිං, ලේ ගෑවුණු මහපටැඟිල්ල බිත්තියට වද්දපු එක හරියට දේව හාස්කමකින් වුණු දෙයක් වගෙයි! හොඳයි නැද්ද? ඒ ගැන හිතන කොටයි අපට තේරෙන්නෙ. මොන තරම් ස්වාභාවිකව සිදුවුණු ක්‍රියාවක්ද?"

හෝම්ස් පැවසුවේය. පිටතින් ඔහුගේ ශාන්ත දාන්ත බවක් පෙනුණත්, හිත ඇතුළෙන් නම් තිබුණේ නොඉවසිලිවන්ත බවක් බව මම නිරීක්ෂණය කළෙමි.

"ඒක තමෙයි ලෙස්ට්‍රේඩ්. වටිනාකම කියල නිමකරන්න බැරි, මේ සොයාගැනීම කළේ කවුද?"

"ගෘහපාලිකාව තමයි එය දැකල තියෙන්නෙ. රාත්‍රී මුර සේවයට හිටි පොලිස් භටයට ඇය එය පෙන්වලා දුන්නා."

"ඇයි පොලිස් භටයා කොහේද ඒ වෙලාවෙ හිටියෙ?"

"ඔහු අපරාධය සිදුවුණු කාමරය ඇතුළත මුරකළා. ඇතුළත තිබු දේවල් කාටවත් එහෙ මෙහෙ කරන්න බැරි වෙන්නයි ඔහු මුර කළේ?"

"මේ ලේ සලකුණ ඇයි පොලිසිය ඊයෙ දක්කෙ නැත්තෙ?"

"ඉස්තෝප්පුව සියුම් පරීක්ෂණයකට ලක්කරන්න තරම් විශේෂ හේතුවක් අපට තිබුණෙ නෑ. ඒ ඇරත් ඔබට පෙනෙන්නෙ නැද්ද, මෙතැන මහ අඳුරු තැනක් නේ."

"ඒක හැබෑව. මං හිතන්නෙත් කිසිම සැකයක් නැතුව පෙරේදා රෑ ඉඳලම මේ ලේ සලකුණ මෙතැන මේ විදියට තියෙන්න ඇති . . . .?"

ලෙස්ට්‍රේඩ් හෝම්ස් දෙස හෙළුවේ, "ඔහේට පිස්සුද?" යන ආකාරයේ බැල්මකි.

හෝම්ස් එම ප්‍රශ්නයෙන් අදහස් කළේ කුමක්ද යන්න ඇත්තෙන්ම මට ද තේරුම් ගැනීමට නොහැකි විය. ලෙස්ට්‍රේඩ්ගේ සිතේ ඇතිවූ දැඩි කෝෂය ඔහුට තවදුරටත් ඉවසාගැනීමට නොහැකි වූ බව, ඔහුගේ උපහාසාත්මක කියමනෙන් මම තේරුම් ගතිමි.

"මං දන්නෙ නෑ හෝම්ස් මහත්මයා; සමහර විට මැක්ෆාලේන් ඊයේ මහ රෑ හිරෙන් පැනල ආවද දන්නෙ නෑ, මෙතැන ලේ සලකුණක් තියල යන්න, ඔහුට විරුද්ධව සාක්ෂි තවත් ශක්තිමත් කරන්න. මං ලෑහැස්තියි ලෝකෙ ඕනෑම ඇඟිලි සලකුණු විශේෂඥයෙකුට මෙතැනට

http://sherlockholmesinvestigations.blogspot.com

ඇවිත් මෙ ඇඟිලි සටහන් පරීක්ෂා කරලා බලන්න කියන්න. මේක මැක්ෆාලේන්ගේ මහපටැඟිල්ලේ සලකුණද, නැද්ද කියලා."

"කිසිම සැකයක් නෑ, මේක ඔහුගේ මහපටැඟිල්ලේ සලකුණක් තමා."

"ඔය කියන්නේ. ඒ මදැයි?" ලෙස්ට්‍රේඩ් වහා පිළිතුරු දුන්නේය.

"මං බොහොම ප්‍රායෝගික විධියට වැඩ කරන කෙනෙක් හෝම්ස් මහත්මයා. පැහැදිලි සාක්ෂි තියෙනවා නම් මං වහාම නිගමනයකට එනවා. දැන් ඉතින් මං මගේ වාර්තාව ලියන්න ඕන. ඔබට තවත් කිවයුතු දෙයක් තියෙනවා නම්, එන්න අර විසිත්ත කාමරයේ මේසය ළඟට." පැවසූ ලෙස්ට්‍රේඩ් තම රාජකාරිය සඳහා එතැනට ගියේය.

"ඇත්ත වශයෙන්ම මේක හරිම කණගාටුදායක සොයාගැනීමක් නේද වොට්සන්? එහෙම වුණත් අපේ අනුග්‍රාහකයා ගැන බලාපොරොත්තු තබාගත හැකි, සුවිශේෂ කරුණක් දෙකක් මෙහි නැත්තෙත් නෑ."

"ඒක අහන්නත් සන්තෝෂයි. මං හිතුවේ මැක්ෆාලේන්ගෙ අවසානය තීන්දුවුණා කියල." මම කීවෙමි.

"එහෙම තීන්දුවත් දෙන්න මම නම් ඉක්මන් වෙන්නෙ නෑ වොට්සන්. ප්‍රශ්නය තියෙන්නේ, බොහොම වැදගත් සාක්ෂියක් කියලා අපේ මිත්‍රයා හඳුන්වන මේ ලේ සලකුණේ, ලොකු අඩුපාඩුවක් තියෙනවා!"

"හැබෑට? ඒ මොකක්ද?"

"මෙන්න මේකයි. ඊයෙ මං මේ ඉස්තෝප්පුව හොඳින් පරීක්ෂාවට භාජනය කළා. එතකොට ඔය ලේ සලකුණ තිබුණේ නෑ. අපි ටිකක් එළියට බැහැලා ඉර අව්ව වැටෙන පැත්තට ගිහිං එමු වොට්සන්."

කිසිම දෙයක් තේරුම් ගැනීමට නොහැකි අයුරින් මගේ මොළය අවුල් වී ඇත. කෙසේ වුවද යළිත් යම්කිසි බලාපොරොත්තු ඇතිකර ගත හැකි අයුරක් පෙනී යයි. නිවස වටා තිබුණු ගෙළයනේ සිරි නරඹමින්, අපි ඇවිද ගියෙමු.

ඕල්ඩේකර්ගේ නිවස සෑහෙන තරම් විශාල මන්දිරයකි. මේ නිවස දෙස හෝම්ස් සෑම දිගාවක සිටම බලාසිටියේ දැඩි

http://sherlockholmesinvestigations.blogspot.com

අවධානයකිනි. ඉන්පසු නිවසට ඇතුළු වූ ඔහු, ගොඩනැගිල්ලේ බිම් මහලේ සිට උඩම තට්ටුවට ඉහළින් පිහිටි සොල්දරය දක්වා සෑම අස්සක් මුල්ලක් නෑරම පරීක්ෂා කර බැලුවේය. සමහර කාමරවල කිසිදු ලී බඩුවක් නොතිබිණි. එහෙත් හෝම්ස් එය නොතකා, සෑම තැනක්ම තියුණු ලෙස පරීක්ෂාවට ලක් කළේය. අවසන් වශයෙන් ඔහු ගමන් කළේ ඉහළ මාලයේ දිගු බරාඳය දෙසටයි. එය වැටී තිබුණේ කිසිවකු ලැගුම් නොගත් හිස් නිදන් කාමර තුනක් ඉදිරියෙනි. යළින් ඔහු සතුටින් ඉපිලී යන ආකාරය මම දුටුවෙමි.

"අපට මීට කලින් කිසිම පරීක්ෂණයක දකින්න ලැබුණෙ නැති, ඉතාම සුවිශේෂ ලක්ෂණ මේ පරීක්ෂණයේ තිබෙනවා වොට්සන්. ලෙස්ට්‍රේඩ් මෙච්චර වේලා අපට හිනාවුණු බව ඇත්තයි. ඒ වුණත් දැන් ඉතින් අපි හොයාගනිපු සත්‍ය තත්ත්වය මිනිහට හෙළිකළොත් හොඳයි කියලයි මට හිතෙන්නෙ. මං මේ ගැටලුව තේරුම් අරගෙන විසඳන හැටි නිවැරදි නම්, අපටත් පුළුවන් වෙවී ලෙස්ට්‍රේඩ්ට හිනාවෙන්න. අප මේ ප්‍රශ්නය විසඳීම අරඹන්න ඕන හැටි මට මැවී පෙනෙනවා වොට්සන්."

අපි විසිත්ත කාමරයට ඇතුළු වූයෙමු. ඒ වනවිටත් පොලිස් නිලධරයා ඔහුගේ වාර්තාව ලියමින් සිටියේය.

"මං හිතන්නේ ඔබ මේ අපරාධ පරීක්ෂණය පිළිබඳ පොලිස් වාර්තාව ලියනවා වෙන්න ඇති?" හෝම්ස් බාධා කළේය.

"ඔව්, ඒක තමයි මේ ලියන්නෙ."

"ඔබ හිතන්නෙ නැද්ද, වාර්තාව ලියන්න ඔය හැටි ඉක්මන් වෙන්න හොඳ නෑ කියල. මං හිතන්නෙ ඔබේ සාක්ෂි සියල්ලම සම්පූර්ණ නැහැ."

ෂර්ලොක් හෝම්ස් මෙවැන්නක් ප්‍රකාශ කරන්නේ දැඩි වගකීමකින් යුතුව බව ලෙස්ට්‍රේඩ් දැන සිටියේය. පෑන පසෙකට දැමූ ඔහු හෝම්ස් දෙස බැලුවේ පුදුමයෙනි.

"මොකක්ද හෝම්ස් මහත්මයා ඔබේ කථාවෙ තේරුම?"

"තේරුම? තේරුම නම් බොහොම වැදගත් සාක්ෂිකාරයෙක් ඉන්නවා. ඔබ ඔහුගෙන් සාක්ෂි විමසුවේ නැහැනෙ?"

"ඔබට පුළුවන්ද ඔහුව ඉදිරිපත් කරන්න?"

http://sherlockholmesinvestigations.blogspot.com

"මං හිතන්නේ මට පුළුවන් වෙයි."

"එහෙම නම් ඉදිරිපත් කරන්න හෝම්ස් මහත්මයා."

"මගේ සම්පූර්ණ උත්සාහය යොදලා බලන්නම්. ඔබ ළඟ පොලිස් භටයන් කීදෙනෙක් ඉන්නවාද?"

"කථා කරන්න පුළුවන් දුර ප්‍රමාණයේ ඉන්නේ තුන් දෙනයි."

"අනර්ඝයි! එයාලා හොඳ 'සවිශක්තිය' තිබෙන මහ හඬින් කෑගහන්න පුළුවන් අයද?"

"ඔව්. ඒ ගැන නම් සැකයක් නෑ.. නමුත් ඒගොල්ලන්ගෙ කටහඬේ තරම කොහොමද මෙතනට සම්බන්ධ වෙන්නෙ?"

"බාග වෙලාවකට මට හැකිවේවි ලෙස්ට්‍රේඩ් ඔබට ඒක පෙන්වල දෙන්න. ඒ විතරක් නෙමෙයි තවත් කරුණු දෙක තුනකුත් පෙන්වල දෙන්න. කරුණාකරල ඔබේ භටයන් මෙහි කැඳවන්න."

මිනිත්තු පහක් ගතවෙද්දී පොලිස් භටයෝ තිදෙනා ඉස්තෝප්පුව වෙත පැමිණියහ.

"අර එළියේ තිබෙන මඩුවේ පිදුරු වගයක් තිබුණා. මිත්‍රවරුනි කරුණාකරලා මඩුවෙන් පිදුරු මිටි දෙකක් අරගෙන එන්න. මගේ සාක්ෂි කාරයා ඉදිරිපත් කරන්න, පිදුරු බොහොම ප්‍රයෝජනවත් වේවි."

හෝම්ස්ගේ ඉල්ලීම පරිදි පොලිස් භටයෙක් පිදුරු මිටි දෙකක් රැගෙන ආවේය.

"අන්න හොඳයි. බොහොම ස්තූතියි. දැන් අපි තරප්පු පෙළ දිගේ උඩ තට්ටුවට යමු. එන්න, එන්න. ඔක්කොම එන්න. මේ හිස් කාමර තුන ඉදිරිපිට තියෙන බරාඳයට තමයි අපි එන්න ඕනෙ.

හරි. දැන් ඔය පිදුරු ටික බිත්ති වල් නොගෑවෙන විධියට මැද හරියෙන් දමන්න."

ෂර්ලොක් හෝම්ස් බරාඳයේ එක් කෙළවරක සිටගෙන සිටියේ විශේෂ රඟදැක්වීමකට සූදානම් ඇස්බැන්දුම් කරුවකු මෙනි. මේ කිසිවක් තේරුම් ගැනීමට නොහැකි ලෙස්ට්‍රේඩ් මගේ මිත්‍රයා දෙස බලා සිටියේ ඉමහත් පුදුමයට පත් අයුරෙනි.

"ලෙස්ට්‍රේඩ් කරුණාකරල ඔබේ භටයෙක් පහළට යවන්න පුළුවන්ද වතුර බාල්දි දෙකක් ගෙනෙන්න? . . . . ආ හරි . . . . වතුර බාල්දි ඔහොම තියන්න. දැන් අපි සූදානම්."

http://sherlockholmesinvestigations.blogspot.com

කෝපය ඉවසාගත නොහැකිව ලෙස්ට්‍රේඩ්ගේ මුහුණ රතු පැහැයට හැරිණි.

"මට නම් තේරෙන්නෙ නෑ, ෂර්ලොක් හෝම්ස් මහත්මයා, ඔබ මේ අපිත් එක්ක කරන්න හදන සෙල්ලම මොකක්ද කියලා? ඔබ යමක් දන්නවා නම් මේ මිස්සු විකාර නැතුව ඒක අපට කියලා දෙන්න."

"ලෙස්ට්‍රේඩ්, මං මේ කරන හැමදෙයක්ම කරන්නේ යම්කිසි හේතුවක් ඇතුවයි. මං ඒ ගැන ඔබට සහතික වෙන්නම්. මතකද දැන් පැය කීපයකට ඉස්සරවෙලා ඔබ මාව උපහාසයට ලක් කළා? දැන් මගේ වාරය. ටිකක් ඉවසලා බලාගෙන ඉන්න.

වොට්සන් ඔබ ළඟ තියෙනවා නේද ගිනිපෙට්ටිය? ඔය එක ජනේලයක් අරින්න. දැන් ගිනිකූරක් පත්තු කරලා මේ පිදුරු ගොඩට දමන්න."

ඔහු නියම කළ ආකාරයට ගිනිකූරක් දල්වා මම වියළි පිදුරු ගොඩට දැමුවෙමි. විවෘත කළ ජනේලයෙන් ආ සුළං පහරත් සමගම වියළි පිදුරු මිටියට ඉක්මනින් ගිනි ඇවිළුණේය. මුළු බරාදයම දුමෙන් පිරී ගියේය.

"ලෙස්ට්‍රේඩ්. දැන් අපි බලමු, අර ඔබේ වැදගත් සාක්ෂිකාරයා කැඳවන්න පුළුවන්ද කියලා. මහත්වරුනි. අපි ඔක්කොම එකතු වෙලා, මං එකයි, දෙකයි තුනයි කියන කොට ගින්නක් කියලා මහ හයියෙන් කෑගහන්න ඕනෙ, හරිද? ඔන්න එහෙනම්, එකයි, . . . දෙකයි . . . . තුනයි."

"ගින්නක්!" අපි සියලුදෙනාම මහහඬින් කෑගැසුවෙමු.

"ස්තුතියි මහත්වරුනි. තවත් සැරයක් කෑගසමු. එකයි, දෙකයි . . . . තුනයි."


"ගින්නක්!!"

"තවත් එක සැරයක් මහත්වරුනි. ඔබේ උපරිම ශබ්දයෙන් . . . ."

"ගින්නක්!!!" අපේ මහා ඝෝෂාවේ හඬ මුළු නෝවුඩ් ප්‍රදේශය දෙදරවමින් ඇසෙන්නට ඇත.

ඒ සමගම මහත් පුදුමාකාර දෙයක් සිදුවිය. බරාදය කෙළවර තිබූ බිත්තිය මැදින්, මෙතෙක් අප නොදුටු දොරටුවක් එක්වරම විවෘත

http://sherlockholmesinvestigations.blogspot.com



203 "මොකක්ද මිනිහෝ මේ වැඩේ තේරුම?"

http://sherlockholmesinvestigations.blogspot.com

විය. මෙතැන බිත්තියක් මිස දොරක් තිබූ බවට කිසිදු සලකුණක් වත් නොතිබිණි. ගුහාවේ සිට සැඟවී සිට එළියට එන හාවෙකු මෙන් දොරටුවෙන් එළියට පැන්නේ මිටි, පෝඩ්ඩු වී ගිය පෙනුමක් ඇති මිනිසෙකි.

"විශිෂ්ටයි!" වොට්සන් ඔය වතුර බාල්දි වලින් ගින්න නිවා දමන්න. අන්න හරි.

ලෙස්ට්‍රේඩ්. මෙන්න මෙතෙක් වෙලා සාක්ෂි දෙන්න එන්න බැරිවුණු සාක්ෂි කාරයා; මෙන්න පිළිගන්න ජොනාස් ඕල්ඩ්ඒකර් මහත්මයා!"

පොලිස් නිලධරයා මෙතැනට පැමිණි පුද්ගලයා දෙස බලා සිටියේ බලවත් විමතියෙනි. මේ පුද්ගලයා අඳුරු තැනක සිට එළියට පැමිණීම නිසා, ආලෝකයට දෙනෙත් හුරු කරගැනීමට උත්සාහ දරමින් සිටියේය. ශරීර ප්‍රමාණයෙන් කුඩා වුවත් ඔහුට තිබුණේ කෛරාටික, එමෙන්ම දුෂ්ට පෙනුමකි.

"මොකක්ද මිනිහෝ මේ වැඩේ තේරුම? මෙච්චර දවස් මේකට වෙලා තමුසෙ මොනවා කළාද?" ලෙස්ට්‍රේඩ් කෝපයෙන් ගිගුරුවේය.

නිලධරයාගේ රතු වූ මුහුණ මඟහරමින් ඕල්ඩ්ඒකර් උත්සාහ දැරුවේ සිනාසීමටයි.

"මං කාටවත් මොකුත් හිරිහැරයක් කළේ නෑ."

"හිරිහැරයක් කළේ නෑ? නව පොඩ්ඩෙන් තමුසෙ අහිංසක මිනිහෙක්ව එල්ලුම් ගහේ යවනවා. මේතන ඉන්න මේ හෝම්ස් මහත්මයා නොවෙන්න, තව ටිකෙන් ඒ අපරාධය කරන්නෙ මමයි."

"මහත්මයා මේක පොඩි විහිළුවක්!"

"විහිළුවක්? . . . . හැබෑට . . . ? හොඳයි විහිළුව!! හැබැයි උන්නැහේ මං එකක් කියන්නම්. මේ විහිළුවෙන් තමුසෙට පොඩ්ඩක්වත් හිනහවෙන්න නම් ලැබෙන්නෙ නෑ. ගෙනියනවා මේ මිනිහා පහළ විසිත්ත කාමරයට."

ලෙස්ට්‍රේඩ් පොලිස් භටයාට නියම කළේය. පොලිස් භටයන් ඕල්ඩ්ඒකර් සමඟ පිටත්ව ගිය පසු ලෙස්ට්‍රේඩ් මගේ මිත්‍රයා ඇමතුවේය.

"මං මේව කොස්තාපල්වරුන් ඉන්න තැන කියන්න කැමති නෑ. වොට්සන් මහත්මයා ඉදිරිපිට කිව්වට කමක් නෑ. හෝම්ස් මහත්මයා.

http://sherlockholmesinvestigations.blogspot.com

මෙක තමයි ඔබ විසඳූ විශිෂ්ටතම පරීක්ෂණය. ඒ වුණත් ඔබ මෙතක කලේ කොහොමද? මට ඒක නම් තවමත් අභිරහසක්. ඔබතුමා අහිංසක මනුස්සයෙකුගේ ජීවිතය බේරාගත්තා. ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසිය මහා අපකීර්තියකට පත්වෙන්න කලින් පොලීසිය බේරාගත්තා. ඒ හැමටම වඩා පොලිස් සේවයේ මා පත්වෙන්න තිබුණු විනාශයෙන් මාව බේරාගත්තා."

හෝම්ස් ලෙස්ට්‍රේඩ්ගේ උරහිසට තට්ටු කළේය.

"දැන් ඔබ අපකීර්තියට පත්වෙනවා නෙමෙයි මිත්‍රයා, විශිෂ්ට කීර්තියට පත්වෙනවා. අර පොලිස් වාර්තාවේ පොඩි වෙනස්කම් ටිකක් කරන්න. එතකොට පොලිස් ලොක්කෝ තේරුම් ගනීවි, ලෙස්ට්‍රේඩ් කියන්නේ ලේසියෙන් නොමඟ යවන්න පුළුවන් පුද්ගලයෙක් නෙමෙයි කියල."

"මොනවා? ඔබට උවමනා නැද්ද ඔබේ නම වත් මේ වාර්තාවට ඇතුළත් කරන්න?"

"කොහොමටවත් ඕනෙ නෑ. මෙම අභිරහස සාර්ථකව විසඳීමෙන් මා ලැබූ තෘප්තියම මට ඇති. මගේ රහස් පරීක්ෂණ පිළිබඳ කථා ලියන වාර්තාකාරයා මේ ගැනත් ලියුවොත්, සමහර විට ඉදිරි කාලයේදී මටත් කීර්තියක් අත්වේවි. ඒක නෙමෙයි අපි ගිහින් බලමු මේ තක්කඩියා හැංගිලා හිටියෙ කොහේද කියල."

බරාඳය කෙළවරේ සිට අඩි හයක් පමණ දිග කුටියක් සෑදෙන සේ බිත්තිය හරහා ලෑලි වලින් වෙන්කොට, එහි පිටපැත්ත හුණු බදාම යොදා කපරාරු කොට, භින්න ආලේප කිරීමෙන්, මෙම රහස් කුටිය සාදා තිබිණ. එයට ඇතුළුවනු දොර, පිටතින් හඳුනාගත නොහැකි වන සේ සකස්කර තිබුණේ ඉතා සූක්ෂම ලෙසයි. වහලට කිට්ටුවෙන් කුඩා කවුළු තැබීමෙන් එය ඇතුළට ආලෝකය හා වාතාශ්‍රය සැපයිණ. ඇඳක්, හාන්සි පුටුවක්, ආහාර හා ජලය ද පොත් හා පුවත්පත් කිහිපයක් ද එහි තිබෙනු අපි දුටුවෙමු.

"ඔන්න බලන්න ගොඩනැගිලි ඉදිකරන්නෙක් වුණාම තිබෙන වාසිය. කිසිම කෙනෙකුට නොදැනෙන විදියට තමන්ට හැංගෙන්න තැනක් ඔහු සාදා ගත්තා. ඔහුගේ වටිනා ගෘහපාලිකාව පමණයි මේක දැන හිටියේ. වැඩි පමාවක් නැතුව ඇයත් ඔබේ හිරභාරයට පත්විය යුතුයි ලෙස්ට්‍රේඩ්."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබේ උපදෙස් මා පිළිගන්නවා. ඒ වුණත් හෝම්ස් මහත්මයා ඔබ කොහොමද මෙහෙම තැනක් තියෙන බව දැනගත්තේ?"

"මේ මිනිහා හැංගිලා ඉන්නේ මේ නිවස ඇතුළෙමයි යන්න මට අවබෝධ වුණා. ගේ ඇතුළේ හැමතැනකම ඇවිදලා බලන කොට, පහළ තට්ටුවේ බරාදයට වඩා, ඒ කෙළින්ම ඉහළ තට්ටුවේ බරාදය අඩි හයක් දිගෙන් අඩුයි. ඔහු ඉන්නේ කොහේද කියල ඒකෙන් පැහැදිලි වුණා.

ගින්නක් ගින්නක්! කියල අපි කෑගහද්දි ඔහු හොඳටම හයවෙලා, එළියට දුවගෙන එන බව මං දැනගිටියා. අපට ඕනෙ නම් තිබුණා ගිහින් දොරට ගහලා මිනිහව එළියට ගන්නත්. නමුත් මට නිකමට හිතුණා එළියට ඇවිත් ශෙනී සිටින වැඩේ එයා ලවාම කරවන්න."

"ඒ වුණත් මහත්මයා ඔහු මේ ගෙදර රැඳී ඉන්න බවත් ඔබ කොහොමද දැනගත්තේ?"

"අර ලේ සලකුණෙන් ලෙස්ට්‍රේඩ්. ඔබ කිව්වානෙ ඒකෙන් අවසන් තීන්දුව ලැබෙනවා කියලා. ඒකෙන් තමා අවසන් තීන්දුව ලැබුණෙ. නමුත් වෙනත් ආකාරයකට. කලින් දවසේ ඔය සලකුණ බිත්තියේ නොතිබුණු බව මම දැනගිටියා. ඔය ඒගේ සියුම් දේට මං දැඩි අවධානයක් යොමු කරන බව ඔබ දන්නවානෙ. කලින් දවසේ මම මුළු ඉස්තෝප්පුවම තියුණු ලෙස පරීක්ෂා කර බැලුවා. මට හොඳටම විශ්වාසයි ඔහොම දෙයක් බිත්තියේ නොතිබුණු බවට. ඒ කියන්නේ සලකුණ කරලා තියෙන්නෙ ඊයෙ රෑ."

"නමුත් කොහොමද ඔහු ඒක කළේ?"

"බොහොම සරලයි. අර ලියවිලි පැකට් කරලා මුද්‍රා තබන අතරේදී, ඕල්ඩ්ඒකර්, මැක්ෆාලේන්ගෙ මහපටැඟිලි සලකුණ උණුසුම් ලාකඩ මතට ලබාගත්තා. ඒක සැකයක් නොහිතෙන විධියට බොහොම ඉක්මනින් කරන්න ඇති. මං හිතන්නෙ නෑ මැක්ෆාලේන්ට මතක ඇති කියල, එහෙම දෙයක් සිද්ධවුණාද වත් කියල. සමහර විට ඒක අහම්බෙන් වුණු සිදුවීමක් වෙන්නත් පිළිවන්.

අර ගුහාවට වෙලා කල්පනා කර කර ඉන්න විට ඕල්ඩ්ඒකර් දකින්න ඇති, නැත්නම් ඔහුට මතක් වෙන්න ඇති, ලාකඩ මත වැදුණු තරුණයාගේ ඇඟිලි සලකුණ ගැන. තරුණයාව බෙල්ලෙන්ම හිරවෙන විධියේ බලගතු සාක්ෂියක් මේකෙන් හදන්න පුළුවන් කියල

http://sherlockholmesinvestigations.blogspot.com

ඕල්ඩ්ඒකර්ගේ කපටි මොළයට වැටහුණා. ඔහු උණුසුම් ඉටි ස්වල්පයකින් ලාකඩ මත වූ ඇඟිලි සටහනේ මුද්‍රාව ගත්තා. ඊළඟට ඇඟිල්ල අල්පෙනෙත්තකින් සිදුරු කරලා ලේ ටිකක් අරගෙන, ඉටි මුද්‍රාවෙ තවරලා බිත්තියේ සලකුණු කළා. ඒ වුණු වෙලාවෙ එක්කො මෙය ඔහු තනියම කරන්න ඇති. නැත්නං අර කාන්තාව ඔහුට උදව් කරන්න ඇති. මං ඕන ඔට්ටුවක් අල්ලන්නම්. ඔහු අර කුටිය ඇතුළෙ තබාගත් ලියවිලි පරීක්ෂා කරල බැලුවොත්, ඔබට දකින්න ලැබේවි, තරුණයාගේ ලාකඩ මත වැදුණු ඇඟිලි සටහන."

"අති විශිෂ්ටයි හෝම්ස් මහත්මයා, අති විශිෂ්ටයි. ඔබ ඒක තේරුම් කරද්දි අපට හොඳටම පැහැදිලි වෙනවා. ඒ වුණත් මොකක්ද මේ දුෂ්ට ක්‍රියාවෙ අරමුණ?"

"මං හිතන්නෙ නෑ ඒක තේරුම් කරන්න ඒ හැටි අමාරුයි කියල. ඕල්ඩ්ඒකර් කියන්නෙ වෛර කරන්න පටන් ගත්තාම, ඒ වෛරය පැසවා පැසවා හිතේ තබාගෙන, අවස්ථාවක් ලැබුණු වහාම කෲර ලෙස පළිගන්නා දුෂ්ටයෙක්. ඔබ දන්නවාද බොහෝ කලකට පෙර මැක්ෆාලේන් තරුණයාගෙ මව තරුණ කාලෙදි ඇගෙ අතගන්න බලාපොරොත්තුවෙන් ඕල්ඩ්ඒකර් හිටි බව? ඊළඟට ඇය ඔහු ප්‍රතික්ෂේප කළ බව?"

"මං ඒක දැන හිටියෙ නෑ."

"ඇයි ලෙස්ට්‍රේඩ් මං ඔබට කිව්වෙ මුලින් බ්ලැක්හීත් වලට ගිහිං, නෝවුඩ් ගමන පස්සේ යන්න කියලා. මේ ප්‍රතික්ෂේප කිරීම නිසා ඇයගෙන් දරුණු ලෙස පළිගන්න අවස්ථාවක් ඔහු හොය හොයා හිටියේ. අවුරුදු ගණනාවක් ඔහුට එවැන්නක් ලැබුණෙ නෑ.

පහුගිය අවුරුද්දෙ හෝ අවුරුදු දෙකකදි ඕල්ඩ්ඒකර්ගෙ ව්‍යාපාර බොහොම බංකොලොත් වී ගෙන ගිහින් තියෙනවා. ඔහු විශාල වශයෙන් ණය අරගෙන තියෙනවා. ඒ ණය නොගෙවා වංචාවක් කරල, ණය කාරයින්ගෙ ග්‍රහණයෙන් සදහටම ගැලවෙන්න ඔහු තීරණය කළා. මෙන්න මේ අදහසින් තමයි ඔහු අර විශාල මුදල් ගණන් වලට චෙක්පත් ලියලා තියෙන්නේ කෝර්නේලියස් කියල මහත්මයෙකුට. මට තවමත් ඒ චෙක්පත් ගැන හොයල බලන්න බැරිවුණා. නමුත් මට හොඳටම විශ්වාසයි මේ කෝර්නේලියස් කියන්නේ ඕල්ඩ්ඒකර්මයි. ඔහු කොහේ හරි වෙනත් පළාතක බැංකුවක, කෝර්නේලියස් නමින්

http://sherlockholmesinvestigations.blogspot.com

ගිනුමක් ඇරලා, මුදල් හැන්පත් කළා. ඔහු බලාපොරොත්තු වෙන්න ඇත්තෙ නෝවුඩ් වලින් අතුරුදන් වෙලා නමත් වෙනස් කරගෙන, වෙන තැනකට මේ මුදල් ඒකත් එකතු කරගෙන පැනල යන්න. ගිහින් කොහේ හරි වෙනත් කෙනෙක් විධියට අලුත් ජීවිතයක් අරඹන්න."

"ඔව් ඒක බොහොම දුරට වෙන්න පුළුවන්."

"ඔහුගේ සුක්ෂ්ම ප්‍රයෝගකාරී මොළයට කල්පනා වෙන්න ඇති එක ගලෙන් කුරුල්ලො දෙන්නෙක් මරන්න. ඔහුට හිතුණා තමන්ගේ පරණ පෙම්වතියගෙන් පළිගැනීමට මේක හොඳ අවස්ථාවක් කියලා. ඇගේ එකම දරුවා තමාව මරා දැම්මා කියල පෙන්නුවොත්, අර අහිංසක තරුණයා එල්ලුම් ගස් යනවා. තමන්ගෙ පළිගැනීමත් ඉතා සූක්ෂ්ම ලෙස ක්‍රියාත්මක වෙනවා. අන්තිම කැමැති පත්‍රයක් ලිවීමේ අදහස වුණේ ඒ මිනීමැරුම සැලසුම් කිරීම. දෙමව්පියන්ට එක වචනයක්වත් නොකියන්නට අණ දීලා තමන්ගේ ගෙදරට මහ රාත්‍රියේ කැඳවීම, සැරයටිය තමා ළඟ රඳවා ගැනීම, ලේ සලකුණු තබා, සතෙක් සහ තමාගේ පරණ කලිසමක් ලී ගොඩට දමලා ගිනි තැබීම; මේ ඔක්කොම දරුණු කෛරාටිකයෙකුගේ සූක්ෂ්ම උපක්‍රම. මේ දැලේ හිරවුණාම, පණ බේරාගන්න කිසිම ක්‍රමයක් තිබෙන බවක් මට නම් පෙනුණෙ නෑ. දැන් පැය කිහිපයකට කලින් තමයි එහෙම හැකියාවක් යන්තමට ඇති බව මට වැටහුණේ. කොහොම වුණත් ඔහු ශිල්පීය ඥානයේ පරිපූර්ණ පුද්ගලයෙක් නෙමෙයි. ඔහු දැනගෙන හිටියේ නෑ කොතැනද තමන් නැවතීමේ ලකුණ තැබිය යුතු සීමාව කියලා. ඔහුට හිතුණා අර අහිංසක තරුණයාගේ බෙල්ල වටේ වැටුණු තොණ්ඩුව තව තවත් හිර කරන්න. එහෙම හිතුවා හින්දා ඔහු වැඩේ අවුල් කරගත්තා. අපි පහළ තට්ටුවට බහිමු ලෙස්ට්‍රේඩ්. මට තියෙනවා ඔහුගෙන් ඇසීමට ප්‍රශ්නයක් දෙකක්."

ප්‍රයෝගකාර තක්කඩියා පොලිස් භටයන් දෙදෙනෙකුට මැදිවී වාඩිවී සිටියේය. අප දුටු විගසම ඔහු කථා කිරීමට පටන් ගත්තේය.

"ඒක ලොකු විහිළුවක් මහත්මයා. විහිළුවක්. වෙන මොකුත් නෙමෙයි විහිළුවක්. මට ඕන වුණා බලාගන්න මං අතුරුදන් වුණොත් ඇතිවෙන ප්‍රතිඵලය මොකක්ද කියලා. අර අහිංසක මැක්ෆාලේන් තරුණයාට හිරිහැරයක් කරන්න තරම් මං දුෂ්ට මිනිහෙක් කියල ඔබ

http://sherlockholmesinvestigations.blogspot.com

හිතනවද? මං ඔබට සහතික වෙන්නම් ඔහුගේ නම් එහෙම අරමුණක් තිබුණෙ නෑ."

"ඒක උසාවියෙදි තීරණය කරන්නෙ ජූරි සභාවක් මගින්. අපි ඔහේට හදු පවරනවා මිනීමැරීමට තැත්කිරීම උඩ. නැත්නම් මිනීමැරීමට සැලසුම් හා කුමන්ත්‍රණය කිරීම උඩ." ලෙස්ට්‍රේඩ් කීය.

"ඇයි ඊළඟට ඔහේට දකින්න ලැබේවි ඔහේගෙ ණයකාරයො අර කොර්නේලියස් මහත්මයාගෙ බැංකු ගිණුමෙන් ඔහේට සල්ලි ගන්න බැරිවෙන විදියට තහනම් නියෝගයක් අරගෙන තියලා." හෝම්ස් කීය.

ඕල්ඩ්ඒකර් හෝම්ස් දෙස බලා සිටියේ කෝපයෙන් දැවෙමිනි.

"මං වෙනුවෙන් තමුන් බොහෝම මහන්සි වුණා නේද? මටත් පුළුවන් වුණු දවසක ඔහේගෙ ණය ගෙවන්නම්කො." ඕල්ඩ්ඒකර් දුෂ්ට අයුරින් පැවසුවේ හෝම්ස් දෙස රවා බලමිනි.

එහෙත් හෝම්ස්ට ඒ තර්ජනය විහිළුවක් වූ බව පෙනිණ. ඔහු ඊට පිළිතුරු දුන්නේ සිනාසෙමිනි.

"හැබැට? මං හිතන්නෙ ඒකට ඔහේට අවුරුදු ගණනාවක් බලාගෙන ඉන්න වේවි ඕල්ඩ්ඒකර් මහත්තයා. අනෙක ඉතින් ඒ කාලෙදි ඔහේට කරන්න බරපතල වැඩ එහෙමත් තියේවි.

ඒක නෙමෙයි ඔහේගෙ අර පරණ කලිසමත් එක්ක ලී ගොඩට දැම්මෙ මොකෙක්ද? මැරිච්ච බල්ලෙක්ද? හාවො කීපදෙනෙක්ද? මොකෙක්ද? . . . . මොනවා? ඔබ ඒක මට කියන්න කැමති නෑ? අනේ හැබෑට ඒක මට නොකියන්න තරම් ඔහේ ඔය තරම් අකරුණාවන්තද? හොඳයි හොඳයි. කියන්න ඕන තරම්ම අකමැති නම් කමක් නෑ. තැවරී තිබුණු ලේ ප්‍රමාණයේ හැටියටයි, පිළිස්සී තිබුණු සත්ත්ව කොටස් වල හැටියටයි හාවුන් කීප දෙනෙක් වෙන්න ඇති. වොට්සන් ඔබ මේ ගැන කථාවක් ලියනවා නම් හාවුන් කියල ලියාගන්නකො."

http://sherlockholmesinvestigations.blogspot.com

# මිනීමරුවා නිදැල්ලේ

Reading Purpose Only. Not For Print.



http://sherlockholmesinvestigations.blogspot.com

# මිනීමරුවා නිදැල්ලේ

"මං හිතන්නේ වොට්සන් මට යන්න සිදුවේවි."

හෝම්ස් පැවසුවේ, අප දෙදෙනා උදේ ආහාරයට සූදානම්ව මේසයට හිඳගනිද්දීය.

"යන්න? කොහේටද?"

"ඩාට්මුවර් වලට, කර්නල් රොස්ගේ අශ්වයින් පුහුණුකිරීමේ මධ්‍යස්ථානයට."

එම ප්‍රකාශයෙන් මම පුදුමයට පත් නොවීමි. ඇත්තෙන්ම පුදුමයට කරුණ වූයේ මෙතරම් දිනක් එම කලබැගෑනියට මගේ මිත්‍රයා පටලැවුණේ නැති එකයි. මුළු එංගලන්තය පුරාම ඒ දිනවල කතාබහට මාතෘකා වූයේ ද එම සිද්ධියයි. ඔහුගේ පයිප්පය සඳහා සැර දුම්කොළ භාවිත කරමින්, හෝම්ස් දවස තිස්සේම පයිප්පය උරමින් කල්පනා කළේය; නළල රැළි කරගෙන, හිස පහතට නමාගෙන කල්පනා කළේය; මා කියූ දෙයට, ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු නොදී ගොළුවත රකිමින් කල්පනා කළේය. සෑම පුවත්පතකම අලුත්ම මුද්‍රණ, පුවත්පත් අලෙවි නියෝජිතයා අනාකඩවාම අප වෙත සැපයුවේය. ඒ හැම එකක්ම යන්තමින් කියවා බැලූ ඔහු, පුවත්පත් කාමරයේ මුල්ලකට විසිකළේ නොසතුටෙනි.

ඔහු මේ ළතැවුණේ කුමක් සඳහා දැයි මම හොඳින් දැන සිටියෙමි. ඒ, වෙසෙක්ස් මහා තුරඟ තරඟාවලියේ ජයග්‍රාහකයා වන බවට කාගේත් විශ්වාසය දිනා සිටි අශ්වයා, අතුරුදහන් වීමත්, උගේ පුහුණුකරුවා බේදජනක ලෙස මරාදැමීමත් පිළිබඳවයි. එහෙයින්, සිද්ධිය වූ තැන පරීක්ෂා කර බැලීම සඳහා යාමට තමා, තීරණය කළ බව හෝම්ස් පැවසූ විට, එය මට පුදුමයක් නොවීය.

"මගේ පැමිණීම ඔබට අවහිරයක් නොවෙයි නම්, මාත් කැමතියි ඔබ එක්ක ඒ ගමනට සහභාගි වෙන්න."

http://sherlockholmesinvestigations.blogspot.com

"මගේ හිතවත් වොට්සන්, ඔබ ආපු එක මට කරන ලොකු උපකාරයක්. මට හිතෙනවා මේ ගමන කාලය අපතේ යැවීමක් වෙන එකක් නැහැ කියලා. අප කළ අනෙක් පරීක්ෂණ හැම එකකටම වඩා සුවිශේෂ එකක් වියහැකි ලක්ෂණ මේකෙ දකින්න පුළුවනි. පැඩිංටන් දුම්රිය පොළෙන් පිටත්වන දුම්රිය අල්ලාගන්න අපට ටික වෙලාවයි තියෙන්නෙ. ඒ නිසා මේ සිද්ධිය ගැන වැඩිදුර සාකච්ඡා අපි දුම්රියේදී කරමු. ඇත පැහැදිලිව බලාගන්න පුළුවන් ඔබේ අනර්ඝ 'දෙනෙතිය' අරගෙන එන්න පුළුවන් නම් ඒක ඔබට ප්‍රයෝජනවත් වේවි වොට්සන්."

පැයකට පමණ අසූ, ඉතා වේගයෙන් එක්සිටර් දෙසට ගමන් කරන දුම්රියක පළමුවන පන්තියේ මැදිරියක් අපි අසුන්ගෙන සිටියෙමු. පැඩිංටන් දුම්රියපොළේදී මිලට ගත් අලුත් පුවත්පත් ගොන්න හෝම්ස් දැඩි අවධානයට ලක්කරමින් සිටියේය. ඔහු අන්තිම පුවත්පත ද කියවා අවසන් කොට, සියල්ල ආසනය යටට දමන විට අපි රීඩිං ප්‍රදේශය පසුකරමින් සිටියෙමු. ඔහු තම පුරුද්දු ඇඹරූ පසුම්බිය මට දිගුකොට කතාබහ පටන් ගත්තේය.

"අපි බොහොම වේගයෙන් ගමන් කරනවා නේද වොට්සන්? දැනට අපේ වේගය පැයට සැතපුම් පනස්තුනහමාරක් වෙනවා."

හෝම්ස් පැවසුවේ දුම්රිය කවුළුවෙන් එබී බලා, තමාගේ ඔරලෝසුවද පරීක්ෂා කරමිනි.

"සැතපුම් කාලේ කණු මට නම් දකින්න ලැබුණේ නෑ?" මම කීවෙමි.

"මටත් දකින්න ලැබුණේ නෑ. ඒ වුණත් මේ දුම්රිය මාර්ගය අයිනේ තිබෙන, දුරකථන රැහැන් සවිකළ කණු දෙකක් අතර පරතරය යාර හැටයි. ඒ නිසා ගණනය කිරීම ඉතා පහසුයි. මට හිතෙනවා වොට්සන්, සිල්වර් බ්ලේස් අශ්වයාගේ අතුරුදන්වීම හා ජෝන් ස්ට්‍රේකර් මරා දැමීම ගැන තොරතුරු සියල්ලක්ම ඔබ දන්නවා ඇති කියලා?"

"ටෙලිග්‍රාෆ් හා ක්‍රොනිකල් පුවත්පත්වල තිබුණු ප්‍රවෘත්ති නම් මං කියෙව්වා."

"මේ පරීක්ෂණයේ තිබෙන්නේ කලාතුරකින් දකින්න ලැබෙන විධියේ අවස්ථා පෙළගැසීමක්, මෙතැනදී අපරාධ පරීක්ෂකයාගේ නිරීක්ෂණ හා එයින් නිගමනයන්ට එළැඹීමේ හැකියාව, වැදගත් බව

http://sherlockholmesinvestigations.blogspot.com

ඇත්ත. එය යොදාගත යුත්තේ, අපට ලැබෙන තොරතුරු හා නිරීක්ෂණ රාශියකින්, වැදගත් හා අත්‍යවශ්‍ය ඒවා තෝරා බේරා ගැනීම සඳහායි. මේ බෙදවාචකය ඉතාම කලාතුරකින් සිදුවෙන ආකාරයේ අසාමාන්‍ය එකක්. ඒ වගේම පුද්ගලයින් ඉතා විශාල ගණනකට ලොකු බලපෑමක් ඇති කරන එකක්. ඒ නිසාම අප වෙත ගලා එන තොරතුරු, උපකල්පන, සැක පහළ කිරීම, අනුමාන කිරීම, ප්‍රමාණය අසීමිතයි. ඒ නිසා අපට මෙතැනදී මුහුණ දෙන්න සිදුවෙනවා ලොකු ගැටලුවකට. ඒ තමයි නිවැරදි, සත්‍ය කරුණු වලින් හැනුණු අරටුව බේරා ගැනීම. කාගෙන්ද? කුමකින්ද? උපකල්පන ඉදිරිපත් කරන්නන්ගෙන් හා වාර්තාකාරයින්ගේ අපද්‍රව්‍ය වලින්. මෙන්න මේ කරුණ හොඳින් හිතේ තබාගෙන, අපි බලමු එළඹෙන්න පුළුවන් නිගමන මොනවද කියලා. අශ්වයා අයිතිකරු කර්නල් රොස් මහත් සහ මේ පරීක්ෂණය භාර පොලිස් පරීක්ෂක ග්‍රෙගරි ගෙන් අඟහරුවාදා හැන්දෑවෙයි මට විදුලි පණිවුඩය ලැබුණේ. ඔවුන් මගෙන් ඉල්ලා සිටිනවා මේ ගැටලුව විසඳීමට උදව්වෙන්න කියලා."

"අඟහරුවාදා හැන්දෑවෙ? දැන් අද බ්‍රහස්පතින්දා උදේ නේ. ඇයි ඔබ ඊයෙ යන්න නොහිතුවෙ?" මුම ඇසීමි.

"ඒක මගේ අතින් සිදුවුණු ලොකු වැරැද්දීමක් වොට්සන්. එංගලන්තයේ ඉන්න සුප්‍රසිද්ධම අශ්වයා වන සිල්වර් බ්ලේස්, ඩාට්මුවර් වැනි ජනශූන්‍ය ප්‍රදේශයක, මේ තරම් දවසක් සඟවලා තියන්න කිසිවෙකුට හැකිවේවි කියල, මං හිතුවේ නෑ. ඊයෙ දවස පුරාම මං හිතුවා, අශ්වයා හොයාගත්තා කියන ආරංචිය, කොයි මොහොතේ හෝ අහන්න ලැබේවි කියලා. ඒ වගේම ඌ පැහැර ගෙන ගිය, ජෝන් ස්ට්‍රේකර් මරා දැමූ අපරාධකාරයා ගැන දැනගන්න ලැබේවි කියලා. ඒ වුණත් අදටත් එළිවුණාම තමුන් ෆිට්ස්රෝයි සිම්සන් නම් තරුණයා හිරභාරයට ගැනීම ඇරෙන්න කිසිම දෙයක් සිදුවෙලා නැහැ. ඒ නිසා මං තීරණය කළා වැඩට බහින්න. කොහොම වුණත් ඊයෙ දවස අපරාදෙ නාස්ති වුණා කියලා මං හිතන්නෙ නෑ."

"එහෙනම් ඔබ මොනවා හරි උපකල්පනයක් ගොඩ නගන්න ඇති?"

"අඩුම ගණනෙන් මේ සිදුවීමට සම්බන්ධ මූලික කරුණු ටික ග්‍රහණය කරගන්න වත් මට හැකිවුණා. මං ඒවා එකින් එක ඔබට පහදලා දෙන්නම්. මේ වගේ කාරණා පැටලී ගිය වෙලාවක, ඒවා

http://sherlockholmesinvestigations.blogspot.com

තවත් කෙනෙකුට විස්තර කරලා දීමත් එක තමන්ට පැහැදිලි කරගන්න හොඳ ක්‍රමයක්. අනෙක අප මුහුණ දෙන්නේ කුමකටද, පටන් ගන්නේ කොහනින්ද කියල නොකියා, මං කොහොමද ඔබෙන් උදව්වක් බලාපොරොත්තු වෙන්නෙ?

'සිල්ව බ්ලේස්' කියන්නෙ සොමොමි පැටිතිරියේ අශ්වයෙක්. උගේ මී මුත්තා ඒ කාලයේ තරඟ දිගින් දිගටම ජයග්‍රහණය කළා. ඒ වගේම සිල්ව බ්ලේසුත්, වාර්තා පිහිටවපු, ජය පිට ජය ලබා ගනිපු අශ්වයෙක්. වයස අවුරුදු පහක් වෙන මේ ,ඌනා, පහුගිය කාලයේ උගේ වාසනාවන්ත හිමිකරුවා වන කර්නල් රොස්ට විශාල ධන සම්භාරයක් උපයා දුන්නා. මේ අවාසනාවන්ත සිද්ධිය වූ දවස ළඟාවෙද්දී, ඌ වෙසෙක්ස් කුසලාන තරඟයේ ජයග්‍රාහකයා වේ යයි කාගේත් විශ්වාසය දිනාගෙන හිටියා. සිල්ව බ්ලේස් ජයග්‍රහණය කරන බවට මේ වන විට අල්ලා ඇති ඔට්ටු ප්‍රමාණය, අනෙක් අශ්වයින්ට අල්ලා ඇති ඔට්ටුවල එකතුව මෙන් තුන්ගුණයක්. ඌ කවදත් තුරඟ තරඟ ලෝලීන් අතර ජනප්‍රියයි. කවදාවත් ඔවුන්ගේ බලාපොරොත්තු කඩ කළේ නෑ. විශාල මුදල් සම්භාරයක් දැනටම ඌ වෙනුවෙන් ඔට්ටු අල්ලා තියෙනවා. ඒ නිසාම ලබන අඟහරුවාදා තරඟ ආරම්භ වෙද්දී සිල්ව බ්ලේස් එයට සහභාගී නොවෙනවා දකින්න කැමැති අයගේ ගණනත් සුළුපටු නෑ.

මේ කාරණාව කර්නල් රොස්ගේ අශ්වයින් පුහුණුකිරීමේ මධ්‍යස්ථානයේ අයත් හොඳින් දැන සිටියා. ඒ නිසා අශ්වයාගේ ආරක්ෂාව වෙනුවෙන් ගන්න පුළුවන් හැම පියවරක්ම ඔවුන් ගෙන තිබුණා. අශ්වයින් පුහුණුකරු ජෝන් ස්ට්‍රේකර් කලින් අශ්වාරෝහකයෙක්. ඔහු කර්නල් රොස්ගේ වර්ණ යටතේ සෑහෙන කාලයක් අශ්වයින් මෙහෙයවපු කෙනෙක්. ශරීරයේ බර වැඩිවෙද්දී ඔහු අසුපිට යාමෙන් ඉවත්වෙලා පුහුණුකරුවෙක් බවට පත්වුණා. ඔහු කර්නල් යටතේ අවුරුදු පහක් අශ්වාරෝහකයෙක් හැටියටත්, අවුරුදු හතක් පුහුණුකරුවෙක් හැටියටත් සේවය කළා. ඔහු ස්වාමියාගේ දියුණුව වෙනුවෙන් තම යුතුකම් කොටස නොපිරිහෙළා ඉටුකළ අවංක සේවකයෙක්.

ජෝන් ස්ට්‍රේකර් යටතේ අස්හලේ සේවයට තරුණයන් තුන්දෙනෙක් සිටියා. මේ ආයතනයේ සිටි අශ්වයන් ගණන හතරක් නිසා එහි සේවක සංඛ්‍යාවත් ඉතා විශාල වුණේ නෑ. තරුණයින්

http://sherlockholmesinvestigations.blogspot.com



215 "දවස පුරාම මං හිතුවා ස්ට්‍රේකර් මරාදැමූ අපරාධකාරයා ගැන දැනගන්න ලැබේවි කියලා."

http://sherlockholmesinvestigations.blogspot.com

තුන්දෙනාගෙන් එක් අයෙක් හැමදාම රාත්‍රිය පුරා අවදියෙන් සිටි අතර, අනෙක් දෙදෙනා ඉස්තාලයේ ඉහළ තට්ටුවේ නිදාගත්තා. ඒ තුන්දෙනාම බොහොම හොඳ චරිත ඇති අය. ජෝන් ස්ට්‍රේකර් විවාහකයෙක්. ඔහුගේ නිවස තිබෙන්නේ ඉස්තාලයට යාර දෙසීයක් පමණ දුරින්. ස්ට්‍රේකර් මහතාට සහ මහත්මියට දරුවන් නැහැ. ගෙදර වැඩට ඉන්නේ එක් සේවිකාවක් පමණයි. ඒවුන් අගහිගයක් නොතිබුණු, වත්පොහොසත්කම් ඇති අය.

ඉස්තාලය අවට ප්‍රදේශය බොහොම පාළුයි. නමුත් එතැනට හැතැක්ම භාගයක් පමණ උතුරෙන් ගෙවල් කිහිපයක් තනා ඇති අඩවියක් තිබෙනවා. ටැවිස්ටොක්හි කොන්ත්‍රාත්කරුවකු විසින් තනා තිබෙන මේ නිවාස බොහොමයක්ම, ආබාධිත අයට වෙන්කෙරුණු ඒවා. අනෙක් ගෙවල්, ඩාට්මුවර් විල්ලුවේ පිරිසිදු වාතයේ සිසිල විඳගැනීමට කැමති අයට කුලියට ගැනීම සඳහා. මෙතැනින් බටහිරට සැතපුම් දෙකක් පමණ ගියාම අපට ටැවිස්ටොක් ප්‍රදේශය හමුවෙනවා. ඩාට්මුවර් විල්ලුවේ අනෙක් පැත්තට තවත් සැතපුම් දෙකක් ගියාම හමුවෙනවා මේපල්ටන් අශ්වයින් පුහුණු කිරීමේ මධ්‍යස්ථානය. මෙක ඉතා විශාල මධ්‍යස්ථානයක්. එහි අයිතිකරුවා බැක්වෝටර් සාමිවරයා. ආයතනයේ භාරකාර ප්‍රධානියා සයිලස් බ්‍රවුන්. විල්ලුවේ අනෙක් හැම පැත්තක්ම කෙළවර වෙන්නෙ වන ලැහැබෙන්. එහි ජීවත්වෙන්නේ තැනින් තැන ඇවිදින අහිගුණ්ඨික මිනිසුන් පමණයි. මේ අවාසනාවන්ත සිද්ධිය වුණු සඳුදා රාත්‍රිය වනවිට, ඒ පැත්තේ තත්ත්වය ඔන්න ඔහොමයි.

එදා හැන්දෑවෙත් වෙනදා සිදුකරණ පරිදි සේවකයින් අශ්වයින්ට ව්‍යායාම් කරවා, වතුර බොන්න දීලා, රාත්‍රී නවයට පමණ ඉස්තාලය වසා අගුළු දැම්මා. සේවක තරුණයින්ගෙන් දෙදෙනෙකු රාත්‍රී ආහාරය සඳහා ස්ට්‍රේකර් නිවසට ඇවිද ගිය අතරේ නෙඩ් හන්ටර් නම් තරුණයා ඉස්තාලයේ රැඳී සිටියා. නිවසට ගිය සේවකයින් කුස්සියේ හිඳගෙන රාත්‍රී කෑම ගත්තා. මේ අතරේ, එනම් රාත්‍රී නවයට මිනිත්තු කිහිපයකට පසු, ඊඩිත් බැක්ස්ටර් නම් සේවිකාව හන්ටර් තරුණයාගේ රාත්‍රී කෑම පිඟාන ගෙන ආවා. රාත්‍රී කෑමට තිබුණේ එළුමස් යොදා සෑදූ ව්‍යාංජනයක්. ඇය ඔහුට බීමට වතුර ගෙන ගියේ නෑ. ඒ මොකද ඉස්තාලයේ ජල කරාමයක් තිබෙනවා. සේවකයන්ට පනවා තිබූ නීතියක් ගැන මෙහිදී සිහිපත් කිරීම වැදගත්. රාත්‍රී සේවයට ඉන්න,

http://sherlockholmesinvestigations.blogspot.com

තරුණයාට රාත්‍රියට බීමට අවසර තිබුණේ වතුර පමණයි. මත්පැන් කිසිවක් බීම තහනම්.

සේවිකාවට ගමන් කිරීමට සිදුවී තිබුණේ පාළු විල්ලුවේ මැදින් නිසාත්, එහි තිබූ ඝන අඳුර නිසාත් ඇය ලන්තෑරුමක් ගෙන ගියා. ඉස්තාලයට යාර තිහක් පමණ තිබියදී හදිසියේම බැක්ස්ටර් ඉදිරියට අඳුර මැදින් මිනිහෙක් ආවා. ඔහු ඇයට නවතින්න අණ කළා. ඔහුගේ ස්වභාවය ලන්තෑරුම් එළියෙන් ඇයට දකගන්නට ලැබුණා. වැදගත් මහත්මයෙකුගේ පෙනුමක් තිබූ ඔහු, අළුපාට ට්වීඩ් ඇඳුම් කට්ටලයක් හැඳ, රෙදි කැප් තොප්පියක් පැළැඳ සිටියා! දණිස් ළඟටම කකුල් ආවරණය කෙරෙන බූට්ස් පැළැඳ සිටි ඔහුගේ අතේ, කෙළවරේ ලොකු ගැටයක් සහිත මුගුරක් තිබුණා. එහෙත් ඔහු සිටියේ සුදුමැලිවෙලා, බොහෝම කැළැඹීමට පත්වෙලා. ඒ පෙනුම ඇයට සැනසීමට කරුණක් වුණා. ඔහුගේ වයස අවුරුදු තිහකට වැඩි මිසක් අඩු නැතැයි ඊඩිත් බැක්ස්ටර් පවසනවා.

"ඔබට කියන්න පුළුවන්ද මං මේ ඉන්නෙ කොහේද කියලා. කොයි පැත්තට යන්නද කියලා හිතාගන්න බැරුව, මං මේ විල්ලුව මැද්දෙ නිදාගන්න හිතුවා විතරයි. එතකොටයි මං ඔබේ ලන්තෑරුමේ එළිය දක්කෙ."

"මහත්මයා ඔබ ඉන්නේ කර්නල් රොස්ට අයත් කිංස් පීලන්ඩ් අශ්වයින් පුහුණු කිරීමේ මධ්‍යස්ථානය කිට්ටුව." ඇය කිව්වා.

"අනේ හැබෑටම? එහෙනම් මම හරි වාසනාවන්තයි. මං දන්නවා හැමදාම රෑට ඉලන්දාරියෙක් ඉස්තාලයේ තනියම මුරට සිටින බව. බාග වෙලාවට ඔබ මේ අරගෙන යන්නේ ඔහුගේ රෑ කෑමවේල වෙන්න ඇති. මං දන්නවා ඔබ ඒ තරම් ආඩම්බර කෙනෙක් වෙන්න බෑ. අලුත්ම ගවුමක් මිළදී ගන්න, මුදලක් උපයාගන්න තිබෙන අවස්ථාවක් ඔබ ප්‍රතික්ෂේප කරන්නෙ නැහැ නේද?"

මෙහෙම කිව් ඔහු ඇතුළු කබායේ සාක්කුවෙන් නැමූ සුදු කඩදාසියක් එළියට ගත්තා.

"මෙන්න මේ ලියුම ඒ ඉලන්දාරියාට අද රෑම දෙන්නකෝ. ඒකට ගාස්තුව වගයෙන් ඔබට ලැබෙනවා, සාප්පුවේ තිබෙන ලස්සනම ගවුම මිළදී ගැනීමට මුදල්."

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහු මෙහෙම කියද්දි ඇය කලබල වුණා. ඔහු එය තදින්ම පැවසූ ආකාරයට ඇය හයවුණා. ඔහු පසුකර දමා ඇය ඉස්තාලය වෙත දිවගියා.

සේවක තරුණයාගේ කෑම පිඟාන ජනේලයෙන් ඔහුට දීමටයි ඇය පුරුදුව සිටියේ. ඇය එතැනට යන විටත් ජනේලය විවෘතව තිබුණා. ඒ අසල තිබුණු කුඩා මේසය ළඟ හන්ටර් වාඩිවී සිටියා. ඇය මුහුණ දුන් සිද්ධිය ඔහුට විස්තර කරන්න පටන් ගත්තා පමණයි, ඔන්න අර නාඳුනන මිනිහා එතැනටත් ආවා.

"සුභ සන්ධ්‍යාවක්" ඔහු කිව්වේ ජනේලයෙන් ඇතුළට එබෙමින්.

"මට තියෙනවා ඔබත් එක්ක වචනයක් දෙකක් කථා කරන්න."

අමුත්තා මෙහෙම කියද්දි ඔහුගේ මිට මොළවූ අතේ පැත්තකින්, අර කුඩා කඩදාසි පැකැට්ටුවේ කෙළවරක් එළියට පෙනෙන්න තිබුණු බව ඊඩිත් බැක්ස්ටර්ට හොඳටම විශ්වාසයි. ඇය ඒ ගැන දිවුරනවා.

"තමුසෙ මොනවද මෙහේ කරන්නෙ?" ඉලන්දාරියා ඇසුවා.

"මං මෙහේ කරන වැඩෙන්, ඔහේගෙ සාක්කුවටත් කීයක් හරි දාගන්න පුළුවනි මිත්‍රයා. මං දන්නවා වෙසෙක්ස් කුසලානට ඔහේල අශ්වයින් දෙදෙනෙක්, සිල්ව බ්ලේස් හා බේයාඩ් ඉදිරිපත් කරන බව. දෙන්නකො නියම "ටිප්" එකක්. ඔහේට හොඳට වාසි ලැබෙනවා. පර්ලොං පහේ රේස් එකේදි බෙයාඩ්ට යාර සීයක් ඉදිරියෙන් දිනන්න පුළුවන් බව කියන්නෙ ඇත්තද?"

"ආ. . . . තමුසෙත් අර "ටිප්" හොයාගෙන එන රේස් ඔත්තුකාරයෙක්ද? ඔය ජාතියේ මිනිස්සුන්ට අපි මෙහේ සලකන හැටි මං පෙන්වන්නම්." එහෙම කිව හන්ටර්, ඉක්මනින් බලු කූඩුව වෙත ගියේ බල්ලා අතහරින අරමුණෙනි.

සේවිකාව ආපහු ගෙදර දුවගෙන ආවා. එහෙම එද්දි ඇය ආපසු හැරී බැලුවා. ඇය දුටුවා අර අමුත්තා ඉස්තාලයේ ජනෙල් කවුළුවෙන් ඇතුළට එබීගෙන ඉන්න හැටි. නමුත් ඊට මිනිත්තුවකට පස්සේ හන්ටර් බල්ලා ලිහාගෙන එනකොට, අර මිනිහා පැන ගිහින්. ඔහු කොහේට ගියාද කියන්න හන්ටර් දුටුවේ නෑ. හන්ටර් බල්ලාත් රැගෙන ගොඩනැගිල්ල වටේටම ගියත්, අර පුද්ගලයා ගැන කිසිදු සලකුණක් දැකගන්න බැරිවුණා."

http://sherlockholmesinvestigations.blogspot.com



 "ඔහුගේ අතේ ලොකු ගැටයක් සහිත මුගුරක් තිබුණා."

http://sherlockholmesinvestigations.blogspot.com

"මොහොතක් ඉන්න." මම කීවෙමි.

"බල්ලා සමග එළියේ අමුත්තාව සොයද්දී, තරුණයා ඉස්තාලයේ දොර අගුළු දමා ගියේ නැද්ද?"

"විශිෂ්ටයි වොට්සන්! ඉතාම විශිෂ්ටයි!" හෝම්ස් කීවේය.

"ඔබ කිව් මේ කරුණ ඉතාම වැදගත් එකක්. ඒක කොයිතරම් වැදගත්ද කියලා මට අවබෝධ වුණාද කිව්වොත්, මං ඒක ගැනම අහලා විශේෂ විදුලි පණිවුඩයක් ඊයේ යැව්වා ඩාට්මුවර් වලට. අර ඉලන්දාරියා ඉස්තාලයේ දොර හොඳින් යතුරු දමා වහලයි ඔහු කුඩුව වෙත ගිහින් තියෙන්නේ. අර කවුළුවත් කුඩා එකක්ලු. මිනිහෙකුට ඇතුළු වෙන්න තරම් ඒක ප්‍රමාණවත් නැති බවයි කියන්නෙ.

අනෙක් සේවක තරුණයන් දෙදෙනා ආපසු එනතුරු හන්ටර් බලාගෙන සිටියා. ඒළඟට ඔවුන් ආව වහාම සිද්ධිය ගැන කියලා ඔහු අශ්වයින් පුහුණුකරු, ස්ට්‍රේකර්ට පණිවුඩයක් යැව්වා. ඒ විස්තරය අහලා ස්ට්‍රේකර් බොහොම කලබලයට පත්වුණාලු. නමුත් මෙම අමුත්තාගේ පැමිණීම වැදගත් වෙන්නේ කුමන ආකාරයටද කියලා ස්ට්‍රේකර් තේරුම් ගනිපු බවක් පෙනෙන්නේ නැහැ. මෙම සිදුවීම නිසා ඔහු මහත් කැළැඹීමට පත්ව සිටි බවට නම් සැකයක් නැහැ.

රාත්‍රී එකට අවදිවුණු ස්ට්‍රේකර් මහත්මිය දුටුවා, තම සැමියා හැඳ පැළැඳ ගන්නා හැටි. ඇය ඒ ගැන ප්‍රශ්න කළාම ඔහු කියලා තිබෙනවා, අශ්වයින්ගේ ප්‍රවේශම ගැන ඔහුගේ හිතට භය බවත්, ඒ නිසා ඔහුට නිදාගැනීමට අපහසු බවත්. මොකුත් ප්‍රශ්නයක් නැතිව, ඉස්තාලයේ තත්ත්වය සියල්ල සුභවුදායකද කියලා හොයල එන්න, ඔහුට එහි යන්න උවමනා බව කිව්වලු. ඒ වෙලාවේ තනියම අශ්වයින් ගැන හොයන්න නොයන ලෙසට, ස්ට්‍රේකර් මහත්මිය සැමියාට බැගෑපත්ව ආයාචනය කර සිටියාලු. ඔම වෙලාවේ මහ වැස්සක් කඩා වැටෙන්න වැහිබොද වැටෙන ශබ්දය ඇයට ඇහිල තිබෙනවා. නමුත් ඇයගේ ඉල්ලීම ගණනකට නොගත් ඔහු වැහිකබායක් හැඳගෙන ගෙදරින් පිටවී ගියාලු.

ස්ට්‍රේකර් මහත්මිය අවදිවුණේ උදේ හතටයි. තම සැමියා තවමත් ආපසු ඇවිත් නැති බව ඇයට දකින්න ලැබුණා. ඉක්මනින් හැඳ පැළඳගත් ඇය, සේවිකාව ද කැඳවාගෙන ස්ට්‍රේකර් මහතා ගැන හොයා බලන්න නිවසින් පිටත්වී ආවා. ඇයට දකින්න ලැබුණේ

http://sherlockholmesinvestigations.blogspot.com


ඉස්තාලයේ දොර සම්පූර්ණයෙන්ම විවෘත කර දමලා ඇති බව, අශ්වයා ප්‍රවේශම් කරන්න සිටි හන්ටර්, පුටුවක් මත වැතිරිලා සිටියේ සම්පූර්ණයෙන්ම මත්වී සිහිකල්පනාවක් නොමැතිවයි. සිල්ව බ්ලේස් අශ්වයා සිටි ඉස්තාලය හිස්. පුහුණුකරුවා ගැන කිසිම සලකුණක් නෑ.

ඉස්තාලයේ උඩු මහලේ නිදා සිටි සේවක තරුණයන් දෙදෙනා අවදිකරනු ලැබුවා. ඔවුනට රාත්‍රියේ කිසිම් ශබ්දයක් අහන්න ලැබිල නැහැ. කොහොමටත් ඔවුන් බොහොම තදින් නින්ද යන අයලු. හන්ටර් කොයිතරම තදින් මත්වෙලා හිටියද කිව්වොත්, ඔහුව නින්දෙන් අවදිකරවා ගැනීම ඉතාම අපහසු බව ඔවුනට පෙනිලා තියෙනවා. පැහැදිලිවම ඔහු මොනවා හරි ප්‍රබල ඖෂධයක් මාර්ගයෙන් මත්කළා වෙන්න ඇති. ඔහුට නිදාගන්න හැරලා, තරුණයන් දෙදෙනාත් කාන්තාවන් දෙදෙනාත් අශ්වයා සහ පුහුණුකරු සෙවීමේ අරමුණෙන් දිවගොස් තිබෙනවා. නිවස අසල කුඩා කඳු ගැටයට නැගුනාම විල්ලුවේ සෑහෙන තරම දුරට දකිය හැකියිලු. සිල්ව බ්ලේස් අශ්වයාගේ සලකුණක්වත් ඔවුනට දකගන්න බැරිවුණා. නමුත් ඛේදවාචකයක් පිළිබඳ අනතුරු ඇඟවීමක් නම් ඔවුනට දකින්න ලැබුණා.

ඉස්තාලයේ සිට සැතපුම කාලක් පමණ දුරින් පඳුරක පැටලී තිබුණු ජෝන් ස්ට්‍රේකර්ගේ පිටකබාය සුළඟට සෙලවෙන ආකාරය ඔවුන් දුටුවා. ඔවුන් වහාම එතැනට ගියා. එතැනට ටිකක් එහායින් විල්ලුවේ පොළොවට පහත මට්ටමකින් පිහිටි, බේසමක හැඩය ගත් තරමක් ලොකු වළක් ඔවුනට දකින්න ලැබුණා. අවාසනාවන්ත පුහුණුකරු ස්ට්‍රේකර්ගේ මළසිරුරු එහි වැටී තිබුණා. බර ආයුධයකින් එල්ල කළ වේගවත් පහරකින් ඔහුගේ හිසට දරුණු තුවාල සිදුවී ඇති හැටි ඔවුන් දුටුවා. එමෙන්ම ඔහුගේ කලවේ මුවහත් ආයුධයකින් කළ දීර්ඝ කැපුම් තුවාලයක් ද තිබුණා.

කෙසේ වෙතත් සතුරන්ට විරුද්ධව ජෝන් ස්ට්‍රේකර් එඩිතර ලෙස සටන්කර ඇති බව පැහැදිලියි. ඒ මොකද ඔහුගේ දකුණු අතේ කුඩා පිහියක් තිබුණා. පිහිතලය මිට දක්වාම සම්පූර්ණයෙන්ම වැසී තිබුණේ කැටිගැසුණු ලෙයින්. ඔහුගේ වම් අතේ රතු සහ කළු පාට සේද කර ලේන්සුවක් තිබුණා. මෙය, කලින් දා රාත්‍රියේ පැමිණි අමුත්තා පැළැඳ සිටි කර ලේන්සුව බව සේවිකාවට හඳුනාගත හැකිවුණා. මත් වූ නිද්‍රාවෙන් අවදි වූ පසු හන්ටර් ද එම කරුණ

http://sherlockholmesinvestigations.blogspot.com



222 "ස්ට්‍රේකර්ගේ මළසිරුර එහි වැටී තිබුණා."

http://sherlockholmesinvestigations.blogspot.com

නිවැරදි බව සහතික කළා. තමාගේ රාත්‍රී ආහාරය වූ එළුමස් ව්‍යාංජනයට, ජනේලයෙන් නිද්‍රාකාරක ඖෂධයක් මිශ්‍ර කිරීමත් ඒ පුද්ගලයා විසින් කරන්නට ඇති බව හන්ටර්ට විශ්වාසයි. ඒ මගින් මුරකාරයා සිහිමූර්ජාකර අශ්වයා හොරකම් කිරීම ඔහුගේ අරමුණ වෙන්න ඇති.

මළ සිරුර තිබූ වලේ මඩ සහිත පස් මත, අතුරුදන්වූ අශ්වයාගේ කුර සළකුණු සැහෙන්න තිබුණා. අරගලය ඇතිවෙද්දී අශ්වයා එතැන හිටි බවට කිසිම සැකයක් නැහැ. නමුත් පසුදිනට එළිවෙද්දී ඌ එතැනින් අතුරුදන් වෙලා. ඩාට්මුවර් විල්ලුව පෙදෙස වටේටම අභිගුණ්ඨිකයන්ට දැනුම් දීලා අශ්වයා ගැන සෙවිල්ලෙන් හිටියා. අශ්වයා ගැන හරි ආරංචියක් දෙන කෙනෙකුට විශාල ත්‍යාගයක් දෙන බවට ප්‍රසිද්ධ කළා. නමුත් ඌ ගැන කිසිම ආරංචියක් නැහැ. එදා ඉස්තාලයේ සේවක ළමයාට ලැබී තිබුණු රාත්‍රී ආහාරයෙන් ඉතුරු වූ ස්වල්පයක් විශ්ලේෂණය කර තිබෙනවා. එහි සැහෙන තරම් අබිං මිශ්‍රව තිබූ බව විශේෂඥයින්ට සොයාගැනීමට හැකිවුණා. නමුත් එම එළුමස් ව්‍යාංජනයම ආහාරයට ගත් ස්ට්‍රේකර් නිවසේ අයට කිසිම ආබාධයකට මුහුණ දීමට සිදුවුණේ නැහැ.

මේ පරීක්ෂණය සම්බන්ධ ප්‍රධාන කරුණු තමයි මම මේ සඳහන් කළේ. මෙය භාරව් තිබෙන පොලිස් පරීක්ෂක ග්‍රෙගරි බොහොම දක්ෂ නිලධරයෙක්. සිදුවීම වුණු ආකාරය පිළිබඳව චිත්තරූපයක් සිතේ මවාගැනීමට තරම් ඔහුට හැකියාවක් ඇත්නම්, රැකියාවේ ඉහළටම ඔහුට උසස්වීමට හැකි බවට සැකයක් නෑ.

පරීක්ෂණ සඳහා පැමිණි ග්‍රෙගරි සැකයට භාජනය වූ මිනිහාව සොයාගෙන, ඔහුව ඉක්මනින් අත්අඩංගුවට ගත්තා. ඔහු සොයාගැනීම එතරම් අපහසු වුණේ නැහැ. ඒ මොකද ඔහු ලැගුම්ගෙන හිටියේ අර මං ඔබට කලින් කිව්, ආබාධිතයන් වාසය කළ නිවාස වලට සමීපව කුලියට ගත් නිවාසයක. ඔහුගේ නම ෆිට්ස්රෝයි සිම්සන්. ඔහු බොහොම හොඳ ඉහළ පෙළේ පවුලක උපත ලබලා, හොඳ අධ්‍යාපනයක් ලැබූ අයෙක්. නමුත් රේස් ඔට්ටු ඇල්ලීමට ගිහින් මහා ධනස්කන්ධයක් අපරාදේ විනාශ කළ කෙනෙක්. දැන් ඔහු අමාරුවෙන් ජීවත්වෙන්නේ, ලන්ඩනයේ සුප්‍රසිද්ධ රේස් ඔට්ටු සමාගම්වලට අශ්වයින් පිළිබඳව රහස් ඔත්තු සැපයීමෙන්. ඔහු ඔට්ටු භාරගනිපු පොත පරීක්ෂා කර බලා තියෙනවා. ඒකෙ සඳහන්ව තිබෙනවා

http://sherlockholmesinvestigations.blogspot.com

අතුරුදන් වූ සිල්වර් බ්ලේස් ජයග්‍රහණය කරන බවට රන්පවුම් පන් දහසක මුදලකට ඇල්ලූ ඔට්ටු ගැන. අත්අඩංගුවට ගත්තාම, සිය කැමැත්තෙන්ම ඔහු ප්‍රකාශයක් කර තිබෙනවා.

ඔහු ඩාට්මුවර් ප්‍රදේශයට ඇවිත් තියෙන්නේ කර්නල් රොස්ගේ අශ්වයින් සහ මේපල්ටන් ඉස්තාලයෙන් වෙසෙක්ස් කුසලානට ඉදිරිපත් වෙන ඩෙස්බරෝ නම් අශ්වයා ගැන අලුත්ම තොරතුරු සපයාගන්නා අදහසින්ලු. මේ ඩෙස්බරෝ 'සිල්වර් බ්ලේස්' ට හොඳ තරඟයක් දෙයි කියා විශ්වාස කරන අනෙක් වේගවත්ම අශ්වයා. කලින් දවසේ සිම්සන්ගේ හැසිරීම පිළිබඳව හෙළිවූ කරුණු කිසිවක් ඔහු ප්‍රතික්ෂේප කළේ නැහැ. නමුත් ඔහු කියා සිටියා කිසියම් අපරාධයක් කිරීමේ චේතනාවක් හෝ සැලැස්මක් ඔහුට නොතිබුණු බව. ඔහුට අවශ්‍යව තිබුණේ, අශ්වයින් පිළිබඳව නිවැරදි තොරතුරු ඉස්තාලයෙන්ම 'උණු උණුවේ' ලබාගැනීම බව. ඔහුගේ නැතිවූ කර ලේන්සුව ඉදිරිපත් කළාම සිම්සන් බොහොම සුදුමැලි වුණා. එපමණක් නොවෙයි, මියගිය තැනැත්තාගේ අතට එය ලැබුණේ කොහොමද යන්න ගැන කිසිවක් කීමට ඔහුට හැකියාවක් තිබුණේ නැ. ෆිට්ස්රෝයි සිම්සන්ගේ ඇඳුම තෙම් තිබුණා. ඒකින් තේරුම් ගැනීමට හැකිවුණේ ඔහු කලින් දා රාත්‍රියේ වැස්සට හසුවී ඇති බවයි. ඊට අමතරව ඔහුගේ සැරයටිය මෙහිදී ඉතාම වැදගත් වෙනවා. එය 'පීනෑං නීතිඥ සැරයටි' නමින් හඳුන්වන වර්ගයේ, මීට තුළට ඊයම් පුරවා සෑදූ බර මුගුරක්. මියගිය තැනැත්තා ලබා ඇති තුවාල දිහා බලන විට ඒවා මෙවැනි බර මුගුරකින් නොනවත්වා පහර දීමෙන් කළ හැකි ඒවා. අනෙක් අතට සිම්සන්ට කිසිම තුවාලයක් සිදුවී තිබුණේ නැහැ. ස්ට්‍රේකර්ගේ පිහියේ තිබුණු ලේ ප්‍රමාණය අනුව, ඔහුගේ සතුරන්ගෙන් අඩුම වශයෙන් එක් අයෙකුවත් තුවාල ලබා සිටිය යුතුයි. ඔන්න වොට්සන් කරුණු සියල්ලම කෙටියෙන් එහෙත් නොඅඩුව පැවසුවා. මේ ගැටලුව විසඳීමට යම් අදහසක් දියහැකි නම් මං ඔබට කෘතඥ වෙනවා."

හෝම්ස් තම දීර්ඝ කථාන්තරය එසේ පවසද්දී මම එයට දැඩි උනන්දුවෙන් සවන් දීගෙන සිටියෙමි. ඔහුට සුපුරුදු පැහැදිලි ශෛලියෙන් ඉදිරිපත් කළ මේ කරුණු බොහොමයක් මා පුවත්පතෙන් කියවා තිබූ ඒවා විය. එහෙත් ඒ කිසිවක් එකිනෙකට සම්බන්ධ වන ආකාරය හෝ ඒවායේ වැදගත්කම මම වටහාගෙන නොසිටියෙමි.

http://sherlockholmesinvestigations.blogspot.com

"මෙහෙම වෙන්න බැරිද හෝම්ස්? සමහර විට අර ස්ට්‍රේකර්ගේ කලවයේ තිබුණු තුවාලය ඔහුගේම පිහියෙන් සිදුවූ එකක් වෙන්න බැරිද?"

"සමහර විට නෙමෙයි වොට්සන්, බොහෝ දුරට ඒ විධියට සිදුවුණා වෙන්න පුළුවනි. එහෙම වුණොත් විත්තිකාර සිම්සන්ගේ වාසියට තිබෙන එක් සාක්ෂියක් ඉවත්වෙනවා. නමුත් තවමත් මට හිතාගන්න අමාරුයි, පොලිසිය මේ පිළිබඳව දරන මතය කුමක් වේවිද කියල.

අප ඉදිරිපත් කරන උපකල්පනය කුමක් වුවත්, ඊට විරෝධතා මතුවෙන්න පුළුවන් කියා මට හිතෙනවා වොට්සන්. මට දැනගන්න ලැබුණු හැටියට පොලිසියේ මතය මේකයි.

මත්බෙත් සහිත කෑම ඉස්තාලයේ ඉලන්දාරියාට කන්න සලස්වලා, සිම්සන් තමන් ළඟ තිබූ අමතර යතුරකින් ඉස්තාලයේ දොර ඇරගන්නවා. ඔහු අශ්වයා ඉවතට ගත්තේ පැහැරගෙන යාමේ අදහසින්. නමුත් අශ්වයාගේ කටකලියාව දමා තිබුණේ නැහැ. සිම්සන් එයත් අශ්වයාට දමාගන්න ඇති. එහෙම කරලා ඉස්තාලයේ දොර විවෘතව තිබියදී සිම්සන්, සිල්වර් බ්ලේස් අරගෙන පිටවී යනවා. එක්කෝ පුහුණුකරු ස්ට්‍රේකර්ට, සිම්සන් සහ අශ්වයා මගදී හමුවුණා. නැතිනම් පුහුණුකරු ඔවුන් පසුපස එළවාගෙන ගිහින් අල්ලාගන්නවා. එතැනදී සණ්ඩුවක් ඇතිවුණු එකේ පුදුමයක් නෑ. ස්ට්‍රේකර්ගේ පිහිපාරෙන් බේරිලා, ඔහුට දරුණු සැරයටි පහර කිහිපයක් එල්ල කිරීමට සිම්සන් සමත් වෙනවා. ඊට පස්සේ ඔහු අශ්වයා අරගෙන ගිහිං රහස් තැනක සඟවන්න ඇති. එහෙමත් නැත්නම් මේ සණ්ඩුව වෙන අතරේ අශ්වයා පැන ගිහින්, තවමත් මේ විල්ලුවෙම කොහේ හරි ඉන්නවා වෙන්නත් පුළුවනි. පොලිසියේ මතය එයයි. මෙය සිදුවිය නොහැකි එකක් බව බැලූබැල්මටම පෙනෙනවා. නමුත් වෙනත් පැහැදිලි කිරීම මේ තරමටවත් සිදුවිය හැකි ඒවා නොවෙයි. කොහොම වුණත් අදාල ස්ථානයට ගියාට පස්සේ මං මේ හැම දෙයක්ම හොඳින් සෝදිසි කරලා බලනවා. එතෙක් මේ සම්බන්ධයෙන් වැඩිදුර යමක් කීමට හැකියාවක් මට නම් නැහැ.

ටැවිස්ටොක් නම් ගම්මානය වෙත අප ළඟාවන විට සන්ධ්‍යා කාලය එළැඹී තිබිණ. විශාල කවයක් ලෙස පිහිටි ඩාට්මුවර් විල්ලුවේ මැද ටැවිස්ටොක් ගම්මානය පිහිටා තිබුණේ විශාල පලිහක් මැද

http://sherlockholmesinvestigations.blogspot.com

උඩට නෙරා ආ කොටස විලසිනි. අප බලාපොරොත්තුවෙන් මහත්වරු දෙදෙනෙක් දුම්රිය පොළෙහි රැඳී සිටියහ. සිංහයෙකුගේ කේශර වැනි කොණ්ඩයක් ද, මුහුණ පුරා වැඩුණු රැවුලක් ද තිබූ පුද්ගලයා පොලිස් පරීක්ෂක ග්‍රෙගරිය. සියලුම ඇඳුම් පැළඳුම්වලින් සම්පූර්ණ වී, උපැසක් පැළඳ සිටි, කුඩා සිරුරක් තිබූ අනෙකා කර්නල් රොස්ය. ඔහු රේස් සඳහා අශ්වයින් යෙදවීම පිළිබඳව ඉමහත් ප්‍රසිද්ධියක් ලබාසිටි තැනැත්තෙකි.

"ඔබේ පැමිණීම ගැන මට බොහොම සන්තෝෂයි, හෝම්ස් මහත්මයා. මේ පරීක්ෂක ග්‍රෙගරි මහත්මයා කළ යුතුයි කියල හිතෙන හැම දෙයක්ම කළා. ඒ වුණත් අහිංසක ස්ට්‍රේකර් මරා දැමූ පුද්ගලයාට නිසි දඬුවම් ලබාදීමටත්, මගේ නැතිවූ අශ්වයා සොයා ගැනීමටත් කළ හැකි ඕනෑම දෙයක්ම කිරීමට මං පසුබට වෙන්නෙ නෑ."

"මොනවද අලුතෙන් දැනගන්න ලැබිල තියෙන තොරතුරු?"

"කියන්නත් කණගාටුයි මහත්මයා, අප ලැබූ ප්‍රගතියක් නම් නෑ. විවෘත අශ්ව කරත්තයක් එළියේ සූදානමින් තියෙනවා. ඇඳිරි වැටෙන්න කලින් එම ප්‍රදේශය පරීක්ෂා කරන්න ඔබ කැමැත්තෙන් ඇති. ඒ නිසා අපි යන ගමන් කථාකරමු."

මිනිත්තුවක් ගතවෙද්දී ඩෙවන්ෂයර් ප්‍රදේශය හරහා අපි අශ්ව කරත්තයෙන් ගමන් කරමින් සිටියෙමු.

ග්‍රෙගරි මෙම අපරාධය පිළිබඳව තම අදහස විස්තර කළේය. එය සම්පූර්ණයෙන්ම හෝම්ස් දුම්රියේදී පැවසූ දෙයම විය. හෝම්ස් වරින් වර ප්‍රශ්න ඉදිරිපත් කළ අතර, කර්නල් රොස් සියල්ලටම සාවධානව සවන්දීගෙන සිටියේය.

"ෆිට්ස්රෝයි සිම්සන් බොහොම දුරට දැන් දැලේ හිරවෙලා අවසන්. මං විශ්වාස කරනවා අප සොයන අපරාධ කාරයා ඔහුයි කියල. ඔහුට විරුද්ධව ඇති සාක්ෂි ගැන කියනවා නම්, ඒවා කෙළින්ම ඔහු වරදට හසු නොකළත්, අනියම් ආකාරයට ඔහු වරදකරුවා බව ඔප්පු කරන ඒවා."

"ස්ට්‍රේකර්ගේ පිහිය ගැන හොයල බැලුවද?"

"ඒක ගැන අපි අවසන් නිගමනයකට ආවා. ස්ට්‍රේකර්ට තුවාලය සිදුවී ඇත්තේ, ඔහු ඇද වැටෙද්දී තමාගේම පිහියෙන්."

http://sherlockholmesinvestigations.blogspot.com



"ඔබේ පැමිණීම ගැන මට බොහොම සන්තෝෂයි."



Reading Purpose Only, Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

"මගේ මිත්‍ර දොස්තර වොට්සනුත් අප එද්දී දුම්රියේදී ඔය මතයම ප්‍රකාශ කළා. ඒක එහෙම නම් සිම්සන්ට විරුද්ධව සාක්ෂිය තවත් ශක්තිමත් වෙනවා."

"ඇත්තෙන්ම ඔව්. සිම්සන් ළඟ පිහියක් වත්, තුවාලයක් වත් නැහැ. ඔහුට විරුද්ධව ඉතාමා ප්‍රබල සාක්ෂි තියෙනවා. සිල්ව බ්ලේස් අශ්වයා අතුරුදන්වීම ඔහුට ලොකු වාසියක්. ඉස්තාලයේ සේවකයාගේ කෑමට විෂ මත්බෙහෙත් දැමීම ගැනත් ඔහු වෙත සැකය යොමු වෙනවා. වැස්ස වෙලාවේ ඔහු එළියෙ ගමන් කර ඇති බවට කිසිම සැකයක් නෑ. ඊළඟට ඔහු ළඟ ඇති බර සැරයටිය සහ මියගිය තැනැත්තා අතේ තිබූ කර ලේන්සුව ගැනත් අපට අමතක කරන්න බෑ. මං හිතන්නේ ජූරි සභාවක් සෑහීමට පත්කරන්න ප්‍රමාණවත් තරම් සාක්ෂි අප ළඟ තියෙනවා."

ඊයට එකඟ නොවන බව හඟවමින් හෝම්ස් හිස සෙලෙව්වේය.

"දක්ෂ නීතිඥයෙකුට පුළුවනි ඔය සාක්ෂි හැම එකක්ම කෑබලි කෑබලිවලට කඩා දමන්න. ඔහු මොකටද අශ්වයා ඉස්තාලයෙන් ඉවතට අරගෙන යන්නේ? ඔහුගේ අරමුණ අශ්වයාට තුවාල සිදුකිරීම නම්, ඒක ඉස්තාලය තුළදීම කළ හැකියි. ඔහු ළඟ අශ්වයාගේ කුඩුවේ දොර විවෘත කළ හැකි අමතර යතුරක් තිබුණාද? ඔහුට අබිං කුඩු විකුණුවේ කුමන ඖෂධ වෙළෙන්දාද? ඒ ඔක්කොටම වඩා මේ පළාතට අමුත්තෙක් වන සිම්සන්, කොහේද අශ්වයෙක්ව හංගන්නේ? වෙන එකෙක් නොවෙයි, සිල්ව බ්ලේස් වගේ සුප්‍රසිද්ධ, කැපී පෙනෙන අශ්වයෙක්? අර සේවිකාව අතේ ඉස්තාලයේ ඉලන්දාරියාට යවන්න හැදූ ලියමන ගැන සිම්සන් මොකද කිව්වේ?"

"ඔහු කියනවා ඒක පවුම් දහයේ නෝට්ටුවක්ලු. ඔහුගේ මුදල් පසුම්බියේ තිබී පවුම් දහයේ නෝට්ටුවක් නම් හම්බවුණා. නමුත් ඔබ පැවසූ අර දුෂ්කරතාවල් නම් ඔය කියන තරම් බරපතල නැහැ.

ඔහු මේ පළාතට අමුත්තෙක් නොවෙයි. ඔහු දෙවතාවක්ම ග්‍රීෂ්ම සෘතුවේදී ටැවිස්ටොක් නිවාසවල ලැගුම්ගෙන ඉඳලා තියෙනවා. අබිං නම් ඔහු ලන්ඩනයෙන් මිලදී ගෙන, අරගෙන එන්න ඇති. අර අමතර යතුරෙන් ගතයුතු ප්‍රයෝජනය ගත්තට පස්සේ කොහේට හරි විසිකළා වෙන්න පුළුවනි. ඒ වගේම අශ්වයා මේ පළාතේ ලෝහ ඉල්ලම් හාරන ගැඹුරු පතලක අඩියේ වෙන්න ඇති."

http://sherlockholmesinvestigations.blogspot.com

"කරලේන්සුව ගැන ඔහු මොනවද කියන්නේ?"

"ඔහු පිළිගන්නවා ඒක ඔහු සතු දෙයක් කියල. සිම්සන් කියන්නේ ඒක ඔහු අතින් නැතිවුණා කියලයි. නමුත් දැන් පරීක්ෂණයට තවත් කරුණු කිහිපයක් එකතුවෙලා තියනවා. එයින් අපට හිතාගන්න පුළුවනි, ඔහු අශ්වයාව ඉස්තාලයෙන් එළියට දක්කාගෙන ගියේ ඇයි කියලා."

මේ තොරතුරු ගැන හෝම්ස්ගේ ඇදසවන් යොමුවිණි. ග්‍රෙගරි කථාව පටන් ගත්තේය.

"මේ මිනීමැරුම සිදුවුණු තැන ඉඳලා සැතපුමක් ඇතුළත, සඳුදා රාත්‍රියේ අභිගුණ්ඨිකයින් කඳවුරු බැඳගෙන හිටි තැනක ලකුණු අපට දකින්න ලැබුණා. නමුත් අඟහරුවාදා වෙනකොට ඔවුන් එතැනින් පිටවෙලා ගිහින්. සිම්සන් හා අභිගුණ්ඨිකයන් අතර යම් රහස් ගිවිසුමක් හෝ සම්බන්දතාවයක් තිබුණා කියලා හිතමු. එහෙම නම්, ස්ට්‍රේකර්ට සිම්සන්ව අහුවුණේ ඔහු අශ්වයාව අභිගුණ්ඨිකයන් වෙත දක්කාගෙන යද්දී වෙන්න බැරිද? දැනට සිල්වර් බ්ලේස් ඔවුන් ළඟ ඉන්නවා වෙන්නත් පිළිවන්."

"ඔව් ඇත්තෙන්ම එහෙම දෙයක් වෙන්නත් පුළුවනි."

"අභිගුණ්ඨිකයන් සොයන්න විල්ලුව ප්‍රදේශය සම්පූර්ණයෙන්ම පීරා බලන්න අපි පටන් අරගෙන. ටැවිස්ටොක් ප්‍රදේශයේ සහ මෙහි සිට සැතපුම් දහයක අර්ධ විෂ්කම්භයක, සෑම ඉස්තාලයක්ම අශ්ව මඩුවක්ම මං පරීක්ෂාවට ලක් කළා."

"මෙහේට කිට්ටුවම තවත් අශ්වයින් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් තිබෙන බව අපට අහන්න ලැබුණා?"

"ඒක ඇත්ත. ඒ කරුණත් අපි මහා සලකා හරින එක වැරදියි. ඔවුන්ගේ අශ්වයා වන ඩෙස්බරෝ, සිල්වර් බ්ලේස් එක්ක දුවද්දී දෙවැනි තැනට පත්වෙන බවයි කාගේත් මතය. ඒ නිසා සිල්වර් බ්ලේස් අතුරුදන් වුණු එකට ඔවුන් කැමැති ඇති. එතැන ප්‍රධාන පුහුණුකරුවා සයිලස් බ්‍රවුන්. ඔහු ඩෙස්බරෝ දිනන බවට විශාල මුදල් ප්‍රමාණයක් ඔට්ටු අල්ලා ඇති බව අපට දැනගන්න ලැබුණා. ඒ වගේම ඔහු ජෝන් ස්ට්‍රේකර් එක්ක එච්චර හිත හොඳ නෑ. අපි ඔවුන්ගේ ඉස්තාලයත් පරීක්ෂා කරල බැලුවා. නමුත් මේ සිද්ධියට සයිලස් බ්‍රවුන් සම්බන්ධ යයි සිතිය හැකි කිසිම ලකුණක් එහි තිබුණේ නැහැ.

http://sherlockholmesinvestigations.blogspot.com

"මෙ පුද්ගලයා සිම්සන්, මේපල්ටන් ඉස්තාලය හා සම්බන්ධ කෙරෙන කරුණක් ඔබට හමුවුණේ නැද්ද?"

"ඒත් නැහැ."

කතාබහ එතැනින් අවසන් විය. මිනිත්තු කිහිපයකට පසු රියැදුරා රථය නැවැත්විය. ඒ රතු පැහැති ගඩොළුලන් තනා තිබූ හුරුබුහුටි කුඩා නිවසක් අසලයි. අශ්වයින් පුහුණු කිරීම සඳහා සකස් කළ ධාවන පථයක් සහිත ප්‍රදේශයක් ද ඉදිරියෙන් පිහිටා තිබිණි. ඊටත් එහා පැත්තෙන් තරමක් ඈත, ළඳු ගසවිලි කළ දිගු ගොඩනැගිල්ලක් අපි දුටුවෙමු.

ඊට අමතරව කැඩිස්ටම්ටන් දෙසින්, තුරඟ තරඟ වලදී අශ්වයින් මුහුණ දෙන, පැනීම පුහුණුවීම සඳහා මල්වැට හා දියකඩිති ද, ගෙවල් කිහිපයක් ලෙස මේපල්ටන් ඉස්තාලය ද දැකිය හැකිවිය. ඒ හැරුණු විට සෑම දෙසකින්ම දක්නට ලැබුණේ ලෝකඩ පැහැති ධාවිමුවර් විල්ලුවයි. අපි කවුරුත් අශ්ව රියෙන් බිමට බැසීමු. එහෙත් හෝම්ස් පමණක් අසුනේ සුවපහසු ලෙස වාඩිවී, ඈත අහස දෙස නෙත් යොමුකරගෙන, කල්පනාවේ වෙළී සිටියේය. මම ඔහුගේ අතට තට්ටු කළෙමි. තමා සිටියේ කොහිද යන්න අවබෝධ වී, ඔහු ඉක්මනින් රියෙන් බිමට බැස්සේය. කර්නල් රොස් හෝම්ස් දෙස බලාසිටියේ මහත් පුදුමයෙනි.

"සමාවෙන්න මහත්මයා. මම මේ දවල් හීනයක් දකිමින් සිටියේ." හෝම්ස් පිළිතුරු දුන්නේය.

රියෙන් බැස ආ මගේ මිතුරාගේ දෑනෙත් දීප්තියෙන් බබළන ආකාරයත්, ඔහු සතුටෙන් ඉපිලෙන ස්වභාවයත් මට තේරුම් ගත හැකිවිය. ගැටලුව විසඳීම පිළිබඳ දැක්කර් මගට ඔහු සාර්ථක ලෙස පිවිසී ඇති බවට සංඥාවකි මේ. ඔහුට මේ හෝඩුවාව ලැබුණේ කොතැනකදී දැයි මට සිතාගත නොහැක.

"හෝම්ස් මහත්මයා, ඉක්මනට වෙලාම අපරාධය සිදුවූ තැනට ගිහිං එන්න ඔබ කැමැති ඇති?" ග්‍රෙගරි ඇසීය.

"නෑ. මං වැඩිය කැමතියි ටික වේලාවක් මෙහේ ඉඳලා නොපැහැදිලි තැන් කිහිපයක්, ප්‍රශ්නයක් දෙකක් මාර්ගයෙන් පැහැදිලි කරගන්න. ස්ට්‍රේකර්ගේ මළසිරුර ආපසු ගේන්න ඇති කියලා මම විශ්වාස කරනවා?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව්. මිනිය උඩහට්ටුවේ. හදිසි මරණ පරීක්ෂණය පැවැත්වෙන්නේ හෙට."

"ඔබේ සේවකයෙක් ලෙස ඔහු දන් සැහෙන කාලයක සිට කටයුතු කළා නේද කර්නල් රොස්?"

"ඔව්. ඔහු ඉතාම හොඳ සේවකයෙක් බව මට සෑම විටකම පෙනීගියා."

"ඔහුගේ මරණය සිදුවෙන වෙලාවේ ස්ට්‍රේකර්ගේ සාක්කුවේ තිබුණු ද්‍රව්‍ය වල නාමලේඛනයක් ඔබ පිළියෙළ කරන්න ඇති ග්‍රෙගරි?"

"එම දේවල් හැම එකක්ම එකතුකරලා විසිත්ත කාමරයේ තැනක මම තැන්පත් කර තැබුවා. ඔබට අවශ්‍ය නම් බලන්න පුළුවනි."

"එය දකින්න ලැබෙනවා නම් මට ලොකු සතුටක්." හෝම්ස් පිළිතුරු දුන්නේය.

අප මේසය වටා රැස්වී බලාසිටියදී පොලිස් පරීක්ෂක ග්‍රෙගරි, හතරැස් ලෝහ පෙට්ටියක තිබූ දේවල් මේසය මතට හැළුවේය. ගිනිපෙට්ටියක්, අඟල් දෙකක් පමණ දිග ඉටිපන්දම් කැබැල්ලක්, බ්‍රයර් ලීයෙන් තැනූ දුම් පයිප්පයක්, පසුම්බියක ඇසිරූ පයිප්පයට දමන දුම්කොළ අවුන්ස භාගයක්, රන්දම්වැලක් සහිත රිදී ඔරලෝසුවක්, රන්පවුමේ කාසි පහක්, ඇලුමිනියම් පැන්සල් පෙට්ටියක්, ලිපි කිහිපයක්, සහ ලන්ඩනයේ වයිස් සමාගමේ තැනූ ඇත්දත් මිටක් සමඟ ඉතා මුවහත්, එහෙත් නොනැමෙන සුළු තලයක් සහිත පිහියක් ද එහි විය.

"මේක හරිම සුවිශේෂ පිහියක්." හෝම්ස් පැවසුවේ එය සියුම් ලෙස පරීක්ෂණයට ලක් කරමිනි.

"මෙහි දක්නට ලැබෙන ලේ පැල්ලම් නිසා මට හිතෙනවා මියගිය තැනැත්තා අතේ තිබූ පිහිය මේක වෙන්න ඇති කියලා. වොට්සන් මේක නම් ඔබේ ක්ෂේත්‍රයේ භාවිත කරන ආයුධයක් බවට සැක නෑ?"

"මේකට තමයි අපි කියන්නේ Cataract knife - අක්ෂි සැත්කම් පිහිය කියලා."

"මං දනගත්තා. බොහොම සියුම් සැත්කම් සඳහා යොදාගන්නා සියුම් තලයක් සහිත පිහියක්. රාත්‍රියේ ගෙදරින් එළියට බැහැලා

http://sherlockholmesinvestigations.blogspot.com

අන්තරායදායක ගවේෂණ කටයුත්තකට යන කෙනෙකු මෙවැනි ආයුධයක් ගෙන යෑමත් පුදුමයක්; විශේෂයෙන්ම මේකෙ තලය ආරක්ෂා සහිතව ආවරණය කරගෙන යෑමට ක්‍රමයක් නැති නිසා. ."

"පිහිතලයේ තුඩ ආවරණය කිරීමට යොදාගත් කුඩා කිරල මූඩි කැබැල්ලක් මළසිරුර අසල තිබී අපට හමුවුණා." පොලිස් නිලධරයා කීය.

"ඔහුගේ බිරිඳ කියනවා මේක කන්නාඩි මේසය උඩලු තබා තිබුණේ. කාමරයෙන් පිටවෙද්දි ඔහු මෙය අතට ගත් බවයි පෙනෙන්නේ. මේක ආයුධයක් හැටියට බොහොම දුර්වල එකක් බව ඇත්ත. නමුත් ඒ වෙලාවෙ ඔහුට සොයාගැනීමට තිබුණු හොඳම ආයුධය මේක වෙන්න ඇති."

"ඔව් බොහෝ විට එහෙම වෙන්න ඇති. ලිපි ගැන මොනවද කියන්න පුළුවන්?"

"එයින් ලිපි තුනක් අශ්ව ගාලට පිදුරු සපයන්නන්ගේ බිල්පත් සහ ගනුදෙනු වාර්තා. එකක් කර්නල් එවා තිබුණු උපදෙස් අඩංගු ලිපියක්. අනෙක බොන්ඩ් වීථියේ ලෙසූරියර් නම් කාන්තා ඇඳුම් හා හිස්වැසුම් අලෙවි කරන ආයතනයකින් නිකුත් කළ අයකිරීම් පතක්. පවුම් තිස්හතයි, පැන්ස අහළොවකට එම අයපත නිකුත්කර තිබෙන්නේ විලියම් ඩර්බිෂයර් නැමැත්තෙකුට. විලියම් ඩර්බිෂයර් කියන්නේ ඇගේ ස්වාමියාගේ මිතුරෙකු බව ස්ට්‍රේකර් මහත්මිය අපට පැවසුවා. ඔහුට යැවිය යුතු ලියුම් ඉඳහිට ඇගේ ස්වාමියාගේ නමට හරවා එවනවලු."

හෝම්ස් එම අයපත සහිත ලිපිය පරීක්ෂා කර බැලුවේය.

"විලියම් ඩර්බිෂයර්ගේ නෝනා නම් බොහොම මිළ අධික දේවල් අඳින පලඳින කෙනෙක් වගෙයි. එක් හිස්වැස්මකට ගිනි විසි දෙකක්? ඒ කියන්නේ බොහොම මිළ වැඩි වර්ගයේ එකක්. කොහොම වුණත් මේවායින් දැනගැනීමට වෙනත් කිසිවක් නැති බවයි පෙනෙන්නේ. අපි යමු අපරාධය සිදුවූ තැනට."

විසිත්ත කාමරයෙන් අප එළියට බසින්නම බරාඳයේ රැඳී සිටි කාන්තාවක් ඉදිරියට ආවාය. මුහුණපෑමට සිදුවූ බිහිසුණු සිදුවීම නිසා ශෝකයෙන් ඇළලී ගිය ලකුණු ඇගේ මුහුණේ දිස්විය. පොලිස් නිලධරයාගේ කමිස අතෙන් අල්ලා නැවැත්වූ ඇය, ඔහු ඇමතුවාය.

http://sherlockholmesinvestigations.blogspot.com



 "ඔබට හැකිවුණාද ඔවුන්ව හොයාගන්න?"

http://sherlockholmesinvestigations.blogspot.com

"අනුවුණාද ඔවුන්ව? ඔබට හැකි වුණාද ඔවුන්ව හොයාගන්න?"

"තවමත් අපට ඊට හැකියාවක් ලැබුණේ නැහැ ස්ට්‍රේකර් නෝනා. මේ ෂර්ලොක් හෝම්ස් මහත්මයාත් ලන්ඩනයෙන් ඇවිත් ඉන්නෙ අපට උදව් කරන්න. යොදන්න පුළුවන් හැම උත්සාහයක්ම අපි යොදනවා."

"සමාවෙන්න ස්ට්‍රේකර් මහත්මිය, ඕක කලකට ඉස්සර ප්ලිමත් නගරයේ උද්‍යාන සම්භාෂණයකදී ඔබ මට හමුවුණා නේද?" හෝම්ස් එක්වරම ඇසීය.

"නැහැ මහත්මයා, ඔබට වැරදීමක්."

"අනේ හැබෑට? මට දිවුරන්න පුළුවනි. ඔබ එදා ඇඳ හිටියේ දීප්තිමත් අළු පැහැයේ සේද ගවුමක්. ඒක පැස්බර පිහාටු වලින් වැඩ දමා තිබුණා."

"ඔය කියන බිධියේ ගවුමක් නම් මට කවදාවත් තිබුණේ නෑ." කාන්තාව පිළිතුරු දුන්නාය.

"ආ එහෙනම් එහෙම වෙන්න ඇති." පැවසූ හෝම්ස් තම වැරදීම ගැන ඇගෙන් සමාව අයැද සිටියේය.

අපි නිවසින් පිටත්ව ගියෙමු. කෙටි දුරක් විල්ලුවේ ඇවිද ගිය අපි, මළසිරුර හමුවූ විශාල ආවාටයක් වැනි වළ පිහිටි තැනට ළඟාවූයෙමු. කබාය එල්ලා තිබූ පඳුර පිහිටියේ ඒ අසල තැනිතලා බිම මතුපිටයි.

"එදා රාත්‍රි තදින් සුළං හැමූ බවක් අහන්න ලැබුණේ නැද්ද?" හෝම්ස් ඇසීය.

"නැහැ. නමුත් ධාරානිපාත වර්ෂාවක් වැහැල තියෙනවා."

"ඒ කියන්නේ පිට කබාය සුළං පහරට ගහගෙන ගිහින් පඳුරේ පැටළුණා නොවෙයි; හිතාමතාම පඳුර මත තබල තියෙනවා?"

"ඔව්. එය පඳුර හරහා දමලයි තිබුණේ."

"ඔබ පවසන කරුණු හරිම සිත්ගන්නා සුලුයි. මට පෙනෙන හැටියට පොළොවේ හැමතැනක්ම බොහොම පෑගිලා, හැපිලා, මඩවෙලා. සඳුදා රාත්‍රියේ සිදුවීමෙන් පස්සේ, බොහොම දෙනෙක් මෙතැන ගැවසෙන්න ඇති?"

http://sherlockholmesinvestigations.blogspot.com

"නැහැ මහත්මයා, මෙතැන, මෙන්න මේ පැත්තේ අයිනට වෙන්න අපි ලණු පැදුරක් දැම්මෙව්වා. පැමිණි කවුරුත් සිටියේ එය මතයි."

"ඉතාම විශිෂ්ටයි."

"හෝම්ස් මහත්මයා මෙන්න මේ මල්ලේ තිබෙනවා ෆිට්ස්රෝයි සිම්සන්ගේ බූට් සපත්තුවත්, ජෝන් ස්ට්‍රේකර් එදා පැළැඳ සිටි බූට් සපත්තුවක් සහ සිල්වර් බ්ලේස් සඳහා වාත්තු කළ අශ්ව ලාඩමක්."

"මගේ හිතවත් ග්‍රෙගරි මහත්මයා. ඔබ නම් අති දක්ෂයෙක්!" පැවසූ හෝම්ස්, මල්ල අතින් ගෙන වළ තුළට බැස්සේය. එහි එක් කෙළවරක තිබූ ලණු පැදුර තරමක් මැදට ගෙන ආ ඔහු, එහි දිගා වුණේය. අනතුරුව දෑත්වල වැළමිටි පැදුර මත තබාගෙන, විහිදූ දෙඅත්ල මත මුහුණ තබාගෙන තම කාර්යය ඇරඹුවේය. ඔහු පරීක්ෂා කළේ ඉදිරියෙන් තිබූ පෑගී, හැරුණු මඩ සහිත පොළොවයි.

"ඔහෝ! මේ මොකක්ද?" ඔහු එක්වරම පැවසීය. එය අඩක් දැල්වී නිවී ගිය ගිනිකූරකි. එය මඩවලින් කොපමණ වැසී තිබුණාද යත් බැලූ බැල්මට පෙනුණේ, ලී පතුරු කැබැල්ලක් ලෙසයි.

"ඒක මට මග ඇරුණේ කොහොමද කියලා මට හිතාගන්නවත් බෑ."

පොලිස් නිලධාරියා පැවසුවේ නොසන්සුන් ස්වරයෙනි.

"ඒක එළියට පෙනුණේ නැහැ. මඩේ යටවෙලයි තිබුණේ. මං ඒක දුටුවෙත් මං ඒක හෙව්ව නිසා."

"මොනවා! එය එතැන තිබෙන බව ඔබ දැන හිටියද?"

"මං හිතුවා එහෙම දෙයක් තිබීමට ඉඩ ඇතියි කියලා."

ඊළඟට හෝම්ස් මල්ල තුළ තිබූ සපත්තු එළියට ගත්තේය. මඩේ සලකුණු වී තිබුණු ලාංඡන සමග සපත්තු වල අඩි සසඳා බලමින් ඔහු සපත්තු එකින් එක නිරීක්ෂණය කළේය. ඉන්පසු වළෙන් උඩට පැමිණි හෝම්ස් එහි ඉවුර දිගේ පිහිටි මීවණ හා වල් පඳුරු අතර දණගාමින්, ඒවා ද සූක්ෂ්ම ලෙස පරීක්ෂා කළේය.

"මං හිතන්නෙ නෑ, වෙනත් මොනවත් අඩි සටහනක් ඇති කියලා. මෙතන ඉඳලා සෑම දිශාවකටම, යාර සියයක් දුරට මං හොඳින් පරීක්ෂා කරලා බැලුවා." ග්‍රෙගරි පැවසුවේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"හැබැමයි! ඔබ ඒක කිව්වට පස්සෙ ඒ වචනය විශ්වාස නොකර මං පොළොව සෝදිසි කිරීම වැරැද්දියි. ඒ වුණත් මං කැමතියි ඇඳිරි වැටෙන්න ඉස්සර වෙලා, විල්ලුව දිගේ ටිකක් ඇවිදලා එන්න. එනකොට හෙට, මට මේ ප්‍රදේශය පරීක්ෂා කරන එක වඩාත් පහසු වේවි. ඒ ගමනට වාසනාව ප්‍රාර්ථනා කරමින් මේ අශ්ව ලාඩම මගේ සාක්කුවට දමා ගන්නම්."

මගේ මිත්‍රයාගේ ක්‍රමානුකූල, නිහඬ පරීක්ෂණය කිරීමේ ආකාරය ගැන කර්නල් රොස් එතරම් පැහැදීමකින් පසුවී සිටි අයුරක් නොපෙනිණ. තරමක් නොඉවසිල්ලෙන් සිටි ඔහු, පොලිස් නිලධරයා ඇමතුවේය.

"ග්‍රෙගරි මහත්මයා ඔබ මාත් එක්ක ආපහු යන්න ආවොත් හොඳයි. කාරණා කිහිපයක් ගැන මට ඔබේ උපදෙස් අවශ්‍ය වෙනවා. විශේෂයෙන්ම මං ඔබෙන් අහන්නයි හිටියේ, වෙසෙක්ස් කුසලාන තරගයෙන් අපේ අශ්වයාගෙ නම ඉවත් කරගත්තොත් හොඳයි නේද? ඒක මහජනයා වෙනුවෙන් අපෙන් ඉටුවිය යුතු යුතුකමක් කියලයි මට හිතෙන්නේ."

"කොහොමටවත් නම් ඉවත් කරන්න එපා." හෝම්ස් පැවසුවේ තීරණාත්මක ස්වරයෙනි.

"මං ඔබ නම්, නම එහෙමම තියෙන්න ඉඩ හරිනවා."

කර්නල් හිස නමා හෝම්ස්ට ආචාර කළේය.

"ඔබේ උපදේශය අහන්න ලැබීමත් මට සතුටක් මහත්මයා. අප දැන් ස්ට්‍රේකර්ගේ නිවසට ආපහු යනවා. ඔබ විල්ලුවේ කරන පරීක්ෂාව අවසන් කළාම එතැනටම එන්න. අපට අශ්වකරත්තයෙන් ටැවිස්ටොක් වෙත යාහැකියි."

ඔවුනු ආපසු හැරී ගියහ. අපි දෙදෙනා විල්ලුවේ හෙමින් ඇවිද ගියෙමු. මේපල්ටන් අස්හාල දෙසින් ඉර බැසගෙන යාමට පටන්ගෙන තිබිණි. අප ඉදිරියෙන් තිබූ විල්ලුව වැයී තිබුණේ මීවණ, කුඩා පැළෑටි, තණ පඳුරු හා තැනින් තැන වැවුණු, උස් නොවූ පඳුරු වලිනි. සැඳෑ හිරුගේ රන්වන් පැහැති ආලෝකය මේ පඳුරු මත වැටීමෙන් අලංකාර දර්ශනයක් මැවී තිබිණ. එහෙත් සොබාදහමේ සුන්දරත්වය, මගේ මිත්‍රයාගේ සිත ආකර්ශනය කිරීමට සමත් නොවීය. ගැඹුරු කල්පනාවක වෙළී සිටි ඔහුට, අවට පරිසරය අමතක වී ඇති අයුරක් දිස්විය.

http://sherlockholmesinvestigations.blogspot.com

"දැන් කාරණා ටික ගොනු වෙන්නෙ මෙන්න මේ විධියටයි වොට්සන්. ජෝන් ස්ට්‍රේකර් මරාදැමුවේ කවුද කියන ප්‍රශ්නයට පිළිතුරු සෙවීම අපි පැත්තකින් තියලා හිටිමු. එහෙම කරලා, සිල්වර් බ්ලේස් අශ්වයාට අත්වුණු ඉරණම මොකක්ද කියලා ඉස්සර වෙලා කල්පනා කරල බලමු. මේ අපරාධය සිද්ධවෙද්දී හෝ එයින් පසුව අශ්වයා පැන ගියා නම්, ඌ කොහේටද යන්න ඇත්තේ? අශ්වයා කියන්නේ සාමූහිකව, රංචු වශයෙන් ජීවත්වීම පුරුදු සතෙක්. කළ යුත්තේ මොකක්ද කියන එක තීරණය කිරීමට ඌට නිදහස තිබුණා නම් ඌ මොකද කරන්නේ? එක්කෝ ඌ කර්නල් රොස්ගේ අශ්වගාලට ආපහු එනවා; නැත්නම් ඌ මේපල්ටන් අශ්වගාලට යනවා. ඌ මොකටද පිස්සුවෙන් වගේ විල්ලුවේ සැරිසරන්නේ? මේ වෙනකොට කවුරු හරි ඌව දැකල තියෙන්න ඕන. ජිප්සීවරු ඌව අරන් ගියා කියලා කොහොමටවත් හිතන්න බෑ. ඔවුන්ගේ සිරිත, මොනවා හරි කලබල, කරදර තියෙන තැන්වලින් පුළුවන් ඉක්මනට ඈත්වීමයි. මොකද පොලීසියේ කරදර හිරිහැර විඳින්න ඔවුන් කැමති නැහැ. මේ වගේ සුප්‍රසිද්ධ අශ්වයෙක් ඔවුනට කොහොමවත් විකුණන්නත් බෑ. එවැන්නක් උත්සාහ කළොත් ඒක මහා අන්තරායදායක වැඩක් වෙනවා. අශ්වයා ළඟ තබාගැනීමෙන් ඔවුනට ඇති ප්‍රයෝජනයකුත් නෑ. ඒ ටික හොඳටම පැහැදිලියි නේද?"

"ඔව් ඒක හරි. එහෙනම් මොකද ඌට වුණේ?"

"මං ඔබට කිව්වා එක්කෝ ඌ කර්නල් රොස්ගේ අශ්වගාලට යන්න ඇති කියලා. නමුත් ඌ එතැනට ඇවිත් නැහැ. එහෙමත් නැත්නම් මේපල්ටන් වෙත යන්න ඇති කියලා; ඒ නිසා ඌ සිටිය යුත්තේ මේපල්ටන් වල විය යුතුයි. තර්කානුකූලව මේ සිද්ධිය ගොඩනැගීම සඳහා, අපි ඒක උපකල්පනයක් හැටියට භාවිත කරමු. එහෙම කළාම අපි යන්නේ කොතැනටද බලමු.

ග්‍රෙගරි කිව්වා වගේ විල්ලුවේ මේ කොටසේ පොළොව බොහොම වියළියි. එය සිමෙන්ති පොළොවක් වගේ දැඩි ස්වභාවයක් ගන්නවා. නමුත් මේපල්ටන් දෙසට ඉදිරියට යද්දී විල්ලුව මඳක් පහතට බෑවුම් වෙනවා. ඊළඟට ඔබට පෙනෙනවාද, අර ඈත සැහෙන තරම් පහත් බිමක් තියෙන හැටි. සඳුදා රෑ ඔය ප්‍රදේශය, බොහොම තෙත්ව ජලයෙන් පෙඟී තියෙන්න ඇති. අපේ නිගමනය නිවැරදි නම්, අශ්වයා ඔය පහත් තෙත් බිම හරහා යන්න ඇති. ඌ එහෙම ගියා

http://sherlockholmesinvestigations.blogspot.com

නම් උගේ කුර සටහන් ඒ පැත්තේ තිබිය යුතුයි. ඒ නිසා අපි ගිහිං ඒ පැත්ත පරීක්ෂා කර බලමු."

කතාබහේ යෙදෙමින්ම අපි වේගවත් ගමනක යෙදී සිටියෙමු.

"වොට්සන්. මේ පහත් බිමේ ඔබ දකුණු පැත්තේ ඉවුර දිගේ යන්න, අවට හොඳින් බලමින්. මම යන්නම් වම් පැත්තෙන්."

එහෙත් මට පියවර පනහක් තරම් ඉදිරියට යාමට ඉඩ නොලැබිණි. සතුටෙන් කෑගැසූ හෝම්ස් මා එහි කැඳවමින්, මට සංඥාකරන අයුරු මම දුටුවෙමි. මෘදු මැටි වැනි පොළොවේ අශ්වයෙකුගේ කුර සටහන් පැහැදිලිවම දැකිය හැකිවිය. සාක්කුවේ තිබූ අශ්ව ලාඩම අතට ගත් හෝම්ස්, බිම වැදී තිබුණු කුර ලාංඡනයට එය ගැළපේදැයි පරීක්ෂා කළේය. එය නූලටම ගැළපිණි.

"ඔන්න බලන්න, සිදුවීමක් සිතේ මවාගැනීමේ වටිනාකම." හෝම්ස් කීය.

"ග්‍රෙගරිගේ තිබෙන ලොකුම අඩුපාඩුව අන්න ඒක. මෙවැනි දෙයක් වෙන්න ඉඩ තිබෙනවා කියල අපි හිතේ මවා ගත්තා. ඊළඟට ඒක ඔප්පුවෙන සාක්ෂි තිබේද බලන්න ඉදිරියට ගියා. අපේ සැකය තහවුරු කරන්න සාක්ෂි ලැබුණා. දැන් බලමු මෙතැනින් ඉස්සරහට කොහොමද කියලා."

පහත් බිමේ පහතම කොටස මඩ ගොහොරු ස්වභාවයක් ගත්තේය. අපි ඒ හරහා ගමන් කළෙමු. අනතුරුව අප පිවිසියේ සැතපුම් කාලක් පමණ දුරට පිහිටි වියළි සවිමත් පොළොවක් තිබූ බිමකටයි. එය පසුකොට අපි නවත් පහත් බිමකට පැමිණියෙමු. අශ්වයාගේ කුර සලකුණු එහි ද පැහැදිලිව සටහන් වී තිබිණ. යළිත් සැතපුම් භාගයක සවිමත් පොළොවේ ඒවා සම්පූර්ණයෙන්ම අතුරුදන්විය. මීළඟට අප ඒවා දුටුවේ මේපල්ටන් ඉස්තාලයට ළං වෙද්දිය. මෙවර අශ්ව කුර සටහන් දුටු හෝම්ස්ගේ මුහුණේ ජයග්‍රාහී සිනාවක් නැගිණ. සිල්වර් බ්ලේස්ගේ කුර සලකුණු සමඟ මිනිසකුගේ පා සටහන් ද විය.

"මීට ඉස්සරවෙලා අශ්වයා ඇවිත් තිබුණේ තනියම."

"ඒක ඇත්ත. ඌ මුලින් ආවේ තනියම. ඔහෝ, මේ මොකක්ද?"

පා සලකුණු ද්විත්වය එක්වරම වෙනත් දිශාවකට හැරී ක්‍රමයෙන් කර්නල් රොස්ගේ ඉස්තාලය පිහිටි දිශාවට යොමු විය. තම විස්මය පළකරන සිවුරුහන් හඬක් කටින් පිට කළ හෝම්ස් ආපසු හැරුණේය.

http://sherlockholmesinvestigations.blogspot.com

එම පියසටහන් අනුව අපි මඳ දුරක් ගමන් කළෙමු. එම සටහන් මඟ නොහැරෙනු පිණිස හෝම්ස් ගමන් කළේ පා සටහන් වෙත දැඩි අවධානයක් යොමු කරමිනි. අප ගමන් කළ පෙදෙසට යාර කිහිපයක් ඈතින් එම පා සලකුණු ද්විත්වය යළිත් වරක් මෙපල්ටන් දිශාවට වැටී ඇති බැව් දක මම ඔහුත් පුදුමයට පත්වීමි. මම වහාම ඒ බැව් හෝම්ස්ට පෙන්වා දුන්නෙමි.

"හැබැමයි. ඔන්න වොට්සන් ඔබටත් ගෞරව ලකුණක්. නිස්කාරණේ සෑහෙන දුරක් අපට ඉදිරියට ඇවිද යන්න වෙන එක ඔබ වැළැක්වුවා. දැන් අපි ආපහු හැරිලා, මෙපල්ටන් දිහාවටම යමු.

අපට එසේ වැඩිදුරක් යාමට අවශ්‍ය නොවීය. මෙපල්ටන් ඉස්තාලයේ දොරටුව දක්වා වැටෙන, ගල් හා තාර දමා පොළොව සකසා තිබූ පෙදෙසට පිවිසෙද්දී, කුර සටහන් අතුරුදන් විය. එහෙත් අපි ඉදිරියටම ගමන් කළෙමු. ඉස්තාලයේ සේවකයෙක් වේගයෙන් අප වෙත දුව එන ආකාරය දකින්නට ලැබිණි.

"ඒයි! රස්තියාදුකාරයො මේ පැත්තෙ ඇවිසෙන්න එන්න එපා." ඔහු කීය.

"මට තියෙනවා අහන්න ප්‍රශ්නයක්. හෙට පාන්දර පහට ආවොත්, ඔබේ ලොකු මහත්තයා සයිලස් බ්‍රවුන් හම්බවෙන්න කලින් වැඩිවේවිද?"

"මොනවා කියනවද මහත්මයා. අනෙක් ඔක්කොටම කලින් මෙතැනට එන්නෙ අපේ බ්‍රවුන් මහත්තයා. හෙට වෙනතුරු ඉන්න ඕනෙ නෑ. ඔන්න අපේ මහත්තයා එනවා. ඔබට අහන්න තියෙන ප්‍රශ්න දැන්ම ඔහුගෙන් අහන්න පිළිවන්. . . . නෑ, එපා මහත්මයා. ඔබේ අතින් සල්ලි ගන්න බව දැක්කොත් මට මගේ රස්සාවත් නැතිවේවි. ඔබ එය දෙනවා නම් ඔහු ගියාට පස්සෙ. . . ."

තම සාක්කුවෙන් ගත් ක්‍රවුන් භාගයේ කාසිය හෝම්ස් ආපසු සාක්කුවට දමා ගත්තේය. ඉස්තාලයේ සිට එළියට ආවේ දරුණු පෙනුමක් තිබූ තරමක් වයස්ගත මිනිසෙකි. අතේ තිබූ දඩයම් - කසය ඔහු ලෙලවමින් සිටියේ කොයි මොහොතේ හෝ එයින් පහර දීමට සූදානම් බව හඟවමිනි.

"මොකක්ද ඩෝසන් මේ වැඩේ තේරුම? මොනවද උඹේ ඔය ඕපාදූප කතාබහ? පලයං, ගිහින් උඹට තියෙන වැඩක් කරපන්!

http://sherlockholmesinvestigations.blogspot.com

මොකද? මොන අහවල් උවමනාවකටද තමුසෙලා මෙහේට කඩා වැටුණෙ?"

"කරුණාවන්ත මහත්මයා. ඔබ සමග විනාඩි දහයක් කථා කරන්න මට ඉඩදෙන්න."

හෝම්ස් කියා සිටියේ ඉතා විනීත ස්වරයකිනි.

"මෙහේට කඩාවදින හැම එකා එක්කම දොඩවන්න මට වෙලාවක් නෑ. නාඳුනන මිනිස්සු මෙහේට එනවට අපි කොහොමටවත් කැමති නෑ. මෙතැනින් යනවා යන්න ඉක්මනට. නැත්තං ලිහනවා බල්ලව!"

ඔහු කෑගැසුවේ කෝපයෙනි.

ඉදිරියට නැමුණු හෝම්ස් අශ්වයින් පුහුණුකරුගේ කනට යමක් කෙඳිරුවේය. නැතිගැනීමට පත්වූ ඔහුගේ මුහුණ, කෝපයෙන් රතු වූ හැටි මම දුටුවෙමි.

"ඒක බොරුවක්! පට්ටපල් බොරුවක්!!"

සයිලස් බ්‍රවුන් කෑගැසුවේය.

"බොහොම හොඳයි. එහෙම නම් කාටත් අහගෙන ඉන්න පුළුවන් විදියට මෙතන ඉඳගෙන, අපි ප්‍රසිද්ධියේම ඒ ගැන වාද කරමුද?" එහෙම නැත්නම් ඔබේ කාමරය ඇතුළට ගිහිං ඒ ගැන කථා කරමුද?"

හෝම්ස් ඇසීය.

"ආ..... කමක් නෑ. ඇතුළට යමුකෝ, ඔහේට ඕනෙ නම්."

හෝම්ස්ගේ මුවේ සිනාරැල්ලක් මතුවිය.

"මං ඔබව මිනිත්තුවකට වඩා රස්තියාදු කරන්නෙ නෑ වොට්සන්. හොඳයි බ්‍රවුන් මහත්මයා, ඔබත් එක්ක එන්න මං සූදානම්."

මා එහි රැඳී සිටියදී, හෝම්ස් සයිලස් බ්‍රවුන් සමග ඔහුගේ කාර්යාලයට ගියේය.

හෝම්ස් හා බ්‍රවුන් ආපසු පැමිණියේ මිනිත්තු විස්සකට පසුවයි. ඒ වන විට සැඳෑ හිරු එළියෙන් දිලිසුණු පඳුරුවල රතු මිශ්‍ර රන්වන්

http://sherlockholmesinvestigations.blogspot.com



241 "මොකක්ද ඩෝසන් මේ වැඩේ තේරුම? . . . . හැම එකා එක්කම දොඩවන්න මට වෙලාවක් නෑ."

පැනැය, තද අළු පැහැයකට හැරී තිබිණි. ඒ තරම් කෙටි කාලයක් තුළ මිනිසෙකුගේ මුහුණේ හැගීම් සම්පූර්ණයෙන්ම වෙනස් වූ අයුරු මා මීට පෙර කිසිදිනෙක දැක නොතිබිණි. දැන් සයිලස් බ්‍රවුන්ගේ මුහුණ, මළමිනියක් මෙන් සුදුමැලිය. ඔහුගේ නළලේ හා ඇහිබැමට උඩින් ඩහදිය බිඳු එකතුවී තිබිණ. අත් වෙවුලන්නට පටන්ගෙන තිබීම නිසා, අතේ තිබූ දඩයම් - කසය සෙලවුණේ සුළඟට අසුවූ ලා දල්වක් විලසිනි. ඔහුගේ සැරපරුෂ චණ්ඩි ස්වභාවය සම්පූර්ණයෙන්ම අතුරුදන්ව ගොසිනි. ඔහු ෂර්ලොක් හෝම්ස් පසුපස පැමිණියේ, සුවච කීකරු බවක් පෙන්වමින්, ස්වාමියා-පිටුපස එන සුනඛයෙකු ලෙසයි.

"ඔබේ උපදෙස් අනුව හැමදෙයක්ම සිදු වෙනවා හෝම්ස් මහත්මයා. ඔබේ නියෝග කිසි අඩුපාඩුවක් නැතිව සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරන්නම් මහත්මයා."

"ඒකෙ කිසිම ප්‍රමාදයක් අඩුපාඩුවක් තියෙන්න බෑ." හෝම්ස් පැවසුවේ ආපසු හැරී, එක එල්ලේ බ්‍රවුන්ගේ මුහුණ බලමිනි.

"නෑ මහත්මයා, කොහොමටවත් නෑ. කිසිම අඩුපාඩුවක් වෙන්න මං ඉඩ තියන්නෙ නෑ. වෙනස්කිරීම් මං කලින්ම කරල හිටින්නද? නැත්තං එහෙම උවමනා නැද්ද?"

මඳ වේලාවක් කල්පනා කළ හෝම්ස් මහ හඬින් සිනාසුණේය.

"නෑ එපා. මං ඒ ගැන ඔබට ලියුමක් එවන්නම්. මොකුත් ප්‍රයෝග එහෙම එපා. ඒව කළොත් . . . ."

"මහත්මයා ඔබට මාව විශ්වාස නැද්ද? මාව විශ්වාස කරන්න මහත්මයා!"

"ඔව්. මං හිතනවා මට ඔබව විශ්වාස කරන්න පුළුවන් කියලා. හෙට වෙනකොට ඔබට නොවරදවාම මගෙන් පණිවුඩයක් ලැබෙනවා." පැවසූ හෝම්ස් අතට අත දීමට තමා දෙසට දිගු කෙරුණු බ්‍රවුන්ගේ සුරත ද නොසලකා මා වෙත පැමිණියේය. අපි ආපසු ඒමට පිටත් වුණෙමු.

"මේ සයිලස් බ්‍රවුන් වගේ බොරු චණ්ඩියෙක්, බයගුල්ලෙක් වගේම, පුළුවන් වෙලාවල අනුන්ගේ දේ හොරෙන් වංචාකරගන්න තක්කඩියෙක් සෑහෙන කාලෙකට මට හම්බවෙලා නෑ."

http://sherlockholmesinvestigations.blogspot.com

හෝම්ස් පැවසුවේ අප ආපසු එන අතරතුරේදීය.

"මිනිහා ළඟ අශ්වයා ඉන්නවා එහෙනම්?"

"මිනිහා උත්සාහ කළේ කට්ටක් ගහලා බේරෙන්න. ඒ වුණත් එදා පාන්දර වුණු සිදුවීම, ඔහුගේ ක්‍රියාකලාපය හැම එකක්ම මං හරියටම විස්තර කළා. ඒක අහලා මිනිහ හිතුවෙ, මං මේ හැම දෙයක්ම බලාගෙන හිටියා කියලා. ඔබ දුටුවා නේද වොට්සන් අර අන්තිමට දකපු සපත්තු අඩි සටහන් වල ඉදිරි කොටස හතරැස් බව? බ්‍රවුන්ගේ සපත්තු වලත් ඒ කොටස හතරැස්; ඒ ලාංජනයට හරියටම ගැළපෙනවා. අනෙක් කාරණය, සුළු සේවකයෙක් වගේ වෙනත් කෙනෙක් භය නැතුව මේ වගේ දේකට අතගහන්නෙ නෑ.

මං ඔහුට විස්තර කළා. සිරිත් පරිදි, ඔහු උදේ පාන්දරම එළිය වැටීගෙන එද්දී ඉස්තාලයට ආව හැටි. ඊළඟට කිසිදිනෙක දැකල නැති නොහඳුනන අශ්වයෙක් විල්ලුවේ ඇවිදිමින් ඉන්නවා ඔහු දුටු හැටි. ඊළඟට ඔහු අශ්වයා වෙත ගිහින්, අශ්වයා හඳුනාගෙන පුදුමයට පත්වුණු ආකාරය. සිල්වර් බ්ලේස්ට 'රිදී දීප්තිය' කියන ඒ නම ලැබුණේ උගේ නළලේ ඇති රිදී පැහැය නිසා. ඒකෙන් බ්‍රවුන්ට අශ්වයා හඳුනා ගැනීමට හැකිවුණා. ඉන්පසු, තමා විශාල මුදලක් ඔට්ටු අල්ලා ඇති, තමා පුහුණු කරන ඩෙස්බරෝ අශ්වයාව පරාජය කළ හැකි සිල්වර් බ්ලේස්, හරිම පුදුමාකාර විධියට තමා ළඟටම පැමිණීම ගැන ඔහු විස්මයට පත්වුණු අයුරු මං ඔහුට කිව්වා. මේ සතාව ආපසු භාරදෙන්න හිතිලා, ඔහු සතාව අරගෙන කර්නල් රොස්ගෙ ඉස්තාලය දෙසට යන්න පිටත්වෙලා ගිය හැටි. මඳ දුරක් යද්දී යක්ෂයා ගෙනා ද්වේෂ සහගත, වංචාකාරී සිතුවිලි ගැන; ඔහු තේරුම් ගත්තා අශ්වයාගේ බාහිර පෙනුමේ වෙනසක් කරලා, වෙසෙක්ස් කුසලාන තරගය අවසන් වෙනතුරු උෟ හංගලා තබාගත්තොත් තමාට ඇතිවෙන ලාභය ගැන. ඊළඟට ඔහු සිල්වර් බ්ලේස් ආපසු ගෙනවිත් මේපල්ටන් ඉස්තාලයේ සැඟවූ සැටි ගැන මං කිව්වා. මං මේ හැම දෙයක්ම අකුරට විස්තර කළාම, ඔහුට තේරුණා තවදුරටත් කාරණා සැඟවීමෙන් පලක් නෑ කියලා. ඊට පස්සේ ඔහු සිතුවෙ තමන්ගේ ගැළවීම ගැන පමණයි."

"ඒ වුණත් ඔහුගේ ඉස්තාලය ග්‍රෙගරිගේ පරීක්ෂාවට ලක්වුණා?"

"සයිලස් බ්‍රවුන් වගේ අශ්ව රේස් ක්ෂේත්‍රයේ පළපුරුදු තක්කඩින්ට ඒවායින් බේරෙන එක සුළු වැඩක්."

http://sherlockholmesinvestigations.blogspot.com

"නමුත් සිල්ව බ්ලේස් අශ්වයා තවදුරටත් ඔහුගේ භාරයේ සිටීම ප්‍රවේශමද හෝම්ස්? ඌව මොනව හරි අනතුරක් ආබාධයක් වුණොත් වාසිය බුවුන්ටයි."

"මගේ ආදරණීය මිත්‍රයා, අපට ඒ ගැන භයවෙන්න දෙයක් නෑ. ඔහු අශ්වයාව තමන්ගේ ඇස් දෙක වගේ ආරක්ෂා කරගනීවි. ඔහුගේ සම්පූර්ණ ගැලැවීම රඳා පවතින්නේ අශ්වයා ප්‍රවේශම් සහිතව භාරදීම මතයි."

"ඒ කොහොම වුණත් මට පෙනුණු විධියට නම් කර්නල් රොස් කියන්නේ, ඒ තරම් අනුකම්පාව දක්වන, සමාව දෙන ජාතියේ කෙනෙක් නෙමෙයි."

"මෙතැනදී අවසන් පියවර කිහිපය පිළිබඳව තීරණයක් ගැනීම කෙරෙන්නේ මගේ කැමැත්ත උඩ; කර්නල් රොස්ගේ කැමැත්ත අකමැත්ත අනුව නොවෙයි. මං අනුගමනය කරන්නේ මගේම ක්‍රම. කාරණා ගොනු කරද්දී, අඩු හෝ වැඩි වශයෙන් මට කැමති ප්‍රමාණයක් මං ඉදිරිපත් කරනවා. නිල නොවන රහස් පරීක්ෂකයෙක් වීමේ වාසිය ඒකයි.

මං දන්නෙ නෑ වොට්සන් ඔබ කර්නල් රොස්ව හොඳින් නිරීක්ෂණය කළාද කියලා. ඔහුගේ ආචාරශීලීභාවය ගැන නම් මගේ පැහැදීමක් ඇති වුණේ නැහැ. පෙනුමෙන් නැද්ද ඔහු අප වෙත දක්වාපු අවඥා සහගත උඩඟු හැසිරීම, දැන් ඉතින් මගේ වාරය. මට හිතෙනවා ඔහුව ටිකක් අපහසුවටත්, උපහාසයටත් ලක්කරලා ටිකක් විනෝද වෙන්න. අශ්වයා ගැන එක වචනයක්වත් ඔහුනට කියන්න එපා."

"ඔබේ අවසරයක් නැතුව කොහොමවත් කියන්නෙ නෑ"

"නමුත් වොට්සන්, ජෝන් ස්ට්‍රේකර් මරා දැමීම ගැන හිතන කොට, මේව ඔක්කොම සුළු දේවල්."

"ඔබ ඊළඟට කාලය යොදවන්නේ ඒ ගැන හොයා බලන්නද?"

"අපොයි නෑ! අද රාත්‍රී දුම්රියෙන් අපි දෙන්නා ලන්ඩනයට යනවා"

මගේ මිත්‍රයාගේ මේ පිළිතුරෙන් මම මවිතයට පත් වූයෙමි. අප ඩෙවන්ෂයරයට පැමිණ තවමත් ගතකොට ඇත්තේ, පැය කිහිපයක් පමණි. මෙම අභිරහස විසඳීම ඔහු ඉතා උනන්දුවෙන් පටන්ගෙන,

http://sherlockholmesinvestigations.blogspot.com

දක්ෂ ලෙස එය විසඳා ගෙන ඉදිරියට ගොස් තිබිණ. එහෙත් එය විසඳා අවසන් කිරීම අත්හැර දමා, ඔහු ආපසු ලන්ඩනයට යාමට තීරණය කිරීම, මට නම් තේරුම් ගැනීමට නො හැකි විය. අප ආපසු ජෝන් ස්ට්‍රෙකර්ගේ නිවසට එනතුරුම මගේ මිත්‍රයා එක වචනයක් වත් කටින් පිට නොකෙළේය. කර්නල් රොස් සහ පොලිස් නිලධරයා, අප බලාපොරොත්තුවෙන් නිවසේ රැඳී සිටියහ.

"මගේ මිත්‍රයයි මමයි අද රාත්‍රි ශීඝ්‍රගාමී දුම්රියෙන් ලන්ඩනය බලා පිටත් වෙනවා. ඔබේ ඉතාම අලංකාර විල්ලුවේ, නැවුම් වාතයේ සිසිල විඳීමට අපට අනර්ඝ අවස්ථාවක් ලැබුණා"

පොලිස් පරීක්ෂකවරයා විමතියට පත්ව දෑස් විශාල කරගෙන බලා සිටියේය. කර්නල් රොස්ගේ කට පැත්තකට හැකිළුණේ උපහාසාත්මක සිනහවක් නගන අයුරෙනි.

"අර අහිංසක ජෝන් ස්ට්‍රෙකර් මරා දැමූ මිනීමරුවා අල්ලාගන්න ඔබට හැකියාවක් නෑ?" කර්නල් රොස් ඇසුවේය.

හෝම්ස් දෙවුර හැකිළුවේ එය තමාට ද ගැටලුවක් බව හඟවමිනි.

"ඒ ප්‍රශ්නය විසඳගන්න අපහසු විධියේ බාධක රාශියක් ම අප ඉදිරියේ තිබෙනවා. හැබැයි ලබන අඟහරුවාදා වෙසෙක්ස් කුසලාන තරඟයට ඔබේ අශ්වයාව ඉදිරිපත් කිරීමට හැකිවන බව මට හොඳටම විශ්වාසයි. මං ඔබෙන් ඉල්ලා සිටිනවා ඔබේ අශ්වාරෝහකයා ඒ සඳහා සම්පූර්ණ සූදානමෙන් තබාගන්නා ලෙස. ජෝන් ස්ට්‍රෙකර් මහත්මයාගේ ඡායාරූපයක් තිබෙනවා නම් කරුණාකර මට දෙන්න පුළුවන්ද?"

තමන් ළඟ තිබූ කවරයක් විවෘත කළ ග්‍රෙගරි, ස්ට්‍රෙකර්ගේ ඡායාරූපයක් හෝම්ස් අතට දුන්නේය.

"ග්‍රෙගරි මගේ හිතවත් මිත්‍රයා. ඔබ දන්නවා මට අවශ්‍ය වෙන්නේ මොනවාද කියල. ඒ හැම දෙයක්ම ඔබ ළඟ සූදානමෙන් තියෙනවා. මං ඔබෙන් ඉල්ලා සිටිනවා තව ස්වල්ප වේලාවක් රැඳී ඉන්න කියලා. ඒ මොකද මට තිබෙනවා අර සේවිකාවගෙන් ප්‍රශ්න කිහිපයක් අහන්න."

මගේ මිත්‍රයා කාමරයෙන් පිටවී ගියේය.

"ලන්ඩනයෙන් පැමිණි අපරාධ පරීක්ෂණ විශේෂඥයා ගැන මගේ තිබූ බලාපොරොත්තු සම්පූර්ණයෙන්ම කඩවුණා." කර්නල්

http://sherlockholmesinvestigations.blogspot.com

රොස් කිසිදු පැකිලීමකින් තොරව පැවසුවේ මගේ මිතුරා පිට වී ගිය පසුයි.

"ඔහු මෙහේට එද්දි තිබුණු තත්ත්වයෙන් එක් අඩියක් වත් ඉදිරියට ගිය බවක් මට නම් පෙනෙන්නෙ නෑ"

"අඩුම ගණනෙ ඔහු සහතික වෙනවා නේද ඔබේ අශ්වයා තරගය සඳහා සහභාගී කරවන බවට?" මම ඇසීමි.

"ඔව්. ඔහුගෙන් ඒ සහතිකය නම් මට ලැබුණා. ඒ වුණත් මං ඊට වඩා කැමතියි මට මගේ අශ්වයා ලැබුණා නම්"

මා මෙයට පිළිතුරු දීමට සූදානම් වෙද්දී හෝම්ස් යළිත් කාමරයට ඇතුළු විය.

"එහෙනම් මහත්වරුනි. ටැවිස්ටොක් බලා පිටත්වීමට මම සූදානම් "

දුම්රියපොළ වෙත අපගෙන යාම සඳහා අශ්ව කරත්තය සූදානමින් තිබිණ. අපේ පහසුව සඳහා ඉස්තාලයේ සේවය කරන තරුණයෙක් රියේ දොර විවෘතව තබාගෙන සිටියේය. හෝම්ස්ගේ සිතට එක්වරම යමක් සිහි වූ අයුරකි. ඔහු අර තරුණයා ඇමතුවේය.

"මං දුටුවා, ඉස්තාලයෙන් පිට තණබිමේ බැටළුවන් කිහිපදෙනෙක් සිටියා. කවුද ඔවුන්ව බලාගන්නෙ?"

"මම තමයි උන් ගැන බලන්නෙ, මහත්මයා"

"ළඟකදී ඉඳලා උන්ගේ මොකක් හරි වෙනසක්, අසනීපයක් වගේ දෙයක් ඔබට දකින්න ලැබුණාද?"

"කියන්න තරම් ලොකු අසනීපයක් නැහැ මහත්මයා. නමුත් උන් තුන් දෙනෙකුගේ කකුල් වල කොණ්ඩි ගතියක් ඇවිත්, හරියට ඇවිදගන්න බැහැ"

එය ඇසූ හෝම්ස් දෑත් පිරිමැද්දේ ය. එම ආරංචියෙන් ඔහු දැඩි සතුටකට පත් වූ බව මම වටහාගත්තෙමි.

"බොහොම ඈත ඉඳන් යැවූ හීයක් වොට්සන්. ඒත් ඒක හරියටම ඉලක්කයට වැදුණා" හෝම්ස් පැවසුවේ මගේ අත කොනිත්තමිනි.

http://sherlockholmesinvestigations.blogspot.com



247 "ග්‍රෙගරි මං කැමතියි අන්න ඒකට ඔබේ අවධානය යොමු කරන්න."

http://sherlockholmesinvestigations.blogspot.com

"ග්‍රෙගරි මං කැමතියි, අන්න ඒකට ඔබේ අවධානය යොමු කරන්න පුළුවන් නම්. බැටළුවන් අතර ඉතා සුවිශේෂ වසංගතයක්! එහෙනම් අපි පිටත්වෙමු රියැදුරු ඉන්නැහේ."

කර්නල් රොස් ගේ මුහුණේ තවමත් දකිය හැකි වූයේ මගේ මිනුයා අදක්ෂයකුය යන්න ඉලක්කරන් හැඟීමය. එහෙත් පොලිස් පරීක්ෂකවරයා මහත් උද්‍යෝගයෙන් එම අදහස සිතට ගත් බව මම දුටුවෙමි.

"ඒක හුඟක් වැදගත් කරුණක් කියලාද ඔබ කියන්නෙ, හෝම්ස් මහත්මයා?"

"හරිම වැදගත්."

"මගේ අවධානය යොමු කළ යුතුයි කියා ඔබ සිතන වෙනත් මොනවා හරි වැදගත් කරුණු තියෙනවාද හෝම්ස් මහත්මයා?"

"ඔව්. එදා රාත්‍රියේ ඉස්තාලයේ ඇතිකළ බල්ලාගේ හැසිරීමේ තිබූ පුදුමාකාර ස්වභාවය."

"නමුත් එදා රෑ ඒ බල්ලා කිසිම කලබලයක් කර නැහැනේ ?"

"ග්‍රෙගරි මහත්මයා, අන්න ඒකට තමයි මං කිව්වෙ හැසිරීමේ පුදුමාකාර ස්වභාවය කියලා" හෝම්ස් පිළිතුරු දුන්නේය.

* * *

දින හතරකට පසු හෝම්ස් සහ මම යළිත් වරක් වින්චෙස්ටර් බලා යන දුම්රියට නැගුණෙමු. අප පිටත්ව ගියේ වෙසෙක්ස් කුසලාන සඳහා පැවැත්වෙන මහා තුරඟ තරගය නැරඹීම සඳහායි. කලින් යොදා ගෙන තිබූ නිසා, කර්නල් රොස් අප හමුවීමට දුම්රියපොළට පැමිණ සිටියේය. අපි ඔහුගේ අස්රියෙන් නගරයෙන් පිටත පිහිටා තිබූ තුරඟ තරග පිටිය වෙත පැමිණියෙමු. ඔහුගේ මුහුණේ තිබුණේ බලාපොරොත්තු කඩවූ කලකිරුණු ස්වභාවයකි.

"මගේ අශ්වයා තවමත් ඇහැට දැක්කේ නෑ"

"ඔබ ඌව දුටුවොත්, ඔබට ඌව හඳුනාගන්න පුළුවන්ද?" හෝම්ස් ඇසීය.

මෙ ප්‍රශ්නයෙන් කර්නල් රොස් මහත්සේ කෝපයට පත්විය.

http://sherlockholmesinvestigations.blogspot.com

"මං මේ අශ්වරේස් කරන්න පටන් අරගෙන අවුරුදු විස්සක් වෙනවා. කිසි කෙනෙක් මගෙන් අහලා නැ ඔය වගේ ප්‍රශ්නයක්. උගේ නළලේ තියෙන සුදු පාට රවුම් ලකුණත්, ඉස්සරහ ගාත්වල තියෙන පුල්ලිත් නිසා පුංචි ළමයෙකුට වුණත් පුළුවන් සිල්වර් බ්ලේස්ව අඳුනාගන්න."

"ඔට්ටු ඇල්ලීම කොහොමද?"

"ඒක තමයි පුදුමාකාරම කොටස. කලින් පහළොවට එකක් වගේ තිබ්බා. ඒක එන්න එන්නම අඩුවෙලා. තුනට එකක්වත් ගන්න බෑ දැන්"

"හ්ම්. කවුරු හරි මොනවා හරි දන්නවා. ඒක පැහැදිලියි."

අශ්ව කරත්තය රේස් පිටිසර ළඟාවිය. ක්‍රීඩා මණ්ඩපයට ඇතුළුවන දොරටුව අසල පුවරුවේ තරඟකරුවන් පිළිබඳ දැන්වීමක් විය.

**වෙසෙක්ස් කුසලාන**

**අලුත් ධාවන පථය - සෑතපුම් එකයි පර්ලොං පහයි.**

1. **හීන් නිවටන් මහතාගේ - නීග්‍රෝ**
   රතු හිස්වැස්ම, තැඹිලි කබාය

2. **කර්නල් වෝඩලෝගේ - පගිලිස්ට්**
   රෝස හිස්වැස්ම, නිල් කබාය

3. **බැක්වෝටර් සාමිවරයාගේ - ඩෙස්බරෝ**
   කහ හිස්වැස්ම, කහ කබාය

4. **කර්නල් රොස්ගේ - සිල්වර් බ්ලේස්**
   කළු හිස්වැස්ම, රතු කබාය

5. **බැල්මොරල් සාමිවරයාගේ - අයිරිස්**
   කහ සහ කළු පටි

6. **සිංගල්ෆඩ් සාමිවරයාගේ - රාස්පර්**
   දම් හිස්වැස්ම, කළු කබාය

http://sherlockholmesinvestigations.blogspot.com

"අපේ අනෙක් අශ්වයාගේ නම කපල දාල. සිල්ව බ්ලේස්ගේ නම දැම්මෙ ඔබ කිව්ව වචනෙ විශ්වාස කරලා" කර්නල් කීය.

තරඟ විස්තර ප්‍රචාරකයා ශබ්ද නගා කළ ප්‍රකාශයේ සිල්ව බ්ලේස්ගේ මෙන්ම ඩෙස්බරෝගේ නම ද කියවනු ඇසිණ.

"අන්න අශ්වයින් හයදෙනාම ඉන්නවා." මම කීවෙමි.

"හය දෙනාම ඉන්නවා? එහෙනම් මගෙ එකත් දුවනවා ඇති! කර්නල් කෑගැසුවේ ඉමහත් කැළැඹීමට පත්වයි

"කෝ මගේ අශ්වයා මට නම් පෙනෙන්නේ නෑ."

ඒ මොහොතේ බර කිරන අංගණයේ සිට නැඳවාගෙන ආ ශක්තිමත් පෙනුමක් තිබූ අශ්වයා ගේ පිටේ සිටි අසරුවා පැළැඳ සිටියේ කර්නල් ගේ රතු සහ කළු වර්ණයයි.

"ඒ මගේ අශ්වයා නෙමෙයි." රොස් කීය.

"ඒ සතාගෙ ඇගේ සුදු පාටට එක ලෝම ගහක් නෑ. මොකක්ද හෝම්ස් මහත්මයා ඔබ මේ කරලා තියෙන්නෙ?"

"හොඳයි, අපි කලබල නොවී තව ටිකක් බලමුකො." මගේ මිතුරා පැවසුවේ සන්සුන් ස්වරයෙනි. මගේ 'ඉඳහෙතිය' අතට ගත් හෝම්ස් තරඟය ආරම්භ වෙන ආකාරය පිළිබඳව දැඩි අවධානයකින් බලා සිටියේය.

"විශිෂ්ටයි! ඉතාමත් හොඳ ආරම්භයක්."

"ඔන්න එනවා ඔවුන්. දැන් ඔක්කොම කරට කර"

ධාවන පථයේ සෘජු කොටසේ දුවද්දී උන් සියලු දෙනාම අපට පැහැදිලිව දකගත හැකි විය. උන් අතර පැවතියේ කරට කර තරඟයකි. අශ්වයින් හය දෙනාම එක් බුමුතුරුණකින් වුවත් වැසිය හැකි තරම් ඉතා සමීපයෙන් දිව ගියහ. එහෙත් තරඟයෙන් අඩක් දුර යද්දී මේපල්ටන් ඉස්තාලයේ කහ වර්ණය පෙරමුණ ගත්තේ ය. වංගුව පසුකොට ආ අශ්වයෝ තරඟයේ අවසන් භාගය සඳහා ඉතා වේගයෙන් දිවීමට පටන් ගත්හ. කර්නල් රොස්ගේ රතු සහ කලු වර්ණ දරූ අශ්වයා, ඩෙස්බරෝ පරදවා ක්‍රමයෙන් ඉදිරියට එන අයුරු අපි දුටුවෙමු. අන්තිම මොහොතේ කර්නල් රොස්ගේ අශ්වයා පෙරමුණට පැමිණ, විශිෂ්ට ලෙස ජයග්‍රහණය කළේ ක්‍රීඩා ලෝලීන්ගේ ප්‍රීති ඝෝෂා මැදයි.

http://sherlockholmesinvestigations.blogspot.com

"කොහොම වුණත් අන්තිමට මං දිනුවා"

කර්නල් රොස් පැවසුවේ සැනසුම් සුසුමක් හෙළමිනි.

"ඒත් මෙයෙ අගක් මුලක් මට නම් තවමත් තේරුම් ගන්න බෑ. ඔබට හිතෙන්නේ නැද්ද හෝම්ස් මහත්මයා, ඔබ මේ අභිරහස හංගාගෙන හිටි කාලය ඇතියි කියල?"

"සත්තකින්ම කර්නල්, මං ඔබට කියන්නම් සම්පූර්ණ විස්තරයම. අපි ඔක්කොම ගිහිල්ලා, ඉස්සර වෙලා අශ්වයා බලල ඉඳිමු. ඔන්න එනවා."

ජයග්‍රාහී අශ්වයා ගෙන එනු ලැබූ පෙදෙසට ඇතුළුවීමට අවසර ලැබුණේ අශ්වයා අයිතිකරුට හා ඔහුගේ මිතුරනට පමණි.

"ඔබට කරන්න තියෙන්නෙ අශ්වයාගේ මුහුණ හා ඉදිරි කකුල් වයින් ස්ප්‍රීතු වලින් සෝදීම පමණයි. එතකොට ඔබට හමුවේවි ඔබේ පරණ සිල්ව බ්ලේස්ම"

"මොනවා ?"

"මට මුව හමු වුණා අශ්වයින්ව ව්‍යාජ පෙනුමක් දෙන අයෙකු ළඟ ඉඳලා. මම තීරණය කළා ඌ ඒ හිටි හැටියටම තරගයට ඉදිරිපත් කරන්න."

"අනේ මහත්මයා ඔබ කර ඇති දේ හාස්කම් වගේ පුදුමාකාරයි. මගේ අශ්වයා හොඳ සනීපයෙන් ඉන්නවා. ඌ ජීවිතේට මේ තරම් වේගයෙන් දුවල නැහැ. ඔබේ දක්ෂතාවය ගැන සැක කළාට මං ඔබෙන් දහස්වාරයක් සමාව ඉල්ලනවා හෝම්ස් මහත්මයා. මගේ අශ්වයා සොයාදීමෙන් ඔබ කර තිබෙන්නේ මිළ කළ නොහැකි සේවයක්. ඔබට පුළුවනි මට ඊටත් විඩා ලොකු සේවයක් කරන්න, අහිංසක ජෝන් ස්ට්‍රේකර් මරා දමූ මිනීමරුවා හොයා දුන්නොත්"

"ඒ කාර්යය මම දැනටමත් කර අවසානයි"

"මොනවා ඔබ ඌව අල්ලා ගත්තාද? කෝ ඒකා?

"ඔහු මෙතැන ඉන්නවා"

"මෙතැන ඉන්නවා! කෝ කොහේද?"

"මේ අවස්ථාවේ නම් මා අසලම ඉන්නවා"

http://sherlockholmesinvestigations.blogspot.com

කර්නල් ගේ මුහුණ කෝපයෙන් රතු විය. ඔහු එක් නිමේෂයක් කෝපයෙන් වෙව්ලමින් නිහඬව සිටියේ කථා කර ගැනීමට අපහසු වූ නිසයි.

"මං හොඳට දන්නවා මගේ අශ්වයා සොයා දීම ගැන මා ඔබට ණයගැති බව. නමුත් ඔබේ මේ ප්‍රකාශය එක්කෝ පහත් පෙළේ විහිළුවක්. නැත්නම් මට කරන මහා අපහාසයක්"

හෝම්ස් මහ හඬින් සිනාසුණේය.

"මේ අපරාධයට මං ඔබව සම්බන්ධ කළාද? මං එහෙම දෙයක් කිව්වේ නැහැ නේද කර්නල්? මිනීමරුවා මේ අවස්ථාවේ ඉන්නේ ඔබට පිටුපසින්!"

අඩි කිහිපයක් ඉදිරියට ගිය හෝම්ස් සිල්වර් බ්ලේස්ගේ දිදුලන ග්‍රීවය මත අත තැබුවේය.

"අශ්වයා? කර්නල්ට සහ මට කෑගැසිණ.

"ඔව්. අශ්වයා තමයි. නමුත් මේ අපරාධය ඌ අතින් සිදුවුණේ උගේ ආත්මාරක්ෂාවටයි. ජෝන් ස්ට්‍රේකර් කිසිසේත් ඔබේ විශ්වාසය තැබීමට සුදුසුව සිටි අවංක පුද්ගලයෙක් නෙමෙයි. ආ. . . . අන්න සීනුව නාද වුණා. ඊළඟ තරඟයට වෙලාව හරි. මේ සිද්ධිය දීර්ඝ ලෙස පැහැදිලි කිරීම මම ඊට පස්සේ කරන්නම්"

* * *

එදා සන්ධ්‍යාවේ අපි දුම්රියෙන් ලන්ඩනය බලා පිටත්වීමු. කර්නල් රොස් ද අප සමගු ගමනට එකතු විය. අප වෙනුවෙන් විශේෂ සුඛෝපභෝගී මැදිරියක් වෙන්ව තිබිණ. සඳුදා රාත්‍රියේ ඩාට්මුවර් විල්ලුවේ අශ්වයින් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ වූ සිදුවීම, විසඳූ අයුරු හෝම්ස් විස්තර කිරීමට පටන් ගත්තේය. එයට ආශාවෙන් සවන්දී සිටි අපට, ගමනේ දීර්ඝ භාවය මදකුදු නොවැටහිණ.

"මුලින්ම මං පිළිගන්න කැමතියි, මේ සිද්ධිය පිළිබඳව පුවත්පත් රාශියක වූ වාර්තා කියවල මං කළ මුල්ම උපකල්පනය සම්පූර්ණයෙන්ම වැරදි බව. මං ඩෙවන්ෂයරයට ගියේ මේකෙ තක්කඩියා ෆිට්ස්රෝයි සිම්සන් කියල හිතාගෙන. නමුත් මට තේරුණා, ඔහුට විරුද්ධව ඇති සාක්ෂි, බොහෝදුරට අඩුපාඩු සහිත බව.

http://sherlockholmesinvestigations.blogspot.com



253 "මිනීමරුවා මේ අවස්ථාවේ ඉන්නේ ඔබට පිටුපසින්."

http://sherlockholmesinvestigations.blogspot.com

එදා දුම්රියපොළේ ඉඳලා අශ්ව කරත්තයෙන් ගමන් කරද්දියි, එළුමස් ව්‍යාංජනයේ ඇති වැදගත්කම මට තේරුම් ගැනීමට හැකි වුණේ. මං ඒ ගැන හොඳට කල්පනා කළා. ඔබට මතක ඇති ඒ වෙලාවේ ඔබ සියලු දෙනාම රියෙන් බැස්සාට පසුවත් මං සිහිකල්පනාව අඩු වෙලා වගේ, ඔහේ බලා ඉඳපු හැටි. මේ වගේ වැදගත් හෝඩුවක් මෙතරම් වෙලා මට නොපෙනී ගියේ ඇයි කියලා මට පුදුමත් හිතුණා."

"මට නම් ඒකෙ වැදගත්කම තවමත් තේරුම් ගන්න බැහැ මහත්මයා" කර්නල් රොස් කීය.

"ඒක තමයි මගේ සිතුවිලි දාමයේ පළමුවැනි පුරුක. කුඩු කළ අබිං කියන්නේ කොහොමවත් රසළක් නොමැති ද්‍රව්‍යයක් නෙමෙයි. එහි රස ඉතාම අප්‍රසන්න නොවුණත් දිවට යම් තිත්ත රසයක් දැනෙනවා. එය යම් විධියකින් සාමාන්‍ය ආහාර වේලකට මිශ්‍ර කළොත් එය ආහාරයට ගන්නා තැනැත්තාට තේරෙනවා වෙනස. කෑමට යමක් කලවම් වී ඇති බව වටහාගන්නා ඔහු, එතැනින් එහාට ඒ ආහාරය ගැනීම නවත්වනවා. හමුත් අබිං වල රසය සැඟවීමට ඉතාම සුදුසු ආහාරයක් නම් කුළුබඩු යෙදූ ව්‍යාංජනයක්.

මේ ෆිට්ස්රෝයි සිම්සන් කොහොම හිතාගන්නද එදා රෑට ස්ට්‍රේකර් පවුලේ රාත්‍රී ආහාරයට එළුමස් ව්‍යාංජනයක් පිළියෙල වන බව? ඒ නිසා තරුණයාගේ කෑම වේලට මිශ්‍ර කිරීම සඳහා අබිං කුඩු අරගෙන ආවා කියල හිතන්න අමාරුයි. එතකොට සිම්සන් වෙත එල්ල වූ සැකය එතැනින් ඉවත් වෙනවා. සැකය එල්ල වෙන්නේ ජෝන් ස්ට්‍රේකර් මහතා සහ මහත්මිය වෙත. ඒ මොකද, රෑට කන කෑම තීරණය කිරීම පිළිබඳ අයිතිය තියෙන්නේ ඔවුන් දෙදෙනා අතේ. අබිං මිශ්‍ර කර තිබෙන්නේ තරුණයාගේ කෑම පිඟාන අයින් කළාට පස්සේ. ඇයි එම ආහාරයම ගත් ගෙදර අනෙක් අයට, කිසිම ප්‍රශ්නයක් ඇති වුණේ නැහැ නේ. සේවිකාවට නොපෙනී කෑම පිඟානට අබිං මිශ්‍ර කිරීමට හැකියාව ලැබුණේ කාටද?

ඒක තීරණය කරන්න කලින්, ඉස්තාලයේ බල්ලා නිශ්ශබ්දව හිටියේ ඇයි යන කාරණයේ වැදගත්කම මට තේරුම් ගැනීමට හැකි වුණා. සිම්සන් සම්බන්ධ සිද්ධියෙන් අපි දැනගත්තා ඉස්තාලයේ බල්ලෙක් රඳවාගෙන ඉන්නා බව. ඒ වුණත් කවුරු හරි ඇවිත් ගියා.

http://sherlockholmesinvestigations.blogspot.com

නමුත් උඩ තට්ටුවේ නිදාගෙන සිටි තරුණයන් දෙදෙනා, නින්දෙන් ඇහැරෙන විධියට බල්ලා බිරුවේ නැහැ. ඒකෙන් පැහැදිලිවම අපට තේරුම් ගන්න පිළිවන් මධ්‍යම රාත්‍රියේ ආ අමුත්තා, බල්ලා හොඳින් හඳුනන කෙනෙක්.

දැන් මට බොහෝ දුරට ඒත්තු ගිහින් ජෝන් ස්ට්‍රේකර් මහ රෑ ඇවිත් සිල්ව බ්ලේස් ඉස්තාලයෙන් එළියට ගත් බව. නමුත් ඒ මොන අරමුණෙන් ද? ඒ කුමක් හෝ වංචනික දුෂ්ට අදහසකින් විය යුතුයි. නැත්නම් ඔහු මොකටද ඔහුගේම අශ්වයාගේ කෑම වේලට අබිං දමලා මත් කරන්නේ? ඒ වුණත් මේකට හේතුව මොකක්ද කියල මට හිතාගන්න බැරිවුණා.

සමහර අවස්ථාවල අපට අහන්න ලැබිලා තියෙනවා, සමහර අශ්වයින් පුහුණු කරුවෝ, අති විශාල මුදල් සම්භාරයක් ලබා ගැනීමේ අරමුණෙන් තරඟ පාවා දුන්නු අවස්ථා. ඒ වෙලාවලදී ඔවුන් ඒජන්ත වරුන්ගේ මාර්ගයෙන් ලොකු ගණන් වලට රේස් ඔට්ටු අල්ලලා, තමාගේ අශ්වයා පරාජයට පත්වීමට කටයුතු කරනවා. සමහර විට මෙහෙම පරාජය කරන්නේ අශ්වාරෝහකයාට මුදල් ගෙවලා. සමහර විට වඩාත් සූක්ෂ්ම, විශ්වාසදායක වෙනත් ක්‍රම වලින්. රේස් ඔට්ටු ලෝකයේ මේවා සිදුනොවෙන දේවල් නොමෙයි. නමුත් මෙතැනදී මොකක්ද සිදුවුණේ? ඔහුගේ සාක්කුවේ තිබූ දේවල් වලින් මට යම්කිසි නිගමනයකට ඒමට හැකිවෙවි කියල මං කල්පනා කළා.

එය එලෙසම සිදුවුණා. මං හිතන්නේ නෑ ඔබට අමතක වෙවි කියල, මියගිය පුද්ගලයාගේ අතේ තිබුණු සුවිශේෂ පිහිය. මේ වගේ පිහියක් හොඳ සිහිබුද්ධියක් ඇති මිනිහෙක්, තමන්ගේ ආරක්ෂාවට ආයුධයක් ලෙස අරගෙන යන්නේ නෑ. මද්‍රාස්තර වොට්සන් අපට කිව්වා, මෙවැනි ආයුධ පාවිච්චි කරන්නේ ඉතා සියුම් ශල්‍යකර්ම වලදී පමණක් බව. තුරඟ තරඟ පිළිබඳව ඔබ ලබා තිබෙන දීර්ඝ පළපුරුද්ද අනුව ඔබ දන්නවා අශ්වයාගේ කලවේ පේශියක බන්ධරාවකට කුඩා කැපුමකින් හානියක් කරන්න පුළුවනි. එහෙම වෙන අශ්වයෙකු තොණ්ඩි ගහන්න පටන් ගන්නවා. මෙම තත්ත්වය දුටුවාම කවුරුවත් අනුමාන කරන්නේ, එය දීර්ඝ වශයෙන් පුහුණු වීම් වල යෙදීම නිසා ඇතිවූ ආබාධයක් කියලා; නැත්නම් රූමටික ප්‍රදාහයක් කියලා"

http://sherlockholmesinvestigations.blogspot.com

"දුෂ්ටයා! කාලකණ්ණියා! කන්කාඩියා!!" කර්නල් රොස් කෝපයෙන් කෑගැසුවේය.

"අන්න ඒකෙන් අපට හිතාගන්න පුළුවනි, ජෝන් ස්ට්‍රේකර්ට උවමනා වුණේ ඇයි කියල අශ්වයාව විල්ලුවට ගෙනියන්න. මෙවැනි නිරෝගී ශක්තිමත් සතෙකුට පිහියකින් තුවාලයක් කළාම, ඌ වේදනාවෙන් කෑගහනවා. ඌ නඟන හඬට නදින් නින්ද ගොස් තිබෙන අයට වුණත් ඇහැරෙනවා.

ඒ නිසා ජෝන් ස්ට්‍රේකර් මෙම ක්‍රියාව ඉස්තාලයෙන් බොහොම ඈත, විල්ලුව මැද විවෘත තැනක කිරීමට තීරණය කරන්න ඇති"

"මට මේ කිසිදෙයක් පෙනුණෙ නෑ, අන්ධයෙකුට වගේ. ඔහු අර ගිනිකූර දල්වලා, ඉටිපන්දම දල්වන්න ඇත්තේ ඒ නිසා?"

"ඒකෙ කිසිම සැකයක් නෑ. ඔහුගේ සාක්කුවේ තිබූ දේවල් පරීක්ෂා කිරීමෙන් ස්ට්‍රේකර් මේ අපරාධය සිදුකිරීමට යොදා ගත් මාර්ගය සොයා ගැනීමට හැකිවුණා. එපමණක් නොවෙයි. ඔහු මෙවැනි අපරාධයක් කිරීමට හේතුව සොයා ගැනීමටත් මා වාසනාවන්ත වුණා.

කර්නල් ඔබට තේරුම් ගන්න පුළුවනි, යම් කිසි පුද්ගලයෙක් අනෙක් මිනිසුන්ගේ බිල් පත්, ගෙවීම් පත්, සාක්කුවෙ දමාගෙන එහේ මෙහෙ ගෙනයාමේ පුරුද්දක් නෑ. මොන තරමක් අපේ ම බිල්පත් අප වෙත යොමු වෙනවාද ගෙවා සමථයකට පත්කළ යුතු ඒවා? මට එක් වරම තේරුම් ගියා, ස්ට්‍රේකර් දෙබිඩි ජීවිතයක් ගත කරන, ගෙවල් දෙකක් පවත්වාගෙන යන්නෙක් බව. බිල්ල් හැටියට මට පෙනී ගියා එම කාරණයට කාන්තාවක් අදාළ බව; ඇය කවුරුන් හෝ වේවා, ඇඳුම් පැළඳුම් වෙනුවෙන් අධික ලෙස මුදල් වියදම් කරන්නියක බව. මෙවැනි රැකියාවක් කරන තැනැත්තෙකුට, තමන්ගේ බිරිඳ සඳහා ගිනි විස්සක් වටිනා ගවුමක් අරගෙන දෙන්න හැකි වේවි යයි බලාපොරොත්තු වෙන්න බෑ. කෙළින්ම ඒ පිළිබඳව නොවිමසා, ගවුම ගැන මං ස්ට්‍රේකර් මහත්මියගෙන් වක්‍රව අසා සිටියා ඔබට මතක ඇති. මේ කියන ගවුම කිසිදාක ඇය අතට පත් නොවුණු බව මං තේරුම් ගත්තා. කාන්තා ඇඳුම් ආයතනයේ ලිපිනය මා සටහන් කරගත්තා. ස්ට්‍රේකර්ගේ ඡායාරූපය ගෙන ගොස් මා ඔවුනට පෙන්නුවා. එතකොට මා දැනගත්තා විලියම් ඩර්බිෂයර් යනු මනඃකල්පිත නමක් පමණක් බව.

http://sherlockholmesinvestigations.blogspot.com

එතැනින් එහාට හැමදෙයක්ම පැහැදිලියි. ස්ට්‍රේකර් අශ්වයාව අර වළ තුළට ගෙන ගියේ, ඔහුගේ කාර්යය සඳහා දල්වන ආලෝකය ඈතට නොපෙනෙන්න. සිම්සන් ඉස්තාලයේ ඉඳල පැන දුවද්දී ඔහුගේ කර ලේන්සුව බිම වැටී තිබෙනවා. ස්ට්‍රේකර් එය දැකලා ඇහිඳ ගන්න ඇති. සමහර විට අශ්වයාගේ කකුල බැඳීම සඳහා එය යොදා ගන්න ඔහු කල්පනා කරන්නත් ඇති.

වළට බැස්සට පස්සේ, ඔහු අශ්වයා පිටුපසට ගිහිං ගිනිකූරක් දැල්වුවා. ඝන අඳුර මැද එක්වරම දකින්න ලැබුණු ආලෝකයෙන් අශ්වයා කලබල වුණා. තමන්ට ඇතිවිය හැකි උපද්‍රව ගැන දැනගැනීමට සතුන්ට තිබෙන ඉව පුදුමාකාරයි. සමහර විට තමාට සිදුවිය හැකි අනතුර ගැන සිල්වර් බ්ලේස්ට ඉව වැටී භයවුණා වෙන්නත් පිළිවන්. කොහොම වුණත් භයට පත්වුණු අශ්වයාගේ ප්‍රතික ක්‍රියාව වුණේ අනතුර ඇති දෙසට පා පහරක් එල්ල කිරීමයි. වානේ අශ්ව ලාඩම සහිත කුරය කෙළින් ම එල්ල වුණේ ස්ට්‍රේකර්ගේ නළලට. ඒ පහරින් ස්ට්‍රේකර් ඇදවැටුණා. එහෙම වැටෙද්දී සාක්කුවේ තිබූ ඉතා මුවහත් සැත්කම් පිහියෙන් ඔහුගේ කලවය කැපී ගියා. මං අදහස් කරන දේ ඔබට පැහැදිලිද?

"විශිෂ්ටයි! ඉතාම විශිෂ්ටයි! ඔබ එතැන බලාගෙන හිටියා වගෙයි."

"මගේ අවසන් නිගමනය බොහොම ඈත ඉඳලා එල්ල කළ හියක් කියලා කිව්වේ, ස්ට්‍රේකර් වැනි පුද්ගලයෙක්, මෙවැනි සියුම් වැඩක් කරන්න කලින්, පොඩි අත්හදා බැලීමක්, පුහුණුවක්, යෙදෙන්න ඉඩ ඇති බව මට හිතුණා. ඔහුට අත්හදා බැලීම සඳහා යොදා ගන්න පුළුවන් මොන සතාද? මට දකින්න ලැබුණේ බැටළුවන්. මං අර තරුණයාගෙන් ප්‍රශ්නය ඇහුවාම, මගේ සැකය සනාථ කරමින් ලැබුණු පිළිතුරට මමත් පුදුමයට පත්වුණා.

ලන්ඩනයට ගියාම කාන්තා ඇඳුම් අලෙවි ආයතනයෙන් මං හොයා බැලුවා. ඡායාරූපය දුටු වහාම ඔවුන් හඳුනාගත්තා. ඉතා හොඳ ගනුදෙනු කරුවෙක් වන ඩර්බිෂයර් මහත්මයාට ඉතාම රූමත් බිරිඳක් සිටින බවත්, ඇයගේ කැමැත්ත තිබෙන්නේ, අලංකාර මිල අධික ඇඳුම් පැළඳුම් වලට බවත් මට දැනගන්න ලැබුණා. මට කිසිම සැකයක් නෑ මේ ස්ත්‍රිය වෙනුවෙන් ඔහු අධික ලෙස මුදල් වියදම් කරන්න ඇති. ඒ වියදම් සඳහා හතර වටේටම ණය වෙලා. ණය

http://sherlockholmesinvestigations.blogspot.com

නමැති මඩගොහොරුවේ ඇස් දෙකේ ළඟටම එවිලා; ඒකෙන් ගොඩ ඒමෙ අරමුණෙන් මේ දුෂ්ට ක්‍රියාව සැලසුම් කරන්න ඇති"

"ඔබ හැම දෙයක්ම පැහැදිලි කළා, එකක් හැර, මගේ අශ්වයා සිටියේ කොහේද?"


"ආ අශ්වයා පැනගියා. ඔබේ අසල්වාසීන් උාව රැක බලා ගත්තා. ඒ පුද්ගලයන්ට නම් මං හිතන්නෙත් අපි යම්කිසි සමාවක් දියයුතු වෙනවා.

දන්නෙම නැතුව අපි ක්ලැප්හැම් මංසන්ධියටත් ඇවිත් නේද? තව මිනිත්තු දහයකින් අපි වික්ටෝරියා දුම්රිය පොළට ළඟාවේවි. අපේ කාමරයට ඇවිත්, චුරුට්ටුවක් උරමින් තවදුරටත් කතාබහ කරන්න කැමති නම්, ඔබට් දැනගන්න උවමනා අනෙක් තොරතුරු, ඔබට කියාදෙන්න මං සූදානම් කර්නල්."

**- නිමි -**

Reading Purpose Only...
http://sherlockholmesinvestigations.blogspot.com

# ෂර්ලොක් හෝම්ස්ගේ අභිරහස් පරීක්ෂණ 7ක්



## මිනීමරුවා නිදැල්ලේ!

"හෝම්ස් මහත්මයා මගේ අශ්වයා හොරකම් කළා. මගේ අභිංසක සේවකයා මරා දැමූ මිනීමරුවා අල්ලාගන්න ඔබට හැකියාවක් නැද්ද?"

## ෂොස්කෝම්බ් වලව්වේ පළගිලව්ව

"සත්වර මැදියමට පස්සෙ සොහොන් ගැබ ඇතුළට ගිහිං, වළ දමා තිබූ මිළමිනියක් ගොඩ ගන්න සර් රොබට්ට ඇති උවමනාව මොකක්ද?"

## ල් සලකුණ

"ගිහනක් ගින්නක් කියලා කවුරුදෝ කෑගහනකොටයි මට ඇහැරුණේ. අපේ දෙවියනේ අපේ අහිංසක මහත්තයා!"

## මැර පීටර්

"පීටර් කෙරිට මරණ දඬුවම දීම ගැන . . . . . ට ස්තුති කරන්න ඕන. ආණ්ඩුවට එල්ලුම් ගහේ නොකණ්ඩුවිට් යන මුදලත් ඉතිරි වුණා."

## ප්‍රභූ මැඳුරේ මිනීමැරුම

"ෂර්ලොක් හෝම්ස් මහතා බරපතල ලෙස රෝගාතුරව මෙම පෝටලයේ රැඳී සිටියි. විනාශ පැමිණෙන ලෙස ඔහු දොස්තර මෝටිසන්ට ආයාචනය කරයි."

## කල්‍යාණ මිත්‍රයා

"මං උඹට කිව්වා නේද මගේ පවුලේ අඳවල් වලට හොස්ස දාගන එන්න එපා කියලා? මං උඹට වෙඩි තියනවා දෙයියම්පා!"

## න් පදක්කම

"උඹ හොරිසන්ම මැරුණු නම් මේ කාමරයෙන් එළියට උඹට පණ පිටින් යන්න මං ඉඩ තියන්නෙ නෑ!"



175/-

http://sherlockholmes-investigations.blogspot.com